199 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 199 - இல. 8
**Volume 199 - No. 8**

2011 ජූනි 08 වන බදාදා
2011 யூன் 08, புதன்கிழமை
**Wednesday, 08th June, 2011**



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පාසල් ක්ෂේත්‍රයේ පැන නැගී ඇති ගැටලු

**මහජන ආරක්ෂක ප්‍රකාශනය**

**නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**
பாடசாலை முறைமையில் எழுந்துள்ள பிரச்சினைகள்

**பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்**

**கடற்படை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Problems arisen in School System

PUBLIC SECURITY PROCLAMATION

NAVY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ජුනි 08 වන බදාදා***
*2011 யூன் 08, புதன்கிழமை*
*Wednesday, 08th June, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා ] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA ] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2011 ජුනි මස 07 වැනි දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ආහාර (සංශෝධන)

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (සංශෝධන)

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011ජුනි මස 09 වන බ්‍රහස්පතින්දා, එනම් හෙට දින පස් වරු 4.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadda - Minister of Child Development and Women's Affairs)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(1) 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2008 වර්ෂය සඳහා සීදූව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(1) 2008 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2006 වර්ෂය සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා - පැමිණ නැත.

ගරු බන්දුල ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු රිසාඩ් බදියුදීන් මහතා - පැමිණ නැත.

ගරු ජගත් බාලසූරිය මහතා - පැමිණ නැත.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මම ගාල්ල, දංගෙදර, ස්ටීල් පාර, අංක 28 දරන ස්ථානයෙහි පදිංචි එම්. විමලසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.

ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මම ගම්පහ, ඉහළයාගොඩ, අංක 204/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්.පී. සිරිල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මම ගම්පහ, විජය පාර අංක 96/1, දරන ස්ථානයෙහි පදිංචි පද්මා මාලනී මාගමආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා - පැමිණ නැත.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු කථානායකතුමනි, මම මාතලේ, නාගොල්ලගම පාර, අංක 2/57 දරන ස්ථානයෙහි පදිංචි තක්ෂිලා ප්‍රභාෂිනී ආරියරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)
ගරු කථානායකතුමනි, මම ගලෙන්බිඳුණු වැව, මෙගොඩවැව, මරදන්කල්ල, අංක 183 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத் தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) නිට්ටඹුව, මීගමුව පාර, දවටගහවත්ත හි පදිංචි ආර්.පී.ඔලිවර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රුග්ගහවිල, මීවල, අංක 64/1, දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.බී. ප්‍රසන්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) රුග්ගහවිල, මීවල, අංක 11/2, දරන ස්ථානයෙහි පදිංචි තිස්ස නිමල්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2- 0559/'10 - (5), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ගැන මා පසු ගිය වතාවේත් කිව්වා. මේ පිළිබඳව නීතිමය කටයුතු කෙරෙන හෙයින් මේ සම්බන්ධයෙන් අපි උපදෙස් පතලා තිබෙනවා. ඒ නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට කල් ඉල්ලනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ න්‍යාය පත්‍රයේ තිබෙනවා. පස් වන වතාවටයි අද අහන්නේ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ පිළිබඳව නීතිපතිතුමාගේ උපදෙස් පතා තිබෙන බව කියනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු අංක 1/2011 යටතේ තිබෙන නඩුව පිළිබඳව අපි නීති උපදෙස් පතා තිබෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
## மாலிம்பட கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்
## SCHOOLS ADMINISTERED BY MALIMBADA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0803/'10

3.. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் அக்குரஸ்ஸ வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் மாலிம்பட கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலை களில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறை பாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்,

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Malimbada Divisional Education Office of the Akuressa Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(b) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් නොමැත.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර, ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ.

(iii) ගුරු නිවාස සංඛ්‍යාව 05යි.

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව 05යි.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා, ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි. (ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.)

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කරමි.

(ii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

*** සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

විදුලිය නොමැති ගුරු නිවාස - මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01 | මාලිම්බඩ | මාර/ තෙලිජ්ජවිල ම.ම.වි. | තෙලිජ්ජවිල | 041-2240209 |
| 02 | මාලිම්බඩ | මාර/ අකුරුගොඩ ක.වි. | අකුරුගොඩ | - |
| 03 | මාලිම්බඩ | මාර/ගල්පමුණ ක.වි. | පාලටුව | - |
| 04 | මාලිම්බඩ | මාර/ සුල්තානාගොඩ ම.වි. | සුල්තානාගොඩ | - |
| 05 | මාලිම්බඩ | මාර/ හොරගොඩ ම.වි. | තෙලිජ්ජවිල | - |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න ඇසීමට නැත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 -1026/'10- (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අට්ටාලච්චේනෛ - ආලම්කුලම් ප්‍රදේශය: මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්
## அட்டாளைச்சேனை -ஆலங்குளம் பிரதேசம் :முஸ்லிம் விவாகப் பதிவாளர்
## ADDALAICHENAI-ALAMKULAM AREA : MUSLIM MARRIAGE REGISTRAR

1138/’11

5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අට්ටාලච්චේනෛ ආලම්කුලම් ප්‍රදේශයේ වර්ෂ ගණනාවක සිට මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයෙක් නොමැතිකම හේතුවෙන් එහි ජනතාව බොහෝ දුෂ්කරතාවයන් මුහුණ දෙමින් සිටින බවත්;

(ii) පවුල් 300කට අධික සංඛ්‍යාවක් හා 1500කට අධික ජනගහනයක් සිටින ආලම්කුලම් ප්‍රදේශයේ ජනතාව විවාහයක් ලියාපදිංචි කිරීමට සැතපුම් 15ක් දුරින් පිහිටි අට්ටාලච්චේනෛ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයා වෙත යා යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) හදිසියේ සිදු විය යුතු විවාහයන් ප්‍රමාදයකින් තොරව ලියාපදිංචි කිරීමට හැකිවනසේ ආලම්කුලම් ප්‍රදේශයට මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයක් ඇති කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அட்டாளைச்சேனை ஆலங்குளம் பிரதேசத்தில் பல ஆண்டுகளாக முஸ்லிம் விவாகப் பதிவாளரொருவர் இல்லாமை காரணமாக அங்குள்ள மக்கள் மிகுந்த சிரமங்களை எதிர்கொள்கிறார்கள் என்பதையும்,

(ii) 300 இற்கு மேற்பட்ட குடும்பங்களும் 1500 இற்கு மேற்பட்ட மக்கள் தொகையும் காணப்படும் ஆலங் குளம் பிரதேசத்தில் மக்கள் விவாகப் பதிவிற்காக 15 மைல்களுக்கு அப்பாலுள்ள அட்டாளைச்சேனை முஸ்லிம் விவாகப் பதிவாளரிடம் செல்லவேண்டி யுள்ளது என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) அவசரமாக நடைபெறும் விவாகங்களைத் தாமதமின்றி பதிவு செய்வதற்கு முடியுமான வகையில் ஆலங்குளம் பிரதேசத்திற்கு முஸ்லிம் விவாகப் பதிவாளர் பிரிவொன்றை ஏற்படுத்த நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that-

(i) the people of Alamkulam in Addalaichenai face many difficulties because there has not been a Muslim Registrar of Marriages in that area for several years;

(ii) the people of Alamkulam, where over 300 families and over 1,500 people live, have to go to a Muslim Registrar of Marriages in Addalaichenai, which is 15 miles away, to register a marriage ?

(iii) Will he inform this House whether measures will be taken to create a Registrar of Marriages division for Alamkulam to enable the registration of urgent marriages without delay ?

(b) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

අට්ටාලච්චේනෙ ආලම්කුලම් ප්‍රදේශයේ වර්ෂ ගණනාවක සිට මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයෙකු නොමැතිකම නිසා එහි ජනතාව බොහෝ දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව අට්ටාලච්චේනෙ - 17, ආලම්කුලම්, මැද පාර, අංක 53/සී. පිහිටි ග්‍රාම සංවර්ධන සංවිධානය ආලම්කුලම් හි සභාපති වන සම්සුඩීන් ඉස්මයිල් මහතා විසින් වාර්තා කර ඇත.

(ii) ඔව්.

ප්‍රදේශයේ ජනතාව විවාහ සිදු කිරීමට සැතපුම් 15ක් දුරින් පිහිටි රෙජිස්ට්‍රාර් වෙත යා යුතු බව, අට්ටාලච්චේනෙ - 17, ආලම්කුලම්, මැද පාර, අංක 53/සී. පිහිටි ග්‍රාම සංවර්ධන සංවිධානය, ආලම්කුලම් හි සභාපති වන සම්සුඩීන් ඉස්මයිල් මහතා විසින් ලිපියකින් දන්වා ඇත.

(ආ) ඔව්.

ප්‍රදේශයේ ජනගහනය, එහි විශාලත්වය සහ ජනතාව මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරයෙකු නොමැතිකමින් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ආලම්කුලම් ප්‍රදේශය සඳහා මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයක් ඇති කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දිස්ත්‍රික් ලේකම්, අම්පාර වෙතින් නිර්දේශ කැඳවා ඇති අතර එම නිර්දේශ ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු ඇමතිතුමනි, එම නිර්දේශය කවදා පමණ ලැබෙයිද කියලා අපට දැනුම් දීමක් කරන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද අතුරු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කියන්න කැමැතියි, දිසාපතිතුමාට දැනුම් දීලා තිබෙන බව. දිසාපතිතුමාට එවන්න පුළුවන් වාර්තාව ඉක්මනින් එවීම සඳහා උපදෙස් දී තිබෙනවා. ගරු කථානායකතුමනි, දැන් e-mail පහසුකමත් තිබෙනවා. E-mail මඟින් අඩු කාලයකින් එවිය හැකියි. ඒ නිර්දේශය එවීමට දරන උත්සාහය සීඝ්‍ර කරන ලෙස ඔබතුමා තුළින් දිසාපතිතුමාට දැනුම් දෙනවා නම් වඩා හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, මම ලේකම් මණ්ඩලයට දැනුම් දෙන්නම්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ඒ නිර්දේශය e-mail මඟින් ඉක්මනින් ලබා ගැනීමට පියවර ගන්නවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පළමු කොටම e-mail වැඩ කරනවාද කියන එක සොයා බැලීමට ගරු අස්වර් මන්ත්‍රීතුමාට බාර කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

හොඳයි. මුස්ලිම් ආගමික සංස්කෘතික නීතිය අනුව විවාහ රෙජිස්ට්‍රාර්ලා පත් කිරීම කළ යුතුයි. ඒ නිසා මේ සම්සුඩීන් ඉස්මයිල් මහත්මයා ඒ ඇමතිතුමාගේ අවධානයට යොමු කර ඇති ලිපිය පරිදි එය ඉෂ්ට කර දීලා ඒ ජනතාවට ඒ පහසුකම; විවාහ බන්ධනය සම්බන්ධව, දික්කසාද සම්බන්ධව වැඩ කටයුතු කිරීමේ ඒ අවස්ථාව සලසා දෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එසේය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා අහන්නේ හදිසි විවාහ ගැන. මොකද මේ හදිසිය?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හදිසි විවාහ සිද්ධ වෙනවානේ. ඒකයි අහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ආණ්ඩුවට අංශභාගය තිබෙනවාද? රජයේ ඉන්න ඇමතිවරයෙකුගෙන් රජයේ ඉන්න මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් අහලා-[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක තමයි අපේ ප්‍රජාතන්ත්‍රවාදය. ඔබතුමාට තිබෙන කැක්කුම මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රජයට අංශභාගය තිබෙනවාද කියලා මම අහනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අංශභාගය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කියන්නේ දෙපැත්තටම එක වාගේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ කාලය වෙන් කර තිබෙන්නේ අපට ප්‍රශ්න අහන්න. ආණ්ඩුවේ ප්‍රශ්න අහන්න නොවෙයි. රජයේ මන්ත්‍රීවරු ආණ්ඩුවේ අදක්ෂතාව තමයි ඉස්මතු කරන්නේ. [බාධා කිරීමක්] ඔව්, අපි දන්න සම්ප්‍රදාය නිසා තමයි මෙහෙන් ඡන්දය අරගෙන එහාට පැන්නේ. ඔය සම්ප්‍රදාය ගැන තමයි කථා කරන්නේ.

## සීමාසහිත කේ පෝර්ට් සමාගම බද්දට ලබා ගෙන ඇති ගොඩනැඟිලි: ගිවිසුම් කොන්දේසි
### கே.போர்ட் லிமிரெட்டின் குத்தகைக் கட்டிடங்கள்: உடன்படிக்கை நிபந்தனைகள்
### LEASE OF BUILDINGS OF K PORT LIMITED : CONDITIONS OF AGREEMENT

0561/'10

6. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත කේ පෝර්ට් සමාගම විසින් අක්කර 7ක ගොඩනැඟිල්ලක් සහ කුලියට දෙන ගොඩනැඟිලි 18ක්, රාජ්‍ය ආයතනයකින් බද්දට ලබා ගෙන තිබේද;

(ii) ඔවුන් එකඟ වූ ගිවිසුම සහ එහි සඳහන් කොන්දේසි කවරේද;

(iii) ආයෝජන මණ්ඩල සහන යටතේ ඉහත සඳහන් ඉඩම සහ දේපළ රජය විසින් බදු දීමේ අරමුණ කවරේද;

(iv) ආයෝජන මණ්ඩල සහන පදනම යටතේ මෙම ගනුදෙනුව සිදු කිරීමෙන් රටට හිමිවූ ප්‍රතිලාභය කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී බදු දීම සිදු කරන ලද්දේ විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින්ද; එසේ නොමැති නම්, රජයේ තක්සේරුකරුවෙකුගේ තක්සේරුවක් අනුවද;

(ii) මෙහිදී නිවැරදි තක්සේරු ක්‍රියාවලිය අනුගමනය නොකිරීමෙන් රජයට සිදුවූ පාඩුව ගණන් බැලීම සඳහා පෞද්ගලික තක්සේරුවක් ලබා ගත්තේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පෞද්ගලික සමාගම්වලට කුලියට දෙන ලද, බදු දෙන ලද හෝ විකුණා දැමූ රාජ්‍ය ආයතන සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கே.போர்ட் லிமிடெட் அரசாங்க நிறுவன மொன்றிடமிருந்து ஏழு (7) ஏக்கர் விஸ்தீர ணமுள்ள கட்டிடமொன்றையும், வாடகைக்கு விடக்கூடிய பதினெட்டு (18) கட்டிடங்களையும் குத்தகைக்கு விடுவதற்காக வாடகைக்குப் பெற்றுள்ளதா என்ப தையும்,

(ii) அவர்கள் செய்துகொண்டுள்ள ஒப்பந்தம் மற்றும் அதன் நிபந்தனைகளையும்,

(iii) மேற்படி காணி மற்றும் சொத்துக்கள், முதலீட் டுச்சபையின் விலக்குகளைப் பயன்படுத்தி குத்த கைக்கு விட்டதன் நோக்கம் யாதென் பதையும்,

(iv) முதலீட்டுச்சபை விலக்குகளின் அடிப்படையில் செய்துகொள்ளப்பட்ட அக்கொடுக்கல் வாங்கல்களி னால் நாட்டிற்கு ஏற்பட்ட நன்மையையும் அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி குத்தகையானது ஓர் உரிய கேள்விப்பத்திர முறையைப் பின்பற்றியா அல்லது அரசாங்க விலைமதிப்பீட்டாளரின் விலைமதிப்பீட்டின் அடிப்படையிலா நடைபெற்றது என்பதையும்,

(ii) அரசாங்கத்திற்கு ஏற்பட்ட இழப்பை மதிப்பீடு செய்வதற்கு முறையானதொரு விலைமதிப்பீட்டு செயற்பாட்டை பின்பற்றாமையால் தனியார் விலை மதிப்பீடொன்று பெறப்பட்டதாவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) 2004 ஆம் ஆண்டு முதல் 2010 ஆம் ஆண்டுவரை, தனியார் கம்பனிகளுக்கு வாடகைக்கு விடப்பட்ட, குத்தகைக்கு விடப்பட்ட அல்லது விற்கப்பட்ட அரசாங்க நிறுவனங்களின் எண்ணிக்கையை அவர் வருடவாரியாக இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of State Resources and Enterprise Development :

(a) Will he state-

(i) whether a building of 7 acres and 18 rentable buildings have been taken by the K Port Limited on lease from a Government institution;

(ii) the agreement they entered into and its conditions;

(iii) the objective of leasing out the aforesaid land and property from the Government using the BOI exemptions;

(iv) the benefit to the country owing to that transaction was done on BOI exemption basis;

(b) Will he also state whether-

(i) the aforesaid leasing out was done following a proper tender procedure or on a valuation done by the Government Valuer; and

(ii) a private valuation was obtained to measure the loss that the Government incurs, by not adhering to the correct valuation process ?

(iii) Will he inform this House the number of Government institutions that have been rented, leased or sold to the private companies from 2004 to 2010 on per year basis?

(c) If not, why?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

(අ) (i) මෙම අමාත්‍යාංශය යටතේ පවතින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ 15, මට්ටක්කුලියේ, ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ පිහිටි අක්කර 2.5ක ඉඩමක් හා අක්කර 05යි, රූඩ් 01යි, පර්චස් 29.5ක පිහිටි, සැලැස්මේ ABC අක්ෂරවලින් පෙන්වා ඇති ගබඩා 03 (වර්ග අඩි 99,750ක) සී/ස කේ පෝර්ට් සමාගමට 2003.11.28 වන දින බද්දට ලබා දීමට එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු ඇමතිවරයා විසින් දැනුම් දීම පරිදි මෙම බදු දීම සිදු කර ඇත.

(ii) ප්‍රසිද්ධ නොතාරිස් ශාමිලා ටී. විජේරත්න මහත්මිය විසින් 2003.11.28 වන දින ලියා සහතික කරන ලද අංක 15 දරන බදු ගිවිසුමෙන් බදු දී ඇත. බදු ගිවිසුම මගින් දක්වා ඇති ප්‍රධාන කොන්දේසි;

1. බදු කාල සීමාව 2003.11.01 දින සිට 2053.10.31 දක්වා වර්ෂ 50ක් වේ. වාර්ෂික බදු කුලිය රුපියල් 6,800,000ක් (රුපියල් මිලියන හයයි දශම අටක්) වේ.

2. මෙම වාර්ෂික බදු මුදල කාර්තුවක් සඳහා රුපියල් 1,700,000යි. (මිලියන එකයි දශම හතයි) කාර්තු වශයෙන් සෑම කාර්තුවක් ආරම්භ වන මාසයේ පළමු වන දින ගෙවිය යුතුය.

3. අත්තිකාරම් මුදලක් ලෙස රුපියල් 3,400,000ක් (මිලියන තුනයි දශම හතරක්) ගෙවීමට එකඟ වන අතර, එය ගිවිසුමේ අවසාන මාස 06ක කාල පරිච්ඡේදය වෙනුවෙන් හිලව් කිරීමට එකඟ වේ.

4. වාර්ෂික බදු කුලිය සෑම වසර 05කට වරක් සියයට 5කින් වැඩි කිරීමටත්, පළමු වැඩි කිරීම 2008 නොවැම්බර් මස සිදු කිරීමටත් එකඟ වී ඇත.

5. කන්ටේනර් නැවතුම්පොළක් සහ තම ව්‍යාපාරයට අදාළ කටයුතු හැර වෙනත් කිසිදු කටයුත්තක් සඳහා දේපොළ යොදා ගැනීම සපුරා තහනම් වේ.

6. බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරුගේ ලිඛිත අවසරයක් නොමැතිව තෙවන පාර්ශ්වයක් වෙත සම්පූර්ණව හෝ කොටසක් බදු දීම නොකළ යුතුය.

7. බදු කාලය අවසානයේදී බදු දීමනාකරුට අයත් සියලු නිශ්චල හා චංචල දේපොළ බදු දීමනාකරුට භාර දීමටත් එසේ භාර දීමට අපොහොසත් වන දේපොළ සඳහා රජයේ තක්සේරුවට අනුව අලාභ හානි ප්‍රතිපූර්ණය කිරීමටත් එකඟ වේ.

(iii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් පරිදි බහාලුම් නැවතුම්පොළක් සහ ගබඩා පරිශ්‍රයක් සඳහා මෙම දේපොළ බදු දී ඇත.

(iv) අපේක්ෂිත කාර්ය සඳහා යොදා ගෙන නොමැති බැවින් බදු දීමෙන් කිසිදු ප්‍රතිලාභයක් රටට සිදු වී නොමැත.

(ආ) (i) විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමින් බදු දීම සිදු කර නැත.

(ii) රජයේ තක්සේරුව ලබා ගෙන ඇත.

(ඇ) රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය 2010 අප්‍රේල් මාසයේ ස්ථාපිත කර ඇත. අමාත්‍යාංශය යටතේ ඇති කිසිදු ආයතනයක් පෞද්ගලික සමාගම්වලට මේ වන තෙක් කුලියට, බද්දට හෝ විකුණා නොමැත.

මෙම අමාත්‍යාංශය යටතේ පාඩු ලබන රාජ්‍ය ආයතන ලාභ ලබන ව්‍යාපාර බවට පත් කිරීම සඳහා වඩා විනිවිදභාවයෙන් බදු දීම් හෝ බද්ධ ව්‍යාපාර සඳහා ලබා දීමට කටයුතු කරමින් පවතී.

[ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

ප්‍රසිද්ධ පුවත් පත් මාර්ගයෙන් දේශීය හා විදේශීය වශයෙන් ඒ සඳහා ඇති අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවා ව්‍යාපෘති යෝජනා ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

අමාත්‍යාංශය යටතේ ඇති සමාගම් සතු රාජ්‍ය වතු සංවර්ධනය උදෙසා හෙක්ටෙයාර් 25ට නොවැඩි ඉඩම් සඳහා වන ව්‍යාපෘති යෝජනා සඳහා වැවිලි සමාගම්වල සභාපතිවරුන් සහ අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු ඉඩම් කමිටුවක් වසර 30කට නොවැඩි කෙටි කාලීන බදු දීම් සඳහා තීරණ ගැනීම සිදු කරයි.

(ඈ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න අහන්න ඉස්සෙල්ලා ගරු අමාත්‍යතුමාගෙන් අහනවා, ඔබතුමා දීලා තිබෙන මේ දින වකවානු නිවැරදිද කියලා. මම අතුරු ප්‍රශ්නයක් නොවෙයි අහන්නේ. ඊට පස්සේ මම කියන්නම් හේතුව මොකක්ද කියලා. ඔබතුමා සම්පූර්ණයෙන්ම විශ්වාස කරලා මේ දින වකවානු ලබා දෙනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

එම දින වකවානු තමයි සඳහන් වෙලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා එම ප්‍රශ්නය ගැන නැවත බලන්න. මොකද, එක්සත් ජාතික පක්ෂය කාලයේ මේක තිබුණේ නැහැ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමාගේ කාලයේ ඒක ලබා දුන්නා. මම හිතන්නේ 2003 එකොළොස්වැනි මාසය ලෙස කියලා තිබුණු එකේ පොඩි වැරැදීමක් තිබෙනවා කියලායි. මේ වාගේ ගනුදෙනුවක් වුණේ නැහැ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඉන්නවා, එතුමා ඒකට සාක්ෂි දරාවි. මේක ඔබතුමා භාර අරන් තිබෙන්නේ අමාත්‍යාංශයක් ලෙසයි-

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඔබතුමන්ලාගේ කාලයේ තමයි මේක සිදු වෙලා තිබෙන්නේ. මම හිතන්නේ 2003 එකොළොස්වැනි මාසයේ 01 වැනිදා කියලායි. ඒ කාලයේ තමුන්නාන්සේලාගේ රජයක් තමයි තිබුණේ. මම එතැනදී සඳහන් කළේ කාල සීමාව පමණයි. වෙනත් මොකුත් නම් සඳහන් කළේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වගකීමක් සහිතව කියනවා, මේ වාගේ ගනුදෙනුවක් ඇති වුණේ නැහැ කියලා. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා දන්නවා, ඒ කරපු ආකාරය ගැන අපි ප්‍රශ්න කළාට එතැන එතුමාටත් අදහසක් තිබ්බා ඇයි ඒක කළේ කියා. නමුත් දින වකවානු දුන්නු නිසායි මම කියන්නේ. ඒකෙන් වැරදි අර්ථකථනයක් දෙනවා. මම ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ ඒක ගැන දැන ගෙන, ඒ ශිවිසුම මගේ අතේ තියා ගෙන.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

එවකට සිටි වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් තමයි ඒක කේ පෝර්ට් එකට දෙන්න කියලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඇමතිතුමා මම පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහලා ඔබතුමා උත්තර දෙනවා. මම දන්නවා ඔබතුමා භාර ගත්ත අමාත්‍යාංශයක් මේක. මම මේක නිවැරදි කිරීමටයි මේ ප්‍රශ්නය ඇහුවේ.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

මේ උත්තරය හරි කියලා මම හිතනවා. වරදින්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක 2005 දී වුණේ. මෙතැන ඉන්නවා ඒ ඇමතිතුමා. එතුමා කියාවි. එතුමා වෙළඳ ඇමති වශයෙන් ඉන්න කොට ඒ කාලයේ දුන්නා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

මූලිකව මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා, කේ පෝර්ට් එකට ඉඩම ලබා දෙන්න කියලා-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අපේ වරප්‍රසාද අනුව මේ පාර්ලිමේන්තුවේදී මේ වාගේ වැරදි තොරතුරු හෙළිදරවු වුණොත් අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

නැහැ, නැහැ. මේක හරි මන්ත්‍රීතුමා. මේක වරදින්නත් බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක මෙතුමා දැනුවත්ව නොවෙයි කියන්නේ. මම දන්නවා ඒක. ඒ සම්බන්ධයෙන් කවුරු හරි ඒක හදලා දීලා තිබෙනවා. හදලා දීලා තිබෙන එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඊට පස්සේ කියයි මෙන්න මේ වාගේ දෙයක් වුණා කියලා. මේක පළමුවෙනි වතාව නොවෙයි. දැන් මෙතැන තිබෙනවා-

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

මේක වරදින්න බැහැ මන්ත්‍රීතුමා. මේ සඳහන අනුව, එවකට හිටපු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා කේ පෝර්ට් එකට මේ ඉඩම ලබා දෙන්න කියලා එතුමාගේ නිර්දේශ ලිපියක් ලබා දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබ ඒ ඇමතිතුමාගෙන් ඇහුවා නම් ඒ ඇමතිතුමා කියයි උත්තරය මොකක්ද කියලා. ගිවිසුම කොහොමද කියලා ඔබතුමා ඒ ඇමතිවරයාගෙන් ඇහුවා නම් උත්තරය ලබා දෙයි.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඕනෑ නම් බලන්න මම ඒ ගිවිසුමේ විස්තරය සභාගත කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔය වාගේ දේකට-

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
වරදින්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැරදිලා තිබෙනවා. මම වග කීමකින් කියනවා. ඒ ඇමතිතුමා ඉන්නවා. එතුමා නිශ්ශබ්දව ඉන්නේ. මොකද, එතුමා දන්නවා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
සමහර විට වැරදීමක් වෙලා තිබෙනවා නම් නිවැරදි කරන්නම්. මගේ දැනුමේ හැටියට නම් වරදින්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙසේ වුණත් මේ ගැන සොයා බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා ඇමති නේ. එතුමා මේ උත්තරය හදන්න ඕනෑ නැහැ නේ. එතුමාට ඒක හදලා දීලා තිබෙන ලේකම්ව කරුණාකරලා Parliament (Powers and Privileges) Act එක යටතේ පාර්ලිමේන්තුවට ගෙන්වමු. එහෙම නැත්නම් වග කීමක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපි එවැනි අවස්ථාවක ක්‍රියා කළ යුත්තේ කොහොමද කියලා බලන්න කමිටුවක් හදලා, කැඳවලා ඒ ගැන කරුණු විමසන්න වැඩ පිළිවෙළක් හදමු.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
මේක වැරදි නැහැ මන්ත්‍රීතුමා. වැරදීමක් වෙලා තිබෙනවා නම් ඒක මම නිවැරදි කරන්නම්. වැරදීමක් වෙලා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම වග කීමකින් කියනවා වැරදියි කියලා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු කථානායකතුමා කියන නිසා නැවත මා මේක පරීක්ෂා කර බලා උත්තරයක් දෙන්නම්. තව දිනයක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැරදි තොරතුරු දෙනවා නම් ඒක ලොකු ප්‍රශ්නයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක අපි පිළිගන්න ඕනෑ ගරු කථානායකතුමනි. ඔය දෙය වැරදිය කියා මා මෙතැන ඔප්පු කර කියනවා. දැන් මේක හැන්සාඩ් වාර්තාවට ගියොත් වැරදි ප්‍රකාශයක් වාර්තාගත වෙන්නේ. ඔහොම ගියොත් ඇමතිත්, ලේකම්වරයාත් මේකට වග කියලා ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර -

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
වැරදි නැහැ. මේ පිළිතුර සත්‍යයි කියලා මම කියනවා. මේ පිළිතුර නිවැරදියි කියලා මම කියනවා ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඇමතිතුමාට මේ ගැන මොකුත් කියන්නේ නැහැ. මොකද, මේක ඇමතිතුමාගේ වග කීමක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අපි ඒක ඒ අය කැඳවා බලන්න වෙනවා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පිළිතුර දන්නවා නම් අහන්න එපා මීට පස්සේ. ඔබතුමා පිළිතුර දන්නවා නම් ඇයි අහන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ගැන සොයමු. එහෙම නම් අතුරු ප්‍රශ්න ඉවර ඇති. අපි ඉස්සෙල්ලා ඒ කරුණ ගැන බලමු.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු කථානායකතුමා අපට උපදෙස් දෙන නිසා නැවත අප මේක සොයා බලා මන්ත්‍රීතුමාට පෞද්ගලිකව කියන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙනම් මට අතුරු ප්‍රශ්න අහන්න තියෙන්නේ ඔබතුමා නිවැරදි කර ලැබෙන උත්තරයෙන්.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඔබතුමා කියනවා මේක වැරදිය කියා. මා කියනවා මේක නිවැරදිය කියා. මේක වරදින්නත් බැහැ. නමුත් ඔබතුමා කියන නිසා දෙවරක් සොයා බලා උත්තරයක් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමාගෙන් නිවැරදි කර ලැබෙන්නට තිබෙන උත්තරය තුළින් මා අනුමාන වශයෙන් අහනවා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊළඟ උපදේශක කාරක සභාවට ඒ නිලධාරි මහත්වරු එනවා නේ. එදාට තවත් පැහැදිලි කර ගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමා හැටියට ඔබතුමා කියන්න, මේ කොම්පැනියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් ඉදිරිපත් කරන්නය කියා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඒ කියන්නේ K Port (Pvt.) Limited එකේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

K Port (Pvt.) Limited අධ්‍යක්ෂවරුන්ගේ නම් ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

එහෙම ප්‍රශ්නයක් ඔබතුමා මේ ප්‍රශ්නය තුළින් අසා නැහැ. එම නිසා ඊළඟ වතාවේදී ඔබතුමා ප්‍රශ්නයක් අහන්න මා උත්තර දෙන්නම්. නම් වශයෙන් මට කියන්න අපහසුයි. ඒ නම් මතක තියා ගන්න බැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Point of Order එක මොකක් ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, as you correctly pointed out the other day in the House, the Standing Orders are very clear. According to Standing Order Nos. 28 and 29, a question can be asked but it must not be made a pretext for debate. Now, what is happening here is, a සංවාදය. So, let us follow the Standing Orders. Otherwise, you will not be able to conduct the Business of the House in keeping with the traditions of the House. Therefore, Sir, only three Supplementary Questions can be asked.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තමුන්නාන්සේත් ඕනෑවට වඩා කථා කර ගෙන යනවා නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You have told him. Let us follow the Standing Orders. [*Interruption.*]

How can he say that it is untrue? When a Minister gives an answer, he cannot say it is -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අවධානයට යොමු කිරීම ගැන බොහොම ස්තුතියි. ඒ අනුවයි කටයුතු කරන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා. දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මේක 2006 කාලයේ තමයි ඉදිරිපත් කළේ. මා හිතන විදියට ගබඩා 18ක් තිබෙනවා. වර්ග අඩියක් රුපියල් 4කට තමයි දීලා තිබෙන්නේ. ඒ සම්බන්ධව දැන් ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද කියන එක මේ පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කරනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ඔබතුමා කිව්වා නේ පොඩි වැරදීමක් සිදු වී තිබෙනවා කියා. ඒ එක්කම ඔබතුමාගේ ඔය ප්‍රශ්නයටත් උත්තරය හොයලාම කියන්නම්. ඒ ගැන සොයා බැලුවේ නැහැ. කෙසේ වෙතත් මේක අවුරුදු 50කට බදු දීලා තිබෙනවා 2003 සිට 2053 දක්වා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමාට මේ පාර්ලිමේන්තුවට හෙළිදරවු කරන්න ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නය හදලා තිබෙන්නේ කවුද කියා සොයා බලා, ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරලා, දඬුවමක් කරන්න ඕනෑ මේ වාගේ පුද්ගලයන්ට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය සම්බන්ධයෙන් නොවෙයි, පිළිතුර සම්බන්ධයෙන්. ප්‍රශ්නය අහපු එක්කෙනාට නොවෙයි පිළිතුර -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, පිළිතුර.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
මා කියන්නේ මේ උත්තරය නිවැරදියි කියලා. ගරු මන්ත්‍රීතුමා කියන නිසා නැවත සොයා බැලීමක් කරනවා. මම සොයා බලන්නම් වැරදිද නැද්ද කියා. මා දැනුවත්ව නම් එහෙම වරදින්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මෙතැන මම කියන්නේ මේකයි. ඔබතුමා ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගෙන් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා කියන එක ගරු ඇමතිතුමාට පැහැදිලියි

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කීයක් ඇහුවාද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, you cannot allow this to go on.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සම්බන්ධයෙන් bank guarantee එකක් ලබා ගෙන තිබෙනවාද? ඇමතිතුමා මේ ප්‍රශ්නයේ(අ) (iii) කොටසට පිළිතුරු වශයෙන් කිව්වා 2004 සිට 2010 දක්වා කිසිම දෙයක් කුලියට දීලා හෝ, බදු දීලා හෝ විකුණලා නැහැයි කියලා. නමුත් එහෙම බද්දට දීලා තිබෙනවා නම් ඒක අවලංගු කරනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ඇත්ත වශයෙන්ම අපට මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ දීපු ව්‍යාපෘතිය තවමත් හරියාකාරව කෙරෙන්නේ නැහැ. එහෙම වුණොත් එතුමන්ලාට යම් කිසි කාලසීමාවක් දීලා ඒ ව්‍යාපෘතිය නැවතත් අපට පවරා ගන්න සිද්ධ වනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගබඩා සහ ඉඩම් දීලා තිබෙනවා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ඒ ව්‍යාපෘතිය කෙරෙන්නේ නැත්නම් ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්] කොයි රජය කාලයේ හෝ රජයේ දේපොළක් නේ දීලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔන්න ඕක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ඒ ඒ ව්‍යාපෘතිය කෙරෙන්නේ නැත්නම් අපි නැවත ඒක පවරා ගන්න තීන්දුවක් ගන්නවා.

## තිහගොඩ අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: යටිතල පහසුකම්

### திஹகொட கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்

### SCHOOLS ADMINISTERED BY THIHAGODA DIVISIONAL EDUCATION OFFICE: INFRASTRUCTURE FACILITIES

0824/'10

7. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිහගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව ;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் முலடியன வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் திஹகொட கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலை களில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடு களை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நட வடிக்கையெடுப்பாரா என்பதையும்,

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Thihagoda Divisional Education Office of the Mulatiyana Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(c) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඌනතාවයන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) 01 යි.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පන්ති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) 04 යි.

(iv) 02 යි.

(v) ලී බඩු අවශ්‍යතා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි.

ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

(ii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

* ***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

*ඇමුණුම*

මුලටියන අධ්‍යාපන කලාපයේ තිහගොඩ කොට්ඨාස අධ්‍යාපන කලාපය

විදුලිය නොමැති පාසල්

01. මාර/හිලකන්ද කනිටු විදුහල

විදුලිය නොමැති ගුරු නිවාස

01. මාර/කිතලගම බ.ම.වි
02. මාර/පහලවිටියල ක.වි.

ලී භාණ්ඩ අවශ්‍යතා ඇති පාසල්

01. මාර/යටියන මහ විදුහල - යටියන

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට නම් අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. විදුලිය නොමැති පාසල් 01ක් තිබෙනවායි කියලා මේ පිළිතුරේ සඳහන් කළා. මීට කලින් ප්‍රශ්නයේත් විදුලිය නොමැති පාසල් පිළිබඳව සඳහන් වුණා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඊයේත් මේ සම්බන්ධව සඳහන් කළා, තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගුරුවරුන්ගේ ගැටලුවේදී. අද මම ඔබතුමාට වග කීමක් ඇතුව කියනවා, සමහර පාසල්වලට තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගුරුවරු ඉන්නවා. හැබැයි පරිගණක නැහැ. ඒකට හේතුව විදුලිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා සමහර පාසලකට පරිගණක යන්ත්‍ර කීපයක් දෙනවාට වඩා විදුලිය දෙන්න යන වියදම අඩුයි. මේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ගුරුවරු සමහර පාසල්වල නිකරුණේ සිටිනවා. ඒ නිසා කරුණාකරලා ඒ තත්ත්වය වෙනස් කරන්න. විදුලිය සහ පරිගණක දෙකම දෙන්න අවශ්‍ය පාසල්වලට එහෙම දෙන්නත්, විදුලිය දීලා පරිගණක දෙන්න කටයුතු කරන්නත් කොයි තරම් කාලයක් ඔබතුමා ගන්නවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා උපදෙස් දෙනවා නේ. උපදෙස් නොවෙයි අවශ්‍ය වන්නේ. ප්‍රශ්නය අහන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එතුමා කියන ජාතියේ එවැනි පාසල් නැහැ. එතුමා කියන ජාතියේ පාසල් තිබෙනවා නම්, මන්ත්‍රීතුමනි, පෙන්වන්න. එහෙම තිබෙනවා නම් පිළිගන්න අපි ලැහැස්තියි. තමුන්නාන්සේ කටින් කිව්වාට ඒක පිළිගන්න පුළුවන්කමක් නැහැ. විදුලිය නොමැති පාසල්වලට පරිගණක ලබා දුන්නා නම් සූර්ය විදුලි බලය එහෙම නැත්නම් solar power ලබා දීලා තිබෙනවා. එහෙම නැතුව විදුලිය නොමැති පාසල්වලට පරිගණක ලබා දීලා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. ඇමතිතුමා ආයෙත් පොට වරද්දා ගත්තා, ඊයේ වාගේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ. පොට වරදින්නේ නැහැ, පොට හරියට කැපෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම කිව්වේ විදුලිය දීලා නැහැ, පරිගණක නැහැ, නමුත් තොරතුරු තාක්ෂණ ගුරුවරු ඉන්නවා කියලායි. ඉතින් ඵලක් නැහැ. මෙතැන පරිගණක දීලා විදුලිය නැහැ කියලා නොවෙයි කිව්වේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, නිවැරදිව ගුරුවරුන් කළමනාකරණය කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අහනකොට ප්‍රශ්න හැටියට අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මෙතැන පරිගණක දීලා තිබෙනවාය, විදුලිය නැහැයි කියලා නොවෙයි කිව්වේ. ඒක කරුණාකරලා -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මෙතුමා අද ප්‍රශ්නයට ඊයේ ඒවාත් ඇදලා ගන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඊයේ ඒවා ගන්න බැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ අද ගැන කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඊයේ "කායා" ගැන නොවෙයි ඇහුවේ. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අහන්නකෝ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මීට සති දෙකකට කලින් -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තුන්වැනි එක.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. ඒක තමයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කියන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සති දෙකකට කලින් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සති දෙකක් නොවෙයි. දැන් මේ ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම අහනවා ගරු කථානායකතුමනි. සති දෙකකට කලින් විද්‍යා පීඨ ගුරු පුහුණුව ලබපු 2,500කට පත්වීම් දුන්නා. ඒ පත්වීම්වලින් 2,000ක් දීලා තිබෙන්නේත් ජාතික පාසල් 369කට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ විස්තර වැඩක් නැහැ නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් සහා පාසල් සියල්ලටම දීලා තිබෙන්නේ ගුරුවරුන් 500කට ආසන්න සංඛ්‍යාවක්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇහුවොත් මට උත්තර දෙන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මෙන්න මේකයි මේ ගුරු හිඟයට හේතුව. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ ගුරුවරු සංඛ්‍යාව තුලනය කරන්න අධ්‍යාපන ඇමතිතුමා ගන්න පියවර මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අදාළ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ 2,500ක් ගුරුවරු බඳවා ගෙන 2,500න් 2,000ක් දමන්නේ ජාතික පාසල් 369කට. ඉතුරු 500 තමයි පළාත් සභා පාසල් සියල්ලටම යන්නේ. මෙය බරපතළ ගුරු විෂමතාවක්. මේක තුලනය කරන්න පියවර ගන්නේ කවදාද? කොහොමද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේ ගැන වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් ඒකට උත්තර දෙන්න පුළුවන්. වාඩි වෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඇති.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
රෙද්ද අකුළාගෙන වාඩි වෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8. කෙටියෙන් ප්‍රශ්නය අහලා කෙටියෙන් උත්තර දෙනවා නම් ස්ථාවර නියෝග අනුව සභාව ගෙන යන්න පුළුවන්.

## ගාල්ල බස් නැවතුම්පොළ ඉදි කිරීම : විස්තර
காலி பஸ் நிலைய நிர்மாணம்: விபரம்
CONSTRUCTION OF GALLE BUS STAND: DETAILS

**8. ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

859/'10

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ගාල්ල බස් නැවතුම්පොළ ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;
(ii) මෙම ඇස්තමේන්තුව සකස් කළ ආයතනය කුමක්ද;
(iii) එම ඇස්තමේන්තුව හා ගොඩනැගිල්ලේ සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියට අදාළ,
(i) කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;
(ii) උපදේශක සමාගමක් හෝ ආයතනයක් තිබේ නම්, ඒ කවරේද;
(iii) අධීක්ෂණ කටයුතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම බස් නැවතුම්පොළේ ස්වභාවය හා අදාළ ගොඩනැඟිල්ල තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරන ආයතන හෝ ව්‍යාපාර කවරේද;
(ii) මෙම ගොඩනැගිල්ල තුළ ව්‍යාපාරික ස්ථාන ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද;
(iii) බස් නැවතුම්පොළ ඉදි කිරීමට සමගාමීව බස් නැවතුම්පොළ අවට සහ ගාලු නගරයේ අනිකුත් ප්‍රදේශවලින් ඉවත් කරන ලද පදික වෙළෙඳුන්ට හා තාවකාලික ව්‍යාපාරික ස්ථාන හිමියන්ට ලබා දෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி பஸ் நிலையத்தை நிர்மாணிப்பதற்காக மதிப்பிடப்பட்டுள்ள செலவு எவ்வளவென்பதையும்,

(ii) மேற்படி மதிப்பீட்டைத் தயாரித்த நிறுவனம் யாதென்பதையும்,

(iii) குறித்த மதிப்பீடு மற்றும் கட்டடத்தின் திட்ட வமைப்பு யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இந்தக் கருத்திட்டத்திற்கு ஏற்புடைய,

(i) ஒப்பந்தக்காரர் அல்லது ஒப்பந்தக்காரர்கள் யாரென்பதையும்,

(ii) ஆலோசனை கம்பனி அல்லது நிறுவனமொன்று இருப்பின் அது யாதென்பதையும்,

(iii) மேற்பார்வை செய்கின்ற நிறுவனம் யாதென்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பஸ் நிலையத்தின் இயல்பு மற்றும் சம்பந்தப்பட்ட கட்டடத்தில் நடத்திச்செல்ல உத்தேசித்துள்ள நிறுவனங்கள் அல்லது தொழில் முயற்சிகள் யாவையென்பதையும்,

(ii) இந்தக் கால கட்டத்தில் வியாபார நிலையங்களை வழங்கும் போது பின்பற்றும் வழிமுறை யாதென்ப தையும்,

(iii) பஸ் நிலையம் நிர்மாணிக்கப்படுவதற்கு இணையாக பஸ் நிலையத்தை அண்டிய அத்துடன் காலி நகரின் ஏனைய பிரதேசங்களினின்று வெளியேற்றப்பட்ட நடைபாதை வியாபாரிகள் மற்றும் தற்காலிக வியாபார நிலையங்களைக் கொண்டிருந்தவர்க ளுக்கு வழங்கும் நிவாரணம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he submit to this House-

(i) the estimated cost for the construction of the Galle bus stand ;

(ii) the name of the institution that prepared this estimate ; and

(iii) the estimate and the plan of the relevant building?

(b) Will he state, in relation to this project-

(i) the name of the contractor or the names of contractors ;

(ii) the name of the firm or institution which provide consultancy services, if there is any ; and

(iii) the name of the institution responsible for supervision?

(c) Will he inform this House of-

(i) the nature of this new bus stand and the institutions and the businesses that are intended to be carried out inside the building concerned ;

(ii) the methodology which is adopted for allocating places of business inside this building ;and

(iii) the relief that will be provided to the payment hawkers and the owners of temporary places of business who were removed from the vicinity of the Galle bus stand and other places in the Galle town with the construction of the bus stand?

(d) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) රුපියල් මිලියන දෙසිය හැත්තෑ අටකි. (රු.මි.278) (සියලු වැට් සහිත)

(ii) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

(iii) ගොඩනැඟිල්ලේ මුල් සැලැස්ම භාර දී ඇත.

(ආ) (i) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

(ii) ඩී.එච්. විජේවර්ධන ඇසෝසියේට්ස් පුද්ගලික සමාගම (වරලත් වාස්තු විද්‍යාඥ සහ උපදේශකවරුන්), නො.176, දුටුගැමුණු වීදිය, කොහුවල.

(iii) ගාල්ල මහ නගර සභාව

(ඇ) (i) 1. එක් වරකදී බස් රථ 28ක් ධාවනයේ යෙදවීම සඳහා පහසුකම් හා එයට අදාළ වේලා සටහන්කරුවන්ගේ කුටි.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - ගාල්ල ඩිපෝව කාර්යාලය

3. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යාලය

4. නගර සභාවේ නඩත්තු කාර්යාලය

5. ගාල්ල පොලීසියේ මුරකුටි

6. ආපන ශාලා 02ක් ඇතුළුව වෙළෙඳ සැල් 25ක්

7. සුළු වෙළෙඳාම් කරනු ලබන පදිකයන් 28ක් සඳහා පහසුකම්

(ii) ප්‍රසිද්ධ ටෙන්ඩර් මඟින්

(iii) 1. මේ සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් මත කැපූ ඇළ මත පදික වෙළෙඳුන් සඳහා පා වෙන වෙළෙඳ සැල් ඉදි කිරීම.

2. මහජන පොළ භූමියේ කොටසක වෙළෙඳ සැල් ඉදි කිරීම.

3. මහා වීදියේ අතුරු මාර්ග දෙකක වෙළෙඳ සැල් ඉදි කිරීම.

ඉහත සැලසුම් සකස් කිරීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය දැනට කටයුතු කරමින් පවතී.

(ඈ) පැන නොනඟී.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, ගාල්ල බස් නැවතුම් පොළ ඉදි කර අවසන් වුණත්, මේ බස් නැවතුම් පොළේ කලින් තිබුණු කාල සටහන් ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියට බස් නවත්වන්න බැරි

[ගරු අජිත් කුමාර මහතා]

බවයි අපට දැන ගන්න ලැබී තිබෙන්නේ. ඒ නිසා ඒ අනිකුත් බස් රථ නැවැත්වීම -ගාල් කිරීම- සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියන එක මා දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මෙය සම්පූර්ණයෙන් ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ නැවැත්වීම සඳහා යොදවන්න තමයි අපේ මූලික සැලැස්ම තිබෙන්නේ. ඔබතුමා දන්නවා ගාල්ල බස් නැවතුම් පොළ තිබුණ හැටි කොහොමද කියලා. මිලියන 278ක් වියදම් කරලා මෙය හදන්නේ එකවර බස් රථ 28ක් නවත්වන්න පුළුවන් ආකාරයට. ඊට අමතරව පෞද්ගලික බස් රථ විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ පෞද්ගලික බස් රථ සඳහා ගාල්ලේ වෙනම පෞද්ගලික බස් රථ නැවතුම් පොළක් ඉදි කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එය ඉදිරියේදී ඉෂ්ට කරනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
එතකොට එකම මාර්ගයේ -route එකේ- යන අයට දෙපොළකට යන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක ලංකාවේ හැම තැනකම තිබෙන ප්‍රශ්නයක්. සමහර වෙලාවට පෞද්ගලික බස් නැවතුම් පොළ තිබෙන්නේ වෙනම තැනක. දෙකම එක තැන තිබෙන ඒවාත් තිබෙනවා. ගාල්ල වාගේ නගරයක විශාල තදබදයක් තිබෙනවා. මෙතෙක් ගාල්ලේ තිබුණු තදබදය ඔබතුමාත් දකින්න ඇති. අපේ අමාත්‍යාංශයෙන් මුදල් දුන්නේ ලංකා ගමනාගමන මණ්ඩලයට ඒ මුදල් නොමැති නිසා. අපි මූලික කාර්යයක් හැටියට ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කිරීමට අවශ්‍ය සියලු පහසුකම් මෙතැන ඇති කරනවා. ඊට අමතරව, අපි දුම්රියෙන් එන මගීන්ටත් පහසුකම් සැලසීම සඳහා පාලමක් ඉදි කරනවා, දුම්රිය පොළේ ඉඳලා. ඔබතුමාට ඒ සම්පූර්ණ සැලැස්ම භාර දුන්නා. ඉදිරියේදී පෞද්ගලික බස් රථ සඳහා වෙනම සැලැස්මක් ඉදිරිපත් කරලා ඉල්ලීමක් කළොත් අපි මුදල් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා (ඇ) (iii) කියන කොටසට පිළිතුර වශයෙන් ලබා දුන්නා, පදික වෙළෙඳුන්ට හා තාවකාලික ව්‍යාපාර ස්ථාන අහිමි වූවන්ට කැපූ ඇළ මත පාවෙන වෙළෙඳ සැල් ඉදි කර දෙනවා කියලා. එතකොට ඒ කැපූ ඇළ මත තිබෙන පාවෙන වෙළෙඳ සැල්වලින් භාණ්ඩ ලබා ගැනීම සඳහා යන්න පාරිභෝගිකයන්ට බෝට්ටු සේවයකුත් ආරම්භ කරන්න සූදානම්ද ඔබතුමා?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ. එහෙම අවශ්‍යතාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඒ පාලම යටින් යන්න පුළුවන් වෙළෙඳ සැල්වලට. ඒකට මාර්ගයක් තිබෙනවා. ඒක ඔබතුමා නිකම් විහිළුවට අහපු ප්‍රශ්නයක්. එහෙම කරන්න එපා. මේක අපි,- [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කියපු එකෙන් තේරෙන්නේ එහෙමයි. ඒකයි මේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගිහිල්ලා බලන්න.

ප්‍රශ්න අංක 9-1034/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉහළ කහටගොල්ලෑව ගම්මානය : විදුලි බලය ලබා දීම
## இஹல கஹட்டகொல்லாவ கிராமம்: மின்சார விநியோகம்
## IHALA KAHATAGOLLAWA VILLAGE : PROVISION OF ELECTRICITY

1139/'11

**10. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉහළ කහටගොල්ලෑව ගම්මානයට මෙතෙක් විදුලි බලය ලබා දී නොමැති හේතුවෙන් එහි ජනතාව මහත් දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) එම ගම්මානයේ මාර්ගවලට ඉහළින් අධිබලැති ප්‍රධාන විදුලි රැහැන් ගමන් කළද මේ වනතෙක් විදුලිය නොමැතිව අඳුරේ සිටීමට සිදුව ඇති එම ගම්වැසියන් ඉතා අවාසනාවන්ත තත්ත්වයක් යටතේ දිවි ගෙවන බවත්;

එතුමා පිළිගන්නේනිද?

(ආ) එසේ නම්, ඉහළ කහටගොල්ලෑව ග්‍රාමයට විදුලි බලය ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේනිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுர மாவட்டத்தில் இஹல கஹட்ட கொல்லாவ கிராமத்திற்கு இன்றுவரை மின்சாரம் வழங்கப்படாமை காரணமாக அங்குள்ள மக்கள் மிகுந்த சிரமங்களை எதிர்கொள்கின்றனர் என்பதையும்,

(ii) குறித்த கிராமத்தின் பாதைகளுக்கு மேலால் அதி சக்திவாய்ந்த பிரதான மின் கம்பிகள் செல்கின்ற போதிலும் இன்றுவரை மின்சாரம் இல்லாமல் இருளில் இருக்கவேண்டிய நிலையிலுள்ள அந்தக் கிராம வாசிகள் மிகவும் துரதிஷ்டமான நிலையில் வாழ்ந்து வருகின்றார்கள் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) அவ்வாறாயின், இஹல கஹகொல்லாவ கிராமத்திற்கு மின்சாரத்தைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he admit that-

(i) the people of Ihala Kahatagollawa village in the Anuradhapura District face immense difficulties owing to non provision of electricity to date ; and

(ii) even though main high tension electricity lines go over that village, the people of that village who have to stay in dark without electricity to date lead very miserable lives?

(b) If so, will he inform this House whether arrangements will be made to provide electricity to Ihala Kahatagollawa village?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගොල්ලෑව ගම්මානය මැදවච්චිය මැතිවරණ කොට්ඨාසයට අයත් වන අතර මෙම ගම්මානයට මෙතෙක් විදුලිය ලබා නොදීම හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජනතාව දුෂ්කරතාවට මුහුණදී සිටී. කෙසේ වුවද මැතිවරණ කොට්ඨාසයේ පසු ගිය වසර 05ක් තුළ මිලියන 42ක වියදමින් විදුලිය ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ඇත.

අපේ ගරු තිස්ස කරල්ලියද්ද ඇමතිතුමාත් ඒකට සාක්ෂි දරනවා. බොහොම උනන්දුවෙන් ඒ කටයුතු කළා.

(ii) අධිබලැති විදුලි මාර්ගය ගමන් කළද, ගම්මානයට විදුලිය ලබා දීම සඳහා තාරාපැවි සහ අනෙකුත් අඩුසැර විදුලි මාර්ග ගමන් කළ යුතු වේ. ඒ සඳහා වැය වන ආසන්න මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 05ක් වේ. එම මුදල ඉදිරි ප්‍රතිපාදනවලින් ලබා දීමට නියමිතය.

(ආ) ඔව්.

එය ඉටු කිරීමට කටයුතු කරන අතර, එම ඉදි කිරීම් කටයුතු 2011 දෙසැම්බර් මස වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-0562/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සති දෙකක්?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සති දෙකක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැඩේ කර ගෙන යනවා?

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
## முலடியன கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்:உட்கட்டமைப்பு வசதிகள்
## SCHOOLS ADMINISTERED BY MULATIYANA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0825/’10

**12. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරා ලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் முலடியன வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் முலடியன கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலை களில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடு களை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்,

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்குமென் பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Mulatiyana Divisional Education Office of the Mulatiyana Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(c) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) 01.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පන්ති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) 12.

(iv) 05

(v) ලී භාණ්ඩ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි. ඇමුණුමෙහි ඇත. ඇමුණුම **සභාගත*** කරනවා.

දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

(ii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

මුලටියන අධ්‍යාපන කලාපයේ මුලටියන කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසලේ නම සහ ලිපිනය | විදුලිය | ගුරු නිවාස | ගුරු නිවාස-වල විදුලිය | ලිබඩු අවශ්‍යතා |
|---|---|---|---|---|---|
| 01 | මාර/දෙයියන්දර ජාතික පාසල,දෙයියන්දර | ඇත | ඇත | ඇත | |
| 02 | මාර/පල්ලාවෙල ම.වි.,රදාවෙල | ඇත | ඇත | ඇත | |
| 03 | මාර/පල්ලෙවෙල බටදොල ක.වි., දෙනගම | ඇත | ඇත | නැත | |
| 04 | මාර/පිටවල්ගමුව ක.වි., දෙනගම | ඇත | | | |
| 05 | මාර/දෙනගම විපුලසාර ම.ම.වි., දෙනගම | ඇත | | | ඇත |
| 06 | මාර/සීනිපැල්ල ක.වි., මුලටියන හන්දිය | ඇත | ඇත | නැත | |
| 07 | මාර/මඩුවල ක.වි., දෙයියන්දර | ඇත | | | |
| 08 | මාර/බමුණුගම ම.වි., බමුණුගම හොරපාවිට | ඇත | | | |
| 09 | මාර/රදාවෙල ක.වි., රදාවෙල | ඇත | | | ඇත |
| 10 | මාර/දේවාලේගම ක.වි., රදාවෙල | ඇත | | | |
| 11 | මාර/අතපත්තු කන්ද ක.වි., අතපත්තුකන්ද පරනාමුල්ල | ඇත | ඇත | නැත | |
| 12 | මාර/කැටිඩිපේ ම.වි., දෙයියන්දර | ඇත | | | |
| 13 | මාර/කැටියපේ උතුර ක.වි., කැටියපේ, දෙයියන්දර | ඇත | | | |
| 14 | මාර/මාරමණ්ඩිය ක.වි., මුලටියන හන්දිය | ඇත | ඇත | නැත | |
| 15 | මාර/මාකඳුර ම.ම.වි., මාකඳුර මාතර | ඇත (02) | ඇත | ඇත | ඇත |
| 16 | මාර/රන්සෑගොඩ උතුර ක.වි., රන්සෑගොඩ උතුර,මාකඳුර | ඇත | ඇත | නැත | |
| 17 | මාර/බෑරගම ක.වි., මාකඳුර | ඇත | ඇත | ඇත | |
| 18 | මාර/දිද්දෙනිපොත ම.වි., මුල්ටියන හන්දිය | ඇත | | | |
| 19 | මාර/මාකඳුර නියාමක ආදර්ශ ක.වි., මාකඳුර, මාතර | ඇත | | | ඇත |
| 20 | මාර/රන්සෑගොඩ දකුණ ක.වි., රන්සෑගොඩ දකුණ, රන්සෑගොඩ | ඇත | | | |
| 21 | මාර/බෙරලිය අතුර ක.වි., රන්සෑගොඩ | නැත | | | |
| 22 | මාර/කොරඹුරුවාන ම.වි.,රන්සෑගොඩ | ඇත | | | |
| 23 | මාර/පාතුමුල්ල ක.වි.,හොරපාවිට | ඇත | | | |
| 24 | මාර/මීපාවිට ක.වි.,රන්සෑගොඩ | ඇත | | | |
| 25 | මාර/ගොම්බද්දල විජයබා ක.වි., ගොම්බද්දල, මාතර | ඇත | ඇත | ඇත | |
| 26 | මාර/දෙයියන්දර ප්‍රා.වි.,දෙයියන්දර | ඇත | ඇත | ඇත | |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න අහන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

නැද්ද? බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 13-1035/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த )
(The Hon. Tissa Karalliyadda)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම : කින්නියා ප්‍රදේශය
## கலாசார மத்திய நிலையமொன்றை நிருமாணித்தல்: கிண்ணியா பிரதேசம்
## CONSTRUCTION OF CULTURAL CENTRE : KINNIYA AREA

1140/'11

**14. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 90,000ක් පමණ වූ ජනතාවක් ජීවත් වන ත්‍රිකුණාමලය, කින්නියා ප්‍රදේශයෙහි සංස්කෘතික මධ්‍යස්ථානයක් නොමැති වීම හේතුවෙන් එහි කලාවට හා සාහිත්‍යයට ළැදි අයගේ කලා කුසලතාවන් එළි දැක්වීමට අවස්ථාවක් නොමැතිව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ග්‍රන්ථ එළිදැක්වීම, කවි මඩු, විවාද සභා සහ සෙසු කලා වැඩසටහන් ක්‍රියාත්මක කොට ඔවුන්ගේ දක්ෂතාවන් හා පෞරුෂය වර්ධනය කර ගැනීම සඳහා සියලු පහසුකම්වලින් සමන්විත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

கலாசார, கலை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) சுமார் 90,000 மக்கள் வசிக்கும் திருகோணமலை கிண்ணியா பிரதேசத்தில் கலாசார மத்திய நிலைய மொன்று இல்லாமையால் அங்குள்ள கலை இலக்கிய ஆர்வலர்கள் தமது கலைத் திறமைகளை வெளிப்படுத்து வதற்கு வாய்ப்பின்றி இருக்கின்றார்கள் என்பதை அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், நூல் வெளியீடு, கவி அரங்கு, விவாத அரங்கு மற்றும் ஏனைய கலை நிகழ்ச்சிகளை நடத்தி இவர்களின் திறமைகளையும் ஆளுமையையும் விருத்தி செய்வதற்காக சகல வசதிகளுடன் கூடிய கலாசார மத்திய நிலைய மொன்றை நிர்மாணிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Culture and the Arts:

(a) Is he aware that due to the non-availability of a cultural centre in Kinniya, Trincomalee where nearly 90,000 people reside, those who love arts and literature have been deprived of the opportunity to demonstrate their aesthetic talents ?

(b) If so, will he inform this House whether measures will be taken to construct a cultural centre with all facilities for them to launch books and to hold oral poetry contests, debates and other aesthetic programmes and to improve their talents and personality ?

(c) If not, why ?

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

(අ) ඔව්.

පසු ගිය කාලවල පැවැති රුදුරු ත්‍රස්තවාදය හේතුවෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශයන්හි සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමෙහි ප්‍රවර්ධනයක් නොවීය.

(ආ) ඔව්.

කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා යෝග්‍ය ඉඩමක් සොයා වාර්තා කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට දන්වා කලක් තිස්සේ ගන්නා ලද උත්සාහය පරිදි මේ වන විට ඉඩමක් පිළිබඳ තොරතුරු ලැබී ඇත.

ඒ අනුව අදාළ ඉඩමේ යෝග්‍යතාව පිළිබඳව ශක්‍යතා වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් 2011.04.20 දින ලබා ගන්නා ලදී.

එකී ශක්‍යතා වාර්තාවට අනුව එම ඉඩමෙහි සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමට අවශ්‍ය මූලික තොරතුරු ඇතුළත් පොදු සැලැස්මක් 2011.05.27 දින කින්නියා ප්‍රාදේශීය ලේකම්වරයාට යවන ලදී.

එකී සැලැස්ම තෝරා ගත් ඉඩමට ගැලපෙන සේ සකස් කර, ඇස්තමේන්තුවද සමඟ මෙම අමාත්‍යාංශයට එවන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයාට දැනටමත් දැනුම් දී ඇත. අදාළ වාර්තාව ලැබුණු විගස මුදල් ප්‍රතිපාදන ලබා දී ඉදිකිරීම් කටයුතු ඇරඹීමට පියවර ගනිමි. මුදල් ප්‍රතිපාදන ලබා දීම පිළිබඳ ගැටලුවක් නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, my first Supplementary Question is this. The Hon. Minister is also aware that a cultural centre was initiated and opened by the late Hon. A.L. Abdul Majeed, the then Deputy Minister in Parliament. When will the Hon. Minister get the estimate? කවදා වාගේ ඇස්තමේන්තුව හම්බවෙයිද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

අපි estimates සකස් කරගෙන යනවා. සති දෙකක්, තුනක් විතර යනකොට අපට estimates සකස් කර අවසන් කරන්න පුළුවන් වෙයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒ මුදල්වලින්, out of that estimated amount, will you be able to complete the whole project?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

එය ගැටලුවක් නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

This is my last Supplementary Question. There are about 90,000 people in the whole area. Will you send a team to find out the cultural needs of the people of Kinniya and the surrounding areas?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

කින්නියා ප්‍රදේශයේත්, ඔබතුමා කිව්ව අනෙකුත් ප්‍රදේශවලත් ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර තිබෙනවා. ඒ අනුව අපේ සංස්කෘතික අධ්‍යක්ෂවරයාත් දැනුවත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒ report එකක් අරගෙන තමුන්නාන්සේ අපට භාර දෙනවාද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ඔව්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 15- 1144/'11-(1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය. ප්‍රශ්නය අංක 1- 0444/'10 - (4), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, පළමුවන ප්‍රශ්නය මා හතරවන වතාවට අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක පමණ කාලයක් ඉල්ලා සිටිනවා. මෙය -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේක පිළිගන්නට බැරි වැඩ පිළිවෙළක්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මා පිළිතුර දීලා අවසන් නැහැ. ගරු කථානායකතුමනි, අපි මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීතිමය උපදෙස් පතලා තිබෙනවා. මේ පිළිබඳව දැනට අභියාචනා අධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒ නිසායි මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා මේ ප්‍රශ්නය අහන්නේ -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

The case number is CA Writ No. 865/10.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන අවස්ථාව වන විට තව කොම්පැනි දෙකක් බංකොලොත් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න පාර්ලිමේන්තුවෙන් අහන්නේ ඒ අයව සුරක්ෂිත කරන්නයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මුල්‍ය ආයතන පිළිබඳව වග කීමකින් උත්තර දෙන්න ඕනෑ නිසායි ඒ පිළිබඳව එලෙස උපදෙස් පතා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වග කීමෙන් උත්තර දෙන්න ඉස්සර වග කීමෙන් අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන්න. නැත්නම් එතැන තිබෙන අනෙකුත් මුදල් - [බාධා කිරීමක්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මා කලින් සඳහන් කළේ 2011.06.09 වන දින පස් වරු 4.30 ට පැවැත්වෙන බවයි. නමුත් පක්ෂ නායකතුමන්ලාගේ එකඟතාව අනුව එය 2011.06.09 වන දින පස්වරු 2.30ට පවත්වනු ලබන බව දැනුම් දෙනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පාසල් ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටලු
### பாடசாலை முறைமையில் எழுந்துள்ள பிரச்சினைகள்
### PROBLEMS ARISEN IN SCHOOL SYSTEM

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, රටේ අනාගතය හා එහි හැඩතල තීරණය කරනු ලබන්නේ අද දවසේ ජීවත් වන ළමා පරපුර බව අපි දනිමු. එම නිසා එම පරම්පරාව ලබන අධ්‍යාපනයට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් එම අධ්‍යාපනය කෙරෙහි බලපාන කරුණු කෙරෙහි අප නිරන්තර අවධානයෙන් සිටිය යුතුයි. මේ මොහොත වන විට රටේ පාසල් අධ්‍යාපනය ලබන දූවා දරුවන් ඇතුළු ගුරුවරුන් හා දෙමවුපියන්ට බලපාන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අපට අධ්‍යාපනය සම්බන්ධව පොදු ජනතා සුබසෙත ඉලක්ක කර ගත් ප්‍රතිපත්තියක් නොමැතිකමත්, වරින් වර බලයට පත් වන ආණ්ඩු සහ අධ්‍යාපන අමාත්‍යවරයාගේ රුචි අරුචිකම් අනුවත්, අනික් අතින් ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝගවලට වැඩ කටයුතු සිදු වන නිසාත් අධ්‍යාපන ක්ෂේත්‍රය පුරා සෑම තැනම එක ලෙස ඔඩු දූවා ඇති ගැටලු රැසක් මතු වී තිබෙනවා.

ඒවා එක් වරම පිටතින් හඳුනා ගත හැකි ගැටලු මෙන්ම බාහිරව දර්ශනය නොවන ගුණාත්මක ගැටලු ආදී ලෙසද නිශ්චිත ආකාර දෙකකින් හඳුනා ගත හැකිය. උදාහරණයක් ලෙස,

* සුදුසුකම් ලත් පුහුණු ගුරු හිඟය;
* සිසුන්ට අවශ්‍ය පාසල්, ගොඩනැඟිලි, විද්‍යාගාර, පුස්තකාල,

[ගරු අනුර දිසානායක මහතා]

විවිධ උපකරණ, පරිගණක විද්‍යාගාර, දුරකථන, අන්තර්ජාල පහසුකම්, විදුලි බලය හා ක්‍රීඩාගාර පහසුකම් ආදී මූලික භෞතික පහසුකම්වල හිඟය හෝ ඒවා ප්‍රමාණවත් නොවීම;

* විෂය නිර්දේශවල තිබෙන අඩු පාඩුකම්;
* සිසුන් ඇගයීමේ ක්‍රමවේදය තුළ තිබෙන ගැටලු;
* ජනප්‍රිය හා ජනප්‍රිය නොවන පාසල් ලෙස ආකාර කිහිපයකට වර්ගීකරණය වූ පාසල් පද්ධතියක් තිබීම;
* පළමු වසරට සිසුන් ඇතුළත් කර ගැනීම උග්‍ර පොරයක් බවට පත්ව තිබීම;
* ජල පහසුකම් පවා නොතිබීම;
* වැසිකිළි, කැසිකිළි වැනි දෑ ප්‍රමාණවත් නොවීම;
* අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය දේශපාලනීකරණය නිසා අකාර්යක්ෂම වී තිබීම, ඒ අනුව දුර්වලතා හා අඩු පාඩු රැසක් මතු වී තිබීම;
* පාසල් අධ්‍යාපනයට අමතරව උපකාරක පන්ති යෑමට සිදු වීම;
* දෙමවුපියන්ට දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් බදු මඟින් පාසල් තුළ මුදල් අය කිරීම නිසා

අමතර පන්ති සඳහා ආකාර කිහිපයකට ගෙවන්න සිදු වීම දැක්විය හැකිය.

මීට පෙර ක්‍රියාත්මක කළ ව්‍යාපෘති මෙම විවිධාකාර ගැටලු විසඳීම අරමුණු කර ගෙන ආරම්භ කර තිබෙනවා. එහෙත් ඒවායේ සාර්ථක හෝ අසාර්ථක බව පිළිබඳව ඇගයීමක් හෝ නොකර තවත් ව්‍යාපෘතියක් හඳුන්වා දීමට මේ වන විට කටයුතු කරමින් සිටින බව අපට පෙනෙන්නට තිබෙනවා.

මීට පෙර ක්‍රියාත්මක කළ පර්ෂද මූලස්ථාන, නවෝදා පාසල්, ජාතික පාසල්, ඉසුරු පාසල් ආදී විවිධ ව්‍යාපෘති ගණනාවක් ඇති අතර ඒවායින් බොහොමයක් නාම පුවරුවලට සීමා වී "සපිරි පාසල් 1000" වැඩ පිළිවෙළ ලෙස නම් කර ඇති නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව කටයුතු යොදා තිබෙනවා. අපට පැන නඟින ගැටලුව නම් සපිරි පාසල් 1000 ව්‍යාපෘතිය හුදු ප්‍රචාරකවාදී දේශපාලන ව්‍යාපෘතියකට පමණක් සීමා වන්නේද යන්නයි. මෙම ව්‍යාපෘතියට අධ්‍යාපන අමාත්‍යාංශය තාර්කික පදනම ලෙස ඉදිරිපත් කර ඇත්තේ, අවම පහුසකම් සහිත ප්‍රදේශවල ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන මට්ටම්වල ගුණාත්මක තත්ත්වය අඩු මට්ටම්වල පැවතීම, සම්පත් බෙදා හැරීමේදී සම සාධාරණ ප්‍රතිපත්තිය තහවුරු නොවීම, සිසුන්ගේ සෞඛ්‍ය හා ගැටලු පිළිබඳ ආමන්ත්‍රණය නොවීම, නගරයට සිසුන් ඇදී ඒම නිසා වැඩි කාලයක් ප්‍රවාහනයේ යෙදීම හරහා ඇති වී ඇති ගැටලු, ද්විතියික අධ්‍යාපනයේ සහභාගිත්ව අනුපාතයන් තවදුරටත් ඉහළ නැංවිය යුතු වීම, අසීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පන්ති කාමර තුළ සිටීම නිසා ගුරු ශිෂ්‍ය අන්තර් සබඳතා හා අවධානය දුරස්ත වීම, ඌන ශිෂ්‍ය සාධන මට්ටම් සහිත පාසල් හා අධ්‍යාපන සම්පත් නාස්තිය, ගුණාත්මක බවින් පිරිපුන් ප්‍රමාණාත්මක ද්විතියික පාසල් සංඛ්‍යාවක් නොමැති වීම, ජනප්‍රිය පාසල්වල පළමුවැනි ශ්‍රේණියේ ළමුන් ඇතුළත් කර ගැනීම හරහා මතු වී ඇති ප්‍රායෝගික ගැටලු හා සමාජ ආර්ථික ප්‍රශ්න යන කාරණා ටිකයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාසල් වර්ග තුනකට වෙන් කර ඇත්තේ පළමුව ප්‍රාථමික පාසල්, ද්විතියික පාසල් සහ මෙම ව්‍යාපෘතියට අයත් නොවන පාසල් යනුවෙනි. ප්‍රාථමික පාසල් කේන්ද්‍ර කරගෙන ඒවායේ සිසුන් එකතු කර එක් ද්විතියික පාසලක් ගොඩ නඟනු ලැබේ. අවම වශයෙන් ප්‍රාථමික පාසල් 03ත් 05ත් අතර පෝෂිත පාසල් ලෙස ගැනෙන පරිදි ද්විතියික පාසල් 1000ක් තෝරා ගෙන සංවර්ධනයට කටයුතු කරන බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි. මෙහිදී තෝරා ගත් පාසල්වලට අවශ්‍ය මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය සම්පත් සැපයීම හරහා ආකර්ෂණීය පාසල් පද්ධතියක් ගොඩ නඟන බව තවදුරටත් කියා සිටියි. එහෙත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියට පදනම් කරගත් සමහර තර්ක තවදුරටත් තීව්‍ර වන බව අපට දක්නට ලැබේ. කෙසේ නමුත් දැනටමත් පාසල් අතර මෙම පාසල් 1000 ව්‍යාපෘතියේ නාම ලේඛනයට ඇතුළත් වීම සඳහා තරගයක් මෙන්ම මාරාන්තික උපවාසද පැන නැඟී ඇත. ඒවායේ ප්‍රතිඵල ලෙස පාසල් 1000 ව්‍යාපෘතිය පාසල් 1001 -තවත් එක් පාසලක් ඇතුළත් කරලා- ව්‍යාපෘතිය බවට පත් වී ඇති බව පසු ගිය දිනවල අසන්නට ලැබුණි. තවද සමහර පාසල්වල ප්‍රාථමික අංශ ඉවත් කිරීමට දැඩි විරෝධතාවක්ද මතු වී තිබෙනවා.

මෙම ව්‍යාපෘතිය හරහා පාසල් ක්ෂේත්‍රයේ පැන නැඟෙන ගැටලු හඳුනා ගැනීමටත් ඒ ගැන පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හා එම ගැටලු විසඳීමට මෙම ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර පහත ප්‍රශ්න සඳහා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පිළිතුරු අපේක්ෂා කරනවා.

01. දැනට පාසල් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ ව්‍යාපෘති මොනවාද?

02. "පාසල් 1,000 ව්‍යාපෘතියේ" දෙමළ මාධ්‍ය පාසල් සඳහා මේ වනවිට සිදු කර ඇති ක්‍රියා මාර්ග මොනවාද? ඒ වෙනුවෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද?

03. මෙම ව්‍යාපෘතියට දැනට තෝරා ගෙන ඇති පාසල් මොනවාද?

04. මෙම සියලු පාසල්වල ප්‍රාථමික අංශ ඉවත් කරන්නේද?

05. එම ප්‍රාථමික අංශ ඉවත් කිරීමේදී පැන නගින විරෝධතාවන් ගැන සලකා ව්‍යාපෘතිය වෙනස් කරන්නේද?

06. සපිරි පාසල් වටා ඇති පෝෂිත පාසල්වල සියලුම සිසුන් ද්විතියික අංශය සඳහා එම සපිරි පාසලට ඇතුළත් කරනු ලබන්නේද? ඒ, අවට තිබෙන පාසල්වල ළමයින් ටික.

07. නැතිනම් එම සිසුන්ට ඇති ද්විතියික පාසල් මොනවාද? එහෙම ඇතුළත් කරන්නේ නැත්නම් මේ සිසුන්ට තිබෙන ද්විතියික පාසල් මොනවාද?

08. දැනටමත් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික අංශය ඉවත් කර ඇති හෝ ඉවත් කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇති පාසල් මොනවාද?

09. මෙම ව්‍යාපෘතිය මඟින් පාසල් වැසීම නතර කරනු ලබන්නේද?

10. මෙම ව්‍යාපෘතියේ අනුමත මුදල් ප්‍රමාණය කොපමණද?

11. මෙම ව්‍යාපෘතියට මුදල් ලැබෙනුයේ කෙසේද?

12. මෙම ව්‍යාපෘතියේ කාල රාමුව කුමක්ද?

13. මෙම ව්‍යාපෘතිය සිදු කරන කාලය තුළ අනෙකුත් පාසල්වල සංවර්ධනය නතර කරනු ලබන්නේද?

14. මෙම ව්‍යාපෘතියේ සාර්ථක අසාර්ථක භාවය නිර්ණය කරනු ලබන්නේ කෙසේද?

උක්ත ප්‍රශ්න පිළිබඳව ගරු අධ්‍යාපන අමාත්‍යතුමා මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, මෙම ගැටලු විසඳීම කෙරෙහි මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම නව වසරට ළමයි ඇතුළත් කර ගැනීම නිසා මෙම තත්ත්වයේ යම් ව්‍යාකූලත්වයක් තිබෙන නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කර මේ පිළිබඳව ඉක්මන් ක්‍රියා මාර්ග ගනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා නිදහස් අධ්‍යාපනයේ දරුවෙක් වශයෙන් සද්භාවයෙන් මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා මේ ප්‍රශ්න මාලාව ඉදිරිපත් කළාය කියන විශ්වාසය ඇතිව මා මේ පිළිබඳව මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් කරන්නට බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ අධ්‍යාපන පද්ධතිය තුළ ලක්ෂ 40කට ආසන්න දරු පිරිසක් අධ්‍යාපනයේ නිරත වෙනවා. දස දහසකට ආසන්න පාසල් ප්‍රමාණයක් මේ වර්ග සැතැප්ම 25,332 තුළ විසිරිලා පැතිරිලා පවතිනවා. 2,25,000කට ආසන්න ගුරු සංඛ්‍යාවක් මේ තුළ සේවා නියුක්තව සිටිනවා. ඒ නිසා ඉතා විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා, විවිධ ආණ්ඩු යටතේ විවිධ වෙනස්කම් අනුව හැඩ ගැසුණු අධ්‍යාපන ක්‍රමය තුළ -මේ සියල්ලේ- එතුමා කියන විවේචනත් අපි හා අධ්‍යාපනඥයන් දැන හඳුනා ගෙන තිබෙන විවේචනත් රාශියක් තිබෙනවා. ඒ සියල්ල හිතු මනාපෙට නැතුව ගැඹුරෙන් අධ්‍යයනය කරලා අතිගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියන වැඩ පිළිවෙළේ නිශ්චිත ලෙස භාෂාත්‍රයෙන්ම සඳහන් කර තිබුණා, මේ රටේ දූවාදරුවන්ට -ඈත ගම් මට්ටමේ සිටින දරුවන්ටත්- අධ්‍යාපනයේ සමාන අවස්ථා ඇති වන ලෙස යහපත් සංවර්ධිත පාසල් දහසක් ඇති කරන බව.

ඊට අතිරේකව පසු ගිය නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනයේදී අතිගරු ජනාධිපතිතුමා මේ පාසල් දහසේ වැඩසටහන අය වැය රාමුවට ඇතුළත් කොට එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පාර්ලිමේන්තු යෝජනාව ඉදිරිපත් කළා. අපි කවුරුත් පිළිගන්නවා, ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගෙන එන අවස්ථාවේදීත් විවිධ විරෝධතා හා උද්ඝෝෂණ ඇති වුණා කියලා. මේ රටේ ඕනෑම වෙනසක් සඳහා සූදානම් වන විට එවැනි උද්ඝෝෂණ විවිධ තේරුම් ගැනීම් මත ඇති වීම සාමාන්‍ය ස්වභාවයක්.

එදා සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීමට ගිය අවස්ථාවේදීත් රට පුරා දැවැන්ත උද්ඝෝෂණ ඇති වුණා. නමුත් මේ ව්‍යාපෘතිය එදා සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා අධ්‍යාපනයේ සමාන අවස්ථා ලබා දීම යනුවෙන් අදහස් කළේ රට තුළ තිබෙන සෑම පාසලකටම එක වාගේ සම්පත් ලබා දීම කියන අර්ථය නොවෙයි. එතුමා විසින් නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කරලා රට පුරා මධ්‍ය විද්‍යාල 54ක් ඇති කළා. 6 වන ශ්‍රේණියෙන් උඩට ද්විතීයික පාසල් ලෙස තමයි ඒ මැදි විදුහල් 54ම ඇති කළේ.

ඒ පාසල් 54 තුළ විශේෂ ගුණාංග කිහිපයක් තිබුණා. ඒ, 6 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වීම; 8 වන ශ්‍රේණියේදී වාණිජ, විද්‍යා, කලා වශයෙන් විෂයන් බෙදීම; ලජ්ජා භය සහිත දරුවන් පිරිසක් බිහි කිරීම සඳහා මිශ්‍ර පාසල් ලෙස ගැහැනු හා පිරිමි දරුවන් දෙපිරිසම අධ්‍යාපනය ලබන පාසල් වීම; දුෂ්කර පළාත්වල දක්ෂතා හා කුසලතා තිබෙන දරුවන්ට පාසල තුළ අධ්‍යාපනය ලබන්නට එකම භූමි භාගය තුළ පිට්ටනියෙන් එහා පැත්ත මෙහා පැත්ත පිරිමි නේවාසිකාගාරය සහ ගැහැනු නේවාසිකාගාරය යනුවෙන් නේවාසිකාගාර දෙකක් පවත්වා ගෙන යාම; ක්‍රීඩා පහසුකම් නැංවීම සඳහා අංග සම්පූර්ණ ක්‍රීඩා පිට්ටනියක් ලබා දීම; අක්කර 20ක්, 25ක් වැනි විශාල භූමි ප්‍රදේශයක් පාසලට වෙන් කර තිබීම ආදිය මෙම පාසල් පද්ධතිය තුළ දක්නටලැබුණා. වඩු කර්මාන්තය, මැටි කර්මාන්තය, අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය, එවකට පැවතුණු ආකාරයට මෝටර් රථ කාර්මික විද්‍යාව, යාන්ත්‍රීකරණය වැනි කටයුතු සඳහා වෙනම අංශ ඇති කිරීමත්, ඒවා සඳහා ගුරුවරු ලබා දීමත් තුළ ජීවන කුසලතා අත් පත් කර ගැනීම සඳහා මැ විදුහල් තුළ වැඩි ඉඩක් ලබා දීලා මධ්‍ය මහා විද්‍යාල සංකල්පය ඇති කළා.

එවිට ඒ පළාත් තුළ තිබුණු ප්‍රාථමික පාසල්වල දරුවන් ඒ පළාත තුළ තිබෙන ඒ ද්විතීයික පාසල් 54ට ආවා. ඒ අනුව අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය පෝෂණය කරන්න පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය, අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය, කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාල, තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය, හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය, රුවන් වැල්ල මධ්‍ය මහා විද්‍යාලය යන විද්‍යාලවලින් ශිෂ්‍යශිෂ්‍යාවන් බිහි වුණා. එවැනි විද්‍යාලවලින් බිහි වුණු පරම්පරාව අග්‍රවිනිශ්චයකාරතුමියගේ පටන් විවිධ තරාතිරම්වල අතිමහත් බහුතර ග්‍රාමීය දූවා දරුවන් විශාල පිරිසක් ලාංකිය සමාජ ක්‍රමය තුළ දෙපයින් සිටවා තැබීමේ ශක්තිය ලැබුණා කියලා අපි කවුරුත් විශ්වාස කරනවා. නමුත් ඊට පසුව ඇති වුණු විවිධ අනුකරණවාදී වෙනස්කම් හා අත් හදා බැලීම් කරන කොට ගෙන අද්‍යතන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ තත්ත්වය මොකක්ද? ප්‍රාථමික අධ්‍යාපනයේ ගැටලුවක් නැහැ. ඒ කියන්නේ 1 සිට 5 දක්වා අධ්‍යාපනය තුළයි. ගෝලීය අධ්‍යයන දර්ශකයට අනුව - Global Education Indicatorsවලට අනුව- ලෝකයේ රටවල් 82ක ප්‍රාථමික අධ්‍යාපනයේ වර්ගීකරණය තුළ ලංකාව සිටින්නේ 40 වැනි ස්ථානයේයි. රටවල් 82ක් තුළ ප්‍රාථමික අධ්‍යාපනය වෙනුවෙන් 40 වැනි ස්ථානය තමයි අපට හිමි වන්නේ. ඉන්දියාව 56 වැනි ස්ථානයේ ඉන්නේ. පාකිස්තානය ඉන්නේ 62 වැනි ස්ථානයේයි. සාක් කලාපය තුළ ප්‍රාථමික අධ්‍යාපනය වඩාම හොඳ ඉහළ මට්ටමක පවතින්නේ අපේ රටෙයි. ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය, භූතානය, නේපාලය, මාලදිවයින වැනි රටවල් අතුරින් ප්‍රාථමික අධ්‍යාපනය අපේ තිබෙන්නේ ඉතාම ඉහළ මට්ටමකයි. පළමු වැනි ශ්‍රේණියට දරුවන් 100ක් ඇතුළු වුණොත් 96.4ක් ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කරනවා. ඒ නිසා 1 සිට 5 දක්වා දරුවන් නිසි ලෙස ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කරනවා. 1 සිට 5 දක්වා ඇද හැලීමේ අනුපාතය සියයට දශම පහයි අටයි. ඒ නිසා ප්‍රාථමික අධ්‍යාපනය-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, සම්පූර්ණ නොකරන ඉතුරු පිරිස? [බාධා කිරීමක්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඉතුරු පිරිසේ සමහර කොටසක්. ඒ දර්ශකය සකස් කරන ආකාරය අනුවයි. මොකද, dropout ratio එක සකස් කරන ආකාරයේ තිබෙනවා, ගණිතමය පැහිදිලි කිරීමක්.

එම නිසා ඉතා කුඩා ඇදහැලීමේ අනුපාතයක් තමයි තිබෙන්නේ. නමුත් දැන් ප්‍රාථමික අධ්‍යාපනය තිබෙන පාසල්වලත් ගරු කථානායකතුමනි, විශාල ප්‍රශ්නයක් තිබෙනවා. පළමු වන ශ්‍රේණිය සඳහා එකම දරුවෙක්වත් ඉල්ලුම් කරන්නේ නැති පාසල් 124ක් ලංකාවේ තිබෙනවා. පළමුවන වසරට පාසල තිබෙනවා. නමුත් පාසල් 124කට එකම ඉල්ලුම් පත්‍රයක්වත් ලැබෙන්නේ නැහැ. පළමුවන ශ්‍රේණියට ඇතුළු වීම සඳහා දරුවන් දහ දෙනෙකු හෝ ඊට වඩා අඩුවෙන් ඉල්ලන පාසල් 2,167ක් තිබෙනවා. මේ රටේ තිබෙන මුළු පාසල් පද්ධතියෙන් සියයට 25ක් -ඒ කියන්නේ හතරෙන් එකක්- සඳහා පළමුවන ශ්‍රේණියට ඉල්ලුම් කරන්නේ දරුවෝ දහ දෙනකුට වඩා අඩුවෙන්. නමුත් මෙම පාසල් අප නාමික වශයෙන් පවත්වා ගෙන යනවා. සමහර පාසල් තිබෙනවා, මම ගිහින් අවබෝධය ලබා ගත් ඒවා; ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ අවබෝධය ලබා ගත් ඒවා. පාසල තිබෙනවා. විදුහල්පතිතුමා ඉන්නවා. නමා පුවරුව තිබෙනවා. නමුත් එක දරුවෙකුවත් නැහැ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සමහර පාසල් තිබෙනවා, එක දරුවයි, විදුහල්පතිතුමායි, ගුරුතුමියයි ඉන්නවා. එක දරුවා ඉන්නේ මොකද කියා මා අසා බැලුවාම, ගුරුතුමිය කිව්වා, "මේ දරුවා මන්ද මානසික දරුවෙක්" කියා. මන්ද මානසික දරුවා විතරක් පාසලේ ඉන්නවා. මානසික තත්ත්වය හොඳ සියලු දරුවෝ පාසලෙන් ඉවත් වී ගිහින්. මේ තත්ත්වය තුළ සමහර පාසල් ඉතාම අතාර්කික හා විචාරාත්මක නොවන තත්ත්වයක පැවතීමෙන් ඇති වී තිබෙන ප්‍රධාන ප්‍රතිඵලය මෙයයි. දරුවෝ පණහට වඩා අඩුවෙන් ඉන්න පාසල් සංඛ්‍යාව - කුඩා කුඩා පාසල් සංඛ්‍යාව- වැඩි වෙමින් යනවා. ගරු කථානායකතුමනි, 2003 දී ශිෂ්‍ය සංඛ්‍යාව පණහට අඩු පාසල් තිබුණේ 1,437 යි. අද ශිෂ්‍ය සංඛ්‍යාව පණහට අඩු පාසල් 1,552ක් තිබෙනවා. ඒ කියන්නේ ලංකාවේ තිබෙන පාසල්වලින් 1,552ක් ශිෂ්‍ය සංඛ්‍යාව පණහට අඩු පාසල්. ගොඩනැඟිලි තිබෙනවා. ඉඩකඩම් තිබෙනවා. විදුහල්පතිවරු ඉන්නවා. ආචාර්ය මණ්ඩලය ඉන්නවා. නමුත් දරුවෝ පණහට අඩු පාසල් 1,552ක් තිබෙනවා. ඒ කියන්නේ සියයට 16ක්. විශාල පාසල් බැලුවාම විශාලත්වය හා පාසල් ප්‍රමාණය වැඩි වෙමින් පවතිනවා කියලා පෙනෙනවා. 2003 දී දරුවෝ 2,500ට වැඩි පාසල් මුළු ලංකාවේම තිබුණේ 141යි. පාසල් දහ දාහක් කියන චිත්‍රය විශාලට පෙනෙන්නට තිබුණාට, අප කථා කරන දරුවන් දමා ගන්න උනන්දු වන දෙදහස් පන්සියයට වඩා දරුවන් ඉන්න පාසල් එදා තිබුණේ 141යි. එය 2010 වර්ෂය වනකොට පාසල් 187ක් වී තිබෙනවා.

සියයට 1.9ක් තමයි, පාසල් කියලා එළියට පෙනෙන තත්ත්වයේ තිබෙන පාසල් සංඛ්‍යාව. ඒ ශිෂ්‍යයින් 2,500ට වඩා වැඩි පාසල්. ගරු කථානායකතුමනි, ඉතා කුඩා පාසල් තිබීම නිසා ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය තමයි විශාල ගුරු සංඛ්‍යාවක් තාර්කික නොවන ආකාරයට, අසමතුලිත ආකාරයට බෙදිලා ගිහින් තිබීම. මම උදාහරණ කිහිපයක් පළාත් අනුව මෙම ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි.

බස්නාහිර පළාතේ -අපේ පළාතේ- දියුණුම දිස්ත්‍රික්කයේ කෙහෙල්ඇල්ල බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 18යි, ගුරුවරු 4යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 4.5:1යි. ඊළඟට කරපගල ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 19යි, ගුරු සංඛ්‍යාව 07යි. ශිෂ්‍යයෝ 2.7කට ගුරුවරයෙක් ඉන්නවා. ඊළඟට මධ්‍යම පළාතේ හපුගොඩ ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 14යි, ගුරුවරු 07යි. ශිෂ්‍යයෝ 14 දෙනෙකුට ගුරවරු 07යි කියන්නේ සෑම ශිෂ්‍යයෝ දෙන්නෙකුටම ගුරුවරයෙක් ඉන්නවා. උනුවින්න ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 09යි, ගුරු සංඛ්‍යාව 05යි. ශිෂ්‍යයෝ 1.8කට ගුරුවරයෙක් ඉන්නවා. උතුරු මැද පළාතේ ගෝනපිටියාව විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 14යි, ගුරුවරු 06යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 2.3:1යි. කිරිමැටියාව ගාමිණී විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 20යි, ගුරු සංඛ්‍යාව 8යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 2.5:1යි. ඌව පළාත කොහාන විද්‍යාලයේ ශිෂ්‍ය සංඛාව 12යි, ගුරුවරු 08යි. ශිෂ්‍යයෝ 1.5කට ගුරුවරයෙක් ඉන්නවා. ඊළඟට වැල්කැලි විද්‍යාලයේ ශිෂ්‍යයෝ 16යි, ගුරුවරු 08යි. ශිෂ්‍යයෝ 02කට ගුරුවරයෙක් ඉන්නවා. සබරගමුව පළාතේ රත්ගම විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 13යි, ගුරුවරු 05යි. ශිෂ්‍යයෝ 2.6කට ගුරුවරයෙක් ඉන්නවා. අගරෙගම විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 12යි, ගුරුවරු 08යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 1.5:1යි. දකුණු පළාතේ ලංකා සභා ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍යයෝ 04යි, ගුරුවරු 07යි. ශිෂ්‍යයෝ 0.6කට ගුරුවරයෙක් ඉන්නවා. අනුපාතය 0.6:1යි. ඊළඟට රාහුල මහා විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 17යි, ගුරුවරු 10යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 1.7:1යි. උතුරු පළාතේ කෝවිලකන්ඩි මහාලක්ෂ්මි විද්‍යාලයේ ශිෂ්‍යයෝ 17යි, ගුරු සංඛ්‍යාව 05යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 3.4:1යි. නැඟෙනහිර පළාතේ අල්-ජසීර් විද්‍යාලයේ ශිෂ්‍යයෝ 18යි, ගුරු සංඛ්‍යාව 06යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 3:1යි. වයඹ පළාතේ රඹුක්කන ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍යයෝ 20යි, ගුරු සංඛ්‍යාව 07යි. ශිෂ්‍ය ගුරු අනුපාතය 2.9:1යි. මේ ආදී වශයෙන් ඉතාම අතාර්කික ලෙස ගුරුවරු බෙදිලා ගිහිල්ලා ශිෂ්‍ය ගුරු අනුපාතයේ විශාල විකෘති තත්ත්වයක් සමස්ත රටේ තිබෙනවා.

මේ අතර මම මේ ගරු සභාවට තවත් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, 1AB පාසල් කියන්නේ විද්‍යා අංශය සහිත පාසල්. අපේ රටේ විද්‍යා අංශයෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටින්නේ මුළු විභාගයට පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 22යි. හතරෙන් එකක්වත් විද්‍යා අංශය ගණිතයත් සමඟ කරන්නේ නැහැ. වාණිජ අංශය සඳහා සියයට 25යි. උසස් පෙළ කරන ශිෂ්‍යයන්ගෙන් සියයට 53ක් කලා අංශයේ ශිෂ්‍යයෝ. මෙය ශිෂ්‍යයන්ගේ වැරැද්දක්වත්, එහෙම නැත්නම් ශිෂ්‍යයන්ගේ නොහැකියාවක්වත් නොවෙයි. දරුවන්ගේ නොහැකියාවක් නොවෙයි. මොකද ඒ පළාත්වල 1AB පාසල් සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, වාණිජ විද්‍යාගාර පහසුකම්, භෞතික සම්පත්, මානව සම්පත් සහ ගුරුවරු ලබා දීමේ ප්‍රශ්නය නිසා විද්‍යා අංශයෙන් සහ වාණිජ අංශයෙන් ඉතා විශාල පිරිසක් ඈද හැලිලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමන් දැනුම කේන්ද්‍රීය සංවර්ධනය යටතේ මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කරන්න යනවා නම්, මේ සැලැස්මේ අපි ඉලක්ක කරලා තිබෙනවා විද්‍යා අංශයෙන් ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 2015 වන විට සියයට 45ක්, වාණිජ අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 30ක්, කලා අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 25ක් විය යුතු ආකාරයට මේ සංයුතිය -ව්‍යුහය- වෙනස් විය යුතුයි කියලා. 1AB පාසල් තිබෙන තැන්වල තත්ත්වයත් මම ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව මේ ගරු සභාවේ පත්තර කියවන්නත් බැහැ, නිදා ගන්නත් බැහැ. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්තුමා අනුරාධපුර ගැන ස්වප්නයක් දකිනවාද දන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකරලා මේ ඇමතිතුමාගේ දීර්ඝ පිළිතුර සඳහා අවස්ථාව දෙන්න. ප්‍රධාන කටයුතුවල කාලය තමයි මේ යන්නේ. ඉක්මන් කළොත් හොඳයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ශිෂ්‍ය පරාසය 1-15 දක්වා වූ විද්‍යා අංශයේ පාසල් 123ක් තිබෙනවා. ඒවායේ විද්‍යා අංශයේ ඉගෙනුම ලබන දරුවන් ප්‍රමාණය 15ට අඩුයි. විද්‍යා අංශයේ දරුවෝ 50ට අඩු පාසල් 215ක් තිබෙනවා. ඒ කියන්නේ මුළු ලංකාව ගත්තාම විද්‍යා අංශයේ දරුවෝ 50ට අඩු පාසල් සියයට 47.5ක් තිබෙනවා. විද්‍යා අංශය තිබුණත් එහි දරුවෝ 50ට අඩුයි. කොළඹ දිස්ත්‍රික්කයේ ජනප්‍රිය යයි සම්මත පාසල්වලට ආවත් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයේ සමහර පාසල් තිබෙනවා, ජීව විද්‍යාව ඉගෙනුම ලබන එක දරුවයි ඉන්නේ. උපාධිධාරී ගුරුවරු තුන් දෙනෙක් ඉන්නවා. ගණිත අංශයේ දරුවෝ දෙදෙනයි ඉන්නේ, උපාධිධාරී ගුරුවරු තුන් දෙනෙක් ඉන්නවා. එතකොට ශිෂ්‍යයෝ තුන් දෙනයි, උපාධිධාරී ගුරුවරු හය දෙනයි. දියුණුම දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කය ගැනයි මා කියන්නේ. ගරු කථානායකතුමනි, අද්‍යතන ශ්‍රී ලංකාවේ විද්‍යා අංශයේ පාසලක් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා. විද්‍යා අංශයේ එකම පාසලක්වත් නැහැ. 1AB පාසලක් නැහැ.

විද්‍යා අංශයේ එක පාසලක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100ක් තිබෙනවා. රට තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 324ක් තිබෙනවා. 1AB පාසලක් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා. විද්‍යා අංශයේ එක පාසලක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100ක් තිබෙනවා. එතකොට මුළු සංඛ්‍යාව ගත්තාම ද්විතීයික පාසල්වලින් රටට අවශ්‍ය මානව ප්‍රාග්ධනය සපයා ගැනීම පිළිබඳව විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ පාසල් 1000 තෝරා ගැනීමේ වැඩසටහන තුළින් 2015 වන විට විද්‍යා අංශයේ එකම පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ට පාසල් 156ක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

එක පාසලක් විතරක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට 1AB පාසල් 288ක් ලබා දෙන්න. ඒක තමයි මේ සිතියම්ගතකරණයේ ඉලක්කය. ඒ අනුව මන්ත්‍රීතුමා දැන් ඉදිරිපත් කළ ප්‍රශ්න 10 සඳහා මම පිළිතුරු දෙන්න කැමැතියි. දැනට පාසල් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ ව්‍යාපෘති මොනවාද කියලා ඇහුවා. ප්‍රධාන ව්‍යාපෘතිය මෙයයි. ප්‍රාථමික පාසල් පෝෂණය කිරීම සඳහා වූ ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නවෝද්‍යා පාසල්-

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒවා ඉවරයි. ඒ කියන්නේ එහෙම නවෝද්‍යා පාසල්, ඉසුරු පාසල්, ජාතික පාසල්, පළාත් සභා පාසල් කියන ඒවා ගැන දැන් කථාවක් නැහැ. තිබෙන පාසල් එලෙසින්ම තිබෙනවා. මේක තිබෙන්නේ අතිරේකයක් ලෙසයි. මම උදාහරණයක් ලෙස ඔබතුමාට බොහොම පැහැදිලිව සඳහන් කළොත් මේ ව්‍යාපෘතියට රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, විශාඛා විද්‍යාලය, ඩී.එස්. සේනානායක විද්‍යාලය, සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ඉසිපතන විද්‍යාලය කියන මේ එකක්වත් නැහැ. කොළඹ නගරයේ ජාතික පාසල්වලින් තිබෙන්නේ ලුම්බිනි මහා විද්‍යාලය විතරයි. මක් නිසාද යත්, ලුම්බිනි මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශය වෙනමයි තිබෙන්නේ. ඒ නිසා එහෙම හැම දිස්ත්‍රික්කවලම තිබෙන පාසල් පද්ධතිය එලෙසින්ම තිබෙනවා. ඒ තිබෙන පාසල්වලට අතිරේකව තමයි අඩුම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පාසල් තුනකටවත්, නගරයේ සුපිරි යයි සම්මත පාසලක යම් කිසි පහසුකමක් තිබෙනවා නම් ඒ සියලු පහසුකම්, භෞතික හා මානව සම්පත් ලබා දීමේ අරමුණින් තමයි මේ සැලැස්ම සකස් කර තිබෙන්නේ. දැන් මුස්ලිම් පාසලක් තිබෙනවා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමනි, කාලය ගැන සලකන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියමය අනුව මම මේ ප්‍රශ්න ටිකට විතරක් උත්තර දෙනවා. එහෙම නම් අතුරු ප්‍රශ්න අහන්න එපා.

පාසල් දහසේ ව්‍යාපෘතිය තුළ දෙමළ මාධ්‍ය පාසල් සඳහා මේ වන විට සිදු කර ඇති ක්‍රියාමාර්ග මේවායි. දෙමළ මාධ්‍ය සහ සිංහල මාධ්‍යය කියලා දෙකක් තිබෙනවා. දෙමළ මාධ්‍යයෙන් මුස්ලිම් සහ දෙමළ කියන ජනවර්ග දෙකටම අයත් දරුවන් ඉගෙන ගන්නවා. මේ තිබෙන දෙමළ හා මුස්ලිම් පාසල්වලට අතිරේකව ඉහළ මට්ටමට ගෙන එන පාසල් සංඛ්‍යාව මෙසේයි. බස්නාහිර පාසල් 05යි, මධ්‍යම 52යි, දකුණ 03යි, උතුර 122යි, නැඟෙනහිර 96යි, වයඹ 09යි, උතුරු මැද 07යි, ඌව 17යි, සබරගමුව 16යි. මුළු එකතුව 327යි. ඒ කියන්නේ මුළු පාසල්වලින් සියයට 29ක් ජන වර්ග අනුපාතය අනුව සියයට 27යි. සමස්තය වශයෙන් සලකා පාසල් සියයට 29ක් දීලා තිබෙනවා. මේ පාසල් සඳහා දැනට ක්‍රියාත්මක කරන්නේ භෞතික සම්පත් අවශ්‍යතා නිර්ණය කිරීම.

අපි අලුතින් පටන් ගන්නා පාසල් දහසටම අඩුම ගණනේ පරිගණක 50කින් යුත් පරිගණක විද්‍යාගාරයක් ලබා දෙනවා. අලුත් තාක්ෂණික උපකරණ සහිතව ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් විදේශ භාෂා සඳහා භාෂාගාරයක් දෙනවා. ඊ ළඟට ගණිතාගාරයක් දෙනවා. මක් නිසාද යත්, මේ වැඩසටහනේදී අපි බර තියනවා, ප්‍රධාන විෂයයන් පහකට; ප්‍රධාන අංශ පහකට. 1. තොරතුරු තාක්ෂණය 2. ඉංග්‍රීසි භාෂාව හා විදේශ භාෂා 3. විද්‍යාව හා ගණිතය 4. ක්‍රීඩා 5. සෞන්දර්යය. මේ කොටස් පහට තමයි වැඩි බර තැබීමක් කරන්නේ. ඒ නිසා ඒ භෞතික පහසුකම් ලබා දෙනවා. විද්‍යාගාර තිබෙනවා, ගෘහ විද්‍යාගාර තිබෙනවා, වාණිජ විද්‍යාගාර තිබෙනවා, ක්‍රීඩා පහසුකම් දෙනවා. ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු මේ දිනවල සකස් කරනවා. අවශ්‍ය ගුරු සංඛ්‍යාව තීරණය කරලා තිබෙනවා. මම මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් මණ්ඩලය අවසර ලබා දීලා තිබෙනවා, අලුතින් තොරතුරු තාක්ෂණ උපාධිධාරී ගුරුවරුන් දහසක්, ඉංග්‍රීසි භාෂා උපාධිධාරී ගුරුවරුන් දහසක්, ඊළඟට විද්‍යාගාර ගණිත උපාධිධාරී ගුරුවරුන් දහසක්, විදුහල්පතිවරු දහසක් වශයෙන් හාර දහසක් බඳවා ගැනීම ඉදිරි මාස දෙක තුළදී කරන අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන්න අවශ්‍ය විධිවිධාන සකස් කර තිබෙන බව. රත්නපුර, රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ පරිගණක තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දෙනවා. පේරාදෙනියේ, පැණිදෙනියේ ගුරු අභ්‍යාස විද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පුහුණුව ලබලා දෙනවා. ගුරු විද්‍යාල හා විද්‍යා පීඨවල විද්‍යාව හා ගණිත පුහුණුව ලබලා දෙනවා. විදුහල්පතිවරුන්ට කඩිනම් පුහුණුවක් සඳහා රන්ටැඹේ සහ ජාතික අධ්‍යාපන ආයතනය යනාදියේ මානව සම්පත සකස් කරනවා. එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරගෙන යනවා.

ඊළඟට ඔබතුමාගේ තුන්වන ප්‍රශ්නයට අදාළව, තෝරා ගෙන ඇති පාසල් දහසේ ලැයිස්තුව මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. 1,096ක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්, සභාවට ඉදිරිපත් කරනවා.

ඊ ළඟ ප්‍රශ්නය, "මෙම සියලු පාසල්වල ප්‍රාථමික අංශ ඉවත් කරන්නේද?" කියන එකයි. ඔව්. ඇයි? මේ නඟා සිටුවන්නේ ද්විතීයික පාසල්. ප්‍රාථමික අංශය මේ අවුරුද්දේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැහැදිලි කිරීමක් නොකර උත්තරය දුන්නා නම් හොඳයි. දැන් වෙලාව නැති නිසා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හැබැයි, "ප්‍රාථමික අංශය මේ විධියටම තියා ගන්න ඕනෑ, අපට මේ රුපියල් කෝටි 6 1/2ත් එපා; පරිගණකත් එපා; ගුරුවරුත්

එපා" කියලා කවුරු හෝ කියනවා නම්, "හා එහෙම තියා ගන්න" කියලා අපි ඒ ළඟම තිබෙන අනෙක් පාසලකට ඒක විතැන් කරනවා. ඒ නිසා ඒක ගැන කිසි ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ.

ඊ ළඟ ප්‍රශ්නය, "මෙම ප්‍රාථමික අංශ ඉවත් කිරීමේදී පැන නැඟෙන විරෝධතාවන් ගැන සලකා ව්‍යාපෘතිය වෙනස් කරන්නේද" කියන එකයි. විරෝධතාව පොඩ්ඩක් කිව්වාම ඇති. විරෝධතා පාන්න ඕනෑ නැහැ, පිකටින් කරන්න ඕනෑ නැහැ, වැඩ වර්ජනය කරන්න ඕනෑ නැහැ, නිකම් වෙඩි තියා ගන්න ඕනෑ නැහැ. ඇවිල්ලා කිව්වාම, "අනේ! මේක එපා" කියලා, අපි කියනවා, " හා, එහෙම නම් ඔය පාසල එපා, වෙන පාසලක් ගන්නම්" කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා, පෞද්ගලික විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතටත් ඔහොම කළා නම් හරි නේද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අසා තිබෙන 6 වන ප්‍රශ්නයට පිළිතුර - ඔව්. අධ්‍යාපනයේ සම අවස්ථා සැපයීම සහතික කරලීම මෙම වැඩසටහනේ මූලිකම අරමුණක් බැවින් වඩාත් සංවර්ධිත පාසලක් සඳහා සිසුන්ට අවස්ථාව සැපයීමට හැකි වන පරිදි එම ද්විතීයික පාසල හා ජාලගත වූ ප්‍රාථමික පාසල්වල සිසුන්ට එකී ද්විතීයික අංශයේ ඉඩකඩ විවෘත වේ. නමුත් මේ සඳහා විශේෂ බල කිරීමක් සිදු කිරීමට අපේක්ෂා නොකෙරේ.

ඊළඟට, "නැතිනම් එම සිසුන්ට ඇති ද්විතීයික පාසල් මොනවාද?" කියා හත්වන ප්‍රශ්නයෙන් අසා තිබෙනවා. ද්විතීයික පාසල් එහෙමම තියනවා. දැන් මම එක උදාහරණයක් කිව්වොත්, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය සංවර්ධිත ද්විතීයික පාසලක් ලෙස දියුණු කරනවා, හයවන පන්තියෙන් ඉහළ සිට. ඊට එහා පැත්තේ මායාදුන්න විද්‍යාලයේ තිබෙනවා, පළමුවන ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා විද්‍යා,කලා, වාණිජ අංශ. ඒකට මොකුත් වෙන්නේ නැහැ. ඒක ඒ විධියටම තිබෙනවා. ඒ නිසා ද්විතීයික පාසල් පිළිබඳ ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ.

ඊළඟට එතුමාගේ අටවන ප්‍රශ්නය, දැනටමත් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික අංශය ඉවත් කර ඇති හෝ ඉවත් කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇති පාසල් මොනවාද යන්නයි. ප්‍රාථමික අංශය ඉවත් කර ඇති පාසල් 238ක් තිබෙනවා. ඒවායේ කිසි ප්‍රශ්නයක් නැහැ. 238ම පටන් ගත හැකියි. අනික් ඒවායේ මහ ඇමතිතුමන්ලා හා ඒ පළාත් අධ්‍යාපන බලධාරීන් එකඟතාව පළ කරපු පාසල් තමයි ඇතුළු කරලා තිබෙන්නේ. ඒවායේ ප්‍රශ්නයක් මතු වුණොත් අපි ඒ පිළිබඳව සලකා බලනවා.

මෙම ව්‍යාපෘතිය මඟින් පාසල් වැසීම නතර කරනු ලබන්නේද කියා ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඇසුවා. අවශ්‍යයෙන්ම ඔව්. පෝෂිත පාසල් ටික තිබුණාම දරුවා දන්නවා, ශිෂ්‍යත්වය සමත් වුණත් නොවුණත් මේ ප්‍රාථමික පාසල් සියල්ලගේම දරුවෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිබෙන අර ද්විතීයික පාසල් දෙකට නැත්නම් තුනට යනවා කියලා. එතකොට මේ පාසල්වල තිබෙන වැසී යාමේ තත්ත්වය නැති වනවා.

මෙම ව්‍යාපෘතියේ අනුමත මුදල් ප්‍රමාණය කොපමණද කියා ඊළඟට අසා තිබෙනවා. අනුමත මුදල් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක්. ඒ කියන්නේ රුපියල් මිලියන 60,000ක්. මේ ව්‍යාපෘතියට මුදල් ලැබෙන්නේ මේ ආකාරයටයි. ලෝක බැංකු ආධාර මත ඇමෙරිකානු ඩොලර් මිලියන 100යි. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 150යි. චීන රජයේ උපකරණ ආධාර හා අනිකුත් ද්‍රව්‍ය ආධාර යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 200යි. එතකොට දැනටමත් ඇමෙරිකානු ඩොලර් මිලියන 450යි. ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් පමණ අපි ඇස්තමේන්තු කරනවා. 2011 සිට 2016 දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන විට ඒ ව්‍යාපෘතියේ ප්‍රගතිය බලා, ඒ සඳහා වැඩිපුර ආධාර ලබා දෙන්න මේ ආධාර සපයන සියලු ආයතන එකඟතාව පළ කර තිබෙනවා. මෙම ව්‍යාපෘතිය සිදු කරන කාලය තුළ අනෙකුත් පාසල්වල සංවර්ධනය නතර කරනවාද කියා ගරු මන්ත්‍රීතුමා ඇසුවා. කිසිසේත්ම නැහැ. ඒ සඳහා අපේ අය වැය මඟින් දෙන්න පුළුවන් ඒවා මේ පාර්ලිමේන්තුවේ සාමාන්‍ය සම්ප්‍රදායේදී එලෙසින්ම දෙනවා. ඒ සියල්ලට පිටින් තිබෙන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක කඩිනමින් අලුතින් පාසල් දෙකක් නැත්නම් තුනක් සංවර්ධනය කිරීමයි මෙයින් සිදු වන්නේ.

මේ ව්‍යාපෘතියේ සාර්ථක අසාර්ථකභාවය නිර්ණය කරන්නේ මෙලෙසයි. 2016 වන කොට වෙන්න ඕනෑ මෙයයි. මේ ව්‍යාපෘතිය සාර්ථක නම් සියයට 22.5ක් තිබෙන උසස් පෙළ විද්‍යා ශිෂ්‍ය ප්‍රතිශතය 2016 දී සියයට 45ට වැඩි වෙන්න ඕනෑ. ඊට පස්සේ සියයට 25.8ට තිබෙන උසස් පෙළ වාණිජ ශිෂ්‍ය ප්‍රතිශතය සියයට 30ට යන්න ඕනෑ. සියයට 53ට තිබෙන කලා අංශයේ ශිෂ්‍ය ප්‍රතිශතය සියයට 25ට එන්න ඕනෑ.

ඊ ළඟට එක් 1AB පාසලක්වත් නැතිව තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ලැබෙන 1AB පාසල් සංඛ්‍යාව 156ට වැඩි වන්න ඕනෑ. 1AB එක පාසලක් විතරක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එය 288ට වැඩි වන්න ඕනෑ. මේ දර්ශකය ඒ ආකාරයට ඉෂ්ට වන්නේ නැත්නම් මේ ව්‍යාපෘතිය සාර්ථක නැහැ. සාර්ථක නැති වුණත් මම තමුන්නාන්සේලාට කියනවා මෙතේ හංගන්න කිසි දෙයක් නැහැ කියලා. මේ රටේ දරුවන්ට දේශපාලන පක්ෂයක්, පාට්යක් නැහැ. මේ අපේ රට; අපේ රටේ අනාගතය. අපි සියලු දෙනා එකතු වෙලා දේශපාලන පක්ෂ පාට භේදයෙන් තොරව ඔබතුමන්ලාගේ අදහසුත් සැලකිල්ලට යොමු කරලා කටයුතු කරමු. මම මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් - අවුරුද්දක් විතර මහන්සි වෙලා තිබෙනවා මේ වැඩ පිළිවෙළ හදන්නට.- උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරනවා. සද්භාවයෙන් අපේ ළමයි; රටේ ළමයි ගොඩ ගැනීම සඳහා අපි සියලු දෙනා එකතු වෙලා මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගනිමු කියලා ප්‍රාර්ථනය කරමින් මගේ වචන කීපය සමාප්ත කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු සඳහා වෙන් කර තිබුණු කාලයෙන් විනාඩි 20ක් ගත වුණා. ඒ නිසා ඒ වෙලාව කොහෙන් හරි අඩු වෙන්නත් ඕනෑ. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්න 14ක් අසා තිබෙනවා. මීට පසුව සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රශ්න එක ප්‍රශ්නයක් වශයෙන් යොමු කළා නම් හොඳයි.

මීළඟට ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා.1.00 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මී ළඟට අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 - මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව සම්මත කිරීම. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 2 - නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම. ගරු අග්‍රාමාත්‍යතුමා.

## මහජන ආරක්ෂක ප්‍රකාශනය
## பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
## PUBLIC SECURITY PROCLAMATION

[අ. භා. 2.22 ]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 මැයි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ IIවන කොටසේ විධිවිධාන 2005 අගෝස්තු මස 13වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරනු ලැබ ඇති ප්‍රකාශනය අනුමත කරන මෙන් යෝජනා කරමි.

ගරු කථානායකතුමනි, 2005 අගෝස්තු මස 13වන දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක වූ හදිසි අවස්ථා තත්ත්වය පිළිබඳ යෝජනාව 2011 මැයි මස 05වන දින මෙම ගරු සභාව රැස් වූ අවස්ථාවේ දී සම්මත කර ගන්නා ලදී.

ගරු කථානායකතුමනි, සෑම මසකම හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාවේ දී අපගේ මාතෘ භූමියේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව වාර්තාවක් අප විසින් ඉදිරිපත් කරනවා. මෙයින් මෙම ගරු සභාවට රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා දීමට මා උත්සාහ කරනවා.

ගරු කථානායකතුමනි, 2600වෙනි ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම සඳහා ශ්‍රී ලංකාවාසී බෞද්ධ ජනතාව පසු ගිය මාසය ගත කරනු ලැබුවා. වෙසක් මාසය පුරාම ලක්වාසී බෞද්ධ මෙන්ම අනෙකුත් ආගමික කොටස් ඉතා සහජීවනයෙන් කටයුතු කරනු ලැබුවා. මෙම මාසය පොසොන් මාසයයි. ශ්‍රී ලංකාවට බෞද්ධාගම රැගෙන මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කරවීමේ වැදගත් අවස්ථාව අප මෙම මාසය තුළදී අනුස්මරණය කරනවා. බෞද්ධාගම ලක්දිවට වැඩම කරවීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සම්පූර්ණයෙන්ම වෙනස් වී අලුත්ම පුනර්ජීවනයක් ලැබුවා.

එසේම එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් අපේ මාතෘ භූමිය නිදහස් කර ගත් ඒ දෙවර්ෂ පූර්ණ සැමරුම් උත්සවයත් යෙදී තිබුණේ මැයි මාසයටයි. එයින් උතුම් වූ වෙසක් සමයෙහි බෞද්ධ ජනතාව තුළ මෙන්ම අනෙකුත් ආගමික කොටස් තුළද රටට සාමය ලැබීමෙන් ඇති වූ සතුට තවදුරටත් වර්ධනය වුණා. ගරු කථානායකතුමනි, මෙම වෙසක් උත්සවයෙන් 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම, ලංකාවේ කිසිම කාලයක ඉතිහාසයේ නොතිබුණු ආකාරයට ශ්‍රී ලංකාව පුරාම ක්‍රියාත්මක වුණු බව අප බොහොම සන්තෝෂයෙන් මතක් කරනවා. ඒ කටයුතු උතුරු නැඟෙනහිර ප්‍රදේශවලත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වුණා. බෞද්ධයන් පමණක් නොවෙයි, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම් භක්තිකයන් පවා හුඟක් අවස්ථාවලදී මේ වැඩ පිළිවෙළට සහයෝගය ලබා දීලා තිබෙනවා. මම සහභාගි වුණු රැස්වීම් විශාල ප්‍රමාණයකදී මම දැක්ක කාරණයක් තමයි, අනික් ආගම් අදහන අය මිල මුදලින් පවා උදවු උපකාර කරලා, දානමානවලින් උදවු උපකාර කරලා ශ්‍රී ලංකාව තුළ මේ උත්සවය සාර්ථක අයුරින් පැවැත්වීමට කටයුතු කළ බව. තිස් අවුරුද්දක් මේ රටේ භයානක විධියට මරණ බයෙන් හිටපු ජනතාවගේ ඒ තත්ත්වය නැති වෙලා, 2600 වැනි සම්බුද්ධත්ව ජයන්ති කාල පරිච්ඡේදය තුළ බුද්ධාගමට අනුව මිනිස් වර්ගයාගේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වය පුරුදු පුහුණු කරන අවස්ථාවක් හැටියට සියලුම ජාතීන්, සියලුම ආගම් එකට එකතු වුණා කියලායි මම කල්පනා කරන්නේ කියන එක විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි ගරු කථානායකතුමනි.

උතුරු හා නැඟෙනහිර ප්‍රදේශ අද ශීඝ්‍ර දියුණුවක් ලබා තිබෙනවා. එයට ඉතා ආසන්නම හා හොඳම උදාහරණයක් තමයි 2011.06.06 වැනි දින අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන්නට යෙදුණු කොකාවිල් බහුකාර්ය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය. මේ සියලු පහසුකම් ජනතාවට ලැබුණේ වසර 35කට ආසන්න කාලයක් අප රට වෙළා ගත් ත්‍රස්තවාදය අවසන් කර රටට සාමය උදා වූ නිසායි. ඒ සඳහා බොහෝ කැපවීම් කළ සියලුම රණ විරුවන්ට අප මේ අවස්ථාවේ නැවතත් ආචාරය පුද කරනවා. පසු ගිය මාසය තුළ දහස් සංඛ්‍යාත ජනතාවක් උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල සංචාරය කර තිබෙනවා. විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ යාපනය අර්ධද්වීපය වාගේම, නාගදීපය වන්දනා කරන්න දිනකට යන බැතිමතුන්ගේ සංඛ්‍යාව ඉතා විශාලයි.

[ගරු දි.මු. ජයරත්න මහතා]

ගරු කථානායකතුමනි, එල්ටීටීඊ සාමාජිකයන් වශයෙන් හඳුනා ගෙන දැනට පුනරුත්ථාපනය කරන ප්‍රධාන පෙළේ ත්‍රස්තවාදී සාමාජිකයන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙන යනවා. පසු ගිය මාසය තුළ පූර්ණ පුනරුත්ථාපන කටයුතුවලින් පසු සමාජගත කිරීමට නියමිත සාමාජික සංඛ්‍යාව 800ක් පමණ වන අතර, මේ සමඟ පුනරුත්ථාපනයෙන් පසු සමාජගත කළ මුළු එල්ටීටීඊ සාමාජිකයන් සංඛ්‍යාව 6,924කි. මීළඟට රජයේ කාර්ය භාරය හා වගකීම වනුයේ, මෙම සමාජගත කළ අය නිසියාකාරව සමාජයට යහපත් පුරවැසියන් ලෙස ජීවත් වීමට අවශ්‍ය පසුබිම සකස් කර දීමයි. මෙහිදී නිරන්තරයෙන් විදේශීය එල්ටීටීඊ ක්‍රියාකරුවන් හා සමහර රාජ්‍ය විරෝධී බලවේග හා සංවිධාන මොවුන් නැවත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා පොළඹවා ගැනීමට උත්සාහ ගනී.

විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර මෙන්ම අප මාතෘ භූමියේ සෑම ප්‍රදේශයකම ත්‍රස්තවාදී සාමාජිකයන් සහ පුපුරණ ද්‍රව්‍ය සෙවීමේ විමර්ශන කටයුතු නොකඩවා ඉදිරියට කර ගෙන යනවා. පුනරුත්ථාපනය වන සාමාජිකයන්ගේ තොරතුරු මත අවි ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සෙවීමේ කටයුතු නොකඩවා සිදු කරනවා. එසේම යුද මානුෂීය මෙහෙයුම්වල අවසන් කාල සීමාවේදී එල්ටීටීඊ සංවිධානය අත හැර දකුණු ප්‍රදේශවලට සංක්‍රමණය වී සිටි ත්‍රස්තවාදී සාමාජිකයන් විශාල පිරිසක් අප අත් අඩංගුවට ගත්තා.

ඔවුන්ගෙන් ලබා ගත් තොරතුරු මත උතුරු නැඟෙනහිර මෙන්ම දකුණු ප්‍රදේශවලත් නොයෙකුත් විනාශකාරී ක්‍රියා සඳහා රැගෙන එන ලද අවි ආයුධ මෙන්ම පුපුරණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අප අත් අඩංගුවට ගැනීමට ක්‍රියා කර තිබෙනවා.

තව දුරටත් මෙම විමර්ශන කටයුතුවලින් ලැබෙන තොරතුරු මත අවි ආයුධ මෙන්ම ප්‍රධාන පෙළේ ත්‍රස්තවාදි සාමාජිකයන් අත් අඩංගුවට ගැනීමට අප ක්‍රියාකරමින් සිටිනවා. එය රටේ ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව වෙනුවෙන් අප විසින් කළ යුතු ජාතික වග කීමක් බවට රජය හඳුනා ගෙන තිබෙනවා. එල්ටීටීඊ සංවිධානය රට තුළ ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් සිදු කළේ ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත එල්ටීටීඊ ජාලය මඟින් ලැබුණු මූල්‍යමය සහ අනෙකුත් පහසුකම් මඟිනි. ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා භූමියෙන් අවසන් වී ඇතත්, ජාත්‍යන්තරව පවතින එම සම්බන්ධතාවන් තව දුරටත් එලෙසම පවතින බව අපට නිරන්තරයෙන් දැන ගැනීමට ලැබෙනවා. රාජ්‍ය නොවන සංවිධානද ඇතුළුව එල්ටීටීඊ හිතවාදී විදේශීය කණ්ඩායම් එම ත්‍රස්තවාදී සංවිධානයට අත් වූ ඉරණම දරා ගැනීමට නොහැකිව එම සංවිධානය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පිඹුරුපත් සකස් කරමින් සිටින බවට තොරතුරු ලැබී තිබෙනවා.

එසේම, පසු ගියදා ශ්‍රී ලංකා යුද හමුදාව මඟින් සංවිධානය කළ, "ත්‍රස්තවාදය පැරදවීමේ ශ්‍රී ලාංකීය අත් දැකීම"මැයෙන් ගලදාරි හෝටලයේදී පැවැති සමුළුව සඳහා ජාත්‍යන්තර වශයෙන් විශාල සහයෝගයක් ලැබීම අප රටට මහත් ගෞරවයක්. එහිදී අප ආරක්ෂක අංශවල ක්‍රියාකාරකම් බොහෝ රටවල ප්‍රශංසාවට ලක් වුණ අතර, ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදි සංවිධානය වූ එල්ටීටීඊය පරාජය කිරීම සම්බන්ධයෙන්ද ඔවුන් දැනුවත් වන ලදී. එම සමුළුව වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරන ලෙසටත්, ඒ සඳහා සහභාගි වූ ජාත්‍යන්තර නියෝජිතයින් ඉල්ලීම් කරනු ලැබීමෙන් එහි සාර්ථකභාවය අපට තව දුරටත් දැක ගැනීමට ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මම දවස් පහක් චීනයේ පැවැති නොයෙක් විධියේ රැස්වීම්වලට සහභාගි වුණා. ඒ රැස්වීම්වලට සහභාගි වූ අවස්ථාවල මම දැක්කා චීන නායකයන් ශ්‍රී ලංකාව පිළිබඳව විශාල ආදරයකින් ක්‍රියා කරන බව. ගරු කථානායකතුමනි, මම බොහොම සන්තෝෂ වුණා. ඒ වාගේම අපි කථා කරන අවස්ථාවලදී, "අතිගරු ජනාධිපතිතුමා යුද්ධය අවසන් කළා, දැන් මේ රට දියුණු කරන්න ක්‍රියා කරනවා" කියන කොට ඒ ගොල්ලෝ බොහොම සන්තෝෂයෙන් කියනවා, "We know him. President Mahinda Rajapaksa is a person who is very much close to his country and his people. We believe him; we are helping him; we like him." මෙන්න මේ වාගේ වචන ප්‍රකාශ කළා. එහෙම වචන ප්‍රකාශ කරලා ජනාධිපතිතුමාට විශාල ගෞරවයක් දක්වන බව මම කියන්නේ අපේ විපක්ෂයේ ඔබතුමන්ලාටත් එක්කයි. අපේ රටේ නායකයකුට එහෙම ගෞරවයක් දක්වන එක ඔබතුමන්ලාටත් ගෞරවයක්. මම පුදුම වුණා, චීනයේ නායකයෝ ඒ විධියට ප්‍රකාශ කරන එක ගැන. මම ප්‍රකාශ කළා, "ලංකාවට මේ, මේ විධියට ආධාර කරලා තිබෙනවා, අපි ඒ අනුව දියුණු කරලා තිබෙනවා" කියලා. අපි තවත් ඉදිරියටත් ශ්‍රී ලංකාව දියුණු තත්ත්වයට ගෙනෙන තුරුම ඒ සහයෝගය, ආධාරය ලබා දෙනවා කියලා ඔවුන් ප්‍රකාශ කළා. මේක මම කිව්වේ, අපේ ජනාධිපතිතුමාත් ඒ වාගේම පොදු ජනතාවත් කෙරෙහි චීනයේ ලොකු ගෞරවයක් තිබෙන බව පෙන්වීමටයි. මම ඒක බොහොම සන්තෝෂයෙන් තමුන්නාන්සේලාට ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවාසී සාමය අගය කරන සියලු ජනතාව වෙනුවෙන් නීතිය හා සාමය, මහජන ආරක්ෂාව පවත්වාගෙන යෑම සඳහාත්, රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම සඳහාත් තව දුරටත් එක් මසක කාල පරිච්ඡේදයක් සඳහා දිවයින පුරා හදිසි තත්ත්වයක් නොකඩවා පවත්වාගෙන යෑමට මෙම ගරු සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙනු ඇතැයි මම අපේක්ෂා කරමි. තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හදිසි නීතියක් අවශ්‍යද? හදිසි නීතියක අවශ්‍යතාවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and MR.* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Joseph Michael Perera, you can continue.

[අ. භා. 2.32 ]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අගමැතිතුමා හදිසි නීතිය ගැන මොනවාද කථා කරන්නේ කියන එකත්, හදිසි නීතිය මේ විධියට පනවන්න රජය තීරණය කළේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන් එතුමා කියන්නේ මොනවාද කියන එකත් අහලා ලියා ගන්න පෑනත් අතට අර ගෙනයි මා හිටියේ. නමුත් ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ කිව්වේ විනයට ගිය ගමනෙහි විස්තරය විතරයි. අනෙක් කාරණය විධියට කිව්වේ මේ කවුරුත් දන්නා බුද්ධ ජයන්තිය ගැනයි. ඒක කවුරුත් දන්නා දෙයක් නේ. වෙනත් දෙයක් කිව්වේ නැහැ විශේෂයෙන්. ගරු අගමැතිතුමනි, හදිසි නීතිය පනවන්නේ ඇයි කියන එකට හේතුව මොකක්ද කියලා මොනම විධියකටවත් තමුන්නාන්සේ කිව්වේ නැහැ. මට පෙනෙන විධියට නම් ඇත්ත කාරණාව මෙයයි. ගරු ජී.එල්. පීරිස් විදේශ කටයුතු ඇමතිතුමා ගිහිල්ලා ඉන්දියාවේ කරපු සාකච්ඡාවේදී ඒ ගොල්ලන්ගේ ඉල්ලීමක් තිබුණා හදිසි නීතිය ඉවත් කරන්න කියලා. ඒකට ප්‍රතිචාර වශයෙන් ගියා- [බාධා කිරීමක්] මේකේ නැහැ එහෙම දාලා. ජී.එල්. පීරිස් ඇමතිතුමනි, තමුන්නාන්සේගේ අර joint statement එකේ එහෙම නැහැ. නමුත් ප්‍රචාරය ගියා හදිසි නීතිය නැවත වරක් ගෙනෙන්නේ නැහැ කියලා. ඒක රජයත් ප්‍රකාශ කළා. විවිධ ඇමතිවරු ප්‍රකාශ කළා. අද ඒක සිද්ධ වෙලා නැහැ. ඒක නිසා තමුන්නාන්සේ-

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
රජය ප්‍රකාශ කරලා නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙම තමයි ඉතින්. අගමැතිතුමායි, ඇමතිවරුයි එක එක දේවල් එක එක වෙලාවට කියනවා. නමුත්, මා මේ කිව්වේ අප අහපු දේ, අප දැකපු දේ. ඇයි තමුන්නාන්සේලා හදිසි නීතිය පනවන්නේ, ඒ මහජනතාවගේ ආරක්ෂාවටද, නැත්නම් රජයේ විවිධ හමුදාවල ආරක්ෂාවටද කියන එක මේ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේදී පැහැදිලි කර දීම අපේ වග කීමක් හැටියට මම සලකනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා කරන ප්‍රකාශ ගැන ජාත්‍යන්තර වශයෙනුත්, මේ රටේ ජනතාව අතර ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ලොකු සැකයකුත් තිබෙනවා. අප මේක ගරු අගමැතිතුමාට කියන්න ඕනෑ. හදිසි නීතිය ක්‍රමක්‍රමයෙන් ඉවත් කරනවාය කියලා විදේශ ඇමතිතුමා ඉන්දියාවට ගිහිල්ලා එකඟතාවකට ඇවිල්ලා මේ රටේ යම් යම් ප්‍රකාශ කරද්දී, මේ රටේ සියලුම ජනතාව එක රටක නිදහස් වැසියන් හැටියට ජීවත් විය යුතුය කියන මතය ජනාධිපතිතුමා දරන කොට එතුමාගේ රජයේ කොටස් කීපයක වෙනම පාලන තිබෙන බව අපට පෙනෙනවා. විශ්‍රාම වැටුප් පිළිබඳ වැඩ පිළිවෙළට සහයෝගය දෙන්න කොළඹ වෘත්තීය සමිතිවලින් සංවිධානය වුණු තවත් හමුදාවක් -පොලු හමුදාවක්- තිබුණාය කියලා ඊයේ පෙරේදා අපි දැක්කා.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
කොලු හමුදාවක්?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොලු හමුදාවක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කොලු?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොලු. තමුන්නාන්සේලා ඉස්සර ගැහුවේ ඒවා පාවිච්චි කරලා නේ. අර යූඑන්පී කාලයේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කොලු.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කොලු නොවෙයි පොලු. මම දන්නවා අප පොලු කියද්දී විමල් වීරවංශ ඇමතිතුමාට මතක් වෙන්නේ කොලු කියන එක බව. මා දන්නේ නැහැ ඒ ඇයි කියලා.

ඒ සිද්ධිය පිළිබඳව මම ගරු අගමැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ මෙහේ නොහිටියත්, එහේ හිටියත් මේ පිළිබඳව රූපවාහිනියේ දකින්න ඇති. අඩු තරමින් ගිය නිලධාරින්වත් කිව්වා නම් internet එක හරහා හෝ දකිනවා. මම මේ කියන්නේ පත්තරයෙන්. මේ පත්තරයේ බොහොම පැහැදිලිව ප්‍රසිද්ධියේ දාලා තිබෙනවා පොලු හමුදාව කියලා. කොළඹ -ප්‍රධාන නගරයේ- පොලු හමුදාවක්.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට තිබෙන්නේ තුවක්කු හමුදාවක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ වෙලාව.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මා හිතන්නේ මේ විපක්ෂයේ සහ අනෙක් දේශපාලන පක්ෂවල වෙන්න ඇති පොලු හමුදාවක් කියන එකක් තිබෙන්නේ. මා කල්පනා කරන්නේ ඒකයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු අගමැතිතුමනි, මේ විධියට විහිළුකාරයකු වෙන්න එපා කියන එක විතරක් මම තමුන්නාන්සේට කියනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මොකක්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
විහිළුකාරයකු වෙන්න එපා කියන එක.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
නැහැ, නැහැ. තමුන්නාන්සේ විහිළුකාරයකු කියලායි මම කියන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි, ඉන්න කෝ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තමුන්නාන්සේ විහිළුකාරයකු නොවෙයි නම් පොලු හමුදාවක් ලංකාවේ තිබෙනවාය කියලා කියන්න තමුන්නාන්සේට පුළුවන්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ බලන්න පත්තරය.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔය පත්තරවල තිබෙන ඒවා ඔක්කෝම-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පත්තරයේ ගියා, TV එකේ ගියා. [බාධා කිරීම්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තමුන්නාන්සේලා මට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවාය කියලත්- [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් කථා කරනකොට බාධා කරද්දී - [බාධා කිරීමක්] - කරුණාකර ඔබතුමාගේ අවධානය යොමු කර, විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී බාධා කරන අගමැතිතුමාව වාඩි කරවන්න. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කියන දෙයට අපි ඇහුම්කන් දුන්නා නේ, අගමැතිතුමනි. තමුන්නාන්සේ කියන දෙයට අපි ඇහුම්කන් දුන්නා. තමුන්නාන්සේ බුද්ධ ජයන්තිය කරපු හැටි, චීනයට ගිය හැටි, ඉංග්‍රීසියෙන් කථා කරපු හැටි, ඒ ඔක්කොම අපි අහ ගෙන සිටියා. දැන් අපි කථා කරනකොට කරුණාකරලා තමුන්නාන්සේ අගමැතිවරයා හැටියට, මේ පාර්ලිමේන්තුවේ නායකයා විධියට එයට ඇහුම්කන් දෙන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේ ගරු සභාවේ වැරැදි ප්‍රකාශ කරනකොට - [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු අගමැතිවරයෙක් හැසිරෙන්නේ මේ විධියට නම් අපි ඒ ගැන ඉතාම කනගාටු වනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය මේ පිළිබඳව යොමු කරන්න.

මා විශේෂයෙන් අහන්න කැමැතියි, එතුමා කියන විධියට මේ පොලු හමුදාව වෙනත් පක්ෂවල නම්; විරුද්ධ පක්ෂයේ නම්, පොලීසිය මොකක්ද කළේ කියා. පොලීසිය මොකටද බලා ගෙන සිටියේ? මේක මේ රටේ මහජනතාව විතරක් නොවෙයි, ජාත්‍යන්තර මාධ්‍ය හරහාත් විකාශය වුණා. මොකක්ද පොලීසිය කළේ? පොලීසිය කිව්වේ මොකක්ද? මා තමුන්නාන්සේගෙන් අහන්නේ- [බාධා කිරීමක්] මෙතුමාගෙන් මට අහන්න වුවමනා නැහැ. අගමැතිතුමනි, කරුණාකරලා තමුන්නාන්සේ "අගමැති" කියන තනතුරේ ගරුත්වය ආරක්ෂා කර ගෙන වාඩි වන්න. [බාධා කිරීමක්] කරුණාකර වාඩි වන්න. මොකක්ද මේ විහිළුව? මේ විහිළුව මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කථා කළා. තමුන්නාන්සේට යුතුකමක් තිබෙනවා, මූලාසනයේ ඉඳ ගෙන මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු හසුරුවන්න. [බාධා කිරීමක්] මම පෙන්නුවේ මේ "ෆොටෝ" එක. එතුමා කියනවා, මේක විරුද්ධ පක්ෂයේ අයයි කළේ කියලා. මම තමුන්නාන්සේගෙන් අහනවා, එහෙනම් ඇයි, පොලීසිය බලා ගෙන සිටියේ කියලා. මේ රටේ පොලීසියක් නැද්ද? එහෙනම් අපට පැහැදිලි කර ගන්නට දෙයක් තිබෙනවා. මේ රටේ පොලීසියක් නැද්ද?

ඒ එක කාරණයක්. ඒ විතරක් නොවෙයි. තව කරුණු කිහිපයක් තිබෙනවා. තවත් කතන්දරයක් තිබෙනවා. තමුන්නාන්සේත් දන්නවා ඇති, මේ ළඟදී ඇමතිවරුන් දෙදෙනෙක් අතර සට්ටනයක් වෙලා තිබෙනවා. ඒ, කැලණිය පැත්තේ. එක ඇමතිවරයෙක් ඒ ප්‍රදේශයේ රජ්ජුරුවෝ හැටියට නීති ක්‍රියාත්මක කරනවා. එතුමාට ඕනෑ නීති තමයි එහි ක්‍රියාත්මක වන්නේ. ඊට පසුව අර මාළු කඩේ දැම්මාම, මාළු කඩෙන් කප්පම් ගන්න කථාවක් කිව්වා. තවත් නීතියක් එතැන ක්‍රියාත්මක කරනවා. එතුමා තමයි එතැන රජ්ජුරුවෝ. මෙන්න මෙහෙම තමයි මේ රටේ ක්‍රියාත්මක කරන නීතිවල හැටි කියලා අපි තමුන්නාන්සේට ප්‍රකාශ කරනවා. එහෙම නම් මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන්නේ මේ රටේ ජනතාවගේ ආරක්ෂාවටද, එහෙම නැත්නම් රජයේ ආරක්ෂාවටද? අපිටත් දැන් ආරක්ෂාවක් අවශ්‍යයි. මේ රටේ සාමාන්‍ය ජනතාවට ආරක්ෂාවක් අවශ්‍යයි.

පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප පිළිබඳව මම ඊයේ කරුණු කීපයක් කිව්වා. සම්පූර්ණයෙන් වැරැදි මතයක් තිබෙනවා, අපි එයට විරුද්ධ වුණාය කියලා. අපි විශ්‍රාම වැටුපට විරුද්ධ වුණේ නැහැ කියලා මේ පාර්ලිමේන්තුවේ දී මමත්, අපේ නායකතුමා "දෙරණ" රූපවාහිනී නාලිකාවේ අංශක තුන්සිය හැට වැඩ සටහනේ දී ගාමිණී ලොකුගේ ඇමතිතුමා එක්ක කරපු සාකච්ඡාවේ දීත් පැහැදිලිව කිව්වා. නමුත් අද මේ ඉදිරිපත් කරන්නට යන විශ්‍රාම වැටුප් සම්බන්ධ පනත් කෙටුම්පතට අපි විරුද්ධයි කියලා අපි හේතු කිව්වා. අන්තිමේ දී මොකද වුණේ? මේ විශ්‍රාම වැටුප පිළිබඳව කථා කර ගෙන යනකොට එකක් රජය පිළිගත්තා. නිදහස් වෙළෙඳ කලාපයට මේක බලපාන්නේ නැහැ කියලා. දෙ වන එක, තමුන්නාන්සේ දන්නවා, විශ්‍රාම වැටුපක් හිමි තැනැත්තෙකුට මැරෙනකන්ම ඒ විශ්‍රාම වැටුප ගෙවන බව. තුන්වන එක, පුරුෂයා මැරුණත් ඒ අයගේ භාර්යාවට විශ්‍රාම වැටුප දිගටම ලැබෙන බව. සමුපකාර සේවකයෝ මේකට නැහැ, මේකෙන් ඉවත් කරනවා කියලා කිව්වා. මේ ඔක්කෝම ආණ්ඩුව කිව්වා. ඒවා ඉවත් කළාම මොකක්ද මේ පනතේ ඉතිරි වෙලා තිබෙන්නේ? මේ පනතේ මුකුත් නැහැ. අපි කිව්වේ සාධාරණ හේතු ඇතිවයි. මේ පනතේ කිසිම දෙයක් ඉතිරි වුණේ නැහැ. අපි

වේලාසනම කිව්වා, මේ පනත අකුළා ගන්න කියලා. කරුණාකරලා මේ පනත ගෙනෙන්න ඉඩ තියන්න එපා කියලා. තමුන්නාන්සේලා හිතුවක්කාරකමට මේක දිගටම ඇද ගෙන ගියා, "නැහැ, අපි ගෙනෙනවා. තුනෙන් දෙකක් තිබෙනවා, අපි ගෙනෙනවා" කියලා. [බාධා කිරීමක්] අනේ! කරමු. අලුත් පනතක් ගෙනෙන්න. ඒක මේ රටේ වැඩ කරන ජනතාවට. අමතක කරන්න එපා, මේ සංවිධානය වුණු වෘත්තීය සමිතිවල අයට විතරක් නොවෙයි.

මුළු රටේම ජනතාවට. ඒ කියන්නේ, ගොවීන්ට, ධීවරයන්ට, ස්වයං රැකියා කරන අයට, අර ත්‍රී වීලර් එලවන අයට. ඒ සියලු දෙනාටම බලපාන විධියට මේ පනත ගේන්න. අපි ඒකට සහයෝගය දෙනවා. ඒක "නැහැ"යි කිව්වේ නැහැ. නමුත් ප්‍රශ්නය මේකයි. අපි මේක කිව්වේ අද ඊයේ නොවෙයි. තමුන්නාන්සේලා ගෙනාපු පනතේ තිබුණේ නැහැ, ස්වයං රැකියා ගැන. තමුන්නාන්සේලා ගෙනාපු පනතේ තිබුණේ නැහැ, ධීවරයෝ ගැන. මොකද, ඒවාට වෙනම පනත් තිබුණා. තමුන්නාන්සේලා කියපු පනතේ තිබුණේ නැහැ, ගොවියෝ ගැන. ඒකට වෙනම පනත් තිබුණා. ඒක බොහොම පැහැදිලිව අපි තමුන්නාන්සේට මතක් කරනවා. [බාධා කිරීමක්] මම ඒක තමයි කිව්වේ. ඒ පනත් ඔක්කොම අද ගොවීන්ට තිබෙනවා. නමුත් ගෙවන්න සල්ලි නැහැ. ඔන්න ආපහු සල්ලි දෙනවා. ධීවරයන්ට ගෙවන්න සල්ලි නැහැ. ධීවරයන්ගෙනුත් ආලා රජයෙනුත් ආලා තමයි මේක කළේ. අවසානයේ වුණේ මොකක්ද? ගෙවන්න සල්ලි නැහැ. මේක නතර කරලා, මේවා ඔක්කොම එකට එක්කහු කරලා අලුත් විධියට මේ රටේ ජනතාවට බලපාන විධියට විශ්‍රාම යන වයස වෙනකොට ජීවත් වෙන්න පුළුවන් පනතක් ගේන්න කියලා අපි එදාත් කිව්වා. අපි මේ පාර්ලිමේන්තුවේදීත් කිව්වා. "දෙරණ" රූපවාහිනී නාළිකාවේ අර අංශක 360 වැඩසටහනේදීත් කිව්වා. ඒ හැම එකකදීම නායකතුමාත් කිව්වා, මමත් කිව්වා. ඒක නැහැයි කියන්න කාටවත් බැහැ. නමුත් ඊයේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "එක්සත් ජාතික පක්ෂය මේක කිව්වේ නැහැ"යි කියලා. අපි එදා කිව්වා. තමුන්නාන්සේලා තුට්ටු දෙකකටවත් ඒක ගණන් ගත්තේ නැහැ. මේ වෘත්තීය සමිති මේක දැන ගෙන සිටියා. ඒ ගොල්ලන් කිව්වා, "මේක ගේන්න එපා" කියලා. තමුන්නාන්සේලා තුට්ටු දෙකකටවත් ඒක සැලකුවේ නැහැ. එදා ඒ කීම අහලා මේ පනත අකුළා ගෙන, සියලුම වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරලා දේශපාලන පක්ෂ එක්ක සාකච්ඡා කරලා වෙනත් පනතක් ගේන්න සූදානම් කළා නම් අර අහිංසක තරුණයා අදත් ජීවතුන් අතරය කියන එක තමුන්නාන්සේ මතක තියා ගන්න. හිතුවක්කාරකමට ගිහිල්ලා ජීවිතයක් නැති වුණා. ඒකේ ඵල විපාක වෙන කාටවත් දාන්න එපා. තවමත් ඉන්නවා, අත් කැඩිච්ච අය. තවමත් ඉන්නවා, කකුල් කැඩිච්ච අය. ගර්භිණී මව්වරුන් - බබාලා හම්බ වෙන්න ඉන්න අය- ඉන්නවා. පොලු පහරවල් වැදිලා වාහනයක දා ගෙන යනකොට ඒ වාහනයත් කුඩු කරලා. ඊට පස්සේ වෙනත් වාහනයක දා ගෙන මොහුව ආරෝග්‍යශාලාවට ගෙනිහින් තිබෙනවා. වෙඩි වැදිච්ච අය තව ඉන්නවා. මේ සිද්ධි සියල්ලම ඇති වුණේ තමුන්නාන්සේලාගේ හිතුවක්කාර වැඩ පිළිවෙළ නිසයි. ඒක තමයි මම කිව්වේ, "මේ හදිසි නීතිය ගේන්න එපා මේක නතර කරන්න"ය කියලා. මම ස්තුතිවන්ත වෙනවා, ජී.එල්. පීරිස් ඇමතිතුමාට. එතුමා කියනවා, අදියරෙන් අදියර මේක නතර කරන්න අපි එකඟ වුණා කියලා. ඇත්තක් කිව්වා. කා එක්කද එකඟ වුණේ? අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා කා එක්කද එකඟ වුණේ, අදියරෙන් අදියර නතර කරන්න? එක පාරට නතර කරන්නේ නැතිව අදියරෙන් අදියර නතර කරන්න කා එක්කද එකඟ වුණේ? ඉන්දියාව එක්ක. ඒක මතක තියා ගන්න.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)

(The Hon. M. Joseph Michael Perera)

මෙතුමා නේ දැන් කිව්වේ. [බාධා කිරීමක්] මෙතුමා නේ කිව්වේ, මම යැ. විමල් වීරවංශ ඇමතිතුමා ඔයිට ඉස්සෙල්ලාත් කියලා තිබුණා, "ජී.එල්. පීරිස් ඇමතිතුමාට විරුද්ධව විශ්වාශ භංග යෝජනාවක් ගේන්න ඕනෑ"ය කියලා. ඒක හරි. දැනුත් කියනවා. "ජී.එල්. පීරිස් ඇමතිතුමාට විරුද්ධව විශ්වාශ භංග යෝජනාවක් ගේන්න ඕනෑ"ය කියනවා. ඒක තමුන්නාන්සේ දැනුත් කියනවා. එතුමා දැන් කියපු දේ. මම ඇහැව්වා, "මේ එකඟතාව ඇති වුණාම හදිසි නීතිය ඉවත් කරන්න එකඟතාවක් ඇති වුණාද?" කියලා. "එකවර නොවෙයි" කිව්වා. "කොටස් වශයෙන්" කිව්වා. ඒක හරි තමුන්නාන්සේ කියන දේ. කොටස් වශයෙන්, ඇයි කොහාටවත් ගිහිල්ලා එකඟ වෙන්නේ? කොයි රටේවත් ගිහිල්ලා කොටස් වශයෙන් හදිසි නීතිය ඉවත් කරන්නය කියලා එකඟ වෙන්නේ ඇයි? මෙතැනදි තමයි අපට ප්‍රශ්නය තියෙන්නේ. තව ගොඩක් කියන්න තියෙනවා. එහෙම කියන්න ගියොත් මට වෙලාව නැහැ. මම මේ කියන්නේ ප්‍රධාන කරුණු කිහිපයක් විතරයි. අද මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ -ඊයේත් මේ ගැන කථා වුණා. මේ වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ- මේ රටේ ජනතාව හඬ නගනකොට, ජීවිත පූජාවෙන් ඒකට ඉදිරිපත් වන බව ගරු විමල් වීරවංශ ඇමතිතුමා දන්නවා. ඒ, ඒ ගොල්ලන්ගේ අයිතිවාසිකම් පිළිබඳව. [බාධා කිරීමක්] ඔව්. කරුණාකර එදා කරපු වැරදි අද කරන්න එපා. ඒකට නොවෙයි, මිනිස්සු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාව පත් කළේ. එදා කරපු වැරදි කරන්න නොවෙයි පත් කළේ. ඒක මතක තියා ගන්න. ඊයේත් ඔය කතන්දරේ ආවා. මම තමුන්නාන්සේට වගකීමෙන් මතක් කරනවා- [බාධා කිරීමක්] ඒ වැරදි කරපු අය නැවතත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම් ඒ අයවත් දැන්මම අයින් කරන්න ඕනෑ. ඒකත් මතක තියා ගන්න. ඊයේ අපි කථා කරනකොට රජය ප්‍රකාශ කිහිපයක් කළා. එකක් තමයි නිදහස් වෙළෙඳ කලාපයේ අය මේ විශ්‍රාම වැටුප් පනතෙන් අයින් කරනවාය කියන එක. ඊ ළඟට කිව්වා, මධ්‍යම කාරක සභාව සම්බන්ධ වෙලා මේ විශ්‍රාම වැටුප් පනත අහෝසි කරන්න තීරණය කළාය කියලා. ඊයේ වාසුදේව නානායක්කාර ඇමතිතුමා මොකක්ද කිව්වේ? [බාධා කිරීමක්] කරුණාකර මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**

(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)

(The Hon. D.M. Jayaratne)

අපි කිව්වේ සංශෝධනය කරලා ඉදිරිපත් කරනවා කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)

(The Hon. M. Joseph Michael Perera)

අන්න වැඩේ. ඔන්න පැන්නා. [බාධා කිරීමක්] සභානායකතුමා මේ පාර්ලිමේන්තුවේදී මොකක්ද කිව්වේ? "අපි ඒක හකුළා ගත්තා, ඒක ඉවත් කරනවා, අලුත් එකක් ගේනවා" කියලායි.

**ගරු දි.මු. ජයරත්න මහතා**

(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)

(The Hon. D.M. Jayaratne)

සංශෝධනය කරනවා-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)

(The Hon. M. Joseph Michael Perera)

සංශෝධනයක් නැහැ. අලුත් එකක් ගෙනෙනවා කියලායි කිව්වේ. සංශෝධනය කරනවා කියලා නොවෙයි, මේක අයින් කර ගත්තා. මේ න්‍යාය පත්‍රයෙනුත් මේක අයින් කරනවා කියලා කිව්වා. මොකක්ද මේ විහිළුව? [බාධා කිරීමක්]ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පාර්ලිමේන්තුවේදී -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ආණ්ඩුව වශයෙන් නොවෙයි, පක්ෂය වශයෙනුයි-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් අපටත් ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, අගමැතිතුමා එකක් කියනවා, වාසුදේව නානායක්කාර ඇමතිතුමා එකක් කියනවා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තවත් එකක් කියනවා. කොහොම වුණත්- [බාධා කිරීමක්] කරුණාකර, පොඩ්ඩක් නිශ්ශබ්දව ඉන්න. දැන් තමුන්නාන්සේගෙනුයි බේරෙන්න බැරි. අර බලන්න, හොඳට අහ ගෙන ඉන්නවා, අනෙක් අය. තමුන්නාන්සේයි දැන් චණ්ඩියා වෙලා තිබෙන්නේ. විනයට ගිහිල්ලා ආවාට පස්සේ මොකක්දෝ ලොකු හයියක් තිබෙනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමා වැරදි මතයක්-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අනේ නැහැ. තමුන්නාන්සේට මම ආදරෙයිනේ. අපි දෙන්නා හොඳ යාළුවෝනේ. එකක්, ඉස්සර වාගේ දැන් තමුන්නාන්සේට කේන්ති එන්නේ නැහැ. නිවා ගන්න බැරි කේන්තියක් එන්නේ නැහැ. එක වෙලාවකට කේන්ති එනවා, ඉක්මනට ඉවර වෙනවා. [බාධා කිරීමක්] නැහැ, ඒක වයසේ- [බාධා කිරීමක්] නැහැ, මට වඩා වයසයි. ඒක නොවෙයි කාරණය. ඉස්සර තිබුණා pressure එකක්. කේන්තිය නවත්වා ගන්න බැහැ. හැබැයි විනයට ගිහිල්ලා ආවාට පස්සේ දැන් බොහොම සාමකාමීව ඉන්නවා. හැබැයි බාධා කිරීම් වැඩියි. කරුණාකර, ඒකත් නතර කර ගත්තොත් මා හිතනවා ඉතාම හොඳ අගමැතිවරයෙක් විධියට පාර්ලිමේන්තු ඉතිහාසයේ තමුන්නාන්සේගේ නමත් ලියැවේවි කියා. [බාධා කිරීමක්] තමුන්නාන්සේනේ කිව්වේ ඕනෑම අසත්‍යයක් කියන්න පුළුවන් කියලා. මම නොවෙයිනේ කිව්වේ. තමුන්නාන්සේ තමයි මේ පාර්ලිමේන්තුවේ කියලා තිබෙන්නේ "ඡන්දයේදී ඕනෑම අසත්‍යයක් කියනවා. එහෙම නැතිව මේවා කරන්න බැහැ" කියලා. මම නොවෙයි එහෙම කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොහොම වුණත් රජය මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා "මේ පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නවා, න්‍යාය පත්‍රයෙනුත් ඉල්ලා අස් කර ගන්නවා" කියලා. අපි ඒක පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කරනවා. නමුත් මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා විශ්‍රාම වැටුප සම්බන්ධව පනත් කෙටුම්පත් කිහිපයක්; සංශෝධන කිහිපයක්. එකක් තිබෙනවා, සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත - දෙවැනි වර කියැවීම කියලා. ඒක අලුත් පනත් කෙටුම්පතක්. ගරු විමල් වීරවංශ ඇමතිතුමනි, මේක ගැන පොඩ්ඩක් අහලා යන්න. තමුන්නාන්සේගේ උදව් ඕනෑ වනවා මේකට. දෙවැනි එක විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත - දෙවැනි වර කියැවීම. ඒක ගැනත් ප්‍රශ්නයක් නැහැ. තුන් වැනි එක, විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත - දෙවැනි වර කියැවීම. ඒකත් එක්ක තිබෙනවා තව එකක්. එනම්, සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනි වර කියැවීම. මෙන්න මේ අස්සේ තමයි තිබෙන්නේ, රක්ෂණ ක්‍රමයක් හෝ විශ්‍රාම වැටුපක් හදන්න මේ අර්ථසාධක අරමුදල පාවිච්චි කරලා. මේ සංශෝධනය මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හදිසි නීතියේ-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ දන්නේත් නැහැ හදිසි වෙන්නේ ඇයි කියලා. [බාධා කිරීමක්] එහෙම නම් ගරු විමල් වීරවංශ ඇමතිතුමනි, මේක ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න. සේවක විශ්‍රාම වැටුප හදන්න ඒක ප්‍රයෝජනයට ගන්නේ සේවක අර්ථසාධක අරමුදල සංශෝධනය කරලායි. ඒක බොහොම පැහැදිලිව මේකේ ඇතුළත් වෙලා තිබෙනවා කියා මා ඊයෙත් කිව්වා. ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ, මේ හැංගිලා තිබෙන කථාන්දර මොනවාද කියලා. මේකේ හැංගිලා තිබෙන කථාන්දර රාශියක් තිබෙනවා. මා මේ කිව්වේ ඉතා වැදගත් කාරණයක්. මොකද, ආණ්ඩුව පැත්තෙන් මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් විශ්‍රාම වැටුප පෞද්ගලික අංශයේ අයට මේ විධියට ගෙනෙනවාට විරුද්ධත්වය ප්‍රකාශ කරලා, මේක ගැන සාකච්ඡා කරලා කරන්න කියලා තිබෙනවා. ආණ්ඩු පක්ෂය ඇතුළේ මේකට සාකච්ඡාවක් තිබුණා. ඒක ගණන් ගත්තේ නැහැ. මා කම්කරු ඇමතිතුමාටවත්, තමුන්නාන්සේටවත්, මේ ඉන්න ඇමතිවරුන්ටවත් දොස් කියනවා නොවෙයි. ඒක මේ පාර්ලිමේන්තුවෙන් පිට ඉන්න කෙනකුගේ උවමනාවට ගෙනාපු පනත් කෙටුම්පතක්. වෙන එකක් නොවෙයි. [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවෙන් පිට ඉන්න.

**ගරු විමල් වීරවංශ මහතා)**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කවුද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අනේ මම කියන්නේ නැහැ. තමුන්නාන්සේ දන්නවානේ. ඇයි තමුන්නාන්සේ එළියේදී මා එක්ක කිව්වේ. [බාධා කිරීමක්] එළියේදී කිව්වේ කවුද කියලා. [බාධා කිරීමක්] ඔහු තමයි මේකේ සාකච්ඡාවට- [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කිව්වේ නම කියන්න කියලායි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ එළියේදී කියාපු එකක් වුණත් එහෙම කියන එක හොඳ නැහැනේ. කිව්වාය කියන එක කියන්නම්. එච්චරයි. අපි නැවත වරක් තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි, මේ හදිසි නීතිය පාවිච්චි කිරීම නිසා මේ රටේ ඇතිවෙලා තිබෙන කරුණු කිහිපයක් විතරයි තමුන්නාන්සේලාගේ අවධානයට යොමු කළේ කියන කාරණය.

ඒ වාගේම ඊයේ මෙම ගරු සභාවේදී පැහැදිලිවම ප්‍රකාශ කළා සටනක් වෙද්දී තමයි මේ වෙඩි තැබීම සිද්ධ වුණේ කියලා.

මට මතකයි, තමුන්නාන්සේ මාධ්‍යයට ඇවිල්ලා කිව්වා, කවුද මේ වෙඩි තැබීම කළේ, කවුරු කළත් කමක් නැහැ, ඉහළ ඉඳලා පහළට විනයානුකූලව කටයුතු කරන්න ඕනෑ කියලා. ඒ වෙලාවේ

අපි ස්තුතිවන්ත වුණා, කෙළින් කථා කරන කෙනෙක් කැබිනට් මණ්ඩලයේ ඉන්නවා කියලා. පළමුවැනි විරෝධතාව ආපු වෙලාවේ 40,000ක් විතර එළියට බැස්සා. කිසිම කරදරයක් වුණේ නැහැ. මුකුත් ප්‍රශ්නයක් වුණේ නැහැ. මේ ප්‍රශ්නය ඇති වෙන්න හේතු හැටියට තමුන්නාන්සේලා කාරණා කිව්වා. මම ඒක පැත්තකින් තියන්නම්. ඒ කාරණා නිසා පොලීසියට ගල් ගැහුවා, ඒ නිසා මේ ප්‍රශ්නය ඇති වුණා, වෙඩි තැබීම සිද්ධ වුණා කියලා තමුන්නාන්සේලා කිව්වා. CID එකෙන් දීපු වාර්තාව දැන් තමුන්නාන්සේලා අතේ ඇති. මොකද අපිත් ගියා, ජනාධිපතිතුමාත් ගියා, අනෙක් ඇමතිවරුත් ගියා. ගිහිල්ලා කථා කරලා බැලුවාම මොකක්ද ඇත්ත කතන්දරය? මෙතැන වෙඩි තැබීම් එකක් නොවෙයි, වෙඩි තැබීම් කීපයක් තිබෙනවා. එක්කෙනෙක් විතරයි මරණයට පත් වුණේ. මේ වෙඩි තැබීම් සිද්ධ වෙලා තිබෙන්නේ කර්මාන්තශාලා ඇතුළේ. වෙන කොහේවත් නොවෙයි. ඒ අය කට උත්තර දීලා තිබෙනවා. මේ එළියේ සටනක් කරද්දී නොවෙයි, ගල් ගහද්දී නොවෙයි, කර්මාන්තශාලා ඇතුළට ගිහිල්ලායි මේ වෙඩි තැබීම සිද්ධ කරලා තිබෙන්නේ, කාන්තාවන්ට පහර දීලා තිබෙන්නේ, අත පය කඩලා තිබෙන්නේ. ඒ සිදුවීම් සියල්ලම වෙලා තිබෙන්නේ කර්මාන්තශාලා ඇතුළේ. මෙන්න මේක තමයි අති භයානක තත්ත්වය. ඒ නිසා තමයි අද පොලීසිවලට ඔක්කොම බනින්නේ; දැන් අර CID කටඋත්තර අනුව සමහර පොලීසිවල අය මාරු කරලා, රිමාන්ඩ් කරලා ඒ කටයුතු කරලා තිබෙන්නේ.

මෙතැනදී මම කියන්නේ මේකයි. මේ හදිසි නීතිය තුළ ඉඳගෙන අද තමුන්නාන්සේලා මේ විධියට හැසිරෙනවා. තමුන්නාන්සේලාට තුනෙන් දෙකක් නොවෙයි ඊටත් වඩා බලය තිබෙනවා. මුළු පාර්ලිමේන්තුවේම බලය තිබෙන්න පුළුවන්. ඒ මුළු පාර්ලිමේන්තුවේම බලයට වඩා මහ ජන බලයක් එළියේ තිබෙනවා කියන එක අපි අවබෝධ කර ගන්න ඕනෑ. මේක හැම ආණ්ඩුවකටම ආදර්ශයක්. හැම ආණ්ඩුවක්ම කල්පනා කළා මේ විධියට පාර්ලිමේන්තුවේ බලය තිබෙන වෙලාවේ-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have only two more minutes.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
සාමාන්‍ය නීතියයි ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේක විමල් වීරවංශ ඇමතිතුමාත් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩිවලින් මහ ජන මතය මනින්න එපා කියලා එතුමා කිව්වා. මම අද ඒකම කියනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ තිබෙන ඔළු ගෙඩිවල බලයෙන් මහ ජන මතය මනින්න එපා. ඒක මතක තියා ගන්න. [බාධා කිරීම්] අර ඇවිල්ලා ඉන්නේ යාළුවා. මම කිව්වේ, එතුමාව මට අමතක වුණා. හොඳ වෙලාවට ආවේ. තමුන්නාන්සේ ඔය කොහේද ඉන්නේ? මෙහේ නේ ඉන්න ඕනෑ. එතුමා කියනවා ගාල්ලට එන්න එපා කියලා. පොලීසියට කියනවා අයින් වෙලා ඉන්න කියලා. ඒ තවත් රාජ්‍යයක්. එහෙනම් මේ ජනාධිපතිතුමා කියන නිදහස් නීතිය කොහේද තිබෙන්නේ? එක මන්ත්‍රීවරයෙක් ගාල්ලේ.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඔබතුමා ගාල්ලට එන්න කෝ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තව මන්ත්‍රීවරයෙක් කොළඹ. තව මන්ත්‍රීවරයෙක් කැලණියේ. පොලිස් බලය පැත්තකින් තියලා. මේක නේද කටුනායකදීත් සිද්ධ වුණේ? මේක ගැන අපට කල්පනා කරන්න තිබෙනවා. මේ හදිසි නීතිය ඕනෑ කරන්නේ ඇයි කියලා අගමැතිතුමා අද කිව්වේ නැහැ. ඉන්දියාවට ඇහෙන හින්දාද? අපි මේ හදිසි නීතිය ගේන්නේ මේ මේ කාරණා නිසා කියලා කිව්වේ නැහැ. කේපීව අද ජාත්‍යන්තර පොලීසියෙන් ඉල්ලනවාද? අපට කියන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Joseph Michael Perera, please wind up your speech now.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලා ආරක්ෂා කර ගෙන ඉන්න කේපීව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කේ.පී. සිල්වාද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කුමරන් පද්මනාදන්. ප්‍රධාන ත්‍රස්තවාදියා. තමුන්නාන්සේලා ආරක්ෂා කරන, තමුන්නාන්සේලා පෝෂණය කරන ඒ ත්‍රස්තවාදියාව අද ජාත්‍යන්තර පොලීසියට ඉල්ලා තිබෙනවාද? එහෙනම් මෙච්චර කල් මේ හදිසි නීතිය යටතේ තමුන්නාන්සේලා කුමරන් පද්මනාදන් කියන මේ ත්‍රස්තවාදියා මේ රටේ නීතියට යටත් නොකර කවලා පොවලා තියා ගත්තේ මොන නීතියක් යටතේද කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මරන්නද කියන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කුමරන් පද්මනාදන් තවම ඉන්නවා. ඔහු ඉන්නේ කොයි නීතියක් යටතේද? ජාත්‍යන්තර වශයෙන් ඉල්ලන කෙනෙක් අද තමුන්නාන්සේලා තියා ගෙන ඉන්නවා. මේ රටේ ත්‍රස්තවාදය නැති කරපු මනුස්සයා, ඒකට නායකත්වය දුන්නු මනුස්සයා සරත් ෆොන්සේකා තමුන්නාන්සේලා අද වැලිකඩ බන්ධනාගාරයේ ජම්පරයක් අන්දවලා රඳවා තිබෙන්නේ ඇයි? මේකද තමුන්නාන්සේලාගේ සාධාරණත්වය? මේකද ප්‍රජාතන්ත්‍රවාදය? මේකද ජාතික හැඟීම? මේකද ආදරේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Joseph Michael Perera, please wind up your speech now.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

I can get one more minute from my Party. මේකද තමුන්නාන්සේලා කියන්නේ? සරත් ෆොන්සේකා එතැන. එතුමා කරපු වරද මොකක්ද? අතන කේපී. ජාත්‍යන්තරව ඉල්ලන මිනිහෙක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරක්ෂා කරනවා. තමුන්නාන්සේලා ඒ ගැන කියන්නේ මොකක්ද? ඒ ගැන තමුන්නාන්සේලා කථා කරන්නේ නැහැ. අපට කියන්න බොහෝ දේවල් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මට order එකක් දෙන නිසාත්, අපේ වෙලාවේත් විනාඩි 20ක් අඩු නිසාත් මා මෙතැනින් එහාට දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ.

අගමැතිතුමනි, මා කනගාටුවෙන් කියනවා, මේ හදිසි නීතිය ගෙනෙන්න රජයට වුවමනා කරන්නේ ඇයි කියලා තමුන්නාන්සේ අද කිසිම විධියකින් කිව්වේ නැහැයි කියලා. ඒකට අවශ්‍යතාවක් තිබෙනවාය කියන එක තමුන්නාන්සේ කිව්වේ නැහැ. එම නිසා අපි කියනවා, තමුන්නාන්සේලා දැන් හෝ මේ හදිසි නීතිය ඉවත් කරන්න කියලා. හදිසි නීතිය ඉවත් කරලා මේ රටට නිදහස ලබා දෙන්න කියා ඉල්ලමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[අ. භා. 2.58]

**ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

Mr. Deputy Chairman of Committees, I am happy to follow the Hon. Joseph Michael Perera and I would like to make use of this opportunity to inform the House of several aspects of the foreign policy of the Government, which are of particular importance to our country at this time.

During the last month, some of the central initiatives of the Government have been in the field of international relations. We have invested considerable time and effort in bringing to the notice of the world the action taken and the results achieved with regard to a wide range of matters including the resettlement of internally displaced persons, the reintegration into society of ex-combatants, the progress in respect of de-mining, the shrinking of the area covered by high security zones, the handling of issues relating to land and the recruitment of large numbers of Tamil-speaking police officers in the Northern Province. Particular emphasis was placed on the work of the Lessons Learnt and Reconciliation Commission and the implementing arm appointed by the Government, the Inter-Agency Advisory Committee.

I am happy to inform the House that the extensive discussions we have engaged in, make abundantly clear the widespread understanding of and support for, the position of Sri Lanka. The principal basis of this is the belief that Sri Lanka has achieved a daunting task against overwhelming odds, in defeating terrorism; that the country requires from the international community not judgmental postures, imposition of impediments and resort to threats, but goodwill and empathy and, above all, time and space to carry forward the delicate task of reconciliation on which it has embarked; that solutions have to be evolved in keeping with the cultural traditions and value systems specific to each country situation; and that those who cast the first stone must stand prepared to be judged by the standards which they purport to prescribe for the rest of humanity. These, Sir, are the common elements we encountered in a variety of discussions over the last few weeks.

During the State Visit of His Excellency President Mahinda Rajapaksa to Bangladesh, I had the advantage of detailed discussions on the current Sri Lankan situation with Dr. Dipu Moni, the Foreign Minister of Bangladesh. Shortly thereafter, I undertook an official visit to the Sultanate of Oman, where I was received by the Head of Government of Oman and the Foreign Minister of that country. A very clear view on the part of the Government of Oman in respect of Sri Lankan issues emerged from these discussions. It may be noted that Oman is one of the six countries comprising the Gulf Cooperation Council, the other five countries being Saudi Arabia, Kuwait, Qatar, Bahrain and the United Arab Emirates.

In India, I had discussions with His Excellency Dr. Manmohan Singh, Prime Minister of India, Shri Pranab Mukherjee, Finance Minister, Shri S.M. Krishna, Minister of External Affairs, Shri Shiv Shankar Menon, National Security Adviser and Srimathi Nirupama Rao, Foreign Secretary. The result of these discussions with the highest tier of the political leadership and the apex of the bureaucracy of India is crystal clear. I assure the House in categorical terms that there exists an immense fund of goodwill for Sri Lanka in India. The leaders of India were emphatic in their assertion that in their eyes, India's relationship with Sri Lanka has a unique quality which they are firmly resolved to protect and develop.

Sir, in the conduct of foreign relations, it is not always prudent to react to strident rhetoric, at times based on incomplete information and even erroneous assumptions. The priority objective is, and must be, the accomplishment of concrete outcomes in furtherance of the greater good of our country. For our part, our attitude to the relationship between Sri Lanka and India is one of openness and candour and we will continue to work closely with the Government of India on all issues encompassed by our bilateral relationship.

It must be remembered that a crucial aspect of the opportunity which presents itself to Sri Lanka after the eradication of terrorism, is the robust impetus to the development of our economy, with particular reference to tourism, direct and portfolio investment and expansion of volumes of international trade. These dimensions of the current challenge formed an integral part of the engagement in India, where issues relating to livelihoods,

housing, highways and railroad systems, revival of the economy with special importance attached to support for agricultural activity, and resuscitation of the electoral process appropriately received sharp emphasis.

Indeed, Sir, these dimensions occupied pride of place in the fruitful consultations which took place with the Government of Singapore soon after the conclusion of my official visit to New Delhi. It was quite apparent from my discussions with Mr. Tharman Shanmugaratnam, Deputy Prime Minister and Minister of Finance of Singapore, and Mr. Lim Hng Kiang, Minister of Trade and Industry of Singapore, that there is explicit recognition of the synergies which characterize the relationship in the new environment, pervaded by peace and stability in Sri Lanka. We covered substantial ground in respect of identification of areas suitable for collaboration, especially in the services sector. I found the Singaporean side strongly receptive to investment and trade opportunities now available in profusion in Sri Lanka.

Lively interest in unfolding events in our country was demonstrated by the extent of audience participation, and the sustained discussion which followed the lecture I delivered on “The Current Situation in Sri Lanka and the Way Forward” at the Institute of South Asian Studies of the National University of Singapore. The depth of this interest was reflected in the wide exposure which my views, expressed on this occasion and in a separate interview, received in "The Straits Times". Scholars from all over the region, gathered at the International Centre for Terrorism Research at the S. Rajaratnam School of International Studies, Nanyang Technological University of Singapore, had many insightful observations to offer in their discussions with me.

Sir, the outcome of my visit to the People’s Republic of China was uniformly encouraging. Foreign Minister Yang Jiechi articulated, in the most unequivocal terms, the view that, in the opinion of the People’s Republic of China, the Government and people of Sri Lanka have total capability to resolve their issues in accordance with their own requirements and aspirations. There was complete agreement that contextual factors have overriding importance in the formulation of practical approaches to the resolution of national problems, and that the fullest expression must be accorded to the nuances of the local situation. China’s Minister for Foreign Affairs made it clear that the support of his country is at Sri Lanka’s disposal as we address in earnest the tasks of national reconstruction and reconciliation.

This discussion proved beneficial, also from the standpoint of imparting further clarity and cohesion to reciprocal arrangements in the economic sphere, which straddle a wide spectrum of projects. The Foreign Minister of China and I took advantage of the opportunity of my working visit to Beijing to address a cluster of matters relating to projects, now in the process of implementation, as well as new projects proposed by us and further phases of existing projects crucial for infrastructure development in our country. These projects include the development of our ports, harbours and airports, road and railway networks, the power and energy sector, and the field of culture and the performing arts. The warmth of the relationship between the two countries is reinforced by the visit of the Hon. D.M. Jayaratne, Prime Minister of Sri Lanka, this week to the Kunming Trade Fair which, with the participation of several Sri Lankan companies, will certainly add an impetus to the trade relations between Sri Lanka and China.

Mr. Deputy Chairman, Sri Lanka played a leading role in the 16$^{th}$ Summit of Foreign Ministers of countries belonging to the Non-Aligned Movement which was held a fortnight ago in Bali, Indonesia. It is a source of deep pride to Sri Lanka that we were invited to preside over a plenary session of the Conference. Current membership of the Non-Aligned Movement extends to 120 countries, almost two-thirds of the total membership of the General Assembly of the United Nations. My own address served as an occasion to remind the world community of Sri Lanka’s vital contribution to the conceptual underpinnings of the Movement, established and consolidated in Belgrade half a century ago.

An exceedingly useful part of this event, given the level and scope of participation, was the opportunity it afforded for bilateral consultations of immediate relevance to Sri Lanka on the sidelines of the plenary sessions. This was of inestimable value to us in communicating Sri Lanka’s point of view regarding contemporary developments to countries whose voice is of considerable importance in multilateral fora. In this task, I was fortunate to be assisted substantially by my Colleagues, the Hon. Rauff Hakeem, the Hon. Gitanjana Gunawardena, the Hon. Dilan Perera and the Hon. Sajin De Vass Gunawardena.

Sir, in total, we had 22 bilateral meetings with countries from different geographical regions of the world. From the Continent of Asia, we engaged with Indonesia, Vietnam, the Philippines and Myanmar. From Africa, we had discussions with Egypt, Senegal, Nigeria, Tunisia, Mozambique and South Africa. From the Middle East, the countries we interacted with were Kuwait, Bahrain and the United Arab Emirates. From Europe, we had discussions with Spain, Serbia, Slovenia, Belarus and Ukraine. From Latin America, we engaged with Cuba, Gautemala, Ecuador and the Dominican Republic.

There are some principles which can be readily distilled from this extensive range of consultations. There was much in evidence the vigorous sentiment that approaches to contentious matters must be issue-based, and founded on principle rather than expediency. Accompanying this sentiment was vehement opposition to inconsistency, caused by double standards and the

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

selective application of seemingly lofty principles. The conviction was expressed by many delegations that these principles, although unassailable in the abstract, are often exploited, as experience has shown, for partisan ends and in pursuit of objectives which are far from altruism.

Within hours of my return from Indonesia, I received with pleasure in Colombo the Deputy Minister of Foreign Affairs of the Islamic Republic of Iran, the Hon. Mohammed Ali Fathollahi, who pledged the unequivocal support of his Government to Sri Lanka in dealing with our current issues. It was an appropriate occasion for me to convey to the visiting Iranian dignitary, on the Government's behalf, our appreciation of Iran's generous assistance with regard to resources for the purchase of oil during a difficult period in our country's contemporary history and now, for their significant contribution to the economic development of Sri Lanka, notably in the fields of irrigation and rural electrification.

The "Shangri-La" dialogue in Singapore, which has currently established itself as a pre-eminent forum for in-depth analysis of security-oriented issues, especially in the Indian Ocean area and the Pacific rim, served as a timely setting for bringing to the attention of a large number of countries Sri Lanka's perspectives on these issues. I addressed the Plenary Sessions of this Summit on "Armed Forces and Transnational Security Challenges". Sri Lanka's delegation was strengthened by the participation of Vice-Admiral D.W.A.S. Dissanayake, Commander of the Sri Lanka Navy.

I made use of the occasion to have bilateral discussions, which proved of great benefit to our country, with the Rt. Hon. Dr. Liam Fox, Secretary of State for Defence of the United Kingdom, His Excellency Sergei Ivanov, Deputy Prime Minister of the Russian Federation, the Hon. Steven Smith, Minister of Defence of Australia and the Hon. K. Shanmugam, Minister of Foreign Affairs of Singapore.

On my return to Colombo, yesterday, I was delighted to receive, at the Ministry of External Affairs, His Excellency Koro Bessho, Deputy Foreign Minister of Japan. While I found a considerable measure of understanding of Sri Lanka's position on current issues, I thanked the visiting dignitary for the very substantial volume of overseas development assistance which Japan had made available to Sri Lanka over the decades and, above all, for the exemplary gentleness and sensitivity that consistently typified Japan's relations with our country.

I look forward to my discussions tomorrow with a delegation, led by Senator the Hon. Stephen Hutchins, representing Members of the Australia-Sri Lanka Parliamentary Friendship Group in the Parliament of Australia. This will be a valuable opportunity, especially as we prepare for the meeting of Commonwealth Heads of State and Government, which will be held in Perth, Western Australia, in October this year.

Sir, the sequence of events amply demonstrates the vigour and intensity of Sri Lanka's interactions with the world at large as we address a variety of issues of importance to our nation. All the discussions we have had, and the responses we received, indicate beyond doubt that Sri Lanka has a convincing and indeed compelling case to make before the bar of world opinion. There is no need for embellishment. The facts speak for themselves.

We do, however, need to remind ourselves of one basic imperative. At a time when forces hostile to our motherland are acting in concert to launch an onslaught against our vital national interests, there is no room for division on the basis of sectarian loyalty or party affiliation. Our collective voice, rising above differences in respect of domestic issues, must be that of the nation, as a whole. While the thrust and parry of party politics is an essential feature of representative democracy, in the setting of the Parliamentary system, there is the overarching need to recognize that, in matters which transcend narrow consideration and concern the security and dignity of our country, all must unite in a spirit of solidarity to ward off this danger. I have every confidence, Sir, that at this crucial hour, we shall not be found wanting.
Thank you.

[பி.ப. 3.14]

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, காலங்காலமாக ஒவ்வொரு மாதமும் இந்த அவசரகாலச் சட்டம் நீடிக்கப்பட்டுக்கொண்டே போகின்றது. ஆனால், இந்த அவசர காலச் சட்டத்தினால் என்ன பிரயோசனம் இருக்கின்ற தென்பதை நாங்கள் தெரிந்துகொள்ளவேண்டியவர்களாக இருக்கின்றோம். கடந்த மாதம் மட்டக்களப்பு மாவட்டத்திலே நான்கு கொலைச் சம்பவங்கள் நிகழ்ந்திருக்கின்றன. இவற்றில் இரண்டு கொலைகள் துப்பாக்கிப் பிரயோகம் காரணமாக நிகழ்ந்திருக்கின்றன. - [இடையீடு] ஒரு நாட்டிலே அவசரகாலச் சட்டம் இருக்கின்ற பொழுது படையினரைத் தவிர மற்றவர்கள் எப்படித் துப்பாக்கி களை வைத்திருக்க முடியுமென்று நான் கேட்கின்றேன். கிழக்கு மாகாணம், வன்னிப் பிரதேசம் போன்றவை கடந்த மூன்று ஆண்டுகளாகத் *துப்புரவு* செய்யப்பட்டிருந்தாலும் இன்னமும் சட்டபூர்வமற்ற முறையில் ஒருசிலரிடம் துப்பாக்கிகள் இருக்கின்ற தென்பதை அரசாங்கம் புரிந்துகொள்ள வேண்டும். நேற்றுக்கூட வெல்லாவெளிப் பிரதேசத்திலே ஓர் இளம் பெண் கொலை செய்யப்பட்டுத் தூக்கிலே தொங்கவிடப்பட்டிருக்கிறாள். இந்த அவசரகாலச் சட்டம் அமுலில் இருக்கும்போது இப்படியான கொலைகள் நடைபெறுகின்றதென்றால் அங்கு அச்சட்டம் உரிய முறையில் நடைமுறைப்படுத்தப்படவில்லையென்றே நாங்கள் கூறுகிறோம். இந்த நாடு இப்படியே போய்க்கொண்டிருக்கு மானால் ஒவ்வொரு மாதமும் இந்த அவசரகாலச் சட்டத்தினை நீடிப்பதால் என்ன பிரயோசனம் இருக்கின்றதென்று நான் கேட்க விரும்புகின்றேன்.

இன்று வடக்கு, கிழக்கிலே அரசாங்கக் காணிகளில்கூட மக்கள் அத்துமீறிக் குடியேற்றப்படுகின்றனர். மட்டக்களப்பு மாவட்டத்தின் வவுணதீவு பிரதேசத்திலே மேய்ச்சல் தரைக்காக அரசாங்க அதிபரால் சிபாரிசு செய்யப்பட்ட ஏறக்குறைய மூவாயிரம் ஏக்கர் அரசாங்கக் காணிகள் அம்பாறை மாவட்டத்திலுள்ள ஊர்காவற் படையினருக்கு - Home Guards - பயிர்ச்செய்கைக்காகக் கொடுக் கப்பட்டிருக்கின்றன. அதற்கு வேலி அடைப்பதற்காக கிழக்கு மாகாண சபை கம்பியையும் கட்டைகளையும் அந்த ஊர்காவற் படையினருக்கு இனாமாகக் கொடுத்திருக்கின்றது. இதிலே ஒரு விசேடம் என்னவென்றால், அரசாங்க காணியில் அத்துமீறிய குடியேற்றத்தை ஒரு மாகாண சபையே ஆதரிக்கின்றது என்பது தான். அதாவது, மட்டக்களப்பிலுள்ள அரச காணியில் அம்பாறை மாவட்டத்தைச் சேர்ந்தவர்கள் அத்துமீறிப் பயிர்செய்வதற்கு கிழக்கு மாகாண சபையின் விவசாய அமைச்சு கம்பிகளையும் கட்டைகளையும் கொடுத்து உதவி செய்கின்றதென்றால் அந்த அத்துமீறலை அரசாங்கமே ஆதரிக்கின்றதென்றுதான் பொருள் கொள்ள வேண்டியிருக்கிறது. இதனைப் பின்பற்றி இந்த நாட்டி லிருக்கின்ற எல்லா அரசாங்கக் காணிகளிலும் மக்கள் அத்துமீறிக் குடியேறிவிடுவார்களென்று நான் நினைக்கின்றேன். இந்த நடவடிக்கைகளைப் பார்க்கும்போது அரசாங்கம் அவசரகாலச் சட்டத்தைச் சரியான முறையில் செயற்படுத்துகின்றதா என்பதை நாங்கள் கேட்கவேண்டியவர்களாக இருக்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அண்மையில் கட்டுநாயக்கவில் நடைபெற்ற சம்பவம் தொடர்பாக அரசாங்கம் எடுத்த நடவடிக்கைகளை நாங்கள் வரவேற்கின்றோம்; பாராட்டுகின்றோம். ஆனால், அதேவிதமான சம்பவமொன்று வடக்கு, கிழக்கிலே நடந்தால் இப்படியாக அரசாங்கம் உடனடி நடவடிக்கையெடுக்குமா என்பது கேள்விக்குறியாக இருக்கின்றது. ஏனென்றால், சென்ற வருடம் பட்டதாரிகளுக்கு வேலைவாய்ப்பு வழங்கக்கோரி ஆர்ப்பாட்டம் நடத்திய பாராளுமன்ற உறுப்பினர் களையும் பட்டதாரி மாணவர்களையும்கூட நீதிமன்றத்திலே நிறுத் தியது இந்த அரசாங்கம். அப்போது அவர்கள் கல்லும் எறியவில்லை; பொல்லும் எறியவில்லை; துப்பாக்கிச் சூடும் நடத்த வில்லை. இதன்மூலம், இந்த இரு சம்பவங்களையும் ஒரு சமமான நடவடிக்கையென்று எங்களால் எப்படிக் கூற முடியும்? எனவே, வடக்கு, கிழக்கிலுள்ள மக்களை அரசாங்கம் வேற்றுக் கண்கொண்டு பார்க்கின்றதென்றே நாங்கள் கருத முடியும்.

கிழக்கு மாகாணம் விடுவிக்கப்பட்டு இன்று மூன்று ஆண்டுகள் கடந்துள்ளன. கிழக்கு மாகாணம் விடுவிக்கப்பட்டுள்ளது என அரசாங்கத்தினால் என்று அங்கீகரிக்கப்பட்டதோ, அன்றிலிருந்து மட்டக்களப்பு மாவட்டத்தில் மட்டும் முந்நூறுக்கும் மேற்பட்ட இளைஞர்களும் யுவதிகளும் கடத்தப்பட்டிருக்கிறார்கள். அவர்கள் எந்த முகாமிலே இருக்கின்றார்கள் என்பது இன்னமும் தெரியாதிருக்கின்ற விந்தையாகவே இருக்கின்றது. அவர்களின் கதி என்ன என்பதை அறிய முடியாமல் உறவினர்கள் சீரழிந்து கொண்டிருக்கிறார்கள். நாங்கள் அந்த இளைஞர்களின் பெற்றோர் களைச் சந்தித்து அவர்களிடமிருந்து அந்தப் பிள்ளைகள் தொடர் பான சகல விபரங்களையும் பெற்றுக்கொண்டதோடு, அந்த விபரங்களின் பிரதியை பொலிஸ் திணைக்களத்திடமும் ஒப்படைத் திருக்கிறோம். ஆனால், 3 வருடங்கள் கடந்துள்ள நிலையில்கூட இந்த இளைஞர்கள் எங்கிருக்கின்றார்கள் என்பதைக் கண்டுபிடிக்க முடியாத துர்ப்பாக்கிய நிலையில் அவர்களின் பெற்றோர்கள் அவதிப்பட்டுக்கொண்டிருக்கின்றார்கள். அதன் காரணத்தினா லேயே இந்த அவசரகாலச் சட்டத்தை ஒவ்வொரு மாதமும் நீடிப்பதனால் என்ன பிரயோசனம் இருக்கின்றது என்று நாங்கள் கேட்கவேண்டியிருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தின் சில பிரதேசங்கள் அம்பாறை மாவட்ட பொலிஸ் நிலையத்தின் கட்டுப்பாட்டிலே இருந்து கொண்டிருக்கின்றன. குறிப்பாக வவுணதீவுப் பிரதேசத்தின் சில பகுதிகள் மஹாஓயா பிரதேச பொலிஸ் நிலையத்தின் கட்டுப்பாட்டின்கீழ் இருக்கின்றன. இதன் காரணமாக அப்பிரதேச மக்கள் வழக்குகளைப் பதிவு செய்வதற்கும் வழக்கு விசாரணை களுக்கும் அம்பாறைக்குச் செல்ல வேண்டியிருக்கின்றது. ஆகவே, இந்த நிலைமையை மாற்றி மட்டக்களப்பு மாவட்டத்தின் சகல பிரதேசங்களையும் மட்டக்களப்பு மாவட்டப் பொலிஸ் நிலையத்தின் கட்டுப்பாட்டின்கீழ் கொண்டுவந்தால் நாங்கள் நன்றியுடையவர்களாக இருப்போம். ஆகவே, மக்களால் முன்வைக் கப்பட்ட, நான் இங்கு குறிப்பிட்ட பிரச்சினைகளை அரசாங்கம் கருத்திற்கொண்டு, அவற்றுக்குத் தீர்வு காண்பதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ளும் என எதிர்பார்த்து விடைபெறு கின்றேன். நன்றி.

[අ. භා. 3.24 ]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පැවැත්වෙන වෙලාවේ අපේ හිතමිත්‍ර ගරු පොන්. සෙල්වරාසා මන්ත්‍රීතුමාගේ කථාවෙන් අනතුරුව ඔබතුමා මූලාසනය දරන මොහොතේ මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මට තිබෙන්නේ සතුට මිශ්‍ර හැඟීමක්. බෙදුම්වාදී ත්‍රස්තවාදයට විරුද්ධව රාජ්‍ය ආරක්ෂාව වෙනුවෙන් පනවනු ලැබූ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව අද දින මේ සභාවේ කෙරෙන විවාදයේදී මුලසුනේ ඔබතුමා සිටින අවස්ථාවක මට කථා කිරීමට ලැබීම ගැන මා සතුටු වන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, ඔබතුමා බෙදුම්වාදී ත්‍රස්තවාදයෙන් අනූනවයෙන් ජීවිතය බේරා ගත් කෙනෙක් නිසා සහ බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී මතය වෙනුවෙන් ඍජුව පෙනී සිටි නායකයකු නිසා යි. එම නිසා යි මා මේ අවස්ථාව සතුටට කාරණාවක් බව ප්‍රකාශ කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම සභාව පාර්ලිමේන්තුව විධියට වේවා, ඉතිහාසයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව විධියට වේවා, ජාතික රාජ්‍ය සභාව විධියට වේවා ශ්‍රී ලංකා රාජ්‍යය තුළ හදිසි නීතිය දීර්ඝ කිරීමක් පිළිබඳ විවාදයක් පැවැත්වෙන 442 වන අවස්ථාවයි අද දවස. 1953 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ශත විසිපහේ හාල්සේරුව ශත හැත්තෑව බවට පත් කිරීම නිසා උද්ගත වුණු හර්තාලය මැඩ පැවැත්වීමේ අරමුණින් තමයි 1953.8.12 වනදා පළමුවන වතාවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ හදිසි නීතිය පිළිබඳ විවාදය පැවැත් වී තිබෙන්නේ. ඉන් අනතුරුව මේ රටේ උතුරු පළාතෙන් මතු වෙච්ච බෙදුම්වාදී ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ අණ පනත් පැනවීම වෙනුවෙන් 1979.07.11 වන දා හදිසි නීතිය පිළිබඳව නැවත සාකච්ඡා වෙලා තිබෙනවා. ඒ කියන්නේ දැනට අවුරුදු 31කට ප්‍රථම. ඒ, එදා උතුරේ මතු වෙච්ච ත්‍රස්තවාදයට එරෙහිව රාජ්‍ය ආරක්ෂාව සඳහා නව නීති රීති සම්පාදනය කර ගැනීමේ අරමුණින්.එම නිසා යි මේ පාර්ලිමේන්තුවේ ලාබාලම මන්ත්‍රීවරයා -ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා- ඔහුගේ පළමුවන කථාවේදී කිව්වේ, හදිසි නීතිය ඔහුට වඩා වයසයි කියා. මේ හදිසි නීතිය ඉවත් කිරීම පිළිබඳව හදිසි නීතිය අවශ්‍ය ද, නැද්ද කියන ප්‍රශ්නය මතු කරන්නේ නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප අතරේ කිසිම තර්කයක් විවාදයක් නැහැ, අප සියලු දෙනාම එකඟයි හදිසි නීතිය ඉවත් කරන්න.

හදිසි නීතිය පවත්වා ගෙන යාම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට නොවැදගත් ලකුණක්ය කියන කාරණය පිළිබඳව අප අතරේ කිසිම තර්කයක් නැහැ. නමුත් අප මේ හදිසි නීතිය පැන වූයේ ඇයි? ගරු ජෝශප් මයිකල් මැතිතුමා කථාව ආරම්භයේදීම මතු කළ ප්‍රශ්නය එයයි. අප රාජ්‍යයක් විධියට හදිසි නීතිය නීතිගත කළේ, නෛතික බලයක් සහිතව පැනවෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ත්‍රස්තවාදය වෙනුවෙන් පමණක් ද?

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ත්‍රස්තවාදය ද මූලික කාරණය? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප හමුවේ, අප ඉදිරිපිට තිබුණු ප්‍රධාන කාරණය මොකක් ද ? ත්‍රස්තවාදය ද? රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන්, රාජ්‍යයේ ඒකීයභාවය සම්බන්ධයෙන් අපට තිබෙන ගැටලුව බෙදුම්වාදයයි. ත්‍රස්තවාදය කියන්නේ බෙදුම්වාදයේ ප්‍රචණ්ඩ ප්‍රකාශනයයි. බෙදුම්වාදයේ ප්‍රචණ්ඩ ප්‍රකාශනය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ත්‍රස්තවාදය කියා හැඳින්වූයේ. ඒ ත්‍රස්තවාදය, ත්‍රස්තවාදී නායකත්වය හමුදාමය වශයෙන් පරාජයට පත් කොට මුලිනුපුටා දමා හමාරයි. හැබැයි ඔබතුමාට පුළුවන් ද මේ ගරු සභාවට වග කීමෙන් කියන්න, බෙදුම්වාදය පිළිබඳ සාකච්ඡාව, බෙදුම්වාදී මත වාදය, බෙදුම්වාදී සිද්ධාන්ත, ඒ වෙනුවෙන් නැඟිටින, නියෝජනය කරන කණ්ඩායම්, දේශපාලන පක්ෂ මේ බිමේ හෝ මේ බිමෙන් බැහැරව ක්‍රියාත්මක වන්නේ නැහැයි කියා. ඔබතුමාට ඒ පිළිබඳ සහතිකයක් දෙන්නට පුළුවන්ද? ඒ නිසා මේ හදිසි නීතිය පැනවීම, හදිසි නීතිය පවත්වාගෙන යෑම කොයි තරම් අප්‍රසන්න කාරණාවක් වුවත්, රාජ්‍ය ආරක්ෂාව වෙනුවෙන් බෙදුම්වාදයට එරෙහිව, බෙදුම්වාදයේ අවසාන පුරුක, අවසාන බෙදුම්වාදී මතවාදය පරාජය කරන මොහොත දක්වාම යම් මට්ටමකින් ගොරෝසු අඩු පඩු ඉවත් කරමින්, ලිහිල් කරමින්, ක්‍රමක්‍රමයෙන්, පියවරෙන් පියවර, ක්‍රමානුකූලව හදිසි නීතිය ඉවත් කිරීම දක්වා පවත්වා ගෙන යා යුතුයි කියා අපි හිතනවා. ගරු නියෝජ්‍යය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ.

අපි දැන් මේ කථා කරන මොහොත මොකක්ද? ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළේ රුද්‍රකුමාර් කියන එල්ටීටීඊ නියෝජිතයා අන්තර්වාර ඊළාම් ආණ්ඩුවක් ප්‍රකාශයට පත් කර තිබෙනවා; Transitional Government එකක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. අපට ඒක බැහැර කරන්න පුළුවන්ද? ඊයේ පෙරේදා නෝර්වේ රාජ්‍යයේ දී නෙදියවන් නමින් ත්‍රස්තවාදියෙක් අත් අඩංගුවට ගත්තා. අපේ හමුදාවන්, රාජ්‍ය ආරක්ෂක බුද්ධි අංශ වාර්තා කරලා තිබෙනවා, ඔහු ඉතාම දරුණු ගණයේ ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වුණු පුද්ගලයෙක් කියලා. ඒක බැහැර කරන්න පුළුවන්ද? ඊයේ දිනපතා පුවත් පත්වල මුල් පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්තියක් විධියට පළ වුණේ මොකක්ද? විදේශගත වෙලා සිටින එල්ටීටීඊ ක්‍රියාකාරින් යාපනයේ සිවිල් පරිපාලනය පවත්වාගෙන යන දිසාපතිතුමියට මරණ තරජන එල්ල කරන ආකාරයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රාජ්‍ය නායකයා විදේශගත වුණාම ඒ රාජ්‍ය නායකයාට විදෙස් බිමකදී එල්ල වුණු තර්ජනය අඩු තක්සේරුවකට ලක් කරන්න පුළුවන්ද? හමුදා අත් අඩංගුවට පත් වුණු, භාර වුණු සැකකරුවන් සියලු දෙනා මේ වසර අවසන් වීමට පෙර තමන්ගේ ගම් බිම් බලා පිටත් කර හැරිය යුතුයි, මුදා හැරිය යුතුයි කියලා අතිගරු ජනාධිපතිතුමා නියෝග කරලා තිබෙනවා. අමතක කරන්න එපා, තුන්දහස් ගණනක් පුනරුත්ථාපන අභ්‍යාසවල නිරත වෙලා සිටිනවා. මේ රටේ බිම් බෝම්බ ප්‍රමාණයෙන් සියයට 65ක ප්‍රමාණයක් පසු ගිය වසර දෙකක කාල සීමාවේදී තවමත් අපට ඉවත් කරන්න බැරි වෙලා තිබෙනවා. බිම් බෝම්බ ප්‍රමාණය මිලියන ගණනක්. මිලියනයකට වැඩියි. ඒවා ඉවත් කරන්න කාලය අවශ්‍යයි. එම නිසා මෙන්න මේ සමස්ත ක්‍රියාකාරකම් දිහා බලලායි අපි තීරණය කරන්නට ඕනෑ, හදිසි නීතියේ -මහජන ආරක්ෂක ආඥාපනතේ- තිබෙන සමහර අණපනත්, රෙගුලාසි පවත්වාගෙන යා යුතුද, නැද්ද කියලා. ඒ නෂ්ටාවශේෂ තිබෙනවා.

අපි දන්නවා, එල්ටීටීඊයට පක්ෂපාතී දමිළ ඩයස්පෝරාව ගැන. අප රටේ වැරදි යෙදුමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මාගේ මාධ්‍යවේදී මිත්‍රයන් ඉන්න නිසා මා කැමැතියි ඒක කියන්න, දමිළ ඩයස්පෝරාව කියලා. දමිළ ඩයස්පෝරාව ඇතුළේ අපි සාකච්ඡා කරන්නට ඕනෑ, එල්ටීටීඊයට පක්ෂපාතී දමිළ ඩයස්පෝරාව ගැන. දමිළ ඩයස්පෝරාව පොදුවේ එක ගොඩකට දැමීම වැරැදියි. එය වැරැදි භාවිතයක්. එල්ටීටීඊයට පක්ෂපාතී දමිළ ඩයස්පෝරාව ඇතුළේ ඍජුවම බෙදුම්වාදය වෙනුවෙන් පෙනී හිටපු කණ්ඩායම් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපි ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්නට ඕනෑ. මට මතකයි, ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා, -මා හිතන හැටියට එතකොට තිස්ස අත්තනායක මැතිතිමා පාර්ලිමේන්තුවේ සිටියා. අපි සිටියේ නැහැ.- එල්ටීටීඊ ත්‍රස්තවාදය පිළිබඳව හදාරා, වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා කිව්වාම ඒ ඉදිරිපත් කරපු වාර්තාවේ තිබුණේ එල්ටීටීඊ සටන්කාමින් ලංකාවේම ඉන්නේ 400යි කියලායි. අඩු තක්සේරුවක් තිබුණේ. අඩු සංඛ්‍යාවක් සිටියේ. එම නිසා හිසක් සොයන බෙදුම්වාදය, හිසක් සොයමින් සැරිසරන බෙදුම්වාදය පිළිබඳව අපි කිසියම් ආකාරයක අනුකම්පාවකින් නොවෙයි බැලිය යුත්තේ කියලා මා හිතනවා. මේ වචනය පටලවා ගන්න එපා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ පිළිබඳව කිසියම් ආකාරයක බුද්ධිමත් ප්‍රවේශයක් රටකට තිබෙන්නට ඕනෑ. එම නිසා දමිළ භාෂාව කථා කරන ජනතාව දේශපාලන ක්‍රියාවලියට හවුල් කර ගන්නා ව්‍යාපෘති නිර්මාණය කරන අතරේ, දමිළ භාෂාව කථා කරන ජනතාව වෙනුවෙන් නව දේශපාලන ආකෘති නිර්මාණය කරන අතරේ බෙදුම්වාදයේ නෂ්ටාවශේෂ පිළිබඳව සොයා බලා කටයුතු කරලා, රාජ්‍යයේ ආරක්ෂාව මුළුමනින්ම සහතික කර ගන්න අපේ බුද්ධි අංශවලට, අපේ රාජ්‍ය හමුදාවන්වලට ඉඩ සලසා දිය යුතු වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අනික් පැත්තෙන් දැන් අපට කියන්න පුළුවන්ද, බෙදුම්වාදය වෙනුවෙන් සූදානම් වුණු, ඒ වෙනුවෙන් කපුකම් කරපු බටහිර බලවේග, සමහර රාජ්‍යයන් අද නිල නොවන විධියට නිහඬ වෙලාය කියලා. ශ්‍රී ලංකා රාජ්‍යයේ හමුදාව ත්‍රස්තවාදය මුලිනුපුටා දමලා ලබා ගත්තා වූ ඒ ජයග්‍රහණය අවතක්සේරු කිරීමේ උත්සාහයක අද ඔවුන් නිරත වෙලා ඉන්නවා. "ලංකාවේ හමුදා ජයග්‍රහණයක් සිද්ධ වුණේ නැහැ. මානව බේදවාචකයක් වුණේ. යුද ජයග්‍රහණයක් ලංකාවේ සිද්ධ වුණේ නැහැ"යි කියලා හමුදාවන් අවතක්සේරු කරන ව්‍යාපෘතිය ප්‍රබලයි.

දරුස්මාන් වාර්තාව එක වාර්තාවක් විතරයි. දරුස්මාන් කියන්නේ එක ගායකයෙක් විතරයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තනුව, රචනය, සංගීතය සකස් කරන්න තව ඇත්තෝ පිටුපස ඉන්නවා. මේ සමස්ත උත්සාහය මොකක්ද? මා හිතන හැටියට, අපි ඒ පිළිබඳව කථා කරන්නට ඕනෑ. ඒ පිළිබඳව පක්ෂවලට බෙදෙන්නේ නැති සාකච්ඡාවක් පාර්ලිමේන්තුව ඇතුළේත්, පාර්ලිමේන්තුවෙන් පිටස්තරවත් තිබෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් බලන්න මේ මොකක්ද වෙන්නේ? ශ්‍රී ලංකා රාජ්‍යයේ හමුදාව ඒ ත්‍රස්තවාදය මර්දනය කිරීමට ගනු ලැබූ උත්සාහය සහ මේ රටේ ජනතාවට නිදහස්ව, සාමකාමීව ජීවත් වන්න නිර්මාණය වුණ පරිසරය අවතක්සේරු කරන ව්‍යාපෘතිවල අවසාන අරමුණ මොකක්ද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

අපි දන්නවා 2009 මැයි මාසයේ 19 වෙනි දා ඇද වැටුණේ ත්‍රස්තවාදී නායකත්වය පමණක් නොවෙයි කියලා. බටහිර විසින් පසු ගිය අවුරුදු 20ක කාල සීමාව තුළදී ඇති කළ, හදාවඩා ගත්ත, අප වාගේ තුන්වන ලෝකයේ රටවලට ගළපපු, ආදේශ කළ බරපතළ න්‍යායක් 2009 මැයි මාසයේ 19 වන දා වෙල්ලමුල්ලිවෛක්කාල් භූමියේදී බිඳ වැටුණා. ත්‍රස්තවාදී නායකයකුගේ ඇද වැටීමක් විතරක් නොවෙයි වුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ න්‍යාය? කවුද මේක නිර්මාණය කළේ?

අපි දන්නවා 1945 එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කරන්න හේතු වුණ පසු බිම ගැන. ලෝකයේ දෙවන මහා ලෝක යුද්ධය වාගේ මානව බේදවාචකයක් මේ මිහි තලය මත නැවත

ඇති නොවේවා කියන අධිෂ්ඨානය පෙරදැරිව 1945 දී රටවල් 50ක් එක්ක එකතු වෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කළා. ඒ සංවිධානයේ මූලික වගකීම වුණේ මහා බලවතුන් තුලනය කර ගැනීම, න්‍යෂ්ටික බලය පාලනය කර ගැනීම සහ තුන්වන ලෝක යුද්ධයක් වළක්වා ගැනීමයි.

1980 දශකයේ අවසානයේ සෝවියට් දේශය බිඳ වැටීමෙන්, ඇද වැටීමෙන් අනතුරුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලික කාර්ය භාරය අවසන් වුණා. සෝවියට් දේශය ඇද වැටීමෙන් පසුව නැගෙනහිර යුරෝපයේ රටවල් රාශියක අභ්‍යන්තර ගැටලු නිර්මාණය වුණා. මොකක්ද එතැනදී වෙන්නේ? බටහිර විසින් අලුත් න්‍යායක්, විද්‍යාත්මක කියලා හඳුන්වපු න්‍යායක් ගොඩ නඟනවා. මොකක්ද ඒ න්‍යාය? රටක සිවිල් යුද්ධයක්, අභ්‍යන්තර අරගලයක් යුද්ධයෙන් අවසන් කරන්න බැහැ. ඒකට සාමවාදී ප්‍රවේශයක් අවශ්‍යයි. ඔවුන් කියනවා අපේ රටවලට win-win situation එකක් එන්නට ඕනෑ කියලා. දෙපාර්ශ්වයටම ජයග්‍රහණය එන පිළිවෙතකින් විතරයි රටක අභ්‍යන්තර අර්බුදයක් විසඳන්ට ඕනෑ කියලා කියනවා. මේක තමයි බටහිර මතය වුණේ. බටහිර විශ්වවිද්‍යාලවල -ඔබතුමා දන්නවා මට වඩා- ගැටුම් කළමනාකරණය -conflict management - කිරීම පිළිබඳව, ගැටුම් නිරවිකරණය පිළිබඳව, ගැටුම් විපරිවර්තනය පිළිබඳව වෙනම පාඨමාලා ආරම්භ කරනවා.

මොකක්ද, න්‍යාය? රටක අභ්‍යන්තර යුද්ධයක්, සිවිල් යුද්ධයක් යුද්ධයකින් අවසන් කරන්න බැහැ. ඒ සඳහා සාකච්ඡා මේසයට එන්න ඕනෑ. Win-win situation එකක් තියෙන්න ඕනෑ. "ත්‍රස්තවාදය" කියන වචනය පාවිච්චි කරන්න එපා. සැප්තැම්බර් 11 වන දා නිව්යෝර්ක් නගරයට අල්කයිඩා ප්‍රහාරය එල්ල වන තුරු "ජාත්‍යන්තර ත්‍රස්තවාදය" කියන වචනයවත් බටහිර මාධ්‍යවලට ආවේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. Rebelsලා මෙහෙ. "ජාත්‍යන්තර ත්‍රස්තවාදය" කියන වචනය පවා පළමුවන වතාවට බටහිර මාධ්‍ය යොදන්න පටන් ගත්තේ සැප්තැම්බර් 11 වන දා පැවැති ප්‍රහාරයෙන් පසුවයි. මේ න්‍යාය අපේ රට වැළඳ ගත්තා.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය මේ රටට ආදරය නැතුවා නොවෙයි. රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා රටට ආදරය නැතුවා නොවෙයි. ඔවුන්ට සිද්ධ වුණා, ඔවුන්ට බල කළා, ඔවුන්ට තෙරපීමක් කළා, මේ න්‍යාය වැළඳ ගන්න. මේක තමයි විසඳුම. "ත්‍රස්තවාදය" කියන වචනය පාවිච්චි කරන්න එපාය කිව්වා. ඒ ආණ්ඩුවේ ඇමතිවරු විධියට ඔබතුමන්ලා දෙදෙනාටම මතක ඇති, රාජ්‍ය මාධ්‍යවලට ඔබතුමන්ලා උපදෙස් දුන්නා, "ප්‍රභාකරන් මැතිතුමා" කියා කියන්න; "ප්‍රභාකරන් මහතා" කියලා කියන්න. එහෙම රාජ්‍ය මාධ්‍යවලට උපදෙස් ලැබුණා. ඇයි? අර න්‍යාය බලාත්මක කර ගන්න. රටක අභ්‍යන්තර යුද්ධයක් යුද්ධයකින් අවසන් කරන්න බැහැ කියලා කියනවා. සාමවාදී ප්‍රවේශයක් අවශ්‍යයි කියලා කියනවා. ඒක හරහා තමයි සමහර බටහිර රාජ්‍යයන් අප වාගේ තුන්වන ලෝකයේ රටවලට ඇතුළු වුණේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ශ්‍රී ලංකාවට විතරක් නොවෙයි, East Timorවලට වෙන්න පුළුවන්, අප්‍රිකානු මහද්වීපයේ සියරා ලියොන්වලට වෙන්න පුළුවන්, යුරෝපයේ සුඩානයට වෙන්න පුළුවන්, -යුගෝස්ලාවියාව කැබලි හතකට කැඩිලා ගියා.- ඇල්බේනියාවට වෙන්න පුළුවන්. මේ හැම රටකමට බටහිර න්‍යාය ගැලපුවා. අපේ රාජ්‍ය නායකයොත් ඒක පිළිගත්තා. වෙන විකල්පයක් නැහැ කියලා හිතුවා. අපි "සුදු නෙළුම්" ව්‍යාපාරය ගෙන ගියා. මගේ හිත මිත්‍ර මංගල සමරවීර මැතිතුමා දැන් මෙතැන නැහැ. අපි "තවලම" ව්‍යාපාරය ගෙන ගියා. මේක තමයි එකම විසඳුම කියලා අපට අවධාරණය කරමින් අප මත පැට වූ නිසා අපි ඒකෙන් විමුක්තියක් හොයා ගෙන යන්න ගියා. ඒ නිසා මහින්ද රාජපක්ෂ රාජ්‍ය නායකයා විධියටම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ න්‍යායට එරෙහි වුණා; මේ මතවාදය පිටු දැක්කා. එතුමා අලුත් න්‍යායක් හොයා ගෙන ගියා. ඒ පටන් ගන්න කොටම බටහිර න්‍යායාචාර්යවරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට එරෙහි මහා පෙරමුණකට සූදානම් වුණා. ඒකයි මම කිව්වේ, ලෝකයේ ප්‍රධාන පෙළේ අවුරුදු 20ක් අත් හදා බැලූ න්‍යායක් තමයි මැයි මාසයේ 19 වන දා බිඳ වැටුණේ කියලා. දැන් ඒ න්‍යාය තවදුරටත් ගලපන්න බැහැ. ඊට පසු බටහිර විශ්වවිද්‍යාලයක මේ පිළිබඳ දේශනයක් පවත්වනකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද ශ්‍රී ලංකාවේ වුණේ, ශ්‍රී ලංකාවේ theory එක මොකක්ද කියලා ශිෂ්‍යයෙක් නැඟිටලා ඇහුවොත් මහාචාර්යවරයාට සිදු වන්නේ පොත වහලා ගෙදර යන්න. එහෙම නැත්නම් කියන්න, "නැහැ. ශ්‍රී ලංකාවේ වුණේ යුද අපරාධ" කියා; "genocide එකක් වුණේ" කියා මේක හැල්ලු කරන්න. මෙන්න මේ නිසා අවුරුදු 20ක් තුන්වන ලෝකයේ මෙවැනි අර්බුද මතු වුණ රටවල් පාලනය කරපු බටහිර මේ තර්කය රැක ගන්න තමයි මේ යුද අපරාධ චෝදනාවක් පෙරටු කර ගෙන නැවතත් වෙනත් මුහුණුවරකින් මේක ඉදිරියට එන්නේ.

ඇමෙරිකා එක්සත් ජනපදයේ 'War on Terror' විසින් සැප්තැම්බර් 11න් පසු ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය ක්‍රියාත්මක කළා. මේ ජයග්‍රහණය කරා ගෙන ගියේ එක රාජ්‍යයයි. මේ ජයග්‍රහණය කරා ගෙන ගියේ එක රාජ්‍ය නායකයායි. ඒ,මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා රාජ්‍ය ඇතුළත විතරයි. ඒ නිසා අප කියන්නේ, ත්‍රස්තවාදයට අද ලෝකයේ වෙන වෙන නිර්වචන තිබෙනවා කියලායි. ත්‍රස්තවාදයට පොදු නිර්වචනයක් අවශ්‍යයි කියලා අපේ සභාවම එක හඬින් යෝජනා කරන්න ඕනෑ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ත්‍රස්තවාදය පිළිබඳව පොදු නිර්වචනයක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. සැප්තැම්බර් 11 වන දා -09/11- ප්‍රහාරයෙන් පසු කමිටුවක් පත් කළා. ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයෙක් හිටියා. හැබැයි, පොදු නිර්වචනයක් හොයා ගන්න බැරි වුණා. දෙදහස් හතරේ වසරක කාල සීමාවකින් නැවත පොදු නිර්වචනයක් ඉදිරිපත් කරන්නය කියා කමිටුවක් පත් කළා.

ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ලෝක පරිමාවේ නිර්වචනයක්. ඒක අසාර්ථක වුණා. ඇයි අසාර්ථක වුණේ? අද ත්‍රස්තවාදය පිළිබඳව දෙබිඩි නිර්වචනයක් තිබෙන්නේ. මුස්ලිම් මූලධර්මවාදය මත පදනම් වුණු බටහිරට එරෙහි ත්‍රස්තවාදය අන්තර්ජාතික ත්‍රස්තවාදය වශයෙන් හඳුන්වනවා. අනෙක් ඒවා rebellions. ඒවා ත්‍රස්තවාදය නොවෙයි. ඒවා conflicts. මේක පුදුම නිර්වචනයක්. මොකද මෙහෙම වෙන්නේ? වේළුපිල්ලේ පිරබාහරන්ගේ එල්ටීටීඊ ත්‍රස්තවාදය, ඒ මතවාදය මුස්ලිම් මූලධර්මවාදය මත පදනම් වුණා නම් අපට ඇඟිල්ල දිගු කරන බටහිර රටවල් ඒ දරුස්මාන් වාර්තාව එළියට දමයිද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුස්ලිම් මූලධර්මවාදය මත පදනම් වුණා නම් දරුස්මාන් වාර්තාවක් එළියට එයිද? එහෙම වුණා නම් NATO එක අපේ සහායට එනවා. සාගින්නට, ඒඩ්ස්වලට වාගේම මේ ලෝකය මුහුණ දීපු ලොකුම අර්බුදය වන ත්‍රස්තවාදයට පොදු නිර්වචනයක් නිර්මාණය කර ගන්න, අවුරුදු 30ක් ත්‍රස්තවාදයෙන් බැට කාපු ජාතියක් විධියට, ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ ජාතියක් විධියට, ශ්‍රී ලංකාව විධියට අපට ශුද්ධ වූ අයිතියක් තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පාර්ලිමේන්තුව විධියට ජනතා නියෝජිතයෝ අපි සියලු දෙනාටම එකතු වෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා ඒ ගැන ලෝකයට කියන්න අපට යුතුකමක් තිබෙනවා, වග කීමක් තිබෙනවා. International terrorism and domestic terrorism කියලා දෙකක් තිබෙන්නට බැහැ. ඒක ජාත්‍යන්තර ත්‍රස්තවාදය. මෙහේ වෙන වචනයක්. එහෙම වෙන්න බැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි දැන් මේ අභ්‍යාසය රටක් විධියට ගෙන යන්නේ අපේ රටේ බෙදුම්වාදයට එරෙහිව විතරක් නොවෙයි. ලෝක පරිමාණයෙන් මේ ත්‍රස්තවාදයෙන් බැට කන, බෙදීමට ලක් වුණු රටවල ජනතාව වෙනුවෙන් අපි අපේ අත් දැකීම් බෙදා හදා ගෙන ජාත්‍යන්තරයත් එක්ක එකට යන ගමනක් මේක. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබීම අපට ගෞරවයට කාරණාවක් බව අපි පුන

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

පුනා කිව්වා. අපි ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. අපි හැමදාමත් කියන්නේ ඒක අපට ගෞරවයක් කියායි. හැබැයි ඒ තුළ අපි දිනා ගත් ජයග්‍රහණයන් හැල්ලු වෙන්න දෙන්නේ නැතිව ආරක්ෂා කර ගෙන, සංවර්ධනය කර ගෙන ලෝකයේ අනෙක් ජාතීන්ටත් ඒ පරමාදර්ශය ලබා ගන්න පුළුවන් වන විධියට අපි ඒ කටයුත්ත සාර්ථකව නිම කරන්නට ඕනෑය කියලා මා හිතනවා.

කටුනායක ඇති වුණු සිද්ධිය ගැනත් මේ සභාවේ කථා කළා. අවසාන වශයෙන් ඒ පිළිබඳවත් වචන කිහිපයක් කියන්න මා කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ මරණය අසම්මත මරණයක්. ඒ පිළිබඳව කිසිම තර්කයක් නැහැ. පොලිස් වෙඩි ප්‍රහාරයකින් මිය ගිය පළමු පුද්ගලයා නොවුණත්, 1947 කන්දසාමිගෙන් පටන් ගත් ඒ ගමනේ තවත් එක් සන්ධිස්ථානයක්. ඒ පිළිබඳව මුළු රටම ප්‍රකම්පනය වුණා. ආණ්ඩුව විධියට, විපක්ෂය විධියට, ජනමාධ්‍ය විධියට අපි සියලු දෙනාම පුරවැසියෝ විධියට ඒ පිළිබඳව කම්පාවට පත් වුණා, එය හෙළා දැක්කා. රොෂෙන් චානක අහිංසක දරුවාගේ පවුල වෙත පාර්ලිමේන්තුව විධියටත් අපි අපේ කනගාටුව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ දේහය දේශපාලන වශයෙන් වෙන්දේසි කරන්න දෙන්නේ නැහැ කියලා, දේශපාලන වශයෙන් විකුණන්න දෙන්නේ නැහැ කියලා ශීලාචාර තීන්දු ගත් ඒ පවුලටත් අපේ පාර්ලිමේන්තුවේ ගෞරවය හිමි විය යුතුව තිබෙනවා.

කටුනායක සිද්ධිය හරහා මොකක්ද මේ රටේ අපට පෙනෙන දේ? අපි එක පැත්තක් අරගෙන එක කෝණයකින් මේක දිහා බලන්න පටන් ගත්තා. මම මුලිනුත් ඔබතුමාට කිව්වා, රාජ්‍ය මාධ්‍ය, රාජ්‍ය නොවන මාධ්‍ය සියල්ලම තමන්ගේ මුල් පුවත විධියට එම ප්‍රවෘත්තිය ඉහළ වටිනාකමකින් ප්‍රකාශයට පත් කළා. ඒ වාගේම රාජ්‍ය සේවයට අලුත් පරමාදර්ශයක් එකතු කරමින් පොලිස්පතිතුමා ඉල්ලා අස් වුණා. ඒ පරමාදර්ශය හැල්ලු කරන්න සමහරු උත්සාහ කරනවා. නමුත් එතුමා ඉල්ලා අස් වුණා.

ඒ විතරක් නොවෙයි, ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ තමුන්නාන්සේලා සියලු දෙනා ඒ මළ ගෙදරට ගියා. අපේ ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාම එකට එකතු වුණා. පසු ගිය කාලයේ අපි ඒ වාගේ දේවල් දැක්කේ නැහැ. රණ විරුවකුගේ මළ ගෙදරකට යන්න මන්ත්‍රීවරු සොයා ගන්න බැරි කාලයක් අපි ගත කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ වෙනස? මේ රටේ දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මේ මරණය මීට අවුරුදු තුනකට ඉස්සර වෙලා සිද්ධ වුණා නම් මේ රට මේ විධියට ප්‍රකම්පනය වෙයිද? පසු ගිය අවුරුදු 30 තිස්සේ ඝාතනය තමයි මේ රටේ විමධ්‍යගත වෙලා තිබුණේ. ඝාතනය විමධ්‍යගත වෙලායි තිබුණේ. එක තැන 200, 300 මිය ගියේ. පාරවල් අයිනේ, මහ මඟ බල්ලෝ, බළල්ලු වාගේ ශ්‍රී ලාංකික පුරවැසියන් මිය ගියේ. මේ මානව ශිෂ්ටාචාරයට එරෙහි අශිෂ්ටතම ක්‍රියාමාර්ගය මරා ගෙන මැරෙන ක්‍රියාමාර්ගයයි. මේ රටේ මරා ගෙන මැරෙන මිනිසුන් පුහුණු කළා. ඒ ප්‍රතිඵල අපි අත් වින්දා. තොග ගණනින් මිනිස්සු මිය ගියා. ඒ කාලයේ මේක ප්‍රවෘත්තියක් වුණාද? ඒ කාලයේ මෙහෙම දෙයකට අපි කම්පනය වුණාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1983 ජුලි මාසයේ 23 වැනිදා තිරුනල්වේලි ගමේ දී - ගමේ නම වැරදුණා නම් දමිල සහෝදර මන්ත්‍රීවරුන් මට සමා වන්න ඕනෑ- හමුදාවේ 13 දෙනෙක් මිය ගියා. මුළු රටම සංවිධානාත්මකව ප්‍රකෝපයට පත් කළා. 1983 ජුලි ගැන අපි අද තව වන තෙක් කථා කරනවා. 1983 ජුලි මාසයේ 23 වැනිදා හමුදාවේ 13 දෙනෙක් ඒ ගමේදී මිය ගියා. ඊට පස්සේ 1997 ජුලි මාසයේ 18 වැනිදා පැය හතක් ඇතුළත දී මුලතිව් කඳවුරේ 1,300ක් මිය ගියා. 13 දෙනෙක් මැරිලා නිර්මාණය කරපු 1983 ජුලි සිද්ධියෙන් පස්සේ රාජ්‍ය නායකත්වයෙන් අනුග්‍රහය ලබපු මැරයන්ගෙන් නිර්මාණය වුණු කළු ජුලිය අපේ රට මිනී කන්නන්ගේ දේශයක් විධියට හෞතීශ්ම වුණා. ඒ සිදු වීමෙන් අවුරුදු 14කට පස්සේ 1997 අර 13 වාගේ සිය ගුණයක්, ඒ කියන්නේ 1,300ක් මිය ගියා. ඒක අපේ රටේ තවත් එක ප්‍රවෘත්තියක් පමණක් බවට පත් වුණා. ඇයි, අපට කිව්වා මරණත් එක්ක ජීවත් වන්න ඉගෙන ගන්න කියලා. තමන්ගේ ආරක්ෂාව තමන් බලා ගන්න කිව්වා. මරණත් එක්ක ජීවත් වන්න අපි පුරුදු වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඒක ප්‍රවෘත්තියක් බවට පත් වුණේ නැහැ. ඒ මේ පරණ ශ්‍රී ලංකාවේ විධිය. දැන් මොකද වෙලා තිබෙන්නේ? මේ සිද්ධිය ගැන අපි සියලු දෙනාම පොදුවේ දැඩි කම්පාවකට ලක් වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බටහිර රටවල සිදු වනවා වාගේ.

ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලිස් වෙඩි පහරකින් කවුරු හරි මිය යාම ජාත්‍යන්තර ප්‍රවෘත්තියක්. ඇයි? ඒ රටේ මිනිස් ජීවිතයකට වටිනාකමක් තිබෙන නිසා. පසු ගිය මුළු කාලය පුරාවට අපේ රටේ මිනිස් ජීවිතවලට වටිනාකමක් තිබුණේ නැහැ. Cricket match එකක score එක අහනවා වාගේ තමයි අපි ඒවා අහන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද කියලා මම දන්නවා. Cricket match එකක score එක අහනවා වාගේ පසු ගිය අවුරුදු තිහක කාලය තුළ අපි මේ රටේ මරණ ගැන ඇහුවා. අපට කම්පාවක් ඇති වුණේ නැහැ. ඒවා සාමාන්‍ය සිද්ධි බවට පත් වුණා. අර ඇන්ටන් ජෝන්ස් කියන ගායකයා -අස්වර් මන්ත්‍රීතුමා නම් හොඳට දන්නවා- මොනවා හරි මානව ඛේදවාචකයක් ඇති වුණාම ගීතයක් ගායනා කරනවා. මතුගම සමන් කුමාර කියන පුංචි පාසල් දරුවාගේ ඝාතනයෙන් පස්සේ ඇන්ටන් ජෝන්ස් මහත්මයා ගීත ගායනා කළේ නැහැ. ඇයි, ඒක සාමාන්‍ය දෙයක් බවට පත් වුණා. ඒ පරණ ශ්‍රී ලංකාවේ තිබුණ විධිය. තොග ගණනින්, දස දහස් ගණනක් මිය ගිය ඒ මරණත් එක්ක අවුරුදු තිහක් ජීවත් වුණු රටේ අද පොලිස්පතිතුමා ඉල්ලා අස් වෙනවා. ආණ්ඩුව කලබල වනවා. විපක්ෂය කලබල වනවා. ජනමාධ්‍ය ඇතුළු අප සියලු දෙනා මේ පිළිබඳව මහ හඬින් කථා කරනවා. ඒක විය යුතු දෙයක්. ඇයි මෙහෙම වන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ අවුරුදු තිහකට පස්සේ, මිනිස් ජීවිතයකට වටිනාකමක් හම්බ වෙලා තිබෙනවා. මිනිස් ජීවිතයකට වටිනාකමක් හම්බ වෙලා තිබෙනවා! ඒක ඉතා වැදගත් කාරණාවක්., මිනිස් ජීවිතයකට ඒ වටිනාකම එකතු කරපු නායකයා තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒ වාගේම මේ ආණ්ඩුව.

අපි කටුනායක ඛේදවාචකය වෙනුවෙන් කම්පාවට පත් වන අතර, ඒ ඛේදවාචකයට ගොදුරු වූ සියලු දෙනාම එක්ක අත් වැල් බැඳ ගන්නා අතරේ එවැනි ඛේදවාචකයක් නැවත ඇති නොවන්නට කටයුතු කරන අතරේ, රට තුළ ඇති වෙච්ච මේ මහා දැවැන්ත වෙනස්කම පිළිබඳවත් අපි අතරේ කිසියම් දැනීමක්, හැඟීමක් අපි ඇති කර ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ආණ්ඩුව නියෝජනය කරමින් කථා කරන්නට අද මේ අවස්ථාව මා වෙත ලබා දෙන්නට කටයුතු කිරීම පිළිබඳව. පාර්ලිමේන්තුව විධියට අපි හැම ප්‍රශ්නයකදීම දෙකට බෙදෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. සුනාමි ඛේදවාචකයේදීවත් එකට ඉන්න අපට බැරි වුණා. එකට පහන් දල්වා ගෙන ඉඳලා සමඟිය ආරක්ෂා කර ගන්න පුළුවන් වුණේ පැය 48යි. වෙරළ තීරයේ සිට මීටර් 100 ප්‍රශ්නය ආපු හැටියේ ආපහු අර ජනප්‍රිය බෙදීම - ආණ්ඩු පක්ෂය, විපක්ෂය විධියට බෙදීම- සිදු වුණා. කිසිම ජාතික ප්‍රශ්නයකදී අපට එකට එකතු වන්න බැරි වෙලා තිබෙනවා.

මේ, රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්; බෙදුම්වාදය පිළිබඳ ප්‍රශ්නයක්. තමුන්නාන්සේලාට, අපේ මන්ත්‍රීතුමන්ලා, අපේ ඇමතිවරු, අපේ ආණ්ඩුව පිළිබඳව විවේචන තිබෙනවා නම්

විවේචන කරන්න. හැබැයි රාජ්‍ය න්‍යාය පත්‍රයට -ආණ්ඩුවේ නොවෙයි- පිටු පාන්නට එපා. රාජ්‍ය න්‍යාය පත්‍රයත් එක්ක එකට ඉන්නට ඕනෑ කියලා යෝජනා කරන අතරේම මේ ත්‍රස්තවාදය පිළිබඳව පොදු නිර්වචනයක් ගොඩ නඟා ගැනීම සඳහා අපි ලෝක පරිමාවෙන් කටයුතු කරන්නට අඩු තරමින් එකතු වෙමුයි කියා යෝජනා කරමින් මූලාසනයට නැවතත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.56]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය නැවත වතාවක් දීර්ඝ කරන අවස්ථාවේදී අදහස් කීපයක් ප්‍රකාශ කරන්නටයි මම කල්පනා කළේ. විශේෂයෙන්ම අද හදිසි නීති යෝජනාව ඉදිරිපත් කරමින් අපේ අගමැතිතුමා මේ යෝජනාව සාධාරණීකරණය කරන්න කිසිම කාරණයක් ඉදිරිපත් කළේ නැහැ. නමුත් දීර්ඝ ලෙස මේ හදිසි නීතිය තබා ගැනීමට හේතුව වශයෙන්, මේ රටේ බලපාන කාරණාවලට වඩා විවිධ කාරණා මේ සභාවට ඉදිරිපත් කරන්නට ඩලස් අලහප්පෙරුම මැතිතුමා උත්සාහ කළා. පසු ගිය කාල සීමාව තිස්සේම මේ හදිසි නීතිය පාවිච්චි කෙරුවේ රටේ ජාතික ආරක්ෂාවේ ඒ වාගේම රටේ රාජ්‍ය ආරක්ෂාවේ යම් යම් කාරණා ක්‍රියාත්මක කරන්නයි කියන පදනම මේ සභාවේදී නොයෙක් අවස්ථාවල සාකච්ඡා කර තිබෙනවා. නමුත් අද වන කොට මේ රට සාමාන්‍ය තත්ත්වයකට පත් වෙලා තිබෙනවායි කියලා පිළිගන්නවා නම්, අද වන කොට මේ රටේ හදිසි නීතිය පවත්වා ගෙන යෑම අවශ්‍ය නැහැයි කියන පදනම විවිධ හේතූන් මත තහවුරු කරමින් සිටිනවා නම්, එහෙම නම් හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කරමින් පවත්වා ගෙන යෑම ජන ජීවිතයකට අවශ්‍යද නැද්ද කියන කාරණය පිළිබඳ තීරණයකට එළඹෙන්න තිබෙනවා. අපි පසු ගිය දවස්වල දැක්කා, අද විදේශ කටයුතු ඇමතිතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ විධියට හදිසි නීතිය ක්‍රමානුකූලව ඉවත් කළ යුතුයි කියන පදනම එතුමා පිළිගත්ත බව. එහෙම නම් අපි කියන්නේ දැන් මේක ආරම්භ කරන්න හොඳ වෙලාව කියලායි. අපි කියන්නේ නැහැ ජාතික ආරක්ෂාවට බලපාන සියලු කරුණු පැත්තකට දාලා සම්පූර්ණයෙන්ම මේකෙන් වහා ඉවත් විය යුතුයි කියලා. හැබැයි හදිසි නීතිය උපයෝගී කර ගෙන මේ රටේ කම්කරු අයිතීන් මර්දනය කරන්න හදනවා නම්, ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම්, උද්ඝෝෂණ මර්දනය කරන්න හදනවා නම්, ඒ වාගේම සාමාන්‍ය ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට බලපෑම් වන ආකාරයට මේ හදිසි නීතිය යොදා ගන්නවා නම් එහෙම නම් ඒකට අපි විරුද්ධ වන්න ඕනෑ. උතුරු නැඟෙනහිර තිබුණ ඒ ත්‍රස්තවාදී තර්ජනය අද අවසන් වෙලා තිබෙනවා. අද ඒකයි 2600වැනි සම්බුද්ධත්ව ජයන්තිය දකුණෙත්, උතුරෙත් එක විධියට සමරන්න පුළුවන්කම ලැබුණේ.

අද අපි හැමෝම පිළිගන්නවා ඒ සාමකාමී තත්ත්වය මේ රටේ උදා වෙලා තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මතය -එක්සත් ජාතික පක්ෂයේ මතය- තමයි හදිසි නීතිය දැන් ඉවත් කිරීම අපි ආරම්භ කරන්න ඕනෑය කියන එකයි. අපි කියන්නේ මේ හදිසි නීතිය පවත්වා ගෙන යමින් දේශපාලනමය කාරණාවලට බාධා කරන්න ඒක යොදා ගන්න එපා කියලායි. බලන්න. ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ කථාවේදී කාරණා කිහිපයක් සඳහන් කරමින් කිව්වා නෝර්වේ රාජ්‍යයේදී නෙදියවන් අත් අඩංගුවට ගැනීම ගැන; ඒ වාගේම ජනාධිපතිතුමාට විදේශ සංචාරයකදී එල්ල වුණු තර්ජන ගැන; රුද්‍රකුමාරන්ගේ ප්‍රකාශය ගැන. මේවා ඔක්කෝම ශ්‍රී ලංකාව ඇතුළේ හදිසි නීතිය පවත්වා ගෙන යන්න අවශ්‍ය කාරණා නොවෙයි. එවැනි දේවල් තිබෙනවා. හැබැයි මේවා ලංකාවේ හදිසි නීතිය පවත්වා ගෙන යන්න අදාළ වන සාධාරණීය කාරණා නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දා මොකක්ද කටුනායක නිදහස් වෙළෙඳ කලාප සීමාව තුළ සිදු වුණේ? ඇත්ත වශයෙන්ම ඒ යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත ගෙනැල්ලා බලහත්කාරයෙන් ඒක ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන කොට එක්සත් ජාතික පක්ෂය හැටියට අපිත්, තවත් විරුද්ධ පක්ෂයේ පක්ෂ ගණනාවකුත්, වෘත්තිය සමිති ගණනාවකුත් ඒ ගැන විරෝධය පළ කළා. අපි කිව්වේ, මේ පනත සේවකයන් වෙනුවෙන් යහපත් අරමුණක් ඇතිව ඉදිරිපත් කරනවා නම්, කරන්න තිබෙන්නේ මේක තවත් වඩාත් හොඳින් සකස් කරලා ඉදිරිපත් කරන එක කියලායි. ඒ වෙනුවෙන් අදාළ වෘත්තිය සමිති හා දේශපාලන පක්ෂ එක්ක සාකච්ඡා කරන්න කියලා අපි යෝජනා කෙරුවා. ඒ වාගේම මේ පනත මේ රටේ 60 ලක්ෂයක් පමණ වන වැඩ කරන ජනතාවට අදාළ වන පනතක් නිසා මේක වඩාත් යහපත් ආකාරයෙන් සිදු කරන්න කියලා අපි යෝජනා කෙරුවා. ඒකට කිසිම ප්‍රතිචාරයක් දැක්වූවේ නැහැ. යහපත් ප්‍රතිචාර දැක්වීම වෙනුවට ආණ්ඩුවේ සමහර මැති ඇමතිවරු ප්‍රකාශ කළේ මොකක්ද? විශේෂයෙන්ම ජනාධිපතිතුමා එක අවස්ථාවක කිව්වා කවුරු විරුද්ධ වුණත් සමිති සමඟ සාකච්ඡා කර මේ පනත ගේනවා කියලා. අපි කිව්වා, සාකච්ඡා කරලා මේක ගේන්න; එතැන තිබෙන්නේ සාකච්ඡා කරලා මේක සකස් කර ගැනීම පමණයි කියලා. 2011 මැයි මාසයේ 26 වැනි දා "ලංකාදීප" පත්තරේ මේ විධියට සඳහන් වනවා:

> "පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් ක්‍රමය කවුරුන් විරුද්ධ වුව ද, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කර ගෙන එන බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ රාත්‍රී (25) පැවසීය"

ඒ කියන්නේ බලහත්කාරයෙන් ගෙන එන බවයි. ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවේ වාමාංශික ව්‍යාපාරය මෙහෙයවපු, කම්කරු ව්‍යාපාරය මෙහෙයවපු වාසුදේව නානායක්කාර ඇමතිතුමා වරක් මාධ්‍යයට කර තිබුණු ප්‍රකාශයක් මට මතකයි. එතුමා කිව්වා පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත ජනතාවාදී පියවරක් කියලා. ඒක ජනතාවාදී පියවරක් කියලායි කිව්වේ. හැබැයි එහෙම කියලා මේක තහවුරු කරන්න හැදුවා, මේ පනත් කෙටුම්පත ගේන්නම ඕනෑය කියලා. අවසානයේ මොකක්ද වුණේ? අවසානයේදී මේ පනත බලහත්කාරයෙන් පටවන්න ගිහිල්ලා කටුනායක අහිංසක සේවකයෙකුගේ ජීවිතය නැති වුණා; තවත් සිය ගණනකට තුවාල සිදු වුණා; හිරිහැර සිදු වුණා; කර්මාන්තශාලාවලට අලාභහානි සිදු වුණා. මේකයි මතු වුණු තත්ත්වය. ඒ නිසා ඒ විරෝධය මැඩ පවත්වන්න ගත්තු ක්‍රියාමාර්ගවල ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පනත ගෙනාපු අවස්ථාවේදී එක අවස්ථාවක ගාමිණී ලොකුගේ ඇමතිතුමා කලාපය ඇතුළට ගිහිල්ලා ඒ පනත පිළිබඳ කරුණු කියනවා මම දැක්කා. තවත් අවස්ථාවක නියෝජ්‍ය ඇමතිතුමෙක්, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ කලාපය ඇතුළට ගිහිල්ලා කරුණු කියනවා දැක්කා. පොලිස්පතිතුමා මේ සිද්ධියෙන් පස්සේ මාධ්‍යයට කරපු ප්‍රකාශයි ඊට පස්සේ කරන ප්‍රකාශයි අතර විශාල පරස්පරයක් තිබෙනවා. ඇයි පොලීසිය කලාපය ඇතුළට ගියේ? පොලිස්පතිතුමාගේ මේ ප්‍රකාශය අනුවම කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ඇතුළට පොලීසිය ගියේ මේ ඇමතිවරුන්ගේ ආරක්ෂාවටයි. කලාපය ඇතුළේ ඇති වුණු මේ විරෝධය මර්දනය කරන්න නොවෙයි ගියේ. ඇමතිවරුන්ගේ ආරක්ෂාවට කලාපය ඇතුළට ගිය පොලිස් නිලධාරීන් අවසානයේදී සේවකයන් සමඟ ඇති කර ගත්ත ගැටුමේ ප්‍රතිඵලයක් හැටියට ජීවිතයක් අහිමි කරලා මේ සිද්ධිය කනගාටුදායක මට්ටමකින් අවසන් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමතිවරුන්ට විරෝධය පළ කරන කොට ඒකට මුහුණ දෙන්න සිදු වුණේ පොලීසියටයි. ඇමතිවරුන්ගේ ආරක්ෂාවට ගිය පොලීසිය අද විශාල පඹ ගාලක පැටලිලා තිබෙනවා. පොලිස්පතිතුමා ඉල්ලා අස් වුණාය කියනවා; විශ්‍රාම ගියාය කියනවා. මේ මොනවා වුණත් පොලීසිය විශාල පඹ ගාලක පැටලිලා තිබෙනවා.

[ගරු තිස්ස අත්තනායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කටුනායක සිද්ධිය ගැන පොලිස්පති මාධ්‍ය හමුවක් පැවැත්වුවා. එහිදී පොලිස්පති මහින්ද බාලසූරිය මැතිතුමා මොකක්ද කිව්වේ? 2011 මැයි 31වැනි දා "ලංකාදීප" පත්තරයේ මේ විධියට තිබෙනවා:

"යෝජිත නව විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මැති ඇමතිවරුන් පිරිසක් ඊයේ දහවල් කටුනායක ආයෝජන කලාපයේ සේවක පිරිසක් සමඟ සාකච්ඡා කරමින් සිටියදී නොසන්සුන්තාවයක් ඇති වුණා. මෙහිදී එහි ගේට්ටු අංක 4න් එකවරම කඩා වැදුණු 5000ක පමණ පිරිසක් පොලිස් නිලධාරින්ට පහර දෙමින් කලහකාරී ලෙස හැසිරීම නිසා ඔවුන් පාලනය කිරීම සඳහා නිලධාරින්ට විවිධ උත්සාහයන් ගැනීමට සිදු වුණා. පොලිස් නිලධාරින් එහි ගොස් සිටියේ මෙම ඇමතිවරුන්ගේ සාකච්ඡාවට ආරක්ෂාව සැලසීමටයි"

දැන් එතුමාම පිළිගන්නවා, ඇමතිවරුන්ට ආරක්ෂාව දෙන්න ගිහිල්ලා තමයි පොලීසිය මේකට පැටලිලා තිබෙන්නේ කියලා. ඇමතිවරුන්ට ආරක්ෂාව දෙන්න පොලීසිය වෙළෙඳ කලාපය ඇතුළට ගියාට පස්සේ මොකක්ද වුණේ? මේ වෙඩි තැබීම සිදු වුණාට පස්සේ පොලිස්පතිතුමා කියනවා, "කටුනායක පොලීසියට පන්සියයක පමණ පිරිසක් කඩා ගෙන වැදුණා, අවිආයුධ බේරා ගන්න මේ වෙඩි තැබීම සිදු කළා" කියලා. දැන් පොලිස්පතිතුමා තහවුරු කරනවා මේ වෙඩි තැබීම සාධාරණයි කියලා. ඇයි? පොලීසිය ඒ ගත්ත ක්‍රියාමාර්ගය වැරදි වුණත්, ඒ ක්‍රියාමාර්ගය අමානුෂික වුණත්, මේ මතු වන විරෝධය දැක්කාම පොලිස්පතිතුමාට සිදු වුණා, "පොලීසියට කඩා ගෙන වැදුණු නිසා වෙඩි තියන්න සිදු වුණා" කියන්න. මේක හරි පරස්පරයි. මහින්ද බාලසූරිය හිටපු පොලිස්පතිතුමා එක වෙලාවක කියනවා, ඇමතිවරුන්ගේ ආරක්ෂාවට පොලීසිය කලාපය ඇතුළට ගියා, කටුනායක පොලීසිය ඇතුළේ නොවෙයි, නිදහස් වෙළෙඳ කලාපය ඇතුළේදී මේ කලබලය වුණා කියලා. තව වෙලාවක කියනවා, කටුනායක පොලීසිය ඇතුළට මේ සේවකයන් කඩා ගෙන වැදුණු නිසා වෙඩි තිබ්බාය කියලා. මොකක්ද මේ කථාවේ තේරුම? මේ වාගේ පරස්පර කථා කියලා මේ වෙඩි තැබීම සාධාරණීකරණය කරන්න උත්සාහ කළා. හැබැයි, එතුමාට මේ පිළිබඳව බරපතළ විරෝධය එල්ල වුණාම මොකක්ද එතුමා ඊට පස්සේ කියන්නේ? "වෙඩි තබන්න කිසිවෙකුගෙන් නියෝගයක් තිබුණේ නැහැ" කියනවා.

2011.06.01වැනි දා මේ පිළිබඳව පොලිස්පති ආචාර්ය මහින්ද බාලසූරිය මහතාගෙන් "දිවයින" කළ විමසීමකදී ඒ මහතා කියා සිටියේ මෙහෙමයි:

"උද්ඝෝෂණය මර්දනය කිරීම සඳහා වෙඩි තැබීම ඉතාම බරපතළ ක්‍රියාවක් බවයි. කිසිම අවස්ථාවක උද්ඝෝෂකයන් මර්දනය කිරීමට වෙඩි තැබීමට උපදෙස් නොදුන් බවද පොලිස්පතිවරයා කියා සිටියේය."

දැන් අපි අහන්නේ මේකයි. පොලිස්පතිවරයා උපදෙස් දුන්නේ නැත්නම්, නියෝග කළේ නැත්නම් මොකටද පොලිස්පතිතුමා ඉල්ලා අස් වන්නේ? ඒ නියෝගය දුන්නු කෙනාව හෙළි කරන්න තිබුණා නේ. මම දන්නේ නැහැ, එතුමා හෙළි කරනවාද කියලා. එතුමා මාධ්‍යයට කියලා තිබුණා. වෙබ් අඩවි කීපයක ඒ ගැන පළ වෙලා තිබුණා අපි දැක්කා, 17 වැනිදා මේ සියල්ල හෙළි කරනවා කියලා හිටපු පොලිස්පතිතුමා කිව්වාය කියලා. මොකක් හෙළි කරන්න යනවාද දන්නේ නැහැ. කොහොම වුණත් මේක තමයි ඇත්ත තත්ත්වය. මේකෙන් අපට පෙනෙන්නේ මොකක්ද? පොලීසිය ඇමතිවරුන්ගේ ආරක්ෂාවට ගිහිල්ලා මේ සිද්ධියට පටලැවුණා. අන්තිමට පොලිස්පතිතුමා මේ වගකීම භාර අරගෙන තමන්ගේ විශ්‍රාම යෑමේ ලියුම දුන්නා. දැන් මේ සිද්ධිය එහෙම පිටින්ම යටපත් වෙන්න හදනවා.

අපි කියන්නේ මේකයි. දැන් ජීවිතයක් නැති වෙලා ඉවරයි. තවත් සිය ගණනකට තුවාල සිදු වෙලා ඉවරයි. පොලීසියේ නිලධාරින් ගණනාවකට තුවාල සිදු වෙලා තිබෙනවා. කටුනායක ආයෝජන කලාපයේ කර්මාන්තශාලා ගණනාවකට හානි සිදු වෙලා තිබෙනවා. මේ සියල්ල සිදු වෙලා තියෙද්දීත් මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පිළිබඳව ආණ්ඩුවට තවම කිසිදු ස්ථාවරයක් නැහැ. ඔබතුමාට මතක ඇති ඊයේ මේ සභාවේදී සභානායකතුමාගෙන් විමසුවා, "මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගත්තාද, එහෙම නම් ඇයි ඒක මේ පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ තිබෙන්නේ" කියලා. මොකක්ද දුන්නු උත්තරය? "අනුගමනය කරන ක්‍රියා පිළිවෙතට අනුව ඒක සිදු වනවා, මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්න තීරණය කරලා තිබෙනවාය" කිව්වා.

හැබැයි, කැබිනට් මණ්ඩලය මේ ගැන තීරණයක් අරගෙන නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව එහෙම තීරණය කළා කියලා මාධ්‍ය වාර්තා කළා. නමුත් කැබිනට් මණ්ඩලය ඒ ගැන තීරණයක් ගත්තේ නැහැ; පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙන් ඒක ඉවත් කරලා නැහැ. පනත් කෙටුම්පත ඉවත් කර ගන්න තීරණය කළා කියලා සභානායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මේ සභාවට සහතික වුණා විතරක් නොවෙයි, ආණ්ඩුව වෙනුවෙන් නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමා විශේෂ නිවේදනයකුත් නිකුත් කරලා තිබුණා. නමුත් මොකක්ද අද කියන්නේ? අද අගමැතිතුමා කියනවා, "ඒ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගත්තේ නැහැ, සංශෝධනය කරලා ඉදිරිපත් කරනවා" කියලා. ඔන්න දැන් බළලා මල්ලෙන් එළියට පනිනවා. තවම මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගෙන නැහැ. අගමැතිතුමා කියන හැටියට මේ පනත් කෙටුම්පත සංශෝධනය කරලා නැවත ඉදිරිපත් කරනවා. ජීවිතයක් නැති වුණත්, මේ තරම් සේවක අරගල ඇති වුණත්, මොන ප්‍රශ්න ආවත් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියන එක තමයි දැන් මේ කියන්නේ. ඉතින් ජීවිතයක් පරිත්‍යාග කරමින්, මේ රටේ විශාල කම්කරු විරෝධයක් මතු කරමින් මේ ආණ්ඩුවෙන් මේකද ඉල්ලා සිටියේ?

ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නැවතත් කියනවා, මේ යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත නැවත ගෙනෙනවා නම්, ඒ ගෙන ආ යුත්තේ සේවකයන්ගේ යහපත උදෙසා පමණක් බව. එහෙම සේවකයන්ගේ යහපත සඳහා ගෙනෙනවා නම් වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ එක්ක සාකච්ඡා කරලා තමයි නැවත මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ යුත්තේ. ආණ්ඩුව කියා තිබුණා, ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තීන්ට අනුකූලව පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියලා. ඒ වාගේම මෙය කම්කරු සභාවට ඉදිරිපත් කරලා සාකච්ඡා කළ යුතුව තිබෙනවා. මේ සිද්ධීන් තාවකාලිකව යටපත් කරලා නැවත මේ පනත් කෙටුම්පත මේ සභාවේ අනුමැතියට බලහත්කාරයෙන් ඉදිරිපත් කරන්න එපා කියන කාරණය අපි පැහැදිලිවම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම පොලිස්පතිතුමාගේ ඉල්ලා අස්වීම තුළින් මේ කාරණය සම්පූර්ණයෙන්ම යටපත් කරන්න උත්සාහ කරනවා. පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණා නම් අලුත් පොලිස්පතිවරයෙක් පත් කරන්න ඕනෑ. නමුත්18 වැනි දා දක්වා ඒක කරන්න බැරිලු. එහෙම නම්, පොලිස්පතිතුමා ඉල්ලා අස් වෙලාද, එසේ නැත්නම් එතුමාට නියමිත සම්පූර්ණ කාලයම ඉඳලා විශ්‍රාම යෑමට අවස්ථාව සලසා දීලා තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ කොහොම වුණත් අපි කියන්නේ රඟපෑමකින්, බොරුවකින් මේ ප්‍රශ්නය යටපත් කරන්න එපා කියන එකයි. විශේෂයෙන්ම වග කීමක් ඇතිව මේ කටයුත්ත කරන්න ඕනෑ. මේ මිනීමැරුම පිළිබඳව, මේ සිදුවීම් පිළිබඳ වගකීම පොලිස්පතිතුමා බාර ගත්තා නම්, එසේ විශ්‍රාම ගත්තා හෝ ඉල්ලා අස් වුණා හෝ හිටපු පොලිස්පති මහින්ද බාලසූරිය මහතාට කොහොමද මාධ්‍ය ගණනාවක වාර්තා කර තිබුණු විධියට රාජ්‍ය තාන්ත්‍රික පත්වීමක් දෙන්න යන්නේ? මාධ්‍ය ගණනාවක වාර්තා කරලා තිබුණා, එතුමා තානාපති

පදවියකට පත් කරනවාය කියලා; බ්‍රසීලයේ තානාපති පදවියට පත් කරනවාය කියලා. මිනී මැරුමකට වගකීම භාර ගත්ත, ඒ සිද්ධීන් පිළිබඳ වගකීම භාර ගත්ත කෙනෙකුට කොහොමද රාජ්‍ය තාන්ත්‍රික පත්වීමක් දෙන්නේ? ඒකෙන්ම රටට වැරදි පූර්වාදර්ශයක් දෙනවා. මේක හොඳ පූර්වාදර්ශයක් නොවෙයි. රාජ්‍ය සේවයටම අපූරු පූර්වාදර්ශයක් දුන්නාය කියන මේ ඉල්ලා අස් වීම අනික් අතට සාධාරණීකරණය කරනවා, මේ කරන්නට යන තනතුරු ප්‍රදානය තුළින්. මට පෙනෙන විධියට නම් මේක ආණ්ඩුවත් එක්ක ඇති කර ගත්ත එකඟතාවක්; කොන්ත්‍රාත්තුවක්. ඒ නිසා මේක ඉතාම නරක පූර්වාදර්ශයක්ය කියන එක විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපි කියන්නේ මොකද්ද? මේ අවස්ථාවේදී අපි කියන්නේ හදිසි නීතිය යොදා ගෙන උද්සෝෂණ පාලනය කරන්න හදන්න එපා කියන එකයි. දැන් බලන්න, කටුනායක සිද්ධිය වුණාම ආරක්ෂාවට කියලා හමුදාව යෙදෙව්වා. මළ ගෙදර කටයුතුවලටත් හමුදාව යෙදෙව්වා. ඒ වාගේම ඒ මරණයේ අවසන් කටයුතු කළේත් හමුදාව යොදවලා සුවිශේෂ ආරක්ෂාවක් යටතේයි. පුවත් පත්වල පළ වුණා, මීට පස්සේ උද්සෝෂණ පාලනය කරන්නේ පොලීසිය නොවෙයි හමුදාවයි කියලා. සාමාන්‍ය නීතිය යටතේ හමුදාවට එහෙම කරන්න බැහැ. ඒකට හදිසි නීතිය තිබෙන්න ඕනෑ. මීට පස්සේ උද්සෝෂණ ආදිය පාලනය කරන්න හමුදාව යොදවනවාය කියන එකේ අර්ථය මොකක්ද? කටුනායක සිද්ධියට පොලීසිය මැදිහත් වීමෙන් ඇති වෙච්ච මේ තත්ත්වය නිසා, හමුදාව යොදවා මේවා පාලනය කරනවාය කියන එකෙන් කියැවෙන්නේ, මීට පස්සේ උද්සෝෂණ කරනකොට, විරෝධතා කරනකොට, වැඩ වර්ජන කරනකොට හමුදාව යොදවා ඒවා පාලනය කරනවා කියන එකයි.

ඒක සම්පූර්ණයෙන්ම වැරැදි කාරණයක් කියන එක විශේෂයෙන්ම ඔබතුමාට මතක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 ජුනි මාසයේ 03 වැනි දා "ලංකාදීප" පුවත් පතේ තිබුණා අපූරු ඡායාරූපයක්. පසු ගිය දා ජනතා විමුක්ති පෙරමුණ ලිප්ටන් වට රවුමේ උද්සෝෂණයක් කෙරුවා. ඒ උද්සෝෂණය කරන කොට ලිප්ටන් වට රවුමේ මෙහා පැත්තේ කෙළවර, ධර්මපාල මාවතේ පොලු හමුදාවක් හිට ගෙන ඉන්න පින්තූරයක් තමයි ඒකේ තිබුණේ. මේක "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ පළ වුණේ. ඒක "ඩේලි මිරර්" පුවත් පතේත් තිබුණා. "ලංකාදීප" පුවත් පතේ පළ වුණු ඒ ඡායාරූපයට යටින් මෙහෙම සඳහන් කරලා තිබුණා:

> "අඩි 5ක් හෝ 6ක් දිගැති පොලු රැගෙන දහසකට ආසන්න තරුණ තරුණියන් පිරිසක් ඊයේ පස්වරු 4 ට පමණ හදිසියේම කොළඹ ධර්මපාල මාවතේ රතුකුරුස වටරවුම අසලට පැමිණ එහි රැඳී සිටීම හේතුවෙන් ඒ ප්‍රදේශයේ නොසන්සුන් තත්ත්වයක් උද්ගත විය."

මේකේ තිබෙන අපූර්වත්වය ඒක නොවෙයි. මේ ඡායාරූපයේ තිබෙනවා දිග පොලු අරගෙන මේ කට්ටිය හිට ගෙන ඉන්න ස්ථානයේ එහා පැත්තේ තිබෙනවා "පිළිවෙතින් පෙළ ගැහෙමු" කියලා ලොකු දැන්වීමක්. 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය සමරන්න පිළිවෙතින් පෙළ ගැහෙමු කියලා ලොකු දැන්වීමක් දමලා. මේ දැන්වීම යට තමයි මේ අය පොලු අරගෙන ඉන්නේ. අපි දන්නේ නැහැ, මේකද පිළිවෙතින් පෙළ ගැසීම කියලා. ඒ කියන්නේ කවුරු හරි උද්සෝෂණය කරනවා නම් පොලු අරගෙන, අවි ආයුධ අරගෙන පහර දෙන එකද පිළිවෙතින් පෙළ ගැසීම කියන්නේ? කොළඹ නගරය ඇතුළේ මේක සිද්ධ වුණේ. මේවා රහසේ කරන්න බැහැ. අපිට වාර්තා වන්නේ බස්වලින් ගෙනැල්ලා, වාහනවලින් කට්ටිය ගෙනැල්ලා මේක වුණාය කියලා. අපි පසු ගිය පෙබරවාරි 4 වැනි දා -නිදහස් දවසේ- සරත් ෆොන්සේකා මැතිතුමා නිදහස් කරන්න කියලා සාමකාමී උද්සෝෂණයක් කෙරුවාම ඒ උද්සෝෂණයට විශාල පහර දීම් සිදු කෙරුවා; අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගේ වාහනවලට අලාභ හානි වුණා. රෝසි සේනානායක මන්ත්‍රීතුමියගේ, රවි කරුණානායක මැතිතුමාගේ, ඒ වාගේම දයාසිරි ජයසේකර මැතිතුමාගේ, කරු ජයසූරිය මැතිතුමාගේ වාහනවලට අලාභ හානි සිදු වුණා. කොළඹ නගරයේ මේ සිදු වන්නේ. ඉතින් අපි අහන්නේ මෙහෙම තත්ත්වයක් උදා වෙනවා නම් මහජනතාවගේ ආරක්ෂාව තිබෙනවාද කියලායි. ඒ නිසා මේක ඉතාමත් භයානක තත්ත්වයක්. ඉතින් මේ කාරණා දිහා බැලුවාම, මේ හදිසි නීතිය පාවිච්චි කරන්නේ ජාතික ආරක්ෂාවට වඩා අද විපක්ෂය මර්දනය කරන්න, වෘත්තීය සමිති මර්දනය කරන්න, ඒ වාගේම ශිෂ්‍ය අරගල මර්දනය කරන්න, ආචාර්යවරුන්ගේ වෘත්තීයවේදීන්ගේ අරගල මර්දනය කරන්න කියන එක පැහැදිලියි. ඒ නිසා මේකට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා ඊයේත් මේ කථාව කියපු නිසා, අදත් එතුමාගේ කථාවේ මේ කාරණා සඳහන් වුණු නිසා මම මේක කියන්න ඕනෑ.

මම දීර්ඝව කියන්නේ නැහැ. ඉන්දු-ලංකා එකඟතා ගිවිසුම - එකඟතා ලියවිල්ල- පිළිබඳව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඉහළ පෙළේ ඉන්දියානු නියෝජිත පිරිසක් ජුනි මාසයේ 16 වැනි දා ශ්‍රී ලංකාවට එනවා කියලා මාධ්‍ය වාර්තා කරලා තිබුණා. මොකක් සාකච්ඡා කරන්නද මේ අය එන්නේ? ඒ වාර්තා කරලා තිබෙන විධියට මහාචාර්ය ජී.එල්. පීරිස් විදේශ ඇමතිතුමාත්, ඒ වාගේම ඉන්දියාවේ විදේශ ඇමතිතුමාත් අතර ඇති කර ගත්ත එකඟතාවන් ක්‍රියාත්මක කිරීමේ පසුබිම සකස් කර ගැනීම සඳහා සාකච්ඡා කරන්නයි එන්නේ. මොනවාද ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරන්න තිබෙන කාරණා? පළමුවෙනි කාරණාව, හදිසි නීති රෙගුලාසි ඉවත් කිරීම. දෙවන කාරණාව, මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම. එතකොට මේ කාරණා දෙක සම්බන්ධයෙන් ඉන්දියාවේ නියෝජිත පිරිසක් එක්ක සාකච්ඡා කරනවා. මෙතැනදී මතු වන පරස්පරය මේකයි. මේ මූලික කාරණා දෙක දරුස්මාන් වාර්තාවේ තියෙන කොට ඒ වාර්තාවට උඩ පැන පැන ගැහුවා. හැබැයි ගිහිල්ලා ඉන්දියාවත් එක්ක මේක කථාබහ කරලා මේ කාරණා දෙක සාකච්ඡා කරන්නම් කියනවා. අද උදේ මම ස්වර්ණවාහිනියේ "මුල් පිටුව" කියන වැඩසටහන බලන කොට මම දැක්කා, ද්‍රවිඩ පුවත් පතකට -"වීරකේසරී" පුවත් පත වාගෙයි මගේ මතකයේ තිබෙන්නේ- විදේශ කටයුතු ඇමති මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා කිව්වාය කියලා දරුස්මාන් වාර්තාව අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැය කියලා. මම දන්නේ නැහැ ඒක එතුමා කිව්වාද, නැද්ද කියලා. හැබැයි කිව්වා කියලා වාර්තා වෙනවා. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, ඔබතුමාට ඒක නිවැරැදි කරන්න වෙයි. ඒ පුවත් පතේ එහෙම සඳහන් වෙලා තිබුණා. එතකොට අපි අහන්නේ මේකයි. මේ කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න එකඟ වුණා නම් එහෙනම් UN එකේ වාර්තාවත් සාකච්ඡා කර ගන්න තිබුණා. හැබැයි එහෙම කළේ නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up, Hon. Member.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මම අවසාන කරනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම කියන්නේ විශේෂයෙන් ඒ නිසාම මේ හදිසි නීතිය තවත් පවත්වාගෙන යන්න වුවමනාවක් නැහැ කියලායි.

[ගරු තිස්ස අත්තනායක මහතා]

ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කිව්වා වාගේ ජාතික ආරක්ෂාව පිළිබඳව තිබෙන කාරණා අපි දන්නවා. ඒවා පිළිබඳව බරපතළකම් තිබෙනවා. හැබැයි දැන් හදිසි නීතිය පාවිච්චි කරන්නේ එවැනි ජාතික ආරක්ෂාවක් පිළිබඳ කරුණුවලට වඩා, දේශපාලන පක්ෂ මර්දනය කරන්න; වෘත්තීය සමිති මර්දනය කරන්න. ඒ නිසා හදිසි නීතිය ලබන මාසයට ගෙනෙන්නේ නැතුව, මේ හදිසි නීතිය පිළිබඳව ගන්න තිබෙන ක්‍රියාමාර්ග අරගෙන හදිසි නීතිය ඉවත් කරන්නය කියලා අපි එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි.

[අ. භා. 4.19]

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හදිසි නීතිය පිළිබඳ විවාදයට අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම මා වැදගත් කොට සලකනවා.

මේ හදිසි නීති විවාදය හදිසි නීතිය පිළිබඳ සාකච්ඡාවකට වඩා විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒකට හේතුව වශයෙන් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මතු කරන තර්කය තමයි, ඒ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතට විරුද්ධව උද්ඝෝෂණය කරපු නිදහස් වෙළෙඳ කලාපයේ ඇති වෙච්ච සිද්ධියට හදිසි නීතිය තමයි ප්‍රධාන වශයෙන්ම බලපෑවේ කියලා. නමුත් ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති, සුළු පිරිසක් ඒක රාශිවීමත් හදිසි නීතියට අනුව වැරැද්දක් බව. මගේ මතකය අනුව පස් දෙනෙකුට වඩා ඒක රාශි වෙන්න බැහැ. එහෙම ඉන්නවා නම් ඒ අයව විසුරුවා හරින්න පොලීසියට නීතිමය බලයක් තිබෙනවා. මම හිතන්නේ එතුමා ඒක දන්නවා. ඉතින් හදිසි නීතිය ඒ වැඩ කරන ජනතාවට විරුද්ධව පාවිච්චි කළා නම් ඒක එහෙම වෙන්න ඕනෑ. එතැන පස් දෙනෙකුට වඩා වැඩියෙන් නොවෙයි දහසකට වඩා වැඩියෙන් එකතු වෙලා සිටියා. එතකොට හදිසි නීතියට අනුව ගත්තොත් එහෙම එකතු වෙන්න බැහැ. හැබැයි එහෙමෙයි කියලා ඒක විසුරුවා හරින්න ගියාද? හදිසි නීතියට අනුව ඒක රාශි වෙන්න බැහැ කියලා හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න ගියාද? හදිසි නීතියට අනුව ඒක වරදක් කියලා ඒ අයව එලවන්න ගියාද? නැහැ. එහෙම නම් කොහොමද කියන්නේ හදිසි නීතිය පාවිච්චි වෙනවා කියලා කම්කරු මර්දනයට? දැන් තමුන්නාන්සේලා, අපි කල්පනා කරලා බලමු මේ වෙච්ච සිද්ධිය. මේ සිද්ධිය හදිසි නීතිය නොතිබුණත් වෙන්න බැරි දෙයක්ද? ඒ කියන්නේ තමුන්නාන්සේලා දන්නවා, ඒ අහිංසක වෙළෙඳ කලාපයේ සටනට සංවිධානාත්මකව ඇතුළු වෙච්ච පිරිසක් දිගින් දිගටම ගල් ප්‍රහාර එල්ල කළ බව. ගල් මුල්වලින් පහර දීලා; පොලීසියට එළව එළවා ගහලා; පොලිස් ස්ථානයේ අයට පවා ඇවිල්ලා වට කරලා ගැහුවා. ඒ අවස්ථාවේ තමුන්නාන්සේලා දකින්න ඇති නිරායුධ පොලිස් නිලධාරිනුයි ඒ දිව්වේ කියලා. එතකොට පොලීසියට ගල් මුල්වලින් ගහන කොට දුවන එකද හදිසි නීතිය කියන්නේ? පොලීසියට ගැහුවා විතරක් නොවෙයි, පොලිස් ස්ථානයටත් ඇවිල්ලා පහර දුන්නා.

ඒ, එක සිද්ධියක්. ඒ සිද්ධියෙන් පස්සේ ඇති වෙච්ච දෙවැනි සිද්ධිය තමයි, යම් කිසි පිරිසක් කර්මාන්තශාලාවලට බලහත්කාරයෙන් ඇතුළු වෙලා ඒ සටනට එකතු නොවෙච්ච සේවක සේවිකාවන් එළියට ගන්න හදන කොට ඒ කර්මාන්තශාලා අයිතිකරුවන් සීදුව පොලීසියට දුරකථනයෙන් දන්වලා ඔවුන්ට ආරක්ෂාව ඉල්ලා සිටියා. ඒ වෙලාවේ තමයි පොලීසිය ඔය කියන ගිනි අවිත් ඇතුව ඒ ස්ථානයට ගියේ. ඒක හදිසි නීතියට අනුව වෙච්ච දෙයක් නොවෙයි. ඒක රටේ සාමාන්‍ය නීතිය තිබුණත් වෙන දෙයක්. එතැන වරදක් වෙලා තිබෙනවා. ඒ වරද තමයි ජීව උණ්ඩ පාවිච්චි කරලා වෙඩි තැබීමට කටයුතු කිරීම. ඒක අපි පිළිගන්නවා. හැබැයි ඒක හදිසි නීතියත් එක්ක සම්බන්ධ නැහැ. හදිසි නීතිය යටතේ එහෙම වෙඩි තබන අයට ආරක්ෂාව ලැබෙනවා නම්, තමුන්නාන්සේලා දන්නවා හදිසි නීතිය යටතේ ඒ විධියේ වෙඩි තැබීමක් හරි මොනවා හෝ කළාම ඒ අයව ආරක්ෂා කර ගන්න බලයත් ඒකේ තිබෙන බව. ඒ කරුණු තමුන්නාන්සේලා දන්නවා. මට මතකයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේලා ගෙනාවා, වග කීමෙන් ආරක්ෂා කිරීමේ පනත. ඕනෑ වෙලාවක මරලා පැයෙන් දෙකෙන් වළලා දමන්න පුළුවන්; ඒ කරපු නිලධාරින්ව රකිනවා. ඔවුන්ට විරුද්ධව කිසිම ක්‍රියාමාර්ගයක් ගන්න සිවිල් ජනයාට හැකියාවක් නැහැ. හදිසි නීතියෙත් යම් යම් බලතල තිබෙනවා, ඒ බලය පාවිච්චි කරපු පොලිස් නිලධාරින්ව රැක ගන්න. හැබැයි හදිසි නීතියේ බලය පාවිච්චි කරලා, ජීව උණ්ඩ පාවිච්චි කරලා වෙඩි තියපු ඒ පොලිස් නිලධාරින්ව රැකලා තිබෙනවාද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා ] මූලාසනාරූඪ විය.*
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [ மாண்புமிகு சந்திம வீரக்கொடி ] தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OFCOMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ කථාව කර ගෙන යන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හදිසි නීතියේ බලය පාවිච්චි කරලා ඒ වෙඩි තබපු පොලිස් නිලධාරින්ව ආරක්ෂා කරලා තිබෙනවාද? ඒ අයව අත් අඩංගුවට අරගෙන නැද්ද? ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරලා නැද්ද? ඒ අය "රිමාන්ඩ්" කරලා නැද්ද? එතකොට හදිසි නීතිය තිබුණාය කියලා ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමෙන් වැළකී තිබෙනවාද? ඒ නිසා මේ සිද්ධියට හදිසි නීතිය ගාවන්න එපා. මෙතැන හදිසි නීතියට අයිති බලය පොලීසිය පාවිච්චි කරලා නැහැ. හදිසි නීතියෙන් දී තිබෙන බලය පාවිච්චි කළා නම් පස් දෙනෙකුට වඩා එකතු වෙන්නත් බැහැ. ඒක නොවෙයි මෙතැන වෙලා තිබෙන්නේ. මේක කනගාටුදායක සිද්ධියක්; අපි කවුරුත් අනුමත නොකරන සිද්ධියක්; නොවිය යුතුව තිබ්ච්ච සිද්ධියක්. හැබැයි ඒ සිද්ධිය ඇති කර ගැනීමම අරමුණු කොට ගෙන ආපු පිරිසකගේ උගුලේ පොලීසිය අසු වුණා. ඒකයි මෙතැන වුණේ. තමුන්නාන්සේලා දන්නවා අද ඒ සම්බන්ධව පරීක්ෂණ කර ගෙන යන බව. එතකොට බොහොම පැහැදිලිව මනාව අනාවරණය වේවි සංවිධානාත්මකව පැමිණි ඒ පිරිස ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවන්ද නැත්නම් පිටස්තරින් ආපු කට්ටියක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත සම්බන්ධයෙන් මේ අවුල ඇති වෙන්න බලපෑව එක හේතුවක් මා කියන්නම්. කම්කරු අමාත්‍යාංශය හරහා කම්කරු අමාත්‍යාංශයේ ක්‍රියා දාමය හරහා වෘත්තීය සමිති සමඟ ගැඹුරු සාකච්ඡාවක් කරමින් -කලින් සාකච්ඡා කළාට පනත් කෙටුම්පත සකස් කළාට පස්සේ වෘත්තීය සමිති සමඟ නැවත සාකච්ඡාවක් කරමින්- මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ආවා නම් සමහරුන්ට අර උසි ගැන්වීම කරන්න හම්බ වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා ඒ පනත් කෙටුම්පතට විරුද්ධව මේ රටේ වෙනත් ආයතන උද්ඝෝෂණය නොකළ බව. පෞද්ගලික විශ්‍රාම වැටුප කියන එක අයිති ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවන්ට විතරක් නොවෙයි. පෞද්ගලික අංශයේ වෙනත් සේවක මහත්ම මහත්මීන්ට, රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා ඇතුළු එවැනි ආයතනවලට, ඒ හැමටම මේක අයිතියි. හැබැයි ඒ එකකවත් මෙසේ විරෝධතා නිර්මාණය කරන්න කාටවත් බැරි වුණා. පුළුවන් වෙච්ච එකම තැන කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් කර්මාන්තශාලායි. ඇඟලුම් කර්මාන්තශාලා විතරයි මේ පනත් කෙටුම්පතට විරුද්ධව පාරට බස්වා ගන්න පුළුවන් වෙච්ච එකම තැන. මොකක්ද ඒකට හේතුව? ඇඟලුම් කර්මාන්තශාලාවල ඉන්නේ ගමෙන් එන තරුණියන්. ඒ අය අවුරුදු 10ක්ම ඒවායේ ඉන්න බලා ගෙන එන අය නොවෙයි. ඒ අය අවුරුදු පහක් තිස්සේ ඉතාම දුෂ්කර කැප කිරීමක් කරලා ඒවායේ රස්සාව කරලා ඒ අවුරුදු පහ ඇතුළේ උපයපු ආදායම එකතු කරලා තියා ගන්නවා. ඒකෙන් කන කර බඩු ටික හදා ගෙන මඟුලක් තුලාවක් කර ගන්න ඕනෑ කරන පසු බිම හදා ගන්න තමයි ඒ තරුණියන්ගෙන් බොහෝ දෙනෙක් ඔය කටුනායක හරි කොහේ හරි තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවලට එන්නේ. අන්තිමට හම්බ වෙන EPF එකත්, ETF විවාහ සහතිකය දීලා අර ගන්නවා. ඒ අයගේ පැත්තෙන් බැලුවොත් ඒ අයට අමාරුයි අවුරුදු දහයක් එක දිගට එක ස්ථානයක වැඩ කර ගෙන ඉන්න. ඒ ගොල්ලන් ඒ අවුරුදු පහ ඉන්නේත් ඒ තරම් කැමැත්තකින් නොවෙයි. ඒ නිසා අවුරුදු 10ක් හිටියොත් විශ්‍රාම වැටුපක් ලැබෙනවාය කියලා කිව්වාම ඒකට ඒ ගොල්ලෝ මානසිකව සූදානම් නැහැ. මෙන්න මේ ප්‍රශ්නය තිබෙන නිසා තමයි අර කල්ලි කණ්ඩායම්වලට පුළුවන් වුණේ ඇඟලුම් කර්මාන්තවල සේවිකාවන් සේවකයන් විතරක් මේ සටනට සම්බන්ධ කර ගන්න.

අපේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයන්ටත් මේ විශ්‍රාම වැටුප අයිතියි. කෝ, එහි එක සේවකයකු හෝ එළියට බස්වා ගන්න පුළුවන් වුණාද? බැරි වුණා. කිසිම සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක, පෞද්ගලික අංශයේ වෙනත් තැනක වෙන කර්මාන්තශාලාවක -ඇඟලුම් නොවෙයි- එක සේවකයකුවත් එළියට බස්වා ගන්න බැරි වුණා. ඒ අය ඒ දිහා බලන්නේ ඊට වඩා වෙනස් විධියට. නමුත් ඇඟලුම් කර්මාන්තවල ඉන්න අහිංසක සේවිකාවන් එහෙම නොවෙයි. අවුරුදු දහයක් තිස්සේ මේ දායකත්වය දෙන්න ඒ අයට බැරි නිසා අවුරුදු පහෙන් ගමට යන හීනයත් එක්ක ඒ කර්මාන්තශාලාවල වැඩට ආපු නිසා ඒ අය පමණක් උසි ගන්වන්න පුළුවන් වුණා. "අවුරුදු දහයක් හිටියොත් විතරයි මේක හම්බ වෙන්නේ. මේකයි වැඩේ" කියලා ඒ අය උසි ගන්වා ගන්න පුළුවන් වුණා.

ඇත්ත තත්ත්වය ගත්තොත්, දෙවැනි උද්ඝෝෂණය සිද්ධ වුණේ ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවන් මේ විශ්‍රාම වැටුප් පනතෙන් අයින් කරලා තියෙද්දියි. ඒ බව ප්‍රකාශයට පත් කරන්න තමයි ඇමතිවරුන් ගියේ. ඒ බව ප්‍රකාශයට පත් කළාට පස්සේ තමයි ඒ ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන් අත්පුඩි ගැහුවේ. අත්පුඩි ගැහුවාට පස්සේ තමයි පිටස්තරින් ආපු පිරිස පොලීසියට ගල් ගැහුවේ. ඒ නිසා බොහොම පැහැදිලිව නර බිල්ලක් සොයා ගෙන ගිය මෙහෙයුමක ප්‍රතිඵලයක් මිසක් වෙන දෙයක් නොවෙයි මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා ලෝකය පුරා විසිරිලා ඉන්න දෙමළ ඊළාම් කොටි හිතවාදින් අද ලෝකය පුරා ගෙන යන මතවාදය මොකක්ද කියලා. ඒ මතවාදය තමයි ශ්‍රී ලංකාවේ තිබෙන්නේ ජන ඝාතක ආණ්ඩුවක්;

දෙමළ ජනයාව බුරුතු පිටින් මරපු ආණ්ඩුවක්; මිනීමරු ආණ්ඩුවක් කියන එක; මේ ආණ්ඩුවට විරුද්ධව ජාත්‍යන්තර ප්‍රජාව වහාම ක්‍රියා මාර්ග ගන්නට ඕනෑ කියන එක. මම දැක්කා, නිව්යෝර්ක් නුවර කොටි හිතවාදීන්ගේ උද්ඝෝෂණයක දී එක බැනර් එකක තිබුණා, "ඊයේ ඔසාමා, අද ගඩාෆි, හෙට මහින්ද" කියලා. ඒකයි ඔවුන්ගේ සටන් පාඨය. ඔසාමා බිල් ලාඩන්ව මැරුවා, ඊයේ. අද මරනවා, ගඩාෆිව. හෙට මරනවා, - මම දන්නේ නැහැ, බැරැක් ඔබාමා ද කවුද කියලා- මහින්ද රාජපක්ෂව. ඒක තමයි කොටින්ගේ ප්‍රාර්ථනාව. කොටි ලෝකය වටේ ගෙන යන්නේ, මේ මතවාදයයි. දැන් මේකට ඕනෑ කරන දේශීය අඩුම කුඩුම ටික හදලා දෙන්නට ඕනෑ. අන්න ඒ වැඩේ කරන්න කොන්ත්‍රාත්තුව ගත්තු කණ්ඩායමක් ඉන්නවා. කොන්ත්‍රාත්තුව ගත්තු කණ්ඩායමක් ඉන්නවා. ඒ කොන්ත්‍රාත්තුව ගත්තු කණ්ඩායම බලනවා, සාමාන්‍ය ආකාරයෙන් මේ වැඩේ කර ගන්න බැරි නම්, පොලීසියට ගල් ගහලා, එලව එලවා ගහලා, පොලීසිය ඇතුළටත් ගල්වලින් ගහලා, ඒත් වෙඩි තියන්නේ නැත්නම් බලෙන් කර්මාන්තශාලාවලට රිංගලා, ඒ සේවක සේවිකාවෝ බලෙන් එළියට අරගෙන, ඒත් වෙඩි තියන්නේ නැත්නම් මොන ක්‍රමයෙන් හරි වෙඩි තියවා ගන්නා තත්ත්වයක් නිර්මාණය කර ගන්නට ඕනෑ කියලා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට තමයි නර බිල්ල ලැබෙන්නේ. මේ නර බිල්ල පෙන්නුවාම තමයි, මිනීමරු ආණ්ඩුව කියන පාඨය, අන්තර් ජාතිකව කොටි හිතවාදීන් අලවන පාඨය, අන්තර් ජාතිකව කොටි හිතවාදීන් පතුරුවන පාඨය, ආණ්ඩුවේ ඇඟේ අලවන්න ඒ අන්තර් ජාතික ක්‍රියා දාමයට දේශීය වශයෙන් උදවු උපකාර කරන්න උන්නැහේලාට පුළුවන් වන්නේ.

අපි පිළිගන්නවා, ඒ අයගේ වුවමනාවට හසු වුණු බව පොලීසියේ නිලධාරින් සුළු පිරිසක්. ඒ අය ජීව උණ්ඩ අරගෙන මේ ස්ථානයට ගිය එක වැරැදියි. ඒ ගිහිල්ලා ඒවා පත්තු කරපු එක වැරැදියි. ඒ නිසා තමයි සීඝ්‍රව පොලීසියේ ඉහළ නිලධාරින්ට විරුද්ධව අද නීතිය ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා තමයි පොලිස්පතිතුමා විශ්‍රාම යන්න කලින් මේ සිද්ධියේ වගකීම අරගෙන ඉවත් වුණේ. තමුන්නාන්සේලා කියනවා, දා හතද, දහ අටද, කවදාද එතුමා විශ්‍රාම යනවා ලු. අපි කියමු ඒක හරි කියලා. හැබැයි තමුන්නාන්සේලා දන්නවා, සාමාන්‍යයෙන් පොලිස්පති වරයෙක් විශ්‍රාම යන දවසක් ආවාම අඩු ගණනේ නැවත එක වතාවක්වත් සේවය දීර්ඝ කරලා දෙනවා කියලා. සාමාන්‍යයෙන් පොලිස්පති වරයෙක් හෙට විශ්‍රාම යනවා නම්, එක වතාවක්වත් නැවත සේවය දීර්ඝ කර නොදී ඉන්නේ නැහැ. මම දන්නේ නැහැ, ඇත්තටම එතුමා විශ්‍රාම යන්නේ කවදාද කියලා. තමුන්නාන්සේලා කියන එක අනුව එතුමා ඔය කියන දවසේ නම් විශ්‍රාම යන්නේ, ඒ කියන්නේ එතුමාට අනිවාර්යෙන්ම තව අවුරුද්දකවත් සේවා දීර්ඝයක් ලැබෙනවා. ඒක තමයි මේ රටේ පොලිස්පතිවරුන්ට අනිවාර්යෙන්ම ලැබෙන දේ. එහෙම නැතිව විශ්‍රාම යන දිනය ආපු ගමන්ම ඒ මනුෂ්‍යයාව ගෙදර යවන්නේ නැහැ. මේ පොලිස්පතිතුමාත් දන්නවා, එතුමාට සේවා දීර්ඝය ලැබෙන බව. ඒ තීරණය තිබෙන බව එතුමා දන්නවා. ඒ සියල්ල තිබියදීයි එතුමා තීන්දු කළේ මේ පොලීසියෙන් සිදු වුණු ඒ ක්‍රියා දාමය ගැන වගකීම භාර ගෙන, ඒ තීරණය ගන්න. දැන් අහනවා, එහෙම දෙයක වගකීම අරගෙන ඉවත් වන්න තීරණයක් ගත්තු පොලිස්පති කෙනෙකු සේවයෙන් ඉවත් වුණාට පසුව බ්‍රසීලයට යවන එක හොඳද කියලා. අනේ අම්මේ! කවුද මේ අහන්නේ? රන් කිරි කට ගාපු, අර කැලණියේ හිටපු මැරයාට සාම විනිසුරු පට්ටම් දීපු අයියලා ටික නේ මේ අහන්නේ දෙවි හාමුදුරුවනේ. කවුද කැලණියේ- [බාධා කිරීමක්] ගෝනවල සුනිල්. තව නම් ලිස්ට් ඔහොම කිව්ව හැකි. එහෙම අයනේ මේ අහන්නේ. කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු අපේ තිස්ස අත්තනායක මැතිතුමා දන්නවා, ගෝනවල සුනිල් ගැන ඉතාම හොඳින්. මා හිතන්නේ ඔහුව ආශ්‍රය කරලත් ඇති. එහෙම අය අහනවා, වෙනත් පොලිස්

[ගරු විමල් වීරවංශ මහතා]

නිලධාරින් පිරිසක් ගත්තු ක්‍රියා මාර්ගයක් ගැන සාමූහික වගකීම අරගෙන, -සාමූහික වගකීම, එතැන තිබෙන්නේ පොලිස්පතිතුමා තනි වගකීමක් නොවෙයි. ප්‍රධානියා හැටියට ඒකේ සාමූහික වගකීම අරගෙන- ඒ පිළිබඳව එතුමා ක්‍රියා මාර්ගයක් ගත්තාම අහනවා, බ්‍රසීලයට යවන එක කොච්චර කැතද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේවා අහන මන්ත්‍රීතුමන්ලා යි හොඳ නැත්තේ. එහෙම කිසිම ප්‍රශ්නයක් නැති අය ඇහුවා නම් මේක එච්චර ගාණක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත මැයි දිනය වනකොට රටේ වැඩ කරන පොදු ජනතාවට දෙන්න ආණ්ඩුවට ඕනෑ නිසා තමයි මේ විධියට මේක ක්‍රියාත්මක වුණේ. අතිගරු ජනාධිපතිතුමා සිතුවා, ජාත්‍යන්තර කම්කරු දිනයේ දී මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන්ට මේක දෙන්නට ඕනෑ යි කියලා. තමුන්නාන්සේලා නොදන්නවා නොවෙයි. සමහර හාම්පුතාලාත් මේ පනත එනවාට විරුද්ධයි. හාම්පුතාලාගෙන් සල්ලි ගත්තු වෘත්තීය සමිති මොනවාද කියලා අපි දන්නවා. මහා ලොකු වීරයෝ වාගේ මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පුච්චන්න කථා කරන්නේ මොන මොන හාම්පුතාලාගෙන්, මොන මොන සල්ලි අරගෙනද කියලාත් අපි දන්නවා.

ඒ විතරක් නොවෙයි. එදා ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවෝ 15,000කට අධික පිරිසක් පළමුවන විරෝධතා ව්‍යාපාරය සාමකාමීව කළා. ඒ 15,000කට අධික පිරිස කිසිම ප්‍රචණ්ඩ ක්‍රියාවක නියැලුණේ නැහැ. ඒ ආයතනවල ප්‍රධානීන් ඒ අය ඒ දවසේ රාජකාරි කළා ලෙස සැලකුවා. දවසේ වැටුප දුන්නා. කෑම ටික දුන්නා. මා දන්නේ නැහැ, "යන්න ළමයෝ සටනට. අපි ඔයාට පඩි දෙනවා. ඔයාට කෑම දෙනවා. ඔයාට සියලු අයිතිවාසිකම් දෙනවා. ගිහින් උද්ඝෝෂණය කරන්න" කියලා කියන හාම්පුතාලා ඉන්නවාද කියලා. බලන්න කෝ, වැඩ ඇරෙන වෙලාව වන තුරුම ඒ ගොල්ලෝ ඒ උද්ඝෝෂණය කළා නේ. බස් පවා දුන්නා. වැඩ ඇරෙන වෙලාව වන තුරුම ඒ ගොල්ලෝ ඒ වැඩේ කළා. මා ඒකෙන් සටන හෑල්ලු කරන්නේ නැහැ. මා පිළිගන්නවා, ඒ සහෝදරියන්ට සාධාරණ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. අවුරුදු පහෙන් ගෙදර යන්න බලා ගෙන ඉන්න එකේ මේ විශ්‍රාම වැටුප් ක්‍රමයට අවුරුදු 10ක් දායකත්වය දෙන්න බැහැයි කියලා ඒ ගොල්ලෝ හිතුවා. හැබැයි ඒ ගොල්ලෝ ගෙදර ගිහින් අවුරුදු පහක් නිකම් ඉඳලා, ඊ ළඟ අවුරුදු පහේ ගමේ වෙන තැනක රක්ෂාවක් කරලා, ඒ අවුරුදු පහේ දායකත්වයත් දුන්නා නම්, ඒත් ඒ අයට විශ්‍රාම වැටුප ලැබෙනවා.

ඒවා කියන්න තමයි ඔය ඇමතිතුමන්ලා ගියේ. ඒවා කිව්වොත් වැඩේ අහුවනවාය කියා දන්නා නිසා තමයි ගල්, මුල් බල ඇණි එච්චේ. තමුන්නාන්සේලා අහනවා, මොකද පොලු හමුදාවක් කියලා. එතකොට අර ගල් හමුදාව කවුද? ඒ ගල් හමුදාව කවුද? ගල් හමුදාව කිව්වාම අපේ සමහර මන්ත්‍රීවරු හිනා වෙනවා. මා අහන්නේ අර කටුනායක ගල් ගහපු හමුදාව කවුද කියලායි. තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න. මංගල සමරවීර මන්ත්‍රීතුමා කලබල වන්න දෙයක් නැහැ. මා අහන්නේ, ඒ අය ගල් මුල්වලින් පහර දීලා, මේ විධියට මේ රටේ සාමාන්‍ය නීතියට අභියෝග කරලා මෙහෙම කටයුතු කිරීම තමුන්නාන්සේලා අනුමත කරනවාද කියලායි. මේ රටේ විරෝධතා ව්‍යාපාර තිබෙනවා. ඒවා සාධාරණව, සාමකාමීව සිද්ධ වනවා. ඒවායේ කිසි ගැටලුවක් නැහැ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගන්න අප කාටත් වග කීමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීම ආණ්ඩු පක්ෂයේ විතරක් වග කීමක් නොවෙයි, සියලුම දේශපාලන බලවේගවල වග කීමක්; අපි හැම දෙනාගේම යුතුකමක්. අපි හැම දෙනාම ඒ වෙනුවෙන් කැප විය යුතුයි. ඒ කාරණයේදී අප කාටත් එක හා සමාන හෝ කිසියම් ප්‍රමාණයක හෝ වග කීමක් තිබෙනවා. අපට අයිතියක් නැහැ, නිරායුධව එන පොලිස් නිලධාරින්ට එළව එළවා ගල් ගහන්න. එහෙම අයිතියක් අපට දීලා නැහැ. වෘත්තීය සමිතිවලට එහෙම අයිතියක් දීලා නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්නේ, කම්කරු මර්දනයට හදිසි නීතිය පාවිච්චි වනවාය කියලා ප්‍රබන්ධ ගොතන්න එපාය කියලායි. හදිසි නීතිය පාවිච්චි කළා නම් පස් දෙනකුට වඩා එකතු වන්න බැහැ, විසුරුවා හරින්න ඕනෑ. එහෙම වෙලා නැහැ. එම නිසා කම්කරුවන්ගේ සාධාරණ ඉල්ලීම්වලට, උද්ඝෝෂණවලට විරුද්ධව හදිසි නීතිය පාවිච්චි වනවාය කියලා හිතන්න එපා. ඒ මතය ගොඩ නඟන්න එපා. ඒක වැරැදියි. අපි පිළිගන්නවා, මේ හදිසි නීතිය දීර්ඝ කාලීනව තිබෙන්න ඕනෑ නැහැයි කියලා. ත්‍රස්තවාදය පරාජයට පත් කරලා, උතුරේ සිවිල් පාලන තත්ත්වය ක්‍රමානුකූලව ගොඩ නඟලා ඉතාමත්ම හැකි ඉක්මනින් හදිසි නීතියෙන් මේ රට නිදහස් කර ගන්න ඕනෑ. ඒකේ කිසි විවාදයක් නැහැ. හදිසි නීතිය බලෙන් තබා ගන්න මේ ආණ්ඩුවට කිසිම ඕනෑකමක් නැහැ. හදිසි නීතිය තිබුණාය කියලා මේ රටේ වැඩ කරන ජනතාවගේවත්, වෙනත් ප්‍රජාතන්ත්‍රවාදි බලවේගයකවත් අයිතිවාසිකම් පොඩි පට්ටන් කරන්න හදිසි නීතිය පාවිච්චි වෙලා නැහැ. රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් හා බෙදුම්වාදි ත්‍රස්තවාදීන් අන්තර්ජාතිකව හොල්මන් කරමින් අලුත් වටයකින් නැවත ක්‍රියාත්මක වන්න දරන වෑයම පරාජයට පත් කිරීම වෙනුවෙන් පමණක් මේ හදිසි නීතිය පාවිච්චි වනවා. ඒ අර්ථයෙන් පමණක් මේ හදිසි නීතිය තවදුරටත් පවත්වා ගෙන යා යුතුයි කියන කරුණ අවධාරණය කරමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊ ළඟට ගරු මංගල සමරවීර මන්ත්‍රීතුමා.

[අ. භා. 4.37 ]

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විකල්ප එක්සත් ජාතීන්ගේ සංවිධානයක් නිර්මාණය කිරීමේ භාරදූර කාර්ය භාරයේ යෙදී සිටින අපේ විමල් වීරවංශ ඇමතිතුමාගෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වනවා. එතුමාගේ ඒ කාර්ය භාරයටත් මා සුබ පතනවා. විකල්ප එක්සත් ජාතීන්ගේ සංවිධානයක් ලංකාවෙන් බිහි වන්න යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ හදිසි නීතිය පිළිබඳ විවාදය පවත්වන්නේ එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය වෙලා අවුරුදු දෙකක් සම්පූර්ණ වී තිබෙන අවස්ථාවකයි.

ඇත්ත වශයෙන්ම යුද්ධය කර ගෙන ගිය ආකාරය පිළිබඳව ගැටලු රාශියක් පැවතුණ, පවතින මා වැනි උදවියට පවා එදා ලෝකයේ භයානකම ත්‍රස්තවාදි කණ්ඩායම පරාජය වීමත් සමඟ ශ්‍රී ලංකාව ගැන විශාල බලාපොරොත්තුවක් ඇති වුණා. වසර 26කට ආසන්න කාලයක් පුරා පැවැති යුද්ධය නිසා අපේ රටේ ළදරුවන්ගේ සිට මහල්ලන් දක්වා දහස් ගණනකගේ ජීවිත අහිමි වුණා. ආර්ථික විනාශයක් වුණා. අන්න ඒ නිසාම යුද්ධයේ නිමාවත් එක්ක අපට හිමි විය යුතු ආර්ථික සමෘද්ධියත්, සමාජ දියුණුවත් කඩිනමින් අත් පත් කර ගැනීමේ මහඟු අවස්ථාවක්

ලැබුණාය කියලා මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා අපි බලාපොරොත්තු වුණා. එපමණක් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඒකාධිපති පාලනයට යට වී හිටපු උතුරේ අහිංසක දෙමළ ජනතාවට නිදහස්, ප්‍රජාතන්ත්‍රවාදී නව යුගයක් මේ තුළින් ලැබෙනවා ඇතැයි කියලාත් අපි විශ්වාස කළා. ඒ තුළින් දෙවුන්දර තුඩුවේ ඉඳලා පේදුරු තුඩුව දක්වා මේ මුළු රට තුළම අපේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කරමින් උතුරේත්, දකුණේත් සියලුම ජනතාවට බියෙන් සැකයෙන් තොරව ජීවත් වීමට පුළුවන් නව යුගයක් උදා වනු ඇතැයි කියලාත් අපි විශ්වාස කළා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එපමණක් නොවෙයි. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට අතීතයේ තිබුණු කෙනෙහිලිකම් අමතක කර දමමින් ජාති, ආගම්, පක්ෂ, කුල මල භේදයෙන් තොරව බහුආගමික, බහුවාර්ගික රටක් නිර්මාණය කර ගනිමින් නවීන ලෝකයත් සමඟ අත් වැල් බැඳ ගෙන ශ්‍රී ලාංකිකයන් ලෙස අභිමානවත්ව පෙරට යාමට අවස්ථාවක් උදා වනු ඇතැයි කියලා අපි 2009 මැයි මාසය වන කොට බලාපොරොත්තු ඇති කර ගෙන තිබුණා. ශීඝ්‍රයෙන් දියුණු වන ඉන්දියාව වැනි අසල්වැසි රටවල් සමඟ අත් වැල් බැඳ ගෙන එක හා සමානව ඉදිරියට යා හැකි මොහොතක් එළඹෙන බව අපි විශ්වාස කළා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුදමය වශයෙන් එල්ටීටීඊ සංවිධානය පරාජය කරලා අවුරුදු දෙකක් ගත වෙලා තිබුණත් මීට වසර දෙකකට පෙර රටේ අනාගතය, ජනතාවගේ සුබසෙත පිළිබඳ අප තුළ ජනිත වූ එවැනි ප්‍රාර්ථනා, බලාපොරොත්තු ඉන් පසුව මේ දක්වා දිනෙන් දින බිඳ වැටිලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම කිව්වොත් අද මුළු රටම එක්තරා නව අඳුරු යුගයකට පා තබමින් තිබෙනවා. යුද්ධය අවසන් වී වසර දෙකක් ගත වෙලා තිබුණත් මාසයක් මාසයක් පාසා මේ විධියට වාද විවාද කරමින් හදිසි නීතිය තවමත් පවත්වා ගෙන යෑමෙන්ම මා මේ කියන කාරණයේ බැරෑරුම්කම සනාථ වෙනවාය කියලාත් මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වේළුපිල්ලේ ප්‍රභාකරන් දශක දෙකකට ආසන්න කාලයක් තුළ දෙමළ ජාතියේ නාමයෙන් තමයි, දෙමළ දේශප්‍රේමයේ නාමයෙන් තමයි උතුරු නැඟෙනහිර අහිංසක ජනතාව යටපත් කර ගෙන එහි ඒකාධිපති පාලනයක් පවත්වා ගෙන ගියේ. ප්‍රභාකරන් එදා තමන්ගේ ඒකාධිපති නායකත්වයට එරෙහි වූ සියලු දෙනා, තමන්ගේම සංවිධානයේ නායකයන් පවා මරලා දැමූ හැටි අපිට මතකයි. තමන්ගේම සටන් සගයන් වූ "මහත්තයා", "කිට්ටු" යන අය තමන්ගේම හිර ගෙවල්වල දාලා මරලා දැමූ හැටි අපට තවම හොඳින් මතකයි. ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු දෙනාම වාගේ එල්ටීටීඊ සංවිධානයේ යුදමය පරාජය ගැන සතුටු වුණත් එය ඒකාධිපතියකුගේ පරාජය ලෙස සලකපු නිසායි ඒ සතුට අපට ලැබුණේ. ඒකාධිපතියකුගේ එවැනි පරාජයක් තුළින් මුළු රටටම ප්‍රජාතන්ත්‍රවාදී නිදහසක් ලැබෙනු ඇතැයි අපි විශ්වාස කළා. නමුත් ඊට හාත්පසින්ම වෙනස් දෙයක් අද සිදු වෙලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම අද මේ රටට සිදු වෙලා තිබෙන දේ ගැන මාතර මගේ ආසනයේ සිටින එක්තරා කපු මහත්තයෙක් මේ ළඟදි දවසක ඒ ගමේ භාෂාවෙන් බොහොම ලස්සනට කිව්වා.

එතුමා මොකක්ද කිව්වේ? "අනේ මහත්තයෝ, ප්‍රභාකරන්ගේ දිෂ්ටියෙන් මේ ආණ්ඩුව ආරූඪ වෙලා." කිව්වා. ප්‍රභාකරන්ගේ දිෂ්ටියෙන් මේ රජය ආරූඪ වෙලාය කිව්වා. කෙටින්ම කියනොත් දැන් සිදු වෙලා තිබෙන්නේ ඝාතනයට ලක් වූ ප්‍රභාකරන් ක්‍රියාත්මක කළ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ග අපේ පාලකයන් විසින්ම අද මුළු රට පුරාම ක්‍රියාත්මක කිරීමයි. විශේෂයෙන්ම රටවල් 34කින් තහනමට ලක් කරපු, ම්ලේච්ඡ ත්‍රස්තවාදී සංවිධානයක් හැටියට මුළු ලෝකයම පිළිගත් එල්ටීටීඊ සංවිධානය හා සමානවම, මහජනතාවගේ ඡන්දයෙන් මේ රටට පත් වෙච්ච රජයක් අද ක්‍රියාත්මක වීම ගැන අපි සියලු දෙනාම ඉතාමත්ම කනගාටු වෙන්න ඕනෑ; ලජ්ජා වෙන්න ඕනෑ. එදා ප්‍රභාකරන්ගේ අනුගාමිකයන් ප්‍රභාකරන්ට සූර්ය දෙවියන් ලෙස වැන්දා. ඒ අය තමන්ගේ වුවමනාවෙන් වැන්දේ නැහැ, ප්‍රභාකරන් විසින්ම තමන් සූර්ය දෙවියන් හැටියට හඳුන්වන්න ඕනෑයි කියලා, අපට මතකයි ඒ ප්‍රදේශයේ ජනතාවට නියෝග කරලා තිබුණු බව. ඒ වාගේම තමයි අද මේ රටේ ඉන්න නායකයන්, වෙළෙඳාමට ව්‍යාපාරයට කලාව කරන විවිධ කලාකරුවන් අල්ලා ගෙන ඒ අයම මහ රජාණන් කියලා නම් කරවා ගන්නවා. අපි ඊයේ පෙරේදා දැක්කා, ඒ මහ රජාණන් වහන්සේ බුදු රජාණන් වහන්සේටත් නෑකම් කියනවාය කියලා; දුටු ගැමුණු රජතුමාටත් නෑකම් කියනවාය කියලා රජයේ රූපවාහිනිය හරහා නිවේදනය කර ගන්නවා. අන්න ඒ නිසායි මම කිව්වේ, අද ප්‍රභාකරන්ගේ දිෂ්ටියෙන් මේ ආණ්ඩුව ආරූඪ වෙලා තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මතකයි එදා මුලතිව් ප්‍රදේශයේ, කිලිනොච්චිය ප්‍රදේශයේ ප්‍රභාකරන්ගේ මහා පරිමාණයේ cut-outs ගහගෙන සිටි බව. අද ලෝකයේ රාජ්‍ය නායකයන් ගත්තොත් තමන්ගේ cut-outs ගහ ගන්නේ ලිබියාවේ ගඩාපිලා පමණයි; සිරියාවේ අසාඩ්ලා පමණයි; එහෙම නැත්නම් යේමනයේ සලෙයිලා පමණයි. නමුත් ලංකාවේත් ඒ සංස්කෘතිය ඇති කරලා තියෙන්නේ ප්‍රභාකරන්ගේ මානසිකත්වය ඇති රාජ්‍යයක් අද මේ රට තුළ බිහි වී ඇති නිසා බව අපි මතක් කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි. ප්‍රභාකරන් උතුරු නැඟෙනහිර තම අණසක පැතුරූ යුගයේ ඔහුගේ අණසකට අවනත නොවූ සියලු දෙනා හිරේ විලංගුවේ දැම්මා. මම මුලින් කිව්වා වාගේ මහත්තයා, කිට්ටු වැනි අය හිරේ දාලා අන්තිමට මැරුවා. මේ ආණ්ඩුවත්, අද මේ රජයට විරුද්ධ වන අයව හිරේ දානවා. තමන්ට විරුද්ධව ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙච්ච සරත් ෆොන්සේකාව -එදා ප්‍රභාකරන් විසින් මහත්තයාව හිරේ දැම්මා වාගේ- බොරු චෝදනා උඩ මාස 30කට ආසන්න කාලයකට හිරේ දාලා තිබෙනවා. එපමණක් නොවෙයි. මේ ආණ්ඩුවට විරුද්ධ වන මේ ආණ්ඩුවේ මතයට එකඟ නොවන විශාල පිරිසක් අතුරුදහන් වෙලා තිබෙනවා. ජනමාධ්‍යවේදීන් අතුරුදහන් වෙලා තිබෙනවා. ජනමාධ්‍යවේදීන් ඝාතනය කරලා තිබෙනවා. ඒ වාගේම තවත් බුද්ධිමතුන් රාශියක් තම ජීවිතය බේරා ගැනීම සඳහා අද පිට රටවල්වල ජීවත් වෙනවා. අන්න ඒ නිසා තමයි අද මේ ආණ්ඩුවත් ප්‍රභාකරන් ගිය පාරේ යනවාය කියලා අපි කියන්නේ. ඒ සංකල්පය යටතේ වෙන්න ඇති. අපට මතකයි ප්‍රභාකරන් එදා කිලිනොච්චියේ සහ මුලතිව් යන ප්‍රදේශවල හිටපු අහිංසක තරුණයන්ව බලහත්කාරයෙන් කොටි හමුදාවට බඳවා ගත් බව. බලහත්කාරයෙන් කොටි හමුදාවට බඳවා ගෙන ඒ අයට විවිධාකාරයේ යුද පුහුණු දුන්නා. අවශ්‍ය වෙලාවට මහල්ලන් පවා කොටි හමුදාවට බඳවා ගැනීමේ -ඔවුන්ගේ ත්‍රස්ත හමුදාවට බඳවා ගැනීමේ- ඒ කටයුත්ත දියත් කළා. අද ඒ අදහසම මේ රට තුළ ක්‍රියාත්මක කරනවා. නීති විරෝධී ලෙස -මේ රටේ පවතින නීතියට එරෙහිව- මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පවා බලහත්කාරයෙන් යුද පුහුණුවකට යොමු කිරීම ඇත්ත වශයෙන්ම එල්ටීටීඊ සංවිධානයේ කොටි මානසිකත්වය අද රට තුළ පවතිනවාය කියන දේ නැවත වතාවක් සනාථ කිරීමක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට රාජපක්ෂ ආණ්ඩුව මුළු රටම හමුදාකරණයට ලක් කර ගෙන යනවා. යුද්ධයේ නිමාවත් සමඟ, අද මේ රටේ හමුදාකරණය ක්‍රියාත්මක වේ ගෙන යනවා. Sir, militarization is gaining rapidly in all sections of society.

ඇත්ත වශයෙන්ම යුද්ධයේ නිමාවත් සමඟම අපේ රණවිරුවන්ට ගිය කල මොකක්ද? එක පැත්තකින් යුද්ධය කරපු ඒ රණවිරුවන් අද නගරයේ කාප්ප කඩන්න, පෝච්චි තියන්න, එළවලු කපන්න, එළවලු විකුණන්න, උත්සව කාලයට කොඩි වැල් එල්ලන්න, එහෙම නැත්නම් වෙසක් කූඩු එල්ලන්න එක පිරිසක් පාවිච්චි කරනවා. අපි දැක්කා ගිය සතියේ අර අවුරුදු 22ක්

[ගරු මංගල සමරවීර මහතා]

පමණ වයසැති නිදහස් වෙළෙඳ කලාපයේ තරුණයාගේ අවමඟුල් උත්සවයේදී අවමඟුල් අධ්‍යක්ෂවරු -funeral directorsලා- හැටියට කටයුතු කළේත් ඒ හමුදාව බව. ඒක අපි මතක් කරන්න ඕනෑ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, point of Order කියලා කරුණාකරලා මගේ වෙලාව කන්න ඉඩ දෙන්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Be very brief, Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේ රට බේරා ගැනීම සඳහා අභීතව සටන් කළ රණවිරුවන්ට අවමාන කරනවා. රණවිරුවන්ට අපහාස කරනවා. ඒක කරන්න එපා කියලා- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
රණවිරුවන්ට අවමාන කරන්නේ අපි නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා, ඔබතුමාගේ කථාව කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
බොහොම ස්තුතියි. රණවිරුවන්ට අවමාන කරන්නේ අපි නොවෙයි. රණවිරුවන්ට අවමාන කරන්නේ ඒ අය ලවා එළවළු විකුණන, ඒ අය ලවා අවමඟුල් අධ්‍යක්ෂකම් කරවන මේ ආණ්ඩුවයි කියන එකයි අපි මේ වෙලාවේ මතක් කරන්නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නමුත් එක්තරා කොටසක් ඒ විධියට තුට්ටු දෙකේ දේවල් කරවන්න රජය පාවිච්චි කරන කොට ගැමුණු බලකායේ සිටින සුපිරි පිරිසක් මේ රටේ සිවිල් පරිපාලනයට ඇඟිලි ගහනවා මිත්‍රවරුනි. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, please sit down.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ රටේ ආදර්ශ හමුදා නගර දැන් නිර්මාණය වෙමින් තිබෙනවා. අන්න ඒ එක ආදර්ශ හමුදා නගරයක් තමයි මම නියෝජනය කරන මාතර නගරය. අද මාතර නගරය පාලනය කරන්නේ දිස්ත්‍රික් ලේකම්තුමා නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද මාතර නීතිය ක්‍රියාත්මක කරන්නේ පොලීසිය නොවෙයි. අද මාතර දේශපාලන බලය තිබෙන්නේ ඒ දිස්ත්‍රික්කයේ නායකවරයා වන සනත් ජයසූරිය මන්ත්‍රීතුමාට නොවෙයි. අද ඒ සියල්ල පවරා තිබෙන්නේ මාතර ගැමුණු හේවා කඳවුරේ කපිතාන් භාරත කොඩිතුවක්කු කියලා කෙනෙකුටයි. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පොඩ්ඩක් ඉන්න, මේ කථා සනත් ජයසූරිය මන්ත්‍රීතුමාගෙන් අහගන්න. පොලීසියෙන් අහගන්න. අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා හිටියා නම් එතුමාගෙනුත් අහන්න පුළුවන්. මෙම කපිතාන්වරයාගේ සහෝදරයා වැඩ කරන්නේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ළඟ කියලා, අද රාජපක්ෂ නමේ බලය අරගෙන, රාජපක්ෂ නම විකුණා ගෙන මාතර නගරය තුළ පුදුම භීෂණයක් ඇති කරලා තිබෙනවා. [බාධා කිරීම්] පසු ගිය මැයි 21වෙනි දා අතිගරු ජනාධිපතිවරයා පෙරහැර බලන්න මාතර ඇවිල්ලා මේ හමුදා කඳවුරේ මේ කියපු පුද්ගලයාත් එක්ක හිටියා අපි දැක්කා. එතුමා ගිහිල්ලා පැය 24ක් යන්න ඉස්සෙල්ලා ඒ රාජ ඌෂ්ණය උපයෝගී කර ගෙන මොකක්ද කළේ? එතුමාගේ ගෝලයන් පිරිසක් කථා කර කර ඉන්න කොට horn එක ගැහුවා කියලා ගිහිල්ලා මාතර දිසා විනිසුරුතුමාට ගැහුවා. මෙන්න මේ වාගේ මහා භීෂණයක් දැන් නොවෙයි පටන් ගත්තේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට මතකයි, පසු ගිය ජනාධිපතිවරණයේ ඉඳලා අපේ මැතිවරණ කාර්යාල කඩන්න, අපේ පාක්ෂිකයන්ට, ක්‍රියාකාරීන්ට වෙඩි තියන්න, ඒ අයගේ ගෙවල්වලට වෙඩි තියන්න මේ පුද්ගලයා තමයි- [බාධා කිරීම්]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මංගල සමරවීර මහතා අපිත් එක්ක ඉතාම සමීපව කටයුතු කරපු-

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඉතින් ඒක point of Order එකක් නොවෙයි නේ.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඉන්න, ඉන්න Order එක තිබෙනවා. වෙඩි තියන්න, ගහන්න, කඩන්න -ඒ කාලයේ යූඑන්පී එකේ ඒවා- අපට ඉගැන්වූයේ මෙතුමාම තමයි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම නම් මෙතුමා ආශ්‍රය කරලාම නැහැ. අනික් එක, මාතර දිස්ත්‍රික්කයේ මමත් එක්ක වැඩ කරපු යූඑන්පී එකේ අයත් දන්නවා මම වෙඩි තියපු, ගහපු, අත පය කඩපු දේශපාලනය කවදාවත් කළේ නැහැ කියලා. ඒක නිසා ඒ ගැන කථා කරලා කරුණාකරලා මගේ වෙලාව නාස්ති කරන්න එපා. නමුත් මෙන්න මේ පුද්ගලයාට එරෙහිව අපි පොලීසියට පැමිණිලි විශාල ප්‍රමාණයක් දැම්මා. නමුත් එක පැමිණිල්ලක්වත් විභාග කරන්න පොලීසිය බයයි.

ඒ විතරක් නොවෙයි, මීට මාසයකට පෙර භාරතගේ ගෝලයෝ මාතර ප්‍රධාන බස් නැවතුම් පොළේ තිබෙන පොලිස් මුර පොළේ පොලිස් නිලධාරීන්ට මහජනතාව ඉදිරිපිට පහර දුන්නා. එම නිලධාරීන්ට මාතර රෝහලේත්, කරාපිටිය රෝහලේත් නේවාසිකව බෙහෙත් ගන්න සිද්ධ වුණා. නමුත් පොලීසියට විරුද්ධ කටයුතු කිරීම ගැන -විපක්ෂයේ අපේ පැමිණිලි ගැන නොවෙයි- DIGටවත්, ASPටවත්, IGPටවත් මොහුට විරුද්ධව කටයුතු කරන්න තරම් හයියක්, ශක්තියක් තිබුණේ නැහැ. මේ පුද්ගලයා හැම තිස්සේම කියන ප්‍රසිද්ධ දෙයක් ලු, "ජනාධිපතිවරයාට ඇරෙන්න උඹලා ඕනෑම එකෙකුට ගහපන්. මම බලා ගන්නම්" කියන එක. ඒ කියන්නේ, සනත් ජයසූරිය මන්ත්‍රීතුමාට වුණත් මෙවැනි හිතුවක්කාර හමුදා නිලධාරීන්ගෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, මාතර ආදායම් බදු නිලධාරියාට පහර දීම ගැන මේ රටේ විශාල ආන්දෝලනයක් ඇති වුණා. පසු ගිය දා සිදු වුණු පහරදීම්වලට අදාළ චූදිතයන්ට සෙවණ දුන්නේ, ඒ චූදිතයන් හංගා ගෙන හිටියේ කවුද? ආදායම් බදු නිලධාරීන්ට ගහපු චූදිතයන් හංගා ගෙන හිටියේ මේ භාරත කොඩිතුවක්කු. අද මාතර හමුදා කඳවුර මාතරට භීතිය වපුරවන මැරයන්ගේ හා තක්කඩින්ගේ තිප්පොළක් බවට පත් වෙලා තිබෙන බවයි මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**රු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You cannot make charges like that against -

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
That is not a point of Order, Mr. Deputy Speaker. ඒ පමණක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පුද්ගලයා- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is anything contrary to the Standing Orders it will be expunged subsequently.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Hon. Deputy Speaker, if there is anything I have said contrary to the Standing Orders, please go through my speech later and expunge it.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is contrary to the Standing Orders will be expunged.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Exactly. That is fine. Do not take my time off now.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you can continue.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
හමුදාවේ සොල්දාදුවන් යොදා ගෙන කොන්ත්‍රාත් කරන්න පටන් අරන් තිබෙනවා. මම මේ කියන්නේ හමුදාකරණයේ තිබෙන භයානකකමයි. වැඩි අධ්‍යාපනයක් නැති, හමුදා ඇඳුම දා ගත්ත මැරයන්ට බලය දුන්නාම වෙන දේ පෙන්වන්නයි මම මේ ගැන මෙච්චර විස්තරයක් කරන්නේ. අද මාතර ආසනයේ විතරක් නොවෙයි, මාතර දිස්ත්‍රික්කය තුළ විතරක් නොවෙයි මුළු රටම හමුදාකරණය කරා යෑමේ මහා ප්‍රවණතාවක් සහ අවදානමක් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

[ගරු මංගල සමරවීර මහතා]

අන්න ඒ නිසා තමයි මම මේවා කියන්නේ. දැන් බලය යොදා ගෙන ඒ ගොල්ලන් කොන්ත්‍රාත් කරනවා. උදාහරණ වශයෙන් කිව්වොත්, මාතර රෝහලේ නිල නිවාසවලට යන පාර -ෆ්‍රැන්සිස් කන්ඩම්බි මාවත- හැදීමේ කටයුතුවලට මැදිහත් වෙලා ඒ කොන්ත්‍රාත් කරන්නේ හමුදාවේ ඉන්න ඒ මාෆියා කල්ලියයි. ඒ වාගේම ඒ ප්‍රදේශයේ banner ආදිය පවා නිර්මාණය කිරීමට, අච්චු ගහන්නට හමුදාවේ ඒ මාෆියා කල්ලිය විසින් වෙනම කාර්යාල පවත්වා ගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You have a responsibility to substantiate what you say.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Hon. Deputy Speaker, I take full responsibility for every word I am saying. භාරත කොඩිතුවක්කු හරහා ආණ්ඩු පක්ෂයේ ගෝලයන්ට මාතර පොදු දේපොළ කැබලි කර දෙන්න හදනවා. "අපි වෙනුවෙන් අපි" වැඩසටහනට මුවාවෙන් මාතර තානායම පැහැර ගත්තා වාගේම, මාතර බ්‍රෝඩ්වේ සිනමා ශාලාව ඉදිරිපිට නගර සභා ඉඩමත්, බස් නැවතුම් පොළ ළඟ නගර සභා ඉඩමත්, වෙරළ උද්‍යානයත් බෙදා ගන්න හදනවා. ඒ වෙනුවෙන් දකුණු පළාතේ පාලන නිලධාරින්ගේ නිර්දේශ තර්ජනය කරලා බලෙන්ම අර ගන්න උත්සාහ කරන මොහොතකයි මම මේ කථා කරන්නේ. මෙන්න මේ වාගේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ ආණ්ඩුව බලයට ආවේ කොහොමද? තරුණයන්ට රැකියා දෙනවාය කිව්වා. රට සංවර්ධනය කරනවාය කිව්වා. අද මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයට, සනත් ජයසූරිය ක්‍රීඩාංගණයට ගිහිල්ලා බලන්න. රැකියා දෙනවාය කියපු ආණ්ඩුව මේ දවස්වල කැරළි මර්දනය කරන්න පොලිස් පුහුණුවක් දෙනවා. අද වෙන කොට මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේ හා සනත් ජයසූරිය ක්‍රීඩාංගණයේ පොලිස් නිලධාරින් හාර පන්සියකට විශේෂ පුහුණුවක් දෙනවා. රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව පාරට බහින ජනතාව එක සැරේට මරන්නේ නැතුව අත පය කැඩෙන්න ගහන හැටි දැන් පොලිසියට උගන්වනවා. මේක මහා සරඹ සන්දර්ශනයක්. කුලු පොලු අර ගෙන පොලිසිය මහා ඝෝෂාවක් කරමින්, පිට්ටනිය පුරා දුවමින් මිනිසුන්ට ගහන හැටි දැන් පුරුදු වෙනවා.

මේ ආණ්ඩුව දැන් තේරුම් අර ගෙන ඉවරයි මේවා කර ගෙන යන්න පුළුවන් වන්නේ මර්දනයෙන් විතරයි කියලා. මර්දනයෙන් ඉදිරියට ගෙන යන ආණ්ඩුවක් දැන් නිර්මාණය කරමින් සිටිනවා.

අවසාන වශයෙන්, මෙහි පිටුපස සිටින හස්තය කවුද කියලා මා අහනවා. මේ හමුදාකරණය පිටුපස සිටින හස්තය කුමක්ද? මා වග කීමෙන් කියනවා. මේ හමුදාකරණය පිටුපස සිටින්නේ ඇත්ත වශයෙන්ම කිව්වොත් එක්තරා American හස්තයක්. එක්දහස් නවසිය පණස් ගණන්වල මාලන් බ්‍රැන්ඩෝගේ හොඳ film එකක් තිබුණා, "The Ugly American" කියලා. අද ලංකාවේ මේ හස්තයත් එවැනි Ugly American කෙනෙක්; American පුරවැසියෙක්. ප්‍රභාකරන් වාගේම විකෘති චෙච්ච මොළයක් තියෙන කෙනෙක්. ප්‍රභාකරන් එදා මිනීකන කොටියෙක් හැදුවා වාගේ අද මේ ඇමෙරිකන්කාරයා තමන්ගේ නිල නිවාසයේ මිනී කන මෝරුන් හතරක් ඇති කරනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරමින්, මේ ඒකාධිපති හස්තයට විරුද්ධව අපි සියලු දෙනාම ඉදිරියේදී ඒකරාශි වන්න ඕනෑය කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The next speaker is Hon. Chandrakumar Murugesu. You have ten minutes.

[பி.ப. 5.00]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இலங்கைத் தீவின் அரசியலானது புதியதொரு பாதையில் பயணிக்க வேண்டிய காலப்பகுதியில் இந்தச் சபையிலே அரவசரகாலச் சட்ட நீடிப்புத் தொடர்பாக என்னுடைய உரையை நிகழ்த்துகின்றேன். நாட்டை அச்சுறுத்திய காரணிகளுக்காக ஏறக்குறைய இருபது ஆண்டுகளுக்கு முன்னர் கொண்டுவரப்பட்ட அவசரகாலச் சட்டத்தை நீக்குவது பற்றி இன்று நாங்கள் எல்லோரும் சிந்திக்க வேண்டிய ஒரு காலகட்டம் உருவாகியுள்ளது. போர் முடிவுக்கு வந்திருப்பதே இப்படி நாம் சிந்திக்கக்கூடிய ஒரு நிலையைத் தந்துள்ளது. இது மகிழ்ச்சிகரமான ஒரு விடயமாகும். இப்பொழுது போர் முடிவடைந்ததால் அமைதிச் சூழல் ஒன்று உருவாக்கப்பட்டுள்ளது. முன்னரைவிடவும் சுதந்திரமாகச் சிந்திக்கக்கூடிய, சுதந்திரமாகச் செயற்படக்கூடிய ஒரு நிலை இன்று உருவாகியுள்ளது. தமிழரசுக் கட்சியினர்கூட யாருக்கும் பயமின்றி இப்பொழுது சுதந்திரமாகக் கருத்துத் தெரிவித்து வருகின்றனர். ஆனால் 2009ஆம் ஆண்டுக்கு முன்னர் அவர்களால் அப்படிச் சிந்திக்கவும் செயற்படவும் முடியவில்லை. ஆகவே, இந்த அமைதிச் சூழலை, இந்த ஜனநாயகச் சூழலை மேலும் வளர்த்தெடுத்து அதை நிரந்தரமாக்குவதே இன்று எங்கள் முன்னேயுள்ள முக்கிய பணியாகும். இதை அனைவரும் உணர்ந்து கொள்ள வேண்டும்.

இதுவரையில் நடைபெற்ற போரில் எண்ணற்ற உயிர்கள் பலியாகியிருக்கின்றன. இந்த உயிர்களைப் பலி கொடுத்தே நாம் இன்று அமைதியைப் பெற்றிருக்கின்றோம். மாபெரும் உயிர்த் தியாகங்களின் மூலமே இந்த அமைதி எமக்குக் கிடைத்திருக்கின்றது. அதாவது மிகவும் துயரம் நிறைந்த ஒரு காலத்தில் நாங்கள் அனைவரும் கடந்து வந்திருக்கின்றோம். இதை எவரும் மறந்துவிடக்கூடாது. அதேவேளை எந்தக் காரணம் கொண்டும் இனிமேல் மீண்டுமோர் இருண்ட காலத்துக்குள் நாம் பயணிக்க முடியாது. அப்படியானதொரு காலத்தை உருவாக்கும் வகையில் எவரும் அரசியல் நடவடிக்கைகளில் ஈடுபட்டால், அதை இந்த நாடு அனுமதித்தால், மக்கள் அத்தகைய அரசியல் போக்கை ஆதரித்தால், அதற்குரிய தண்டனையையும் நாங்கள் அனைவருமே அனுபவிக்க வேண்டியிருக்கும். எங்களைப் பொறுத்தவரை இந்த நாட்டின் அரசியலானது இனி முற்றிலும் புதிய பாதையில் பயணிக்க வேண்டும் என்றே விரும்புகின்றோம். அந்தப் பாதையானது மக்களுக்கு விமோசனத்தைத் தரக்கூடியதாக இருக்க வேண்டும், நாட்டின் அமைதியை நிரந்தரமாக்க வேண்டும், நிரந்தரமான ஐக்கியத்தையும் சமாதானத்தையும் தர வேண்டும். இதுவே எங்களுடைய விருப்பமாகும். இந்த விருப்பத்தையே மக்களும் கொண்டிருக்கின்றார்கள். மக்களுடைய விருப்பங்களையே நாங்கள் அரசியல் தெரிவாகக் கொண்டிருக்கின்றோம். இத்தகைய அடிப்படையைக்கொண்ட அரசியலையே இந்த நாட்டின் ஏனைய அரசியலாளர்களும் முன்னெடுக்க வேண்டும் என்று நான் கேட்கின்றேன். தயவுசெய்து மக்களுக்கு அப்பாலான அரசியலை யாரும் முன்னெடுக்காதீர்கள்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெவ்வேறு அரசியல் கொள்கையுடையவர்களை இந்த மன்று கொண்டிருந்தாலும் இந்த மன்றானது மக்களுக்காக, மக்களுடைய நலன்களுக்காக, மக்களுடைய எதிர்காலத்துக்காகவே இயங்கி வருகின்றது. அத்துடன் அது நாட்டின் பாதுகாப்புக்கும் சுபிட்சத்துக்குமாகவே இயங்குகின்றது என்பதையும் நாம் உணர்ந்து கொள்ள வேண்டும். ஆகவே, நாம் இந்த மன்றின் நோக்கத்தைப் புரிந்துகொண்டு, கசப்பான கடந்த காலத்தை உணர்ந்துகொண்டு, எதிர்காலத்துக்காகச் சிந்திப்போம் எனக் கேட்டுக் கொள்கின்றேன். அப்பொழுதுதான் அவசரகாலச் சட்டத்தை நீக்குவதைப் பற்றிய சரியான தீர்மானத்துக்கு நாம் வர முடியும். அதுமட்டுமல்ல, அரசியல் தீர்வை எட்டுவதும் நிரந்தர அமைதியை அடைவதும் அப்பொழுதுதான் சாத்தியமாகும். எனவே, இது குறித்து நாம் அனைவரும் தீர்க்கமாகச் சிந்திக்க வேண்டும் என்று கேட்டுக்கொண்டு, இன்னும் சில விடயங்களை இந்த மன்றின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கடந்த சில நாட்களுக்கு முன்னர் மேதகு ஜனாதிபதி அவர்கள் வடக்கிலே கிளிநொச்சிப் பகுதிக்கு வந்திருந்தபோது வடக்கின் பொறியியற் பீடமும் விவசாய பீடமும் கிளிநொச்சியிலே அமையும் என்று அறிவித்திருந்தார். இந்தச் செய்தி வன்னிப் பிரதேச மக்களிடத்திலே அளவற்ற மகிழ்ச்சியைக் கொடுத்துள்ளது. நீண்ட காலமாக வட பகுதி மக்கள் மனதில் இருந்த பொறியியற் பீடம் பற்றிய ஏக்கங்களுக்கு இன்று ஒரு வடிவம் பிறந்திருக்கின்றது. எமது அமைச்சர் கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் பொறியியல் பீடத்தையும் விவசாயப் பீடத்தையும் கிளிநொச்சியிலேயே அமைக்க வேண்டுமென்று கேட்டுக் கொண்டதற்கிணங்க இந்தத் தீர்மானத்தை ஜனாதிபதி அவர்கள் அறிவித்துள்ளார். இதை நாம் மகிழ்ச்சியுடன் வரவேற்கின்றோம். நாட்டின் அபிவிருத்தியும் முன்னேற்றமும் வளப்பகிர்வும் சமநிலைப்படுத்தப்படும் என்ற செய்தியை உறுதிப்படுத்துகின்றது இந்தத் தீர்மானம். இன்று வட பகுதியிலே பல முன்னேற்றகரமான விடயங்கள் செயற்படுத்தப்படுகின்றன. வடக்கிலே எண்பது வீதமான பகுதிகளில் மீள்குடியேற்றம் நடைபெற்றுள்ளது. பலரும் நம்பவே மறுத்த வலிகாமம் வடக்குப் பகுதியில் இன்று மக்கள் மீள்குடியேறி இருப்பது முக்கியமானது. ஆனால், எஞ்சிய இருபது சதவீதமான பகுதிகளைச் சேர்ந்த மக்கள், எப்பொழுது தங்கள் ஊர்களுக்குச் செல்லப்போகின்றோம் என்ற ஏக்கத்தோடு இருக்கின்றார்கள். குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்தின் புதுக்குடியிருப்புப் பிரதேச செயலாளர் பிரிவு மக்களின் மீள்குடியேற்றத்தை நான் இங்கு வலியுறுத்துகின்றேன். ஆகவே, அவர்களுடைய எதிர்பார்ப்பை நிறைவேற்ற வேண்டிய பாரிய பொறுப்பில் நாம் இருக்கின்றோம். இதனைக் காலதாமதமின்றி மிக விரைவில் செயற்படுத்தவேண்டும். எதிர்காலத்தில் உயர் பாதுகாப்பு வலயங்கள் என விசேடமாக எந்தப் பகுதியும் இருக்கமாட்டாது என்று அரசாங்கம் கொள்கை அளவில் அறிவித்திருப்பதை நாம் அனைவரும் வரவேற்கவேண்டும். நாம் ஏனைய பிரதேசங்களிலும் மீள்குடியேற்ற நடவடிக்கைகளைப் பூரணப்படுத்தும்பொழுது, அப்பிரதேசங்களிலுள்ள உயர் பாதுகாப்பு வலயங்களும் இல்லாமல் போய்விடுவதோடு, மீள்குடியேற்றம் பற்றிய பிரச்சினையும் தீர்ந்துவிடும்.

அடுத்ததாக, அண்மையில் கிளிநொச்சி மாவட்டத்தின் கல்லாறுப் பகுதியிலுள்ள மீனவர்கள் தமது தொழிலை மீண்டும் ஆரம்பித்துள்ளனர். இதற்கான சூழலை உருவாக்குவதற்கு எமக்கு ஒத்துழைப்பு வழங்கிய கண்ணிவெடி அகற்றும் பணியாளர்கள் மற்றும் பாதுகாப்புத் தரப்பினர் உள்ளிட்ட அனைவருக்கும் அந்த மக்களின் சார்பாக இந்த மன்றில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அவ்வாறே, நாம் இரணைமடுக் குளத்தில் நன்னீர் மீன்பிடிப்பதற்கான சூழலையும் உருவாக்க முயற்சிக்கின்றோம். அந்த மீனவர்கள் தமது தொழிலை விரைவில் ஆரம்பிக்கவேண்டும். இப்பொழுது வடக்கின் பல பகுதிகளிலும் பல வகையான அபிவிருத்திப் பணிகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. குளங்கள் புனரமைக்கப்படுகின்றன; வீதிகள் செப்பனிடப்படுகின்றன; பெரும்பாலான மக்கள் மீண்டும் தங்களுடைய சுயதொழில்களை ஆரம்பித்துள்ளனர். இப்பொழுது ஆரம்பமாகியுள்ள சிறுபோகத்தில், கிளிநொச்சி மாவட்டத்தில் மட்டும் 12,600 ஏக்கர் நிலப்பரப்பில் நெல் பயிரிடப்பட்டுள்ளது. அத்துடன் மீன்பிடித் தொழிலும் 90 சதவீதம் நடைபெறுகின்றது; மின்சார விநியோகம் துரிதப்படுத்தப்பட்டுள்ளது. பாலங்கள் புதிதாக நிர்மாணிக்கப்படுகின்றன; திணைக்களக் கட்டிடங்கள் மீளுருவாக்கம் செய்யப்படுகின்றன; பாடசாலைகளும் மருத்துவமனைகளும் திறம்பட நிர்மாணிக்கப்படுகின்றன. அங்கு சீரழிந்த உட்கட்டமைப்புகளைச் சீர்படுத்தும் நடவடிக்கைகள் துரிதகதியில் நடைபெற்றுவருகின்றன. இவ்வாறு உட்கட்டமைப்புகள் சீர்படுத்தப்படும்போது மக்களுக்கான நிருவாக இயந்திரம் தடையின்றி இயங்கத் தொடங்கிவிடும். அதன்பின்னர், இந்த இயந்திரத்தை இயக்குவதற்கான பொறிமுறை மற்றும் அதற்கான ஆளணி பற்றியுமே நாம் சிந்திக்கவேண்டும். உட்கட்டமைப்புக்களை மீளுருவாக்கம் செய்வதன்மூலம் மக்களின் இயங்குதளம் நிர்மாணிக்கப்பட்டுவிடும். அதன்பின்னர் மக்களுக்கான உதவிகளை வழங்குவதும் அவர்களை நிருவகிப்பதுமே எஞ்சிய பணிகளாக இருக்கும். அரசாங்கம் இந்த நோக்கிலேயே பயணிக்கின்றது.

இச்சந்தர்ப்பத்தில் புனர்வாழ்வு நிலையங்களில் இருக்கும் முன்னாள் தமிழீழ விடுதலைப் புலிகள் இயக்க உறுப்பினர்களின் விடுதலையைத் துரிதப்படுத்த முயற்சிக்கின்றோம். ஏற்கெனவே, விடுதலையாகியுள்ள முன்னாள் விடுதலைப் புலிகள் உறுப்பினர்களுடைய தொழில் முயற்சிகளுக்கு அரசாங்கம் உதவ முன்வந்துள்ளது. இந்நேரத்தில் இவர்களுக்கான உதவிகளை ஏனைய தமிழர் அமைப்புக்களும் புலம்பெயர் மக்களும் வழங்க முன்வரவேண்டும். மாறாக, சாக்குப்போக்குகளைச் சொல்லி எவரும் உதவாமல் இருக்கக்கூடாது. ஆனால், சில தமிழ் ஊடகங்களும் சில புலம்பெயர் தமிழர் அமைப்புக்களும் பாதிக்கப்பட்ட மக்களுக்கான உதவிகளைச் செய்வதற்குத் தடையாக இருக்கின்றன. இவை எப்போதும் மக்களுக்கு பொய்யான செய்திகளையே வழங்கிவருகின்றன என்பதை நாம் கவனிக்கவேண்டும். இந்த நாட்டில் மக்கள் அமைதியாக வாழ்வதையோ, அமைதி நீடிப்பதையோ, மக்களுடைய வாழ்க்கையில் முன்னேற்றம் ஏற்படுவதையோ இந்தத் தரப்பினர் விரும்பவில்லை. இந்த ஊடகங்கள் தமிழ் மக்களின் வாழ்க்கைக்கும் அவர்களுடைய அரசியல் எதிர்காலத்துக்கும் எப்பொழுதும் தடையாகவே இருக்கின்றன என்பதை நான் மிகவும் வன்மையாக இங்கே கூறிவைக்க விரும்புகின்றேன். மிகத் தவறான வழிகளில் மக்களை வழிநடத்தும் இந்த ஊடகங்கள் தொடர்பாக மக்கள் மிக அவதானமாக இருக்கவேண்டும். ஏனென்றால், இன்னுமோர் இருண்ட யுகத்துக்குள் மக்களைத் தள்ளிவிடவே இவர்கள் விரும்புகின்றனர். பிரச்சினைகளை மேலும் அதிகரிப்பதே இவர்களுடைய ஊடக அரசியல் வியாபாரத்தின் அடித்தளமாகும். எனவே, இவர்களின் பொறிக்குள் சிக்கி, உங்களுடைய சொந்த உறவுகளுக்கு உதவுகின்ற மிகப் பெரிய பொறுப்பிலிருந்து நீங்கள் தப்பிவிடாதீர்கள்; அத்தகைய தவறுகளுக்கு இடமளிக்காதீர்கள் என்று நான் புலம்பெயர் மக்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

தற்பொழுது, முன்னாள் விடுதலைப் புலிகள் உறுப்பினர்களுக்கு அரசாங்கமே அதிகளவான உதவிகளைச் செய்துவருகின்றது. அவர்கள் தொடர்பில் அரசாங்கம் அதிக கவனம் எடுக்கின்றது என்ற கருத்தை புலம்பெயர் தமிழர்கள் நிச்சயமாக ஏற்றுக்கொள்ள வேண்டும். இந்த உண்மையினை எதிர்காலத்தில் முன்னாள் விடுதலைப் புலிகள் இயக்க உறுப்பினர்களே சொல்லுவார்கள். இயல்பு வாழ்வில் அனைவரையும் இணைப்பதன்மூலமே நிலையான சமாதானத்தையும் நீடித்த அமைதியையும் எட்டமுடியும். இதற்கு அடுத்த கட்டமாக அரசியல் தீர்வு காணப்படவேண்டும். இதனை நோக்கிய செயற்பாட்டிலேயே நாம் எமது அரசியல் செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றோம். முதலில் நல்லவற்றுக்கும், முன்னேற்றத்துக்கு வழியேற்படுத்தும் நடவடிக்கைகளுக்கும் ஆதரவளித்துப் பழக வேண்டும். அடுத்த

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

கட்டமாகவே பிரச்சினைகளைப் பற்றியும் தடையாக இருப்பவற்றைப் பற்றியும் நாம் சிந்திக்க வேண்டும். நாங்கள் மக்களின் துயரங்களைத் தீர்ப்பதற்கான செயற்பாட்டை முன்னெடுத்து வருகின்றோம். எமது செயற்பாட்டை மக்கள் தெளிவாகவே புரிந்து வருகின்றார்கள். அத்தோடு நடைமுறைக்குச் சாத்தியமான ஒரு தீர்வை நோக்கி மக்களையும் அரசாங்கத்தையும் தயார்ப்படுத்திவருகின்றோம். இதுதான் இன்றைய அரசியற் செயற்பாடாக இருக்கமுடியுமென நான் ஆழமாக நம்புகின்றேன். இந்த நாட்டில் அமைதியையும் சமாதானத்தையும் அபிவிருத்தியையும் ஏற்படுத்துவதில் நாங்கள் முன்னிலைப் பங்களிப்பாளர்களாக விளங்க வேண்டுமென்பதே எங்களுடைய விருப்பமாகும். இதை இந்த மன்றிலே வெளிப்படுத்துவதில் பெருமிதமடைகிறேன். இந்த மன்றிலே உள்ளவர்கள் இதைப் புரிந்துகொள்ள வேண்டும். இயல்பு நிலையின் வளர்ச்சி என்பது, தடையற்ற தொழில் முயற்சிகளுக்கு இடமளிப்பதாக இருக்க வேண்டும். அத்துடன் சுதந்திரமான செயற்பாடுகளுக்கும் சொந்த இடத்தில் வாழ்வதற்கும் இடமளிப்பதாக அமைய வேண்டும். ஏறக்குறைய இத்தகைய நிலையை நோக்கிய வளர்ச்சி இலங்கை முழுவதிலும் ஏற்பட்டு வருகின்றது. ஆனாலும் வடக்கு, கிழக்கில் இன்னும் போதாக்குறை நிலைகள் காணப்படுகின்றனவென்பதையும் இந்த மன்றிலே கவனப்படுத்துவது எனது கடமையாகும். மீள்குடியேற்றத்தின் பின்னரும் மக்களின் வாழ்க்கையில் பல பிரச்சினைகள் இருக்கின்றன. அவர்களுக்கான இழப்பீடுகள் வழங்கப்பட வேண்டியுள்ளது. வீடமைப்புத் திட்டம் முழுமைப்படுத்தப்பட வேண்டியிருக்கின்றது. இவை இரண்டும் போர் நடைபெற்ற பிரதேசங்களில் இன்று மிக முக்கிய பணிகளாக உள்ளன. போரினால் பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கும் அந்த மக்களுக்கும் உதவ விசேட செயற்றிட்டம் நடைமுறைப்படுத்தப்படுவது உலகப் பொது வழமையாகும். அப்படியான ஒரு விசேட திட்டத்தின் மூலமே பாதிக்கப்பட்ட மக்களை மீள்நிலைப்படுத்திச் சமநிலைக்குக் கொண்டுவர முடியும். இதேவேளை போர் நடந்த வடக்கு, கிழக்கு மாகாணங்களில் ஒரு தொகுதி மக்கள் எல்லா வழிகளிலும் பாதிக்கப்பட்டு நிர்க்கதி நிலையில் வாழ்கின்றனர். இவர்களுக்கும் விசேட திட்டமொன்று உருவாக்கப்பட்டு அவர்களுடைய வாழ்க்கையையும் மேம்படுத்துவது அவசியமாகும்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Please wind up, Hon. Member.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar )
Please, give me one more minute, Sir.

பற்றாக்குறைகள் இருந்தாலும் மக்கள் மிக வேகமாக தமது வாழ்க்கைத்தரத்தை உயர்த்தி வருகிறார்கள். இதற்கு மீள்குடியேறிய மக்களின் பகுதிகளில் ஏற்பட்டிருக்கும் மாற்றங்கள் ஆதாரமானவை. இதைச் சமனிலையான பார்வையோடு அணுக வேண்டும். ஆனால், இந்த மாற்றங்களையும் முன்னேற்றங்களையும் பலர் மறைக்க முற்படுகின்றனர். மீள்குடியேற்றம் நடைபெறத் தொடங்கிய காலத்திலிருந்தே அந்த மக்களுடன் ஒருவனாக வாழ்கின்றவன் என்பதால் அந்த மக்களின் சிரமங்களை நான் நன்றாக அறிவேன். அவர்களுடைய உழைப்பையும் நம்பிக்கையையும் நான் மதிக்கின்றேன். அதனை நாம் அனைவரும் பாராட்ட வேண்டும். அத்துடன் அந்த மக்கள் அரசாங்கத்தின்மீது நம்பிக்கை வைத்தே தங்களுடைய வாழ்க்கையை மேற்கொண்டு வருகிறார்கள். தங்கள் வீடுகளில் இருந்தவாறே அவர்கள் அபிவிருத்திச் செயற்பாடுகளை முன்னெடுக்கிறார்கள். இந்தச் சந்தர்ப்பத்தில் அரசாங்கம் போதிய உதவிகளைச் செய்ய வேண்டும். அதன்மூலம் அந்த மக்களுக்கு மேலும் உற்சாகத்தை வழங்க முடியும். அபிவிருத்திக்காகவும் அமைதிக்காகவும் அரசியற் தீர்வுக்காகவும் நாம் எல்லோரும் ஒன்றுபட்டு உழைக்கும்போது நாட்டை அச்சுறுத்தும் காரணிகளும் நிச்சயமாக இல்லாமற் போய்விடும். அப்போது அவசரகாலச் சட்டத்துக்கு - இந்தச் சட்டத்தை நீடிப்பதற்கு - இடமேயிருக்காது. அதைவிடுத்து, வெறும் வாய்ப்பேச்சினால் எந்தப் பயனும் கிட்டப் போவதில்லை. மக்களைத் தவறாக வழிநடத்துவதால் மீண்டும் இந்த நாட்டிலே அமைதியின்மையைத்தான் உருவாக்க முடியும். தொடர்ந்தும் பாராளுமன்ற உறுப்பினர்களாவதற்காகவே சிலர் அரசியல் செய்கிறார்கள். அவ்வாறன்றி, மக்களுடைய நலன்களுக்காகவும் அவர்களுடைய உறுதியான எதிர்காலத்துக்காகவுமே எவரும் தமது அரசியற் செயற்பாடுகளை முன்னெடுக்க வேண்டுமென்பதை இங்கே வலியுறுத்திக் கேட்டுக்கொண்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

[අ. භා. 5.13 ]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය තවත් මසකින් දීර්ඝ කිරීමේ විවාදයට සම්බන්ධ වෙලා අදහස් දක්වන්නට ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

හදිසි නීතියේ තිබුණු බොහෝ රෙගුලාසි කෙමෙන් කෙමෙන් අයින් කර ගෙන හදිසි නීතියක් නැති සාමාන්‍ය නීතියක් යටතේ රට පාලනය කරන දිසාවට රට අරගෙන යමින් තිබෙන වෙලාවක තමයි හදිසි නීතියේ ඉතුරු වෙලා තිබෙන අණපනත් පිළිබඳව අද සාකච්ඡාවට බඳුන් කරන්නේ. මේ විවාදයේදී හදිසි නීතිය පිළිබඳව කාරණා කටයුතු ගැන කථා කරන්න සැලසුම් කර ගෙන සිටියත් හැම දාම වනවා වාගේ විවාදය තුළ මතු වන කාරණාවලට පිළිතුරු නොදී ඒ කාරණාවලට යෑම යෝග්‍ය නැහැ කියා මා කල්පනා කරනවා.

විශේෂයෙන්ම මට කලින් කථා කරපු හිටපු මංගල සමරවීර ඇමතිතුමාගෙන් පටන් ගැනීම යෝග්‍යයි කියා මා කල්පනා කරනවා. ඒ, එතුමා මගේ පැරණි මිත්‍රයා නිසායි. විරුද්ධ පක්ෂයේ ඉන්න සියලු දෙනාටම වඩා වැඩියෙන්ම එතුමා ආශ්‍රය කරපු කෙනෙක් තෝරනවා නම් ඒ මම. ඒ නිසා එතුමාගෙන්ම පටන් ගත්තොත් හොඳයි කියා මා කල්පනා කරනවා. කාටවත් නොතේරුණාට එතුමා කථාව පටන් ගත්තෙම මෙන්න මෙහෙමයි. යුද්ධය පවත්වාගෙන ගිය ආකාරය ගැන ගැටලු තිබෙන මා වැනි කෙනෙක් පවා-[බාධා කිරීමක්] ඒ කියන්නේ ඔබතුමායි රනිල් වික්‍රමසිංහ මහත්මයායි තරම් ළඟින් ආශ්‍රය කළේ නැහැ. [බාධා කිරීමක්] එතුමා කථාව පටන් ගත්තේ, යුද්ධය පවත්වාගෙන ගිය ආකාරය පිළිබඳව ගැටලු තිබෙන මා වාගේ කෙනෙක් කියායි. එතුමා නොකියා කිව්වේ "යුද්ධය පවත්වාගෙන ගිය විධියට මා කැමැති නැහැ. මේ යුද්ධයෙන් ත්‍රස්තවාදීන් පරාජය කිරීම පිළිබඳව මට ගැටලු තිබෙනවා." කියලායි. මා එතුමාගේම වචන තමයි පාවිච්චි කරන්නේ. එතුමා පටන් ගත්තේම එතැනින්. එතුමා එතැනින් පටන් ගෙන මදක් දුර කථා කර ගෙන යනකොට කිව්වා, "දැන් ශ්‍රී ලංකාව නව අඳුරු යුගයකට පා තබා තිබෙනවා" කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන නව අඳුරු යුගය මොකක්ද? එතුමාට, කොළඹ ඇවිත් අහසින් බෝම්බ දමන්නේ නැති එක අඳුරුයි. එතුමාට, ලංකාවේ තැන් තැන්වල බෝම්බ පිපිරෙන්නේ නැති එක අඳුරුයි. එතුමාට, උදේට පුතාව බස් එකේ ඉස්කෝලෙට අරගෙන ගිහින්, දුව කෝච්චියේ ඉස්කෝලෙට අරගෙන ගිහින් දෙමවුපියන් විසින් ඉස්කෝල මුර

කරන කාලය නැති වුණු එක අඳුරුයි. එතුමාට, මේ රටේ සිංහල දෙමළ මුස්ලිම් මිනිසුන්ට නිදහසේ පේදුරු තුඩුවේ ඉඳලා දෙවුන්දර තුඩුව දක්වාම ගමන් බිමන් යාමට තිබෙන නිදහස අඳුරුයි. මේකද අඳුරු යුගය?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුස්මාන් වෙන වචනවලින් කියන්නෙත් මේකම නේද? මේ කථා කළේ මංගල සමරවීර මැතිතුමාද විකල්ප දරුස්මාන්ද? මෙන්න අඳුරු යුගය. එතුමා කියනවා "මේ යුගය අඳුරුයි" කියලා. එතකොට බෝම්බ ගහපු යුගය හොඳයි. මේ යුගයේ අඳුරු කොටසක් ඉන්නවා. ඒ අය දැන් වැඩිපුර ඉන්නේ ලංකාවේ නොවෙයි. එල්ටීටීඊ ඩයස්පෝරාවට නම් මේ යුගය අඳුරුයි. මා කැමැති නැහැ, "දෙමළ ඩයස්පෝරාව" කියන වචනය කියන්නවත්. මොකද, දෙමළ මිනිසුන් නොවෙයි. එල්ටීටීඊ ඩයස්පෝරාවට විතරයි මේ යුගය අඳුරු. දෙමළ ඩයස්පෝරාවට මේ යුගය අඳුරු නැහැ. ඒ මිනිසුන් කැමැතියි ප්‍රභාකරන්ගේ පරාජයෙන් පසු සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන් එකට අත් වැල් බැඳ ගෙන යන්න. ඒ මිනිසුන් ඒකට අකැමැති නැහැ. ස්වාමිනාදන් මන්ත්‍රීතුමන්ලා අකැමැති නැහැ, එකට අත් වැල් බැඳ ගෙන යන්න. ඒ නිසා ස්වාමිනාදන් මන්ත්‍රීතුමන්ලා එල්ටීටීඊ ඩයස්පෝරාවට දමන්න එපා. හැබැයි, එල්ටීටීඊ ඩයස් පෝරාවට නම් මේක නව අඳුරු යුගයක් තමයි. ඇයි? තමන්ට හිතුමතයට උතුරු පළාත පාලනය කරන්න බැහැ. තමන්ට හිතුමතයට කප්පම් ගන්න බැහැ. තමන්ගේ හිතුමතයට ගිහිල්ලා කොල්ලෙක් කෙල්ලෙක් අරගෙන ඒ කෙල්ලගේ කරේ තිබුණු ඉස්කෝල බෑග් එක පැත්තකට දමා බයිනෙත්තුව එල්ලන්න බැහැ; සයනයිඩ් කරල බෙල්ලේ එල්ලන්න බැහැ. ඒ නිසා එල්ටීටීඊ ඩයස්පෝරාවට නම් මේ යුගය අඳුරුයි. ඒ එල්ටීටීඊ ඩයස්පෝරාවට අඳුරු වූ යුගයම මංගල සමරවීර මන්ත්‍රීතුමාටත් අඳුරුයි. එතුමා අද මේ පාර්ලිමේන්තුවේදී ඒක කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මංගල සමරවීර මන්ත්‍රීතුමා කථා කරනකොට මම හිතුවා මේ කථා කරන්නේ මංගල සමරවීර මන්ත්‍රීතුමාද එහෙම නැත්නම් දරුස්මාන්ද කියා. දරුස්මාන් කියන්නෙත් මේකම නේද? දරුස්මානුත් එල්ටීටීඊ එකේ කරපුවා ගැන වාක්‍ය තුනක් විතර කියලා මුළු වාර්තාවෙම කියන්නේ ආණ්ඩුවට එරෙහිව ඇඟිල්ල දික් කරලා අඳුරුයි අඳුරුයි කියා. මේ කථා කළේ විකල්ප දරුස්මාන් ද, මේ කථා කළේ දරුස්මාන්ගේ දිෂ්ටිය ද කියා මට මේ අවස්ථාවේදී අහන්නට සිද්ධ වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතුමා තව කථාවක් කිව්වා. එතුමා කිව්වා, "මේ රට කෙමෙන් කෙමෙන් හමුදාකරණය වෙගෙන යනවා"ය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මිනිස්සු ලක්ෂ දහඅටකට වැඩි ඡන්ද ප්‍රමාණයකින් මේ රට හමුදාකරණය වීම නැවැත්වූවා. ගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරලා, ඒක නැවැත්වූවා. ජනාධිපතිතුමා ලක්ෂ දහඅටකින් නොවෙයි, ලක්ෂයකින් දෙකකින් විතර දිනලා තිබුණා නම් ඒත් ජනාධිපතිතුමාට ජනාධිපති පුටුවේ වාඩි වෙන්න දෙන්නේ නැතිව හමුදාකරණය සහිත වෙච්ච මිනීමරු ආණ්ඩුවක් ගේන්න සැලසුම් කළේ කවුද? ඒ සැලසුම් කළේත් මංගල සමරවීර මන්ත්‍රීතුමන්ලා නොවෙයි ද? එතුමා හමුදාකරණය ගැන වරින් වර, වරින් වර කිව්වා. වචන දහයක් කිව්වා නම් අටක්ම කිව්වේ "හමුදාකරණය" කියන වචනය. හමුදාකරණය පිළිබඳව සිහින මවමින් හමුදා ආණ්ඩුවක් ගෙනැල්ලා, හමුදා පාලකයෙක් ගෙනැල්ලා, - බිත්තර ආප්පය හදනකොට, ඒ බිත්තර ආප්පයේ හරි මැදට කහමදය නැත්නම් ඒ බිත්තරයෙන් බිත්තරය හදපු එකාට ගහන මට්ටමේ කෙනෙක්ව ගෙනැල්ලා, කොණ්ඩය කපනකොට දැළි පිහියෙන් පොඩ්ඩක් කණ ළඟ සීරුනාම ඒ දැළි පිහිය අරගෙන කොණ්ඩය කපපු මිනිහාගේ කණෙන් කෑල්ලක් කපන තරමට හමුදාවේ නීතිය ක්‍රියාත්මක කළ මනුෂ්‍යයෙක්ව ගෙනැල්ලා- මේ රට හමුදා පාලනයට ගෙන එන්නට උත්සාහ කළ මංගල සමරවීර මන්ත්‍රීතුමාම තමයි අද "හමුදාකරණය, හමුදාකාරණය, හමුදාකරණය" කියා මන්ත්‍රය වාගේ දොඩවන්නේ. එම නිසා මෙතැන ඉන්න සමහර මන්ත්‍රීතුමන්ලා එතුමාට බාධා කරනකොට මාතර පැත්තේ ඉන්න භාරත කියන හමුදා නිලධාරියාට අපහාස කරනකොට මා පුදුම වුණේ නැහැ. මංගල සමරවීර මන්ත්‍රීතුමාගේ ඉතිහාසය පුරාම කර තිබෙන්නේ ඒක. දැන් ලොකුවට කෑ ගැහුවාට සරත් ෆොන්සේකා මහත්මයා ගැන, "සරත් ෆොන්සේකා මහත්මයා හමුදාපති ධූරයට නොවෙයි ගැලවීමේ හමුදාවේ හමුදාපති ධූරයටවත් සුදුසු නැහැ" කිව්වේ ඔය කටින්ම නේද? ඔය කටින්ම නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මංගල සමරවීර මන්ත්‍රීතුමාගේ සමහර කාරණා පිළිබඳව මට පුදුමයක් නැහැ. හැබැයි මට තිබෙන එකම පුදුමය මෙයයි. එතුමා, අපේ අස්වර් මන්ත්‍රීතුමාගේ බාධා කිරීමකට කිව්වා, එතුමාගේ මුළු දේශපාලනය තුළම කාටවත් එතුමා හිංසා කර නැහැ කියා. ඉතින් ඒක අහන්න ඕනෑ අපෙන් නොවෙයි. හිටපු සාගල රත්නායක මන්ත්‍රීතුමාගෙන්. හිටපු සාගල රත්නායක මන්ත්‍රීතුමා තමයි දෙදාහේ ඡන්දය ඉවර වෙලා මාතර පොලීසියට ගිහින් මංගල සමරවීර ඇතුළු පිරිස එතුමාට පහර දුන්නා; තුවාල වුණා;. වාහනයත් දැම්මා ඇළට කියා මාතර උසාවියේ නඩු කිව්වේ. මියගිය ශ්‍රීපති සූරියාරච්චි මහත්මයා, ඒ වාගේම දැන් මෙතැන ඉඳලා නැඟිට ගිය, ළඟදී ඉතාම හොඳට, නීත්‍යානුකූලව දරුස්මාන් වාර්තාව විශ්ලේෂණය කළ මගේ හිතවත් විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලා තමයි එතුමා වෙනුවෙන් මාතර ගිහින් පෙනී සිටියේ. ඩිලාන් පෙරේරා එහෙම නැත්නම් අපේ මහින්ද යාපා අබේවර්ධන මහත්මයාලා, ලක්ෂ්මන් යාපා මහත්මයාලා දැම්ම පැමිණිල්ලකට නොවෙයි. සාගල රත්නායක; යූඑන්පී එකේ අදත් දෙණියාය ආසනයේ සංවිධායකතුමා. එතුමා පැමිණිල්ලක් දැම්මා, “මංගල සමරවීර මහත්මයා ඇතුළු පිරිස මට පහර දුන්නා, මට තුවාල වුණා. වෙඩි තිබ්බා” කියා මාතර උසාවියේ. එතකොට සාගල කිව්වේ බොරුද? එහෙම නැත්නම් මංගල කියන්නේ බොරුද? දෙකම ඇත්ත වන්නට බැහැ නේ. එක්කෝ සාගල බොරුකාරයා, එහෙම නැත්නම් මංගල බොරුකාරයා. හැබැයි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මෙතැන හිටියා නම් එතුමා හරියටම කියාවි කවුද බොරුකාරයා කියා.

බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේම කියා තිබෙනවා, එතුමාගේ ඡන්ද කාලයේ එතුමාගේ මනාප අංකය වෙනස් කර, ඒකට වෙන මූනත් තහඩුවක් ගහගෙන මනාප මං කොල්ලයක යෙදුණු හාදයකුත් මාතර දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලුවාය කියා. ඒ කිව්වෙත් අපි නොවෙයි. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සජිත් ප්‍රේමදාස මහත්තයාත් එක්ක හැම තැනම යන බුද්ධික පතිරණ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාමයි මේ ගෞරවණීය සභා ගර්භයේදී ඒ කථාව කිව්වේ. ඒ නිසා මංගල සමරවීර මහත්තයාට අද වෙලා තිබෙන්නේ මොකක්ද? මංගල සමරවීර එදිරිව මංගල සමරවීර. මංගල සමරවීරට එදිරිව කථා කරන්නේ පරණ මංගල සමරවීර. පරණ මංගල සමරවීරට එදිරිව කථා කරන්නේ අලුත් මංගල සමරවීර. මම හිතුවේ වෙනදා කරනවා වගේ අදත් කොහේ හරි තානාපති කාර්යාලයකින් ඉංග්‍රීසි භාෂාවෙන් ලියලා දෙන එකක් අරගෙන ඇවිල්ලා ඉංග්‍රීසියෙන් බුරලා ඒ වාර්තාවේ පිටපත් දරුස්මාන්ලාට අරින්න කටයුතු කරයි කියායි. එතුමා අද ඒකෙන් පොඩ්ඩක් ඈත් වෙලා වෙන කථාවක් කළේ. හැබැයි ඒ කථාව තුළත් ගම්‍යමාන වුණේ, කියැවුණේ දරුස්මාන්ලා කියන එකමයි. එල්ටීටීඊ ඩයස්පෝරාව කියන එකමයි මෙතැන ගම්‍යමාන වුණේ. එතුමා කිව්වා, මේ ආණ්ඩුවට ප්‍රභාකරන්ගේ දිෂ්ටිය වැහිලා කියා එතුමා මාතර ගිය වෙලාවේ කපුවෙක් කිව්වාය කියලා. අනේ! මංගල සමරවීර මන්ත්‍රීතුමා තමයි ප්‍රභාකරන්ගේ දිෂ්ටිය වැහිලා වාගේ මේ සභාවේ කථා කළේ. ඇයි? ප්‍රභාකරන්ගේ අනුගාමිකයන්ට තමයි අද මේ යුගය අඳුරු. ප්‍රභාකරන්ගේ අනුගාමිකයන්ට අද නැඟිටින්නට බැහැ. ප්‍රභාකරන්ගේ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

අනුගාමිකයන්ට අද හිස ඔසවන්න බැහැ. පසු ගිය පළාත් පාලන මැතිවරණය ගත්තාම අද ඒ ඒ දිස්ත්‍රික්කවල දෙමළ ජනතාව ජීවත් වන ප්‍රදේශවල පවා ප්‍රභාකරන්ගේ අනුගාමිකයන් වෙනුවට අලුත් දෙමළ නායකයෝ බිහි වෙනවා. ප්‍රභාකරන්ගේ යකඩ සපත්තුවට බය වෙලා හිටපු මධ්‍යස්ථ මතධාරි දේශපාලනඥයෝ අද එළියට ඇවිල්ලා කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා අද TNA සංවිධානයට පවා නිදහසේ තමන්ගේ දේශපාලනය කරන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ නිසා අද ප්‍රභාකරන්ගේ දිෂ්ටිය වැහිලා වගේ කථා කළේ වෙනත් කවුරුන් හෝ නොවෙයි, මංගල සමරවීරමයි. ඒ නිසා අර කපුවා ඒ කථාව සමහර විට මංගල සමරවීර මහත්තයාගේ ඇස් දෙක දිහා බලා ගෙන කියන්නට ඇති. මොකද, කපුවා ගමේ ඉන්න නිසා. කපුවා මංගල මහත්තයා වගේ මාස 6කට වරක් මාතරට ගිහිල්ලා කොළඹ එන්නේ නැතිව මාතරම ඉන්න නිසා මාතර මිනිහෙක් හැටියට මංගල සමරවීර මහත්තයාගේ හැසිරීම, කථාව සහ සියල්ල ප්‍රභාකරන්ගේ දිෂ්ටිය වැහිච්ච මිනිහෙක් වගේ කියලා කපුවාට තේරෙන්නට ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය දෙසට අපි පොඩ්ඩක් හැරී බලමු. මංගල සමරවීර මහත්තයා ගැනම මෙහිදී කථා කිරීම වටින්නේ නැහැ. මොකද, දරුස්මාන් වාර්තාව ගැන පසු ගිය මාස ගණනක්ම අපි කථා කළා. ඒ නිසා විකල්ප දරුස්මාන් ගැන මීට වඩා කථා කිරීම යෝග්‍ය වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අද මේ රටේ මිනිස්සු දැන ගත යුතු සත්‍යයක් තිබෙනවා. "බුදු සරණයි" කියලා ඉස්සරහ ගහගෙන ලොරිය ගියාට ඒ ලොරියේ පිටුපස ඉන්නේ හොර හරක් කියලා අපේ පළාත්වල සමහර අය දන්නවා. ඒ වාගේ පෞද්ගලික විශ්‍රාම වැටුප කියලා බෝඩ් එක ගහපු ලොරියේ පිටුපස ආවේ පෞද්ගලික විශ්‍රාම වැටුප් පනතේ තිබුණු යම් යම් විෂමතාවන්, යම් යම් තත්ත්වයන් වෙනස් කිරීමේ ක්‍රියාමාර්ගය නොවෙයි. ඒක පිටුපසින් ආවේ ඉතිහාසය පුරාම විශ්වවිද්‍යාලවල පවා, කම්කරු ක්ෂේත්‍රයේ පවා මිනිස්සු මරලා, මිනිස්සු මරවලා ඒ මළ කඳන් උඩින් දේශපාලනය කිරීමේ පුරුද්ද තිබෙන්නා වූ බංකොලොත් දේශපාලන පක්ෂය කියන එක කවුරුත් දන්නවා. මට කනගාටුව එක්සත් ජාතික පක්ෂයේ සමහර උදවියත් ගිහිල්ලා ඒ බංකොලොත් දේශපාලන පක්ෂයේ නැට්ට අල්ලා ගෙන ඉන්න එක ගැනයි. ඒකට කරන්න දෙයක් නැහැ. සාමාන්‍යයෙන් ඉබ්බා හෙමින් ගියාට ගොළුබෙල්ලාට පෙනෙන්නේ ඉබ්බා හයියෙන් යනවා වගේ නේ. අපට පෙනෙන විධියට ඉබ්බා හෙමින් තමයි යන්නේ. හැබැයි, ඉබ්බා හයියෙන් යනවා කියලා තමයි ගොළුබෙල්ලා හිතන්නේ. ඒ වාගේ තමයි එක්සත් ජාතික පක්ෂයේ තිබෙන භේද වීම් මධ්‍යයේ එක්සත් ජාතික පක්ෂය හිතනවා, අර බංකොලොත් දේශපාලන පක්ෂය හයියෙන් යනවා කියලා. ඒ අය ගිහිල්ලා ඔවුන්ගේ වලිගයේ එල්ලෙනවා. එහෙම කට්ටියත් මම දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා පෞද්ගලික විශ්‍රාම වැටුප පිළිබඳව මතු වුණු කථාවයි, ඊළඟට ස්වාමීන් වහන්සේලා යැයි කියා ගත් පිරිසක් අරලියගහ මන්දිරය ඉස්සරහට ගිහිල්ලා කුණුහරුප කියපු එකයි, දරුස්මාන් වාර්තාවයි, අද අලුතෙන් ඇති වෙලා තිබෙන විශ්වවිද්‍යාලවල ප්‍රශ්න ඇති කිරීමේ සමහර උද්ඝෝෂණ ව්‍යාපාරයි, ඊළඟට ලංකාවේ ප්‍රධානතම මිත්‍රයා වෙච්ච, හැම දාම ලංකාවේ ලොකු අයියා හැටියට නොවෙයි ලොකු අක්කා හැටියට අපත් එක්ක කටයුතු කළ ඉන්දියාව එක්ක මතභේද ඇති කරන්න දරන උත්සාහයයි කියන මේ සියල්ලම හුදකලාව, වෙන් වෙන්ව එන්නා වූ කාරණා නොවෙයි. මේවා එකට බැඳුණු ඒවා. එක දම්වැලක පුරුක් වාගේ. මේ ඔක්කෝම එකතු කර ගෙන මේ එන්නේ මොකාටද? මේ එන්නේ "දරුස්මාන්ලාගේ වාර්තාව හරි"යි කියලා කියන තැනට. අර කුමන්ත්‍රණයට අවශ්‍ය කරන උඩගෙඩි ටික දෙන්න. මේක බළලා මල්ලෙන් එළියට පැනීමක්.

ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයා ගිය සුමානයේ කටුනායක ආයෝජන කලාපයේ සිද්ධිය දිහා බලලා පත්තරයට කියලා තිබුණා "දැන් ඉතින් දරුස්මාන් කියපු එක හරි"යි කියලා. කියන්නත් ඉස්සෙල්ලාම පැන්නා බළලා මල්ලෙන් එළියට. දැන් ඉතින් දරුස්මාන් හරි කියලා කිව්වා. එතුමා මීට ඉස්සෙල්ලා කියලා තිබුණා යුද්ධ කරන්නේත් ගොන්නු කියලා. ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ නිසා මේ එක එක ක්‍රියාවන් හුදකලා සිද්ධීන් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සිද්ධීන් දම්වැලක පුරුක් වාගේ එකට ගෙතී තිබෙන ඒවා. ඒ නිසා මේක දිහා ප්‍රවේශමෙන් බලන්න ඕනෑ. මෙහෙන් මේ දේවල් කරන්නේ අරහෙන් දරුස්මාන්ගේ වාර්තාවේ තිබෙන කාරණා හරි, ඒවා සනාථ කළා කියලා ඔප්පු කරන්න තිබෙන වුවමනාව මතයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රභාකරන් පරාදයි. ත්‍රස්තවාදය පරාදයි. දැන් තිබෙන්නේ අපට රටක් හැටියට අත් වැල් බැඳ ගෙන ඉස්සරහට යන්නයි. ඒකට එක එක විධියට බෙදිලා බැහැ. එක එක පාට කණ්ණාඩි දමා ගෙන බැහැ. දැන් තිබෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන අප සියලු දෙනාම දෙමළ භාෂාව කථා කරන ජනතාවට ඇති වෙලා තිබෙන්නා වූ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සොයා ගැනීම සඳහා අත් වැල් බැඳ ගන්න එකයි. ත්‍රස්තවාදය පරාජය කිරීමේ ශ්‍රී ලාංකේය මොඩලය අපි හැදුවා. අද ඒක තමයි ලෝකයේ ත්‍රස්තවාදය පරාජය කිරීමේ ශ්‍රී ලාංකේය මොඩලය. ඒ නිසා දෙමළ ජනතාවගේ ප්‍රශ්නයටත් දේශපාලන විසඳුමක් ඕනෑ. ඒක Thirteen plus ද, Thirteen plus one ද, Thirteen minus one, plus two ද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපි ඔක්කොම -සිංහල, දෙමළ, මුස්ලිම් ඔක්කොම- සාකච්ඡා කරලා දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්න ඕනෑ. ඒ හරහා පමණයි මේ රටේ කොටි සංවිධානය වාගේ සංවිධාන නැවත නැඟිටින එක වළක්වන්න පුළුවන් වන්නේ. ඒ හරහා පමණයි කොටින්ගේ හොල්මන් වෙච්ච, දරුස්මාන්ගේ දිෂ්ටිය වැහිච්ච මංගල සමරවීර මන්ත්‍රීතුමන්ලා වාගේ උදවිය සහ කුමන්ත්‍රණකාරී නව අධිරාජ්‍යවාදීන් මේ රටට අත පොවන්න දරන උත්සාහය නවත්වන්න පුළුවන් වන්නේ. ඒ කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The next speaker is the Hon. S. Vino. Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[பி.ப. 5.30]

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அவசரகாலச் சட்ட நீடிப்பு விவாதத்திலே பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன். விடுதலைப் புலிகள் என்ற பெயரையோ அல்லது பிரபாகரன் என்ற பெயரையோ உச்சரிக்காமல் இந்தச் சபை அமர்வுகள் நடப்பதில்லையென்றுதான் நான் நினைக்கின்றேன். மூச்சுக்கு ஒரு தடவை பிரபாகரனின் பெயரை உச்சரிக்காமல் இங்கிருக்கின்ற உறுப்பினர்களால் பேச முடியாது; அதேபோல் அண்மைக்காலமாக தருஸ்மன் என்ற பெயரை உச்சரிக்காமலும் இவர்களால் பேச முடியாதுள்ளது. அந்தளவுக்கு எங்களுடைய இனப்பிரச்சினை சர்வதேச மயப்படுத்தப்பட்டிருக்கின்றது. அதற்கு அந்தச் சொற்களின் கனதி மிகவும் முக்கியமான ஒரு காரணமாக இருக்கின்றது. யாழ். மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் சந்திரகுமார் அவர்கள் அங்கு ஜனநாயக சூழ்நிலை உருவாகியிருப்பதாக தன்னுடைய பேச்சிலே கூறியிருந்தார். ஆனால், யாழ்ப்பாணத்திலே அந்த ஜனநாயகச் சூழ்நிலை இருக்கின்றதா? அங்கே எங்களுடைய மாநகர சபை உறுப்பினர்களுக்குத் தொடர்ச்சியாகக் கொலை அச்சுறுத்தல்கள் விடுக்கப்பட்டு வருகின்றன. குறிப்பாக, எங்களுடைய யாழ். மாநகர சபை உறுப்பினர் விந்தன் கனகரத்தினம் என்பவருக்கு பல்வேறு வழிகளிலும் இனந்தெரியாத நபர்களினால் தொடர்ச்சியாக கொலை அச்சுறுத்தல் விடுக்கப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இதுதான் உறுப்பினர் சந்திரகுமார் அவர்கள் கூறிய ஜனநாயகச் சூழ்நிலையா? என்று நான் கேட்க விரும்புகின்றேன். விந்தன் கனகரத்தினம் அவர்கள் யாழ். மாநகர மேயர் மற்றும் ஆளுங்கட்சி உறுப்பினர்கள் செய்கின்ற ஊழல்களைப் பற்றியும் மாநகர சபையின் நிர்வாகச் சீர்கேடுகள், முறைகேடுகளைப் பற்றியும் பகிரங்கமாகச் சபையிலும் அதற்கு வெளியிலும் கூறிவருவதனால், அவர்களுக்கு அதனால் ஏற்பட்டிருக்கும் தாக்கத்தின் காரணமாகவே அவர்மீது கொலை அச்சுறுத்தல் விடுக்கப்படுகின்றது. அங்கு தாம் சிவில் நிருவாகத்தை மேற்கொள்வதாகக் கூறிக்கொள்கின்ற பொலிசாருக்குத் தொடர்ந்தும் அவர்களுக்குப் பாதுகாப்பு வழங்க வேண்டிய பொறுப்பிருக்கின்றது. ஆகவே, மாநகர சபையிலுள்ள எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் தம்மைத் தெரிவுசெய்த மக்களுக்குச் சேவை செய்வதற்காக எவ்வித இடையூறுமின்றித் தமது அரசியல் பணிகளை ஜனநாயக முறையிலே முன்னெடுப்பதற்கு உரிய நடவடிக்கைகளை பொலிசார் மேற்கொள்ள வேண்டும். எனவே, நாட்டின் முப்படைகளின் தளபதியாக இருக்கின்ற மேதகு ஜனாதிபதி அவர்களிடமும் யாழ் மாவட்டப் பிரதான கட்டளைத் தளபதி அவர்களிடமும் பாதுகாப்பு அமைச்சின் செயலாளர் மற்றும் பாதுகாப்பு உயர் அதிகாரிகள் அனைவரிடமும் விந்தன் கனகரத்தினம் உட்பட எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் அனைவருக்கும் உரிய பாதுகாப்பு வழங்கவேண்டுமென நான் பகிரங்கமாக இச்சபையிலே கேட்டுக்கொள்கின்றேன்.

நான் இச்சபையிலே இன்னொரு விடயத்தையும் குறிப்பிட விரும்புகிறேன். நேற்றைய தினம் சில இணையத்தளங்களிலும், நாங்கள் பெரும் மதிப்பும் மரியாதையும் வைத்திருக்கின்ற யாழ். மாவட்டத்தில் வெளியிடப்படுகின்ற 'உதயன்' தினசரிப் பத்திரிகையிலும் வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்களான நானும் சிவசக்தி ஆனந்தன் அவர்களும் மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் சீ. யோகேஸ்வரன் அவர்களும் அரசாங்கத்துடன் இணைந்துகொள்ள இருப்பதாகவும் வடக்கு, கிழக்கில் அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்வதற்காக எங்களுக்கெனக் கோடிக்கணக்கான நிதி ஒதுக்கீடு செய்துதருவதற்கு அரசாங்கம் உடன்பட்டிருக்கின்றது என்றும் செய்திகள் வெளிவந்திருந்ததை நாங்கள் பார்த்தோம். வெளிநாடுகளில் ஒரு கணனியை வைத்துக்கொண்டு தனிநபர் ஒருவரால் இயக்கப்படும் இணையத்தளங்களினூடாக வெளியிடப்படுகின்ற இத்தகைய செய்திகள் தொடர்பாக நாங்கள் அலட்டிக்கொள்ள விரும்பவில்லை. ஆனால், பத்திரிகைத் தர்மத்தைப் பேணிப் பாதுகாக்கும் நடுநிலையான பத்திரிகையாக விளங்குகின்ற 'உதயன்' பத்திரிகை, இத்தகைய செய்தியின் உண்மைத்தன்மையை அறிந்துகொள்ளாமல் இச்செய்தியை வெளியிட்டதையிட்டு நாங்கள் மிகுந்த வேதனைப்படுகின்றோம். இந்தச் செய்தியைப் பிரசுரித்த அப்பத்திரிகை நிறுவனத்துக்கும் இணையத்தளங்களுக்கும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் நாங்கள் மிக வன்மையான கண்டனங்களைத் தெரிவித்துக்கொள்கின்றோம். நாங்கள் மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள். எங்களது ஒவ்வோர் அரசியல் நடவடிக்கையும் நாங்கள் எந்த மக்களினால் தெரிவுசெய்யப்பட்டோமோ, அந்த மக்களின் ஆணைப் பிரகாரமானதாகத்தான் இருக்கும். சில தனிப்பட்ட பத்திரிகையில் வெளியிடப்படுகின்ற இத்தகைய செய்திகளுக்காக நாங்கள் எமது தமிழ் தேசியக் கூட்டமைப்பினுடைய கொள்கைகளிலிருந்து அல்லது தமிழ்த் தேசியத்தின்பால் எங்களுக்கு இருக்கின்ற பற்றிலிருந்து கடுகளவேனும் விலகிச்செல்ல முடியாதென்பதை இந்த ஊடகங்களுக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். கடந்த காலங்களிலே குறிப்பாக 'உதயன்' பத்திரிகையானது, தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் தமிழ் மக்களுக்கும் இடையிலே ஏற்படுத்தியிருந்த அந்நியோன்னியமான உறவையும் எமது அரசியல் நடவடிக்கைகளுக்கு ஆற்றிய பங்களிப்பையும் நாங்கள் என்றும் மறந்துவிடவில்லை. அந்தப் பத்திரிகையையும் அதன் இணைப் பத்திரிகையையும் பக்கச்சார்பின்றி நடுநிலைமையுடன் தமிழ் மக்களுடைய உரிமைக்காகக் குரல் கொடுக்கின்ற, தமிழ் மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளைத் தேசிய மட்டத்திலும் சர்வதேசத்துக்கும் வெளிக்கொணர்கின்ற ஒரு பத்திரிகையாகவே நாங்கள் பார்க்கின்றோம். ஆனால், இப்படிப்பட்ட செய்திகளைத் திடீரென வெளியிட்டமை தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் தமிழ் மக்களுக்கும் இடையில் ஒரு விரிசலை உருவாக்கும் நோக்கத்துடன், குறிப்பாகப் புலம்பெயர்ந்து வாழ்கின்ற எமது தமிழ் மக்களுக்கும் தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் இடையில் விரிசலை உண்டுபண்ணும் நோக்கத்துடன் மேற்கொள்ளப்பட்ட ஒரு சதி முயற்சியாகக்கூட இருக்கலாமென நாம் கருதவேண்டியிருக்கிறது.

அண்மையில் வடக்கு, கிழக்கில் நடைபெற்ற உள்ளூராட்சி தேர்தலின்பொழுது தமிழ்த் தேசியக் கூட்டமைப்பு பாரிய வெற்றியீட்டியதென்பது அனைவரும் அறிந்த விடயம். வட, கிழக்கில் வாழுகின்ற எங்களுடைய தமிழ் மக்கள் அத்தேர்தலில் மிகப் பெரிய வெற்றியை எமது கட்சிக்குத் தந்து, தமிழ் மக்களுடைய அரசியல் சக்தி தமிழ் தேசியக் கூட்டமைப்பே என்பதை நிரூபித்தார்கள். அவ்வாறு இருக்கையில், இவ்வாறான பொய்ச் செய்திகளை இணையத்தளங்களும் சில ஊடகங்களும் வெளியிடுவதன்மூலம் எங்களுக்குள்ளே விரிசல்களையும் ஒரு பரபரப்பான சூழலையும் உருவாக்க முயற்சிக்கின்றன. ஆகவே, இவ்வாறானதொரு சூழலை உருவாக்க முயற்சிக்கின்ற இவ்வேளையில், நாங்கள் அச்செய்தியை முற்றாக மறுக்கின்றோம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு ஒதுக்கப்பட்டுள்ள நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එස්ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 17 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருப்பதாக அறிகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

உங்களுக்கு ஒதுக்கப்பட்டிருந்த நேரம் குறைக்கப்பட்டுள்ளது. ஏனெனில், ஆரம்பத்தில் 35 நிமிடங்களை உறுப்பினர்கள் மேலதிகமாக எடுத்துவிட்டார்கள். அதன்காரணமாக ஒவ்வொரு உறுப்பினருக்கும் ஒதுக்கப்பட்டிருந்த நேரத்தைக் குறைக்கும்படி சபாநாயகர் அவர்கள் உத்தரவிட்டிருக்கின்றார். ஆகவே, நீங்கள் தயவுசெய்து உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

Sir, can I have one more minute, please?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Okay.

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

ஆகவே, இவ்வாறான பொய்ச் செய்திகளை வெளியிடுவதை இணையத்தளங்களும் ஊடகங்களும் தவிர்த்துக்கொள்ள வேண்டும் என்று கேட்டுக்கொண்டு, எதிர்வருகின்ற தேர்தல்களிலும் தமிழ்த் தேசியக் கூட்டமைப்புத் தொடர்ந்து வெற்றிகளைப் பெறும்; அதற்காகத் தமிழ் மக்கள் தமது பூரண ஒத்துழைப்பைத் தருவார்கள் என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி, வணக்கம்.

[අ. භා. 5.41 ]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද "Daily Mirror" පත්‍රයේ තිබුණු editorial එකේ මුල් ඡේදය කියවලාම මම මගේ කථාව පටන් ගන්නම්.

"යුද්ධයේ රුධිරය හා අළුවලින් නව ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා අව්‍යාජ කැපවීමක් සහිත ඉදිරි දැක්මක් රාජපක්ෂ රජයට තිබේ නම් එය සැබැවින්ම බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික දේශයක් විය යුතුය. විවිධත්වය තුළින් එක්සත්කම ආරක්ෂා විය යුතුය. මිනිස් සිරුරක් හෝ මල්වත්තක් මෙන් අලංකාරය පවතින්නේ, විවිධ ප්‍රජාවන් විවිධ ක්‍රියාවන්වල යෙදෙන විවිධත්වයත් පැවැතියත් පොදු දැක්මක් මත ක්‍රියා කරන්නේ නම්ය."

සැබවින්ම අද රටේ ජනතාව බලාපොරොත්තු වන්නේත් එයයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසු ගිය කාලයේ දශක තුනක් පුරාවටම මිනිස් ඝාතන රාශියක් සිදු වුණා. ගලා ගිය ලේ සුළු පටු ප්‍රමාණයක් නොවේ. මටත් වඩා හොඳින් මේ ගැන කථා කළා, ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා. එතුමාගේ කථාවෙන් එතුමා කිව්වා, මිනිස් ඝාතන මේ රටේ සාමාන්‍ය දෙයක් බවට පත් වුණා කියලා. Cricket match එකක ප්‍රතිඵල බලනවා හා සමාන දෙයක් බවට පත් වුණා කිව්වා. මම ඒ අදහස විකෘති කරන්න හදනවා නොවෙයි ගරු ඇමතිතුමනි. නමුත් මම නම් ඒ හැම අවස්ථාවකදීම cricket match එකක ප්‍රතිඵල දකින ආකාරයෙන් නොවෙයි ඒක දැක්කේ. මවක හැටියට මගේ හදවත දැවෙන තත්ත්වයකටයි පත් වුණේ.

ඒ කටුක, අඳුරු අතීතය පසු කරමින් ඇවිත් තිබෙන අපි, ඒ වාගේම මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ ඉතාම සාමකාමීව, ප්‍රජාතන්ත්‍රවාදීව, නිදහස්ව ජීවත් වන්න පුළුවන් වාතාවරණයක් බිහි කරමින්, ඒ වාතාවරණයත් එක්ක රට සංවර්ධනය කරන වාතාවරණයක් බිහි කිරීමටයි. යුද්ධය අවසන්ව වසර දෙකක් ගෙවිලා තිබියදීත්, වත්මන් ආණ්ඩුවට ස්වර්ණමය අවස්ථාවක් ලැබිලා තිබියදීත්, මේ පශ්චාත් යුද සමයේදී මේ රටට අවශ්‍ය කරන, අද "Daily Mirror" පත්‍රයේ editorial එකෙන් කියන පසුබිම සකස් කිරීම සිදු වනවාද කියන එකත් අද ජනතාවගේ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂය හැම දාමත් කියපු කියමනක් තමයි එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කළ යුතුයි; දේශපාලනමය වශයෙන් පරාජය කළ යුතුයි; අන්තර්ජාතිකමය වශයෙන් පරාජය කළ යුතුයි කියන එක. අපි ආණ්ඩුවට අපේ ගරුත්වය පුද කරනවා, යුදමය වශයෙන් එල්ටීටීඊය පරාජය කළාට. අද ඉතාම පැහැදිලිව ආණ්ඩුව පිළිගත් දෙයක් තමයි -විශේෂයෙන්ම ඩිලාන් පෙරේරා මැතිතුමාගේ කථාවෙන් ඒක කියැවුණා- අද එල්ටීටීඊ ඩයස්පෝරාවක් අන්තර්ජාතිකව සැරසෙනවාය කියන එක. එහෙම නම් මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපට පිටු පස්සෙන් හිටපු රටවල්, අපට සමානව හිටපු රටවල් අද ඉදිරියට ගිහින් තිබෙන්නේ කොහොමද, ඒ රටවල් අනුගමනය කරපු ප්‍රතිපත්ති මොනවාද, අපට අනුගමනය කළ හැකි ඒ මොඩලයන් මොනවාද කියන එක. අපි ඒ පිළිබඳව සොයා බැලිය යුතුයි. විශේෂයෙන්ම දකුණු අප්‍රිකාව, අද ලෝකය පිළිගත්ත වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් තිබෙන රටක් හැටියට ඒ ගරු නාමය දිනා ගෙන තිබෙනවා. දකුණු අප්‍රිකාව apartheid ඉවත් කරමින් අලුත් ව්‍යවස්ථාවක් ගොඩ නඟා ගත්ත අවස්ථාවේදී සියලු ජන කොටස්වල අදහස් හා යෝජනා -හැම ආසනයකම, හැම ග්‍රාම සේවා කොට්ඨාසයකම ජනතාවගේ- ඉදිරිපත් කරන්න පුළුවන් desk එකක් පවත්වමින්, ජනතාවගේ අදහස් උදහස් ලබා ගත්තා. ඒ අනුව තමයි, අද මුළු ලෝකයම මොඩලයක් හැටියට බලන ඒ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාව ඒ රටේ බිහි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඩිලාන් පෙරේරා මැතිතුමා ඒ කථාව කිව්ව නිසා මම මේ කාරණය එතුමාගෙනුත් අහන්න කැමැතියි, ඒ වාගේම ආණ්ඩුවෙනුත් අහන්න කැමැතියි. මේ රටේ යුද්ධය අවසන්ව වසර දෙකක් ගෙවිලා, අපට ස්වර්ණමය අවස්ථාවක් ලැබිලා තිබෙන අවස්ථාවක, මේ රටේ සියලු ජාතීන්ට ගරුත්වයකින් යුක්තව -ඩලස් අලහප්පෙරුම මැතිතුමා ජනතාවගේ ජීවිතවල වටිනාකම ගැන කථා කළා- වටිනාකමකින් යුක්තව, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීමට අවශ්‍ය වන පරිසරය නිර්මාණය කර දීමට අපි කටයුතු කරලා තිබෙනවාද? එහෙම කරන්න නම් අපි දේශපාලන විසඳුමක් හරහා කුරිරු ත්‍රස්තවාදය පරාජය කළ යුතුයි.

ඒ දේශපාලන විසඳුම ගෙන ඒමට නම් අපි සියලු දෙනාටම එකඟ විය හැකි අදහස් උදහස් එක්ක කටයුතු කළ යුතුයි. නමුත් වත්මන් රජය මොනවාද කළේ? ජනතාව එපා කියන දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැනි දේවල් බලහත්කාරකමින් ගෙනැල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැලැස්තර දමනවා මිස, මේ රටේ ඒ දැවෙන ප්‍රශ්නයට විසඳුමක් ගෙන එන තත්ත්වයක් අපි දකින්නේ නැහැ. එල්ටීටීඊ ඩයස්පෝරාව ගැන අදත් කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමෙන් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අක්‍රිය වීම නිසා ස්වාධීන පොලිස් කොමිසම අහෝසි වුණා. අද මේ රටේ ජනතාව ඒ ඵල විපාක විඳින විත්තිය මම කියන්න අවශ්‍ය නැහැ.

පසු ගිය සතියේ කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සිදු වුණු සිදු වීම් ගැන කථා කරන කොට රූපවාහිනිය හා අනෙකුත් මාධ්‍ය හරහා ඒ ගැන දුටු දේවල් අනන්ත අප්‍රමාණයි. නිදහස් වෙළෙඳ කලාපය ගැන කථා කරන කොට, ඇඟලුම් ක්ෂේත්‍රය කියන්නේ එක්සත් ජාතික පක්ෂය මේ රටට ගෙනාපු, අදටත් මේ රටේ ලක්ෂ හැටපහක ජනතාව ජීවත් කරවන ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට පත් වෙලා තිබෙන දැවැන්ත ව්‍යාපෘතියක්. එදා සිදු වුණ සිදු වීම නිසා ජාතික ආදායමෙන් සියයට 40ක් උපයන මේ දැවැන්ත ක්ෂේත්‍රයට අවදානම් තත්ත්වයකට අද මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ක්ෂේත්‍රයේ නිරතව සිටින අහිංසක තරුණ තරුණියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් එදා උල්ලංඝනය වුණා විතරක් නොවෙයි, අහිංසක ජීවිතයකුත් නැති වුණා. ඒ විතරක් නොවෙයි, අදටත් රෝහල් ගත වී දැඩි සත්කාර ඒකකවල ප්‍රතිකාර ලබමින් බොහෝ දෙනෙක් ඉන්නවා. 230කට අධික පිරිසකට තුවාල සිදු වුණා. ඒ විතරක් නොවෙයි, සමහර කර්මාන්තශාලාවලට අලාභ හානි සිදු වුණා. එක කර්මාන්තශාලාවකට පමණක් රුපියල් මිලියන 50කට වැඩි අලාභ හානි සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජීඑස්පී සහනය අහිමි වෙලා තිබෙන අවස්ථාවක්. 2005 දී මේ ක්වෝටා ක්‍රමය අහෝසි වුණත්, අදටත් මේ ක්ෂේත්‍රය රඳා පවත්වා ගන්නට හැකි වෙලා තිබෙනවා නම් ඒ තිබෙන්නේ, රණසිංහ ප්‍රේමදාස උත්තමාණන්ට ස්තුතිවන්ත වන්නට ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවය කරන ඒ අහිංසක දරුවන්ට ප්‍රමිතියකින් යුක්තව වැටුප් සහ වැඩ කරන්නට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කර දීපු නිසායි. ඒ වාගේම පසු ගිය වකවානුවේ බලයට පත් වුණු සියලුම රජයන් ඒ ප්‍රමිතීන් ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන ගිය නිසා සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සංවිධානය විසින් ඒවා උසස් ප්‍රමිතියකින් යුක්තව පවත්වා ගෙන යෑමට අවශ්‍ය ඒ පරිසරය නිර්මාණය කර දීම නිසා අදටත් අපේ රටට ඇණවුම් ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව ඉතිරිව තිබෙන්නේ විනාඩියක කාලයක් පමණයි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

අදටත් අපට මේ ඇඟලුම් ක්ෂේත්‍රය රඳා පවත්වා ගෙන යන්නට හැකි වෙලා තිබෙන්නේ ප්‍රමිතියකින් යුක්තව ඇඟලුම් නිෂ්පාදනය කරන නිසායි. නමුත් අද ඒකටත් අවදානම් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය උල්ලංඝනය වීම නිසා ස්වාධීන පොලිස් කොමිසම අහෝසි වීම. මේ රටේ ජනතාව ගරුත්වයකින් යුක්තව සාමය ආරක්ෂා කරන ආයතනයක් ලෙස පොලීසිය දෙස බැලුවත් අද මේ වන විට පොලීසිය දේශපාලනීකරණය වී තිබෙනවා. විශේෂයෙන්ම හදිසි නීතිය යටතේ මේ රටේ විධායකයට විශාල බලතල තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව තිබෙන අනෙක් සියලුම නීතිවලට ඉහළින් නීති පනවන්නට. මේ රටේ ආරක්ෂක ඇමතිවරයාට සහ පොලීසියට සාමාන්‍ය නීතියෙන් ඔබ්බට ගිහින් කටයුතු කරන්නට හැකි යම් යම් ප්‍රවේශයන් හදිසි නීතිය තුළ තිබෙනවා. මේ ප්‍රවේශයන් භාවිත කරමින් එදා පොලීසිය කටුනායක නිදහස් වෙළෙඳ කලාපයට ඇතුළු වෙලා, කර්මාන්තශාලා ඇතුළට ගිහිල්ලා ඒවාට අලාභහානි කරමින්, ගැබිනි මවුවරුන්ට ගහලා, අහිංසක දරුවකු මරණයට පත් කරමින්, තවත් සමහර අය ආබාධිත තත්ත්වයට පත් කරමින්, දහවල් ආහාරය සඳහා පිළියෙල කර තිබුණ ආහාර කාන්තාවන්ගේ ඔළුවලට හළමින්, ගැබිනි මවුවරුන් අතුරුදහන් කරමින් කටයුතු කළා. මේ වාගේ ඉතාම ශෝචනීය තත්ත්වයකට පත් වෙච්ච නිසා අද ඒ ක්ෂේත්‍රයට අවදානම් තත්ත්වයක් ඇති වී තිබෙනවා විතරක් නොවෙයි, රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියත් උල්ලංඝනය වනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ. ඔබවහන්සේට විනාඩි 11ක් පමණයි තිබෙන්නේ.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මට විනාඩි 15ක් තිබෙනවා කියලා දාලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මුලදී මිනිත්තු 35ක කාලයක් වැඩිපුර ගියා.

[අ. භා. 5.51 ]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ විනාඩි 15 අවශ්‍යයි.

අපි හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදවලදී මීට පෙරාතුව කථා කළේ මිනීමරු ත්‍රස්තවාදය අවසන් කිරීම ගැන; ඔවුන් කරන අපරාධ පිළිබඳව. නමුත් අද මට කථා කරන්නට සිදු වෙලා තිබෙන්නේ ඒ සම්බන්ධව නොවෙයි. ත්‍රස්තවාදය අවසන් කරලා, රටේ සාමය ඇති කරලා, මහා විශිෂ්ට මෙහෙවරක් කරපු, ඒ මෙහෙවරට නායකත්වය දුන්න අතිගරු ජනාධිපතිතුමාට අවලාද නඟන්නට, අපහාස කරන්නට ක්‍රියාත්මක වන ඇතැම් ත්‍රස්තවාදීන් කිහිප දෙනෙක් ඉන්න බව පෙනෙනවා. මෙයට හේතුව දේශපාලන ඊර්ෂ්‍යාවයි. මේවා ගැන තමයි අද මට කථා කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

රටේ සාමය කඩපු, රට විනාශ කරපු ත්‍රස්තවාදය අවසන් කරලා, රටේ ආර්ථිකය නංවන්නට දැඩි මෙහෙවරක යෙදෙන රජය අපහසුතාවට පත් කරලා නැවතත් රට අගාධයට ගෙන යන්නයි මේ ක්‍රියාවලිය සිද්ධ කරන්නේ. මම හිතන්නේ නැහැ ඒකට මේ රටේ ජනතාව කිසිසේත් ඉඩ දෙයි කියලා.

එදා අපට පෙරහැරක් යන්න පුළුවන්කමක් තිබුණාද? දේශපාලන පක්ෂයකට හෝ වෙනත් බලවේගයකට පෙළපාළියක් යන්න පුළුවන්කමක් තිබුණාද? රැස්වීමක් තියන්න පුළුවන්කමක් තිබුණාද? පාසල් දරුවෝ පාසලකට ගෙන ගිහිල්ලා පාසලේ තබලා එන මවුපියන්ට ඔවුන් ගෙදර එනතුරු විශ්වාසයක් තියන්න පුළුවන්කමක් තිබුණාද? දුම්රියක, බස් රියක, මහ පාරේ යන්න පුළුවන්කමක් තිබුණාද? මේ වාගේ භීෂණයක් නැති කරලා අද රටේ සාමය ඇති කරලා තිබෙනවා. රටේ නිදහසක් ඇති කරලා තිබෙනවා. ඒ කටයුතු කරන්න ඕනෑ තරම් නිදහස තිබෙනවා. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ එක කාරණයක්. ඒ කාරණය තමයි මේ නිදහස සමාජය තුළ වල්බූරුවන් වාගේ හැසිරෙන්නට ඇති කරලා තිබෙන නිදහසක් නොවෙයි කියන එක. පසු ගිය දින කීපය තුළ රටේ නොයෙක් වැදගත් උදවිය දුරකථනයෙන් කථා කරලා

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි ]

මගෙන් ප්‍රශ්න කළා, "ඇයි ඔබ වහන්සේලා නිහඬව ඉන්නේ" කියලා. බලන්න, පසු ගිය දිනක සිදු වුණු එක් සිද්ධියක්. මොන තරම් නින්දා සහගත අන්දමින් භික්ෂූන් වහන්සේලාට එය බලපානවාද? මේ රටේ බෞද්ධයින්ට බලපානවාද? ඇයි මේ සම්බන්ධයෙන් යම් කිසි ප්‍රකාශයක්, කථාවක් නොකරන්නේ කියන ප්‍රශ්නය පිළිබඳව දුරකථනවලින් සහ හමු වන විශේෂ පුද්ගලයින් මේ දින ගණනාව තුළම අපෙන් ප්‍රශ්න කළා . මේ රටේ ඉන්න ප්‍රබුද්ධ බෞද්ධයින් විශේෂයෙන් සංවිධාන, පසු ගිය ජුනි 3 වැනි දින එක්තරා පිරිසක් අරලියගහ මන්දිරය ඉදිරියට ගිහිල්ලා ඒ ස්ථානයේ හැසිරිච්ච ආකාරය පිළිබඳව කථා කළා.

වඩාත්ම කනගාටුදායකව මේක කැපිලා පෙනුණේ මේ පිරිස අතර භික්ෂූන් වහන්සේලා වශයෙන් පෙනී සිටපු එක්තරා පිරිසකුත් සිටි නිසයි. මේ අය කුමන අන්දමකින්වත් භික්ෂුවකට ගැළපෙන අන්දමින් නොවෙයි හැසිරිලා තිබෙන්නේ. අනික් කාරණය තමයි මේ පිරිස හසුරුවලා තිබෙන්නේ එක්තරා ගිහි පුද්ගලයෙක් වීම. ඒ පුද්ගලයාගේ නියෝගයට අනුව තමයි මේ භික්ෂූන් වහන්සේලා වශයෙන් හිටිය පිරිස ක්‍රියා කරලා තිබෙන්නේ. ඔහු දීපු නියෝග අනුව තමයි ඒ විධියට හැසිරිලා තිබෙන්නේ. බැරල් උඩ නඟිමින්, ගස් උඩ නඟිමින්, බැම් උඩ නඟිමින් ඉතාම අශෝභන අන්දමට මේ අය එතැන ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ අය ඇත්ත වශයෙන්ම අපේ බෞද්ධ සමාජය වැරදි විධියට අවබෝධ කර ගෙන තිබෙනවා. ඒ නිසා පන්සල්වල ඉන්න අපේ ස්වාමීන් වහන්සේලාටත් මේ පිළිබඳව නොයෙක් විධියේ නින්දා අපහාස විඳින්නට සිදු වෙලා තිබෙනවා. මේක පැහැදිලිව සමාජය විසින් තේරුම් ගත යුතු කරුණක්. මේ පිරිස් භික්ෂු වේශයෙන් පෙනී සිටින පුද්ගලයින් මිස නියම භික්ෂූන් වශයෙන් කිසිසේත් සලකන්නේ නැති බව අපි අවධාරණයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. නියම භික්ෂූන් වහන්සේලා නම් කිසි විධියකින් ගිහියෙකුගේ නියෝගය අනුව කටයුතු කරන්නේ නැහැ. නොමනා වැඩ කරන්නට කරන පෙළඹවීම්වලට භික්ෂුවක් කිසිසේත් අනුවර්තනය වන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ පෙන්වා තිබෙන්නේ භික්ෂූන් වහන්සේ රජුට අනුවර්තනය විය යුතුයි කියලායි.

"අනුජානාමි භික්ඛවේ රාජානම් අනුවත්තිතුම් .."

භික්ෂුව රජුන්ට අනුවර්තනව කටයුතු කළ යුතුයි. නමුත් වැරදි මඟකට භික්ෂුවක් පොළඹවනවා නම් රජය වුණත් භික්ෂුව එයට අනුවර්තනය නොවිය යුතුයි කියලායි ධර්මයේ උගන්වලා තිබෙන්නේ. එසේ විනයක් ධර්මයේ තිබියදී ගිහි පුද්ගලයෙකුගේ නියෝග අනුව භික්ෂුත්වයට නොගැළපෙන අන්දමට යම් භික්ෂුවක් හැටියට පෙනී සිටිමින් කටයුතු කරනවා නම් ඔහු භික්ෂුවක් හැටියට අපි සලකන්නේ නැහැ. මේක පැහැදිලිවම අපි ප්‍රකාශ කරන්නට ඕනෑ. මේ රටේ සිල්වත්, ගුණවත්, විශිෂ්ට සංඝ ශාසනයක් තිබෙනවා. සංඝ සමාජයක් තිබෙනවා. ඒ සංඝ සමාජයට වැදගත්ත, වද්දවලා තිබෙන අවස්ථාවාදී චීවරධාරින් පිරිසක් ඉන්නවා. ඒක පිළිගන්න ඕනෑ. ධර්මාශෝක රජතුමාගේ කාලයේදී ඉන්දියාවේ පැවැති මේ පිරිසිදු ශාසනයට මෙවැනි හිතුවක්කාර පුද්ගලයන් 60,000ක් ඇතුළත් වෙලා සිටි බව අපේ ශාසන ඉතිහාසයේ කියැවෙනවා. ඒ වාගේම මේ රටෙත් මේ පිරිස් අතරට එවැනි අතළොස්සක පිරිසක් එක් වෙලා ඉන්නවා. සමහර දේශපාලන පක්ෂ ඒක පෝෂණය කරනවා. ඊර්ෂ්‍යාව වපුරන සමහර දේශපාලන පක්ෂ කෘත්‍රිමව භික්ෂූන් වහන්සේලා නිර්මාණය කරනවා. තාවකාලිකව පෙළපාළිවල යන්න, තාවකාලිකව රැස්වීම්වලට සහභාගි කරවා ගන්න, ඒ පක්ෂයට භික්ෂු බලයක් තිබෙනවාය කියා පෙන්වන්න තාවකාලිකව එවැනි තත්ත්වයක් නිර්මාණය කරන පිරිස් ඉන්නවා. මේ රටේ සිටින පිරිසිදු භික්ෂූන් වහන්සේලා නොවෙයි, අන්න ඒ පිරිස් තමයි මේ නොසංඩාල වැඩ කරන්නේ. රටේ ජාතික ප්‍රශ්නවලදී, ජාතිය විපතට වැටෙන අවස්ථාවලදී භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් වෙලා රට බේරා ගැනීම සඳහා, ජාතිය බේරා ගැනීම සඳහා, ආගම බේරා ගැනීම සඳහා ක්‍රියා කිරීම එදා පටන් අද දක්වා සිදු වෙන කරුණක්. නමුත් උන්වහන්සේලා මේ විධියට කටයුතු කරන්නේ නැහැ. පසුගිය කාල පරිච්ඡේදවල අපිත් රට, ජාතිය බේරා ගැනීම සඳහා යම් යම් අන්දමින් ක්‍රියාත්මක වුණා. නමුත් අපි පෙළපාළි ගියේ නැහැ. අපි පෙරහැරෙන් ගියා. අපි රාජ්‍ය නායකයන්ට අවවාද අනුශාසනා කළේ නියම භික්ෂූන් වහන්සේලා හැටියට ගිහිල්ලායි. නමුත් එදා අරලියගහ මන්දිරය ඉදිරිපිටදී වුණු සිද්ධිය අපි මාධ්‍යවලින් දුටුවා. ඒවා ඉතාමත්ම අගෝචරයි. භික්ෂුත්වයට නොගැළපෙන පිරිසක් කළ ඒ ක්‍රියාවලින් අපට පැහැදිලි වුණා, ඒ අය නියම භික්ෂූන් වහන්සේලා නොවන බව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව් අපේ හාමුදුරුවනේ.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

භික්ෂූන් වහන්සේ පරහිංසාවාදියෙක් නොවෙයි. පරුපවාදියෙක් නොවෙයි. උන්වහන්සේ කරුණාවෙන්, මෛත්‍රියෙන් යුතුව කටයුතු කරන කෙනෙක්. මිහිඳු හාමුදුරුවන් මේ රටේ ඇති කරපු භික්ෂු ශාසනය උත්තරීතර එකක්. ඒ මඟින් බැහැරව යමෙක් කටයුතු කරනවා නම් එතැනදී බරපතළ විනාශයක් සිද්ධ වෙනවාය කියන එක අපේ ඉතිහාසයෙන් පෙන්නුම් කරනවා. වළගම්බා රජතුමාගේ කාලයේදී එහෙම වුණා. කනිරජානුතිස්ස රජ්ජුරුවන්ගේ කාලයේදී එහෙම වුණා. එබඳු අවස්ථාවලදී රජය මැදිහත් වෙලා ඒවා මර්දනය කරලා කටයුතු කළා. භික්ෂූන් වහන්සේ විනාශ කිරීමේ ක්‍රියාමාර්ග මේ රටේ හුඟක් ක්‍රියාත්මක වෙනවා. මොකද, මේ රටේ ජීවනාලිය භික්ෂූන් වහන්සේයි. උන් වහන්සේලා විනාශ කරන්න උන් වහන්සේලාගේ ප්‍රතිරූපය අරගෙන යම් යම් අය අතකොළු හැටියට පාවිච්චි වෙන අවස්ථා තිබෙනවා. ඒ වාගේම ශ්‍රමණ ප්‍රතිරූපකයන් හදා සමාජයට ඉදිරිපත් කරලා භික්ෂුවගේ කීර්තිය නැති කරන්න කටයුතු කරනවා. කීප අවස්ථාවකදීම මම එය දුටුවා. පාරේ රස්තියාදු වෙන ඇතැම් රස්තියාදුකාරයින් අල්ලා හිසකෙස් කපා, සිවුරු පොරවලා තැබෑරුම ළඟ ගිහින් බස්සනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙමයි ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

තැබෑරුමට ගිහිල්ලා බීලා පාරේ යනකොට මිනිස්සු හාමුදුරුවන්ට බණිනවා. ඉතින් සමාජයේ කෙරෙන මෙවැනි ක්‍රියා ඕනෑ තරම් අපි දැක තිබෙනවා. අපේ භික්ෂූන් වහන්සේලා ඉත්තන් කරගෙන සමහර දේශපාලන පක්ෂ විසින් ගෙන යනු ලබන මේ ක්‍රියා කලාපය සම්පූර්ණයෙන්ම නැවැත්විය යුතුයි. ඒ වාගේම මේ රටේ ශාසනය ආරක්ෂා කිරීම රජයට පැවරුණු වග කීමක්. ඒ වගකීම මත මෙබඳු ක්‍රියා කරන උදවිය සොයා, මේ සම්බන්ධයෙන් ශාසන භාරධාරී මහතෙරුන් වහන්සේලා සමඟ සාකච්ඡා කරලා කිසියම් පියවරක් ගැනීමට කටයුතු කළ යුතුයි කියා මේ අවස්ථාවේදී මා සඳහන් කරනවා. ඒ නිසා එදා අරලියගහ මන්දිරය ඉදිරිපිට සිදු වූ ඒ අමනෝඥ ක්‍රියාව පිළිබඳව මේ රටේ සමස්ත බෞද්ධ ජනතාවත්, සමස්ත මහාසංඝයා වහන්සේත් බලවත් සේ කම්පාවට සහ කලකිරීමට පත්ව සිටින බව මේ ගරු සභාවට මතක් කරමින් වැරදි වැඩ කරන පුද්ගලයන් නිසා සමස්ත සංඝ සංහතියටම නිග්‍රහ නොකළ යුතු බවටත් සඳහන් කරමින් මගේ කතාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙමයි ස්වාමීන් වහන්ස. මීළඟට ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ. භා. 6.02]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
Hon. Presiding Member, as a Member of Parliament, on behalf of the Opposition and as a Member of the United National Party in charge of Human Rights, first of all, let me make a special note of thanks to the Inter-Parliamentary Union, especially to Mr. Anders B. Johnsson, Secretary-General of the Inter-Parliamentary Union, and Ms. Ingeborg Schwartz, Secretary of the Committee on the Human Rights of Parliamentarians, Inter-Parliamentary Union, for sending an international observer to watch and observe the cases of former Parliamentarian, General Sarath Fonseka. The Opposition had made a request to the Inter-Parliamentary Union to send international observers to watch these legal proceedings of the former Parliamentarian, General Sarath Fonseka.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ සාකච්ඡා කරන මේ මොහොතේ මම විශේෂයෙන්ම තවත් සිදුවීමක් ගැන කථා කරන්න මේ උත්තරීතර සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. මම දුටුවා ජාත්‍යන්තර ප්‍රජාවට අපේ රටේ යුද ජයග්‍රහණය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට ජාත්‍යන්තර සමුළුවක් පසු ගිය දිනවල කොළඹදී පවත්වලා තිබුණු ආකාරය. මේ සමුළුවට සහභාගි වන්න කියලා ලෝකයේ විවිධ රටවල ජාත්‍යන්තර නියෝජිතයන්ට ආරාධනා කරලා තිබුණා. අපේ රටේ අවුරුදු 30ක් පැවතුණු මේ කුරිරු ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කළේ කොහොමද කියලා ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ කරුණු ඉදිරිපත් කරන්නට, මේ අත් දැකීම් බෙදා හදා ගන්නට ශ්‍රී ලංකා රජය ක්‍රියා කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ඒ යුදමය තත්ත්වය කරට අරගෙන -ඒ යුදමය වගකීම කරට අරගෙන- අණ දුන්නු, අණ මෙහෙයවපු අපේ ත්‍රිවිධ හමුදාව මෙහෙයවපු, වීරෝදාර රණ විරුවා -ජනරාල් සරත් පොන්සේකා මැතිතුමා- එදා යුද හමුදාපතිවරයා හැටියටයි කටයුතු කළේ. මේ යුදමය අතින් එල්ටීටීඊ සංවිධානය පරාජය කිරීම පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කරන්න, මේ යුද ජයග්‍රහණය පිළිබඳව ජාත්‍යන්තරයට කරුණු ඉදිරිපත් කරන්නට එතුමා ඒ අවස්ථාවේ එහි නොසිටීම ජාතියේ අභාග්‍යයක් -අවාසනාවක්- හැටියටයි මම දකින්නේ. එතුමා යටතේ සේවය කළ, එතුමාගෙන් නියෝග ලබා ගත්ත, එතුමාගෙන් අණ ලබා ගත්ත මේජර් ජනරාල්වරු, බ්‍රිගේඩියර්ලා, කර්නල්වරු, මේජර්වරු මේ යුද ජයග්‍රහණය පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කරන්නට, ජාත්‍යන්තර නියෝජිතයන් දැනුවත් කරන්නට ක්‍රියා කරපු ආකාරය අපි දැක්කා. නමුත් සක්‍රිය වශයෙන් යුද බිමේ ඉඳ ගෙන, තමන්ගේ ජීවිතය මරු මුවට තබා ගෙන, බෝම්බය වැදුණු වෙලාවේ තමාගේ බොකු බඩවැල් අතින් තබා ගෙන සිටියදීත් මේ එල්ටීටීඊ ත්‍රස්තවාදය තවත් වීරෝදාර හමුදාපතිවරයකුට භාර දෙන්නේ නැහැය කියලා, ඉතුරු කරන්නේ නැහැය කියලා ශ්‍රේෂ්ඨව, එඩිතරව මේ හමුදාවට නායකත්වය ලබා දුන්න ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා මේ ජාත්‍යන්තරයට යුද ජයග්‍රහණය පිළිබඳව කථා කරන්නට ඒ ස්ථානයේ නොසිටීම මම හිතන්නේ කනගාටුවක් කියලායි. එතුමාගෙන් අවවාද ගත්ත, එතුමාගෙන් නියෝග ගත්ත එතුමාගෙන් අණ ලබා ගත්ත ජනරාල්වරු, මේජර් ජනරාල්වරු, බ්‍රිගේඩියර්වරු ඒ වෙලාවේ තමුන්ගේ හෘදය සාක්ෂියෙන් තට්ටු කරලා අහන්න ඇති, "අනේ අපේ ජනරාල් සරත් පොන්සේකා මැතිතුමා මේ ස්ථානයේ හිටියා නම්" කියලා. මෙන්න මේක තමයි දෛවයේ සරදම කියන එක මම මතක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ යුද හමුදාපතිවරයා ඊට පසුව අපේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අනුව පසු ගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ධුර අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් වුණා. කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව අතිවිශාල ජනවරමකින්, ප්‍රජාතන්ත්‍රවාදීව මේ ජනරාල් සරත් පොන්සේකා මැතිතුමාව මේ උත්තරීතර සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට පත් කළා. එතුමාට මන්ත්‍රීවරයෙක් හැටියට අද අත් විඳින්න සිදු වී තිබෙන මේ දේශපාලන අඩන්තේට්ටම්කම්, මර්දන ක්‍රියාවන් පිළිබඳව බලන්න අද ජගත් පාර්ලිමේන්තු සංගමය ලංකා ඉතිහාසයේ දෙ වැනි වතාවට ජාත්‍යන්තර නිරීක්ෂකයින් ශ්‍රී ලංකාවට එවන්නට ක්‍රියා කර තිබෙනවා. මෙයින් හැඟෙන්නේ මොකක්ද? අද ප්‍රධාන විපක්ෂයක් හැටියට අපි ජගත් පාර්ලිමේන්තු සංගමයට මේ කරුණු කාරණා පිළිබඳව ඉදිරිපත් කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ජනරාල් සරත් පොන්සේකා මැතිතුමාට වෙලා තිබෙන මේ අඩන්තේට්ටම් පිළිබඳව අපි කරුණු ඉදිරිපත් කරලා ජාත්‍යන්තර නිරීක්ෂකයන් එවන්න කියලා අප ජගත් පාර්ලිමේන්තු සංගමයෙන් ඉල්ලීමක් කළා. අන්න ඒ නිසායි මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන මන්ත්‍රීවරු හැටියට අපි ජගත් පාර්ලිමේන්තු සංගමයට අපේ අවංක ස්තුතිය පුද කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අදත් ඊයේත් අපේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා ඉතාමත්ම දීර්ඝ දේශන කළා. එතුමා ඉන්දියාවේ විදේශ කටයුතු ඇමතිතුමාත් සමඟ ඇති කර ගත්ත එකඟතාවන් පිළිබඳව සාකච්ඡා කරන්න, ඒ එකඟතාවන් ක්‍රියාත්මක කරන්නට ඉදිරි කාල සීමාව තුළ ඉන්දියාවේ උසස් මට්ටමේ නායකයින් ශ්‍රී ලංකාවට එන බවට දැන් වාර්තා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසු ගිය හදිසි නීති විවාදයකදී -2011 මැයි මාසයේ 5 වැනි දා- මේ පාර්ලිමේන්තුවේ සභාගත කළා කුමරන් පත්මනාදන්ට ජාත්‍යන්තර පොලීසිය - INTERPOL- ඉදිරිපත් කරලා තිබෙන විවෘත වරෙන්තුව. එම හැන්සාඩ් වාර්තාවේ ඉතා පැහැදිලිව ඒක සඳහන් වෙනවා. ඒ කුමරන් පත්මනාදන් කියන ජාත්‍යන්තර ත්‍රස්තවාදියාව අවශ්‍ය බවට ඉන්දියාව පවා ඉල්ලීමක් කරලා තිබෙනවා. මොනවාටද? රජිව් ගාන්ධි අගමැතිවරයාගේ ඝාතනය පිළිබඳව. ඒ වාගේම ඉන්දියාව තුළ සිදු වෙලා තිබෙන ජාත්‍යන්තර මට්ටමේ ත්‍රස්තවාදී ක්‍රියාවන් පිළිබඳව ඉන්දියාවටත් මේ ජාත්‍යන්තර ත්‍රස්තවාදියාව අවශ්‍යයි. ඒ අනුව තමයි ඉන්දියාවේ චෙන්නායිවල අධිකරණයකින්, ජාත්‍යන්තර පොලීසිය - INTERPOL - මම සභාගත කළ වරෙන්තුව කුමරන් පත්මනාදන්ට එරෙහිව නිකුත් කරලා තිබෙන්නේ. එහෙම නම් අද අපේ විදේශ කටයුතු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරයි කියලා මම විශ්වාස කරනවා, ඉන්දියාවත් සමඟ මේ කරන සාකච්ඡාවලදී කුමරන් පත්මනාදන්ව ඉන්දියාවට භාර දීම ගැන, එහෙමත් නැති නම් ජාත්‍යන්තර පොලීසිය -INTERPOL- ඉන්දියාවේ චෙන්නයි අධිකරණයෙන් ලබා ගෙන තිබෙන මේ විවෘත වරෙන්තුව පිළිබඳව ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය මොකක්ද කියන එක ගැන. මම ඒක පැහැදිලිව දැන ගන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මේ හදිසි නීති විවාදයේදී කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සිදු වෙච්ච ඒ අවාසනාවන්ත සිදුවීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි භාගයක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මම අවසන් කරන්නම්.

ඒ අවාසනාවන්ත ලෙස මිය ගිය තරුණයා ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ, ගල්ලොලුව ප්‍රදේශයේ තරුණයෙක්. ඒ තරුණයාට මිලියන ගණන් වන්දි ගෙවනවාය කියලා රජය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. මම දන්නා තරමින් අද වන තුරු ශත පහක්වත් ඒ පවුලට ගෙවලා නැහැ. ඒ වාගේම ඒ පවුලට ඒ ගෙවන්න පොරොන්දු වෙච්ච මිලියන ගණන් මුදල්, ඒ හදා දෙනවාය කිව්ව ගෙවල්, විරැකියාවෙන් සිටින ඒ පවුලේ සාමාජිකයින්ට රක්ෂා ලබා දෙනවාය කිව්ව ඒ පොරොන්දු රජය වහාම ඉටු කළ යුතුයි කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම අවසාන වශයෙන් කියනවා,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්, කියලා අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සිද්ධියෙන් තුවාල ලබපු, සදාකාලික ආබාධිතයන් බවට පත් වෙච්ච සියලුම සේවක සේවිකාවන්ට වන්දි ගෙවීම රජයේ වග කීමක් කියලා. ඒ වාගේම තවමත් වසා දමා තිබෙන ඒ කර්මාන්තශාලාවලට වෙච්ච හානියට වන්දි ගෙවීම රජයේ වග කීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊටත් අමතරව, මේ දක්වා වසා තිබෙන සමහර කර්මාන්තශාලාවල සේවය කළ, සේවය කරන ඒ අහිංසක සේවක සේවිකාවන්ගේ වැටුප් ගෙවීමත් රජය විසින් සිදු කළ යුතුයි කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය

[අ. භා. 6.12 ]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
මූලසුන හොබ වන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කටුනායක ආශ්‍රිත ප්‍රදේශයේ සිදු වූ ඒ අවාසනාවන්ත සිදු වීම පිළිබඳව ඇත්ත කරුණු ඉදිරිපත් කිරීමට මම අද සූදානම් වෙනවා.

ඇත්තටම 24 වන දින නිදහස් වෙළෙඳ කලාපයේ සේවක සේවිකාවන්ගේ උද්ඝෝෂණයක් තිබුණා යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතට එරෙහිව. ඊට පස්සේ 30 දින අපේ කම්කරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් සූදානම් කරලා හැම කම්හලකම සේවක සභාවල ඉන්න නියෝජිතයින් ගෙනැල්ලා, ඒ වාගේම කළමනාකාරීත්වයේ සහභාගිත්වයෙන් මේ යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට කටයුතු කළා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම මැති ඇමතිවරුන්ගේ සහභාගිත්වයෙන්. විශේෂයෙන්ම එතැනදී අපි දැන ගත්තා මේ නියෝජිතයන් ඒ කම්හල්වල සේවක සේවිකාවන්ට මේ පිළිබඳව නිවැරදි තොරතුරු ලබා දී නොතිබුණු බව. මනස අවුල් කරන අසත්‍ය, විකෘති තොරතුරු තමයි ලබා දී තිබුණේ.

ඒ සාකච්ඡාව අවසානයේදී එකඟතාවකට ආවා කම්කරු ඇමතිතුමා සහ ඒ සේවක සංගම්වල අය, යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර සේවක සංගම්වලට ලබා දීලා ඔවුන්ගේ අදහස් අර ගෙන ඔවුන් යෝජනා කරන සංශෝධනත් අන්තර්ගත කර ගන්නවාය කියලා. ඔවුන් ඒකට එකඟ වෙලා විසිර ගියා. ඒ අනුව විරෝධතාවක් ඇති කිරීමට කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. නමුත් අපට ආරංචි වුණා සඳුදා නැවත කටුනායක ප්‍රදේශයේ විරෝධතාවක් ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා කියලා. ඒ අනුව ඉරිදා අපට -ගරු සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමාටත්, පළාත් සභා ඇමති නිමල් ලන්සා මැතිතුමාටත්,මටත්- අතිගරු ජනාධිපතිතුමාව හමු වුණා. අප ඒ කරුණු අතිගරු ජනාධිපතිතුමාට සැල කර සිටියාම එතුමා අපට උපදෙස් දුන්නා ඒ උද්ඝෝෂණය පැවැත්වුණොත් ගිහිල්ලා ඔවුන්ට කියන්න, ඔවුන් සියලු දෙනාම විරුද්ධ නම් මේ පනත් කෙටුම්පතෙන් ඇඟලුම් ක්ෂේත්‍රය ඉවත් කර ගැනීමට එතුමා සූදානම් කියලා. අපට දැන ගන්නට ලැබුණා සඳුදා, එනම් මැයි 30 වැනි දා තැනින් තැන, එනම් තුන්වන කලාපය සහ දෙවන කලාපය ආශ්‍රිතව ඇතැම් කම්හල්වල සේවක සේවිකාවන් විරෝධතාවක් දක්වනවා කියලා. ඒ අනුව අපි -ගරු සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමාත්, පළාත් සභා ඇමති නිමල් ලන්සා මැතිතුමාත්, මමත්- ඔවුන් හමුවට ගියා. අපි පොලිස් නිලධාරින් සමඟ ගිහිල්ලා ඔවුන් දැනුවත් කළා. ඒ කලාප දෙකේ සේවක සේවිකාවන් හිතුවේ දැනටමත් ඔවුන්ගේ වැටුප කප්පාදු කර ගන්නවා කියලා. ඔවුන් අපෙන් ඉල්ලා සිටියා කපන වැටුප ආපසු දෙන්න කියලා. ඒ වාගේ වැරදි තොරතුරුයි ඔවුන්ට ලබා දීලා තිබුණේ.

අපි ඔවුන්ට පොරොන්දු වුණා ඔවුන් විරුද්ධ නම් අතිගරු ජනාධිපතිතුමා මේ පනත් කෙටුම්පත ඇඟලුම් ක්ෂේත්‍රයෙන් අයින් කර ගන්නවා කියලා. ඒ අනුව දෙවන කලාපයේ සේවක සේවිකාවෝ විසිර ගියා. අපි තුන්වන කලාපයටත් ගිහිල්ලා එම පණිවුඩයම ලබා දුන්නා. අප එක්ක ගිය එක පොලිස් නිලධාරියකුගේවත් අතේ බැටන් පොල්ලක්වත්, කළු ගල් කැල්ලක්වත් තිබුණේ නැහැ. නිරායුධ පොලීසියයි අප එක්ක ගියේ. ඒ පිරිස දැනුවත් කරලා එළියට එනවාත් සමඟම අපි දැක්කා ඒ ගේට්ටුවෙන් පිට කොට කලිසම් ඇඳ ගත්තු, හෙල්මට් දා ගත්තු කණ්ඩායම් තැනින් තැන විසිරී ඉන්නා බව. අප එළියට එනවාත් සමඟම ඔවුන් ඒ විරෝධතාව දක්වන සේවක පිරිස් අතරට ගියා. අප ඒ විශ්වාසය ඇති කළ නිසා ඒ විරෝධතාව පවත්වන්න අවශ්‍ය නැහැ. මොකද, යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත අයින් කර ගන්නවා කියන විශ්වාසයයි, ඒ පොරොන්දුවයි අප දුන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩයෙන්. නමුත් ඔවුන්ට විසිර යෑමට කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. ඒ පිටස්තර පුද්ගලයන් ගිහිල්ලා පිටුපසින් ඉඳලා කලබලය ඇති කළා. කිසිම කම්හලක සේවය කරන්නේ නැති, දුඹුරු පාට ටී-ෂර්ට් එකක් ඇඳ ගත්තු පුද්ගලයකු තමයි පළමුවැනි ගල් පහර එල්ල කළේ. ඒ සිද්ධියේදී ගම්පහ පොලිස් ස්ථානයේ සේවය කරන පොලිස් නිලධාරියෙක් තුවාල වුණා. ඔවුන් ඊට පස්සේ පිටු පසින් ඉඳ ගෙන අර අහිංසක සේවක සේවිකාවන් මිනිස් පලිහක් ලෙස යොදා ගෙන පොලීසියත් එක්ක යම් ගැටුමක් නිර්මාණය කර ගත්තා. ඒ ගැටුමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ අවාසනාවන්ත සිදු වීම වුණේ. වීඩියෝ පටය

අර ගෙන බලන කොට පෙනෙනවා ඒ පිරිස අතරේ හිටපු ගැටුම්කරුවන් කවුද කියා. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ පිරිස් එතැන සිටියාය කියලා අද තොරතුරු ලැබිලා තිබෙනවා. ඉදිරියේදී නම් ගම් එක්ක ඒවා හෙළි කිරීමට රජය කටයුතු කරන බවත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ ගැටුම තමයි නිර්මාණය වුණේ ඒ වාගේ අවාසනාවන්ත තත්ත්වයකට. අපි කනගාටු වෙනවා වැදගත් තරුණයකුගේ ජීවිතයක් රටට අහිමි වීම ගැන. රොෂෙන් චානක කියන සහෝදරයා ඒ ගැටුමෙන් ජීවිතක්ෂයට පත් වුණා. ඒ වෙඩි තැබීමට හේතු වුණේ එතැන හිටපු නියෝජ්‍ය පොලිස්පතිතුමකු ඇද ගෙන ගිහිල්ලා ඔහුට පහර දීමයි. වීඩියෝ එක බැලුවාම හොඳට පෙනෙනවා. ඇද ගෙන ගිහිල්ලා ඔහුට පහර දීම එහි පෙන්නුම් කරනවා.

එදා 2001-2002 රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය කාලයේ යාපනයේ එල්ටීටීඊ ත්‍රස්තවාදියකු අත් අඩංගුවට ගත්තා කියලා පැවැති උද්ඝෝෂණයේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න ගිය එස්එස්පී චාල්ස් විජයවර්ධන මහත්මයාව ඒ උද්ඝෝෂකයෝ ඇද ගෙන ගිහිල්ලා බෙල්ල කපලා ඝාතනය කළා. කටුනායක උද්ඝෝෂණය වෙලාවේ අවාසනාවන්ත වෙඩි තැබීමක් සිද්ධ වුණා. දරුවෝ අට දෙනෙක් විතර එයින් තුවාල ලැබුවා. නමුත් ඒ වෙලාවේ ඉඳන්ම මාධ්‍යයේ ගියේ මොකක්ද? තුන්දෙනකු ජීවිතක්ෂයට පත් වෙලා කියලායි. ඊයේත් මා අහ ගෙනයි ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කියනවා තුන්දෙනකු අතුරුදහන් වෙලා කියලා. මම අභියෝග කරනවා කවුද අතුරුදහන් වෙලා ඉන්නේ කියලා නම් ගම් ඇතිව ඉදිරිපත් කරන්න කියලා. නිර්මාණය කරපු ඒ ගැටුම්කාරී තත්ත්වයේ ප්‍රතිඵලයක් හැටියට තමයි අර අහිංසක සේවක සේවිකාවන්ටත් ඒ වාගේ ගුටි කෑමකට ලක් වීමට සිද්ධ වුණේ. අපි කනගාටු වෙනවා. අපි කොයිම වෙලාවකවත් ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය හුදෙක්ම පොලීසිය ගිහිල්ලා උද්ඝෝෂණයකට පහර දුන්නා නොවෙයි. ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය කරපු නිසා අවසන් ප්‍රතිඵලය ලෙස ඒ දරුවන්ට පොලිස් ප්‍රහාර එල්ල වුණා. ඒ ගැන අපි කනගාටු වනවා. ඒ වාගේම අහිංසක සේවක සේවිකාවන් තුවාල වුණා; රෝහල්ගත වුණා. එක දරුවෙක් අවාසනාවන්ත ලෙස මිය ගියා. ඒ වාගේම පොලිසියේ 20ක්, 25ක් තුවාල ලැබුවා. එතකොට මේ පොලිසියේ කාකි ඇඳුම ඇඳ ගෙන ඉන්නේත් මනුෂ්‍යයෝ. ඒ මනුෂ්‍යයන්ටත් දරු පවුලක් ඉන්නවා. අම්මා, තාත්තා ඉන්නවා; දරුවෝ ඉන්නවා. භාර්යාවක් ඉන්නවා. මේ අය අමනුෂ්‍යයෝ නොවෙයි. ඒ අයත් ගම්වල දුප්පත් දෙමවුපියන්ගේ දරුවෝ. ඒ නිසා අපි කනගාටු වනවා. අපි ඉල්ලනවා මේ වාගේ අහිංසක අය යොදා ගෙන තමන්ගේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්නට එපා කියලා. මේ වාගේ අහිංසකයන් පාවා දෙන්නට එපා කියලා මම ජනතා විමුක්ති පෙරමුණෙන් මේ අවස්ථාවේ දී ඉල්ලා සිටිනවා.

රොෂෙන් චානක දරුවාව රාගම රෝහලේ දැඩි සත්කාර ඒකකයට ගෙන ගිය වෙලාවේ ඉඳලාම විපක්ෂයේ අය සොයා බැලුවේ මැරුණාද, මැරුණාද, මැරුණාද කියන එකයි. දැන් හොඳද, සුවපත් වුණාද, හොඳද, හොඳද කියලා ඇහුවා නම් ඒ දරුවා අදත් ජීවත් වනවා. ඇහුවේ මැරුණාද, මැරුණාද කියලායි. ඉතින් අපි ඒ ගැන කනගාටු වනවා. මේ රජය අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත විශාල වෙහෙසක් ගත්තා, මේ දරුවාව සුවපත් කරන්න. කොළඹ ඉඳලා විශේෂඥ වෛද්‍යවරුන් ගෙන්වලා ඔහුව ඒ තත්ත්වයෙන් සුවපත් කරන්නට කටයුතු කළා. ලේ පයින්ට් 100කට එහා ලබා දුන්නා. නමුත් අවාසනාවකට අපට ඒ දරුවා නැති වුණා. අපි මේ වෙලාවේදී ඒ පවුලට ස්තුතිවන්ත වනවා ඉතාමත්ම වග කීමෙන් යුතුව ඔවුන් එම අවමඟුල් කටයුතු සිදු කිරීම ගැන. විවිධ පක්ෂ ගිහිල්ලා බැලුවා, මේ තුළින් තමන්ගේ දේශපාලන අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කරන්නට. ඒ පවුල ඉතාමත්ම වග කීමෙන් යුතුව බුද්ධිමත් ලෙස ක්‍රියා කරමින් ඒ අවමඟුල් කටයුතු ඉටු කළාය කියන එක මා මේ අවස්ථාවේ දී මතක් කරනවා. ඒ වාගේම පල්ලියේ පියතුමාට, පන්සලේ නායක හාමුදුරුවන්ට, ගමේ අයට ස්තුතිවන්ත වන්නට ඕනෑ, ඊට සහයෝගය ලබා දුන්නාට.

BOI ආයතනය රුපියල් මිලියනයක මුදලක් ඒ දරුවා වෙනුවෙන් ලබා දෙන්න කටයුතු කර තිබුණත්, යම් කිසි කේලමක් හේතුවෙන් ඒ පවුල අපහසුතාවට පත් කිරීමේ තත්ත්වයක් නිර්මාණය වෙලා තිබුණු නිසා ඒ මුදල ලබා දීම කල් දමා තිබෙනවා. අද ඒ දරුවා වෙනුවෙන් පවුලේ උදවිය දානයක් පිරිනැමුවා. රුවන් රණතුංග මන්ත්‍රීතුමා, පළාත් මහ ඇමතිතුමා, නිමල් ලන්සා මැතිතුමා ඇතුළු අපි සියලු දෙනා එම දානමය පිංකමට සහභාගි වුණා. ඒ කටයුතු අවසන් වීමෙන් පසු ඒ දරුවා වෙනුවෙන් එම මුදල ලබා දීමට අපි කටයුතු කරන බවත් මතක් කරන්නට ඕනෑ.

මේ රජය කොයිම වෙලාවකවත් වගකීම්වලින් බැහැර වන්නේ නැහැ. වගකීම් ගත්ත නිසා තමයි කවදාවත් නැතිව පොලිස්පතිතුමා ඉල්ලා අස් වුණේ. ඒ වාගේම පොලිස් පරීක්ෂකවරුන් දෙපළක් දැනට රිමාන්ඩ්ගත වෙලා සිටිනවා. ඒ වාගේම මහානාම තිලකරත්න නැමැති විශ්‍රාමික අධිකරණ විනිශ්චයකාරතුමාගේ සභාපතිත්වයෙන් යුතු කොමිසමක් පත් කරලා තිබෙනවා, මේ පිළිබඳව සොයා බලා ඒ වැරැදි කරපු අයට දඬුවම් කිරීම සඳහා අවශ්‍ය කරන විමර්ශන කටයුතු කරන්නය කියලා. ඒ වාගේම CID එක සම්පූර්ණයෙන්ම මේ කටයුතු භාර අරගෙන මේ විමර්ශන දැන් කෙරෙමින් පවතිනවා. ඒ වාගේම තමයි කටුනායක පොලිසියේ සියලුම නිලධාරින් දැන් මාරු කර තිබෙනවා. අපේ රජය ඒ වැරැදිකරුවන් ආරක්ෂා කිරීමට කොයිම වෙලාවකවත් කටයුතු කරන්නේ නැති බව මතක් කරනවා.

මේ තිස් අවුරුදු යුද්ධය ඉවර වෙලා අපි යන්තම් ඉදිරියට යන අවස්ථාවක මේ වාගේ අහිංසක තරුණ තරුණියන්ව පාවා දීලා තමන්ගේ දේශපාලන අරමුණු ඉටු කර ගන්නට කටයුතු කරන්නට එපාය කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 6.22 ]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සුපුරුදු පරිදි හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පැවැත්වෙනවා. තවදුරටත් අපේ රටේ හදිසි නීතිය පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත්, අත්‍යවශ්‍ය කිසිදු හේතුවක් හෝ කාරණයක් ඉදිරිපත් කරන්නට සමත් වෙලා නැහැ. හදිසි නීතිය පවත්වා ගෙන යාමේ එකම වුවමනාව සහ හේතුව බවට පත් වී තිබෙන්නේ, තම බලය කෙසේ හෝ පවත්වා ගෙන යාමත්, කෙසේ හෝ ආරක්ෂා කර ගැනීමේ වුවමනාවත් පමණයි. එහෙම නැතිව අප රටේ සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී, සාමාන්‍ය සමාජ යහ පැවැත්ම පවත්වා ගෙන යන්නට කිසි සේත්ම හදිසි නීතිය මේ මොහොතේ අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, මැතිවරණ කල් දමන්න, වෙනත් විරුද්ධ දේශපාලන පාක්ෂිකයන් අත්අඩංගුවට ගන්න, ඔවුන්ට විවිධ අඩන්තේට්ටම් කරන්න තමයි තමුන්නාන්සේලා සුපුරුදු පරිදි මේ නීතිය පවත්වා ගෙන යන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට අපි යෝජනා කරන්නේ, මේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කරන්නේ නැතුව රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරන රාජ්‍යයක් බවට මේ රාජ්‍යය පත් කළ යුතුයි කියලායි.

ඒ විතරක් නොවෙයි. දැන් ආණ්ඩුව විවිධ අඬ හැරයන් පාන්නේ කුමන්ත්‍රණ, ඒ වාගේම වෙනස් වෙනස් වර්ගයේ ක්‍රියාමාර්ගවලට රට අවතීර්ණ වෙමින් තිබෙනවාය කියලායි. මෙය

[ගරු අනුර දිසානායක මහතා]

මුළුමනින්ම අසත්‍ය කථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාව මතු වන්න හේතු සාධක වී තිබෙන්නේ වසා තිබෙන සේප්පුවේ දොර විවෘත කරලා, පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ අර්ථසාධක අරමුදල මංකොල්ල කෑමකට අවශ්‍ය වන අණ පනත් සකස් කරමින් තිබුණු නිසායි. සාමාන්‍යයෙන් හොරා කෑමේ ක්‍රම තිබෙනවා. වහලෙන් බැහැලා හොරු එනවා. තමන්ගේ ගිනි අවිය පෙන්වා ගෙදරට පැනලා හොරකම් කරනවා. පාරේ යන කොට දැළි පිහිය පෙන්වා හොරකම් කරනවා. හැබැයි අපේ රටේ අර්ථසාධක අරමුදලේ තිබෙන රුපියල් කෝටි 95,000 හොරකම් කරන්න උත්සාහ කළේ පසු ගිය අප්‍රේල් මාසයේ 27 වන දා විශේෂ පාර්ලිමේන්තුවක් කැඳවා අපේ රටේ නීතියක් සම්මත කරලායි. ඒ මුදල මේ රටේ වැඩ කරන ජනතාව තමන්ගේ වැටුපෙන් සියයට 8ක් කපා එකතු කර ගන්නා -එක් රැස් කර ගන්නා- මුදල්. ඒවා රජයේ මුදල් නොවෙයි. ඒවා මැදමුලන වලව්ව විකුණා ගෙනාපු මුදල් නොවෙයි. ඒවා වැඩ කරන ජනතාවට අයිති මුදල්. එම වැඩ කරන ජනතාවගේ මුදල් මං කොල්ල කෑම සඳහා යම් නීතියක්, අණ පනතක් සකස් කරනවා නම්, ඒ අණ පනත හකුළා ගැනීම සඳහා ඒ අණ පනතට එරෙහිව කටයුතු කිරීමේ සාධාරණ අයිතියක් වැඩ කරන ජනතාවට තිබෙනවා.

විශේෂයෙන්ම පෞද්ගලික අංශය තුළ ශක්තිමත්ම වෘත්තීය සමිති ව්‍යාපාරය තිබෙන්නේ අපේ පක්ෂයටයි. ඒ අන්තර් සමාගම් සේවක සංගමයයි. අන්තර් සමාගම් සේවක සංගමය විධියට අපි දිගින් දිගටම කරුණු පැහැදිලි කරලා කිව්වා. "මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්න එපා. රට තුළ යම් කාර්මික ආරවුලක් ඇති වීමේ තත්ත්වයකට රට පත් කරන්න එපා. මේ පිළිබඳව වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා, වෘත්තීය සමිතිවල අදහස් යෝජනා සැලකිල්ලට ලක් කරලා, ඔවුන්ට තමන්ගේ ජීවිතය දීර්ඝ කාලයක් පවත්වා ගෙන යෑමට සරිලන විශ්‍රාම වැටුපක් ලබා දිය යුතුය"යි කියන අදහස අපි ඉදිරිපත් කරමින් තිබුණා. නමුත් ඒ වෙනුවට ආණ්ඩුව කරමින් සිටියේ මොකක්ද? කෙසේ හෝ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරනවාය, තමන්ට පාර්ලිමේන්තුවේ 162ක ඔළු ගෙඩි ප්‍රමාණයක් තිබෙනවාය, ඒ ඔළු ගෙඩි ප්‍රමාණය පාවිච්චි කරලා, ඒ අධිකාරි බලය පාවිච්චි කරලා ඒ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගන්නවාය කියන උඩඟු හැසිරීමෙන් කටයුතු කරමින් සිටියා. අමාත්‍යවරු කර්මාන්තශාලා ඇතුළට ගිහින් නොසන්සුන්තාවක් නිර්මාණය කළා. අපි ගියේ නැහැ. ඇමතිවරු තමයි කර්මාන්තශාලා ඇතුළට ගිහින්, එහි සේවක සේවිකාවන් හමු වී, මේ පනත් කෙටුම්පත ගෙන එනවාය කියන පොරොන්දුව දෙමින්, එය ඉටු කරනවාය කියන තත්ත්වයක් ඇති කරමින් ඒ තරුණ තරුණියන් තුළ නොසන්සුන්තාවක් ඇති කළේ. ඒ නොසන්සුන්තාව ඇති කිරීම පිළිබඳව වග කියන්න ඕනෑ, කර්මාන්තශාලාව ඇතුළට ගිහිපු ඇමතිවරු සහ මන්ත්‍රීවරියනුයි. එය මතක තබා ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යම් අය පැහැදිලි කරනවා, ඒ පනත් කෙටුම්පත ඉවත් කර ගන්නවාය කියලා කියා තිබියදී ඒ උද්ඝෝෂණය මතු වුණාය කියලා. ඒක පට්ටපල් බොරු. ඒ පනත් කෙටුම්පත නිදහස් වෙළෙඳ කලාපවලට අයිති නැහැයි කියලා ගාමිණී ලොකුගේ අමාත්‍යවරයා 30වන දා දවල් 11.00ට ප්‍රකාශයක් කරනවා. 30වන දා දවල් 11.00ට කරපු ප්‍රකාශය ආණ්ඩුව විසින් මෙහෙයවන ලද වෙබ් අඩවියේ -වෙබ් අඩවියේ නේ ඉක්මනින් පළ වන්නේ.- මේ ප්‍රවෘත්තිය පළ වෙලා තිබුණේ සවස 4.30ටයි. වැඩ පොළට ගිහිපු තරුණ තරුණියන් කොහොමද දැන ගන්නේ මේ පනත් කෙටුම්පත හකුළා ගත්තාය කියලා. හැබැයි මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාත්, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් 30වන දා උදේ 10.00ට මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා කියනවා, මේ පනත් කෙටුම්පත ගෙනෙනවාය කියලා. ඒ 30වන දා උදේ. 30වන දා උදේ වැඩ පොළට යන කොට නිදහස් සේවක සංගමයෙන් පෝස්ටර් ගහලා තිබුණා, මේ පනත ක්‍රියාත්මක කරනවාය කියලා. පත්‍රිකා බෙදලා තිබෙනවා, මේ පනත ක්‍රියාත්මක කරනවාය කියලා. එහෙම නම් පනත් කෙටුම්පත වෙනස් කරනවා හෝ සංශෝධනය කරනවා හෝ හකුළා ගන්නවා කියන ප්‍රවෘත්තිය වෙනුවට ඒ වැඩ කරන සේවක සේවිකාවන් වෙත ගෙන ගියේ කෙසේ හෝ බලහත්කාරයෙන් මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවාය කියන අදහසයි. ඔවුන්ගේ මුදල් හොරකම් කරන්න ඔවුන් ඉඩ දෙන්නේ නැහැ. ඒක සාධාරණ අයිතියක්. ඔවුන් ඒ වෙනුවෙන් සාමකාමී උද්ඝෝෂණයක නිරත වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් අඩුම තරමේ නිදහස් වෙළෙඳ කලාපයේ ප්‍රධාන දොරටුවෙන් මෙහාට එන්න ආවේ නැහැ. ප්‍රධාන දොරටුවෙන් ඇතුළට ගියේ පොලිස් නිලධාරින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් කුරුණෑගල පොලිසියේ සිට කටුනායකට එන්න අවම වශයෙන් පැය තුනහමාරක්වත් යනවා.

කළුතර පොලිසියෙන් කැඳවා තිබුණා; හලාවත පොලිසියෙන් කැඳවා තිබුණා; පුත්තලම පොලිසියෙන් කැඳවා තිබුණා. කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම පොලිස් නිලධාරින් කැඳවා තිබෙන්නේ? ඒ නිසා පොලිසිය හිතාමතාම මෙතැනට කැඳෙව්වා කියන එකයි අපි කියන්නේ. අපි පිළිගන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිසිය සහ ඒ උද්ඝෝෂණකරුවන් අතර යම් නොසංසුන්තාවක් මතු වුණු බව. හැබැයි ඒ උද්ඝෝෂණය නතර වුණා. නතර වුණාට පසු සේවක සේවිකාවන් සුපුරුදු පරිදි කර්මාන්තශාලාවලට ගිහිල්ලා වැඩ කළා. ටොරොයිඩ්, නොරාටෙල්, මාස් කියන ආයතන ඇතුළට ඒ සේවක සේවිකාවන් ගිහිල්ලා තමන්ගේ දෛනික වැඩ කටයුතුවල නිරත වෙලා තිබුණා. තමන්ගේ දෛනික වැඩකටයුත්තේ නිරත වෙලා සිටින අතර තමයි පොලිස් නිලධාරින් ඒ කර්මාන්තශාලාවලට කඩා පැන්නේ. ඉහළින් නියෝගය ආවේ කොහොමද? "පනත් කෙටුම්පත හකුළා ගන්න දෙන්න එපා. තැන තැන පැන නැඟෙමින් තිබෙන කුඩා උද්ඝෝෂණ එක පාරම පොඩි පට්ටම් කරන්න ඕනෑ. නිය පොත්තෙන් කඩන්න තිබෙන දේ පොරවෙන් කපන්න සිදු වන තුරු තියන්න එපා. පොඩි කරපල්ලා" කියලා කිව්වා. ඒ හයිය තමයි පොලිසියට ආවේ. ඒ හයිය පාවිච්චි කරලා තමයි පොලිසිය කඩා පැන්නේ කර්මාන්තශාලා ඇතුළට. ගේට්ටු කඩලා, මුර කුටිවල හිටපු මුර සේවක සේවිකාවන්ට පහර දීලා, කඳුළු ගෑස් ගහලා, සේවිකාවන් උඩ තට්ටුවල ඉඳන් පහළට බස්සවලා, පෝලිම් ගස්සලා පොලිසිය දෙපැත්තෙන් පොලු තියාගෙන හිටියා. එහෙම ඉඳලා තරුණ තරුණියන්ට පහර දුන්නා. මීගමුව ඉස්පිරිතාලයේ 30කට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා, එක්කෝ අත කඩලා, එක්කෝ කකුල කඩලා. ඒ වාගේම 275කට වැඩි ප්‍රමාණයක් නේවාසිකව බෙහෙත් ගත්තා. සීදුව රෝහලේ 30 ගණනකට වඩා වැඩි ප්‍රමාණයක් නේවාසිකව බෙහෙත් ගත්තා. රාගම ඉස්පිරිතාලයේ 20කට වැඩි ප්‍රමාණයක් නේවාසිකව බෙහෙත් ගත්තා. අදත් ඉන්නවා. ආසන්න වශයෙන් ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 350කට වඩා වැඩි ප්‍රමාණයක් රෝහල් ගත වුණා. මේවා උද්ඝෝෂණයේ ප්‍රතිඵල නොවෙයි. කර්මාන්තශාලා ඇතුළට පැනලා පොලිසිය පහර දෙන්න පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ මේ තිබෙන්නේ ටොරොයිඩ් ආයතනයේ කාර්යාලයේ ඇතුළත ඡායා රූපයක්. කාර්යාලය ඇතුළේ තිබෙන සියලුම උපකරණවලට හානි කරලා තිබෙනවා. කාර්යාලයේ උද්ඝෝෂණය තිබුණේ නැහැ. ඊළඟට මේ ඡායාරූපයේ තිබෙන්නේ තවත් garment factory එකක් ඇතුළේ ගාල් කරලා තිබෙන වාහන. ඒ වාහන සියල්ලටම පොලිසිය ගිහිල්ලා හානි කරලා තිබෙනවා, ආණ්ඩුවේ උපදෙස් පරිදි. ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ තිබෙන්නේ garment factory ඇතුළේ, කාර්යාල ඇතුළේ ලේ තැවරුණු බිත්ති. මේ උද්ඝෝෂණ භූමිය නොවෙයි. ඒ වාගේම මේ ඡායාරූපයේ තිබෙන්නේ machine එකක්. මේ තිබෙන්නේ, machine එකක් ඇතුළේ තිබෙන උණ්ඩයක්. කර්මාන්තශාලාවක් ඇතුළේ තිබෙන machine එකකට උණ්ඩයක් ගියේ කොහොමද?

උද්ඝෝෂණයේ ප්‍රතිඵලද? නැහැ. කර්මාන්තශාලාව ඇතුළට ගිහිල්ලා වෙඩි තිබ්බා. ඒ වෙඩි උණ්ඩ තමයි කර්මාන්ත ශාලාව ඇතුළේ machine එකක් ඇතුළේ මේ තිබෙන්නේ. මේ සියලු ඡායා රූප මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන්නේ සමහර කර්මාන්තශාලා ඇතුළේ තිබෙන මෝටර් රථ-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිදු වී තිබෙන මරණයත් ඒ වාගේම දැනට අත් අඩංගුවේ සිටින සියලු දෙනාත්, රෝගාතුර වී සිටින සියලු දෙනාත් ගැන පරීක්ෂණයක් අංක 2011/1577 දරන නඩු විභාගය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ යද්දී මේ පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්ද කියලා තීරණයක් දෙන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එසේ නම් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා දැන්වූ පරිදි, මෙයින් බැහැර වෙන්නය කියා මා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට කියනවා. ඒ ගැන සාකච්ඡා කරන්නට බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා බැහැර වෙන්නම්. නඩුත් හාමුදුරුවන්ගේ. බඩුත් හාමුදුරුවන්ගේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හදිසි නීති විවාදයේම දැන් මේ පිළිබඳව කථා කළා. ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය මේ ගැන කථා කරන කොට ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා සාමකාමීව ඔතැන වාඩි වෙලා හිටියා. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා එතුමාට එහා පැත්තේ ඉඳ ගෙන ඕක ගැන කථා කරන කොට ඔය කන් දෙකේ මූඩි ගහගෙන හිටියාද කියන්න මා දන්නේ නැහැ. ඊයේ පාර්ලිමේන්තුවේ කල් තැබීමේ විවාදයක් තිබුණා. මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යවරයා ඇති තරමට බෙරිහන් දෙමින් කථා කළා, ගෝරනාඩු කරමින් කථා කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක වැරදියි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මා ගෞරවයෙන් කියන්න ඕනෑ එවැනි වචන, වාක්‍ය සම්පූර්ණයෙන් හැන්සාඩ් වාර්තාවෙන් කපා හරින්න කියලා ඊයෙත් මූලාසනයෙන් නියෝගයක් දුන්නු බව.

ඊයේත් මේ ප්‍රශ්නය මතු කළේ මායි. ඒ නිසා අධිකරණ-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා වැඩි වෙලාවක් ගන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කථා කරනවාට විරුද්ධ නැහැ. අධිකරණය ඉදිරියේ තිබෙන කාරණයක් සම්බන්ධව කථා කිරීමේදී, -මරණයක්, බරපතළ ලෙස තුවාල ලැබූ සිද්ධියක්, ඒ වාගේම රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමක්- අපි බොහොම ප්‍රවේශමෙන් කථා කළ යුතුයි. අධිකරණයේ විභාග වන නඩුවලට අදාළ දේවල් ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න බැහැ. ඒක පිළිගත් සම්ප්‍රදායයක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පැත්තෙන්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට නැවත වාරයක් ප්‍රකාශ කරනවා, මූලාසනයේ අණ පිළිපදින්න කියලා. කරුණාකර ඒ ගැන කථා කරන්න එපා. ඒ ගැන යම් දෙයක් කියා තිබෙනවා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් කපා හරිනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කිව්වේ මොකක්ද? එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක්කොම කපා හරින්න. මොකක්ද, මේ දෙබිඩි පිළිවෙත? පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලය තිබෙනවා තමයි. ඔබතුමා මූලාසනයේ ඉන්නවා තමයි. [බාධා කිරීමක්] මොකක්ද මේ කරන අසාධාරණය? එහෙම නම් ඔක්කොම කථා කපා හරින්න. මොකක්ද, පාර්ලිමේන්තුවට මේ නීති දෙකක්?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අධිකරණයට ඉදිරිපත් වී තිබෙන කාරණයක් ගැන ප්‍රකාශ කරන්නට බැහැයි කියන එක ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අපට දැනුම් දුන්නා. ඒක ඔබතුමා පිළිගත්තා. ඒ අනුව ඒකෙන් බැහැර වෙලා දැන් කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද කපා හරින්න කියන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේගේ කථාව කර ගෙන යන්න. තමුන්නාන්සේට තව මිනිත්තු දෙකයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය පුටුවේ වාඩි වෙලා මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව මිනිත්තු දෙකයි තියෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය පුටුවේ වාඩි වෙලා අරලියගහ මන්දිරයේ වළං හෝදන වැඩේ කරන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! You have only two minutes. That is all.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය පුටුවේ වාඩි වෙලා මූලාසනයට අයිති වැඩේ කරන්න. ඔය පුටුවේ වාඩි වෙලා ඉන්නේ වළං හෝදන වැඩේ කරන්න නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීවරයෙකුට මූලාසනයට තර්ජනය කරන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය අසුන අපේ රටේ උත්තරීතර කථානායකතුමා වාඩි වන අසුන. ඒ අසුනේ ගරුත්වය ආරක්ෂා කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විෂයයට අදාළව කථා කරලා දැන් කථාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය අසුනේ ගරුත්වය ආරක්ෂා කරන්න. මොකක්ද මේ පාර්ලිමේන්තුව? තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. සාමකාමී රටක් ගැන කථා කරනවා. නිදහසක් ගැන කථා කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙවියකට සලකන එකද මේ පාර්ලිමේන්තුවේ ප්‍රතිපත්තිය කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. මේ පාර්ලිමේන්තුවේ ප්‍රතිපත්තිය මොකක්ද? ඇති තරමට අපට ප්‍රහාර එල්ල කරන්නත්, අපව ඝාතකයෝ හැටියට නම් කරන්නත්, අපට විවිධ චෝදනා එල්ල කරන්නත් තමුන්නාන්සේලාට නිදහස තියෙනවා. හැබැයි, ඒවා පිළිබඳව විනාඩි 15කින් පිළිතුරු දීමේ අයිතිය අපට නැද්ද? තමුන්නාන්සේලාට පැය ගණන් නන් දොඩවන්න පුළුවන්; පැය ගණන් බෙරිහන් දෙන්න පුළුවන්; පැය ගණන් කථා කරන්න පුළුවන්; පැය ගණන් විෂයයට අදාළ නොවන කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. එතකොට ඔහේ සාවධානව අසාගෙන ඉන්න පාර්ලිමේන්තුව! ඔහේ වාඩිවෙලා ඉන්න මූලසුන!! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් මූලාසනයේ ඉන්නවා. විනාඩි 15ක් කථා කිරීම මගේ අයිතියක්. ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට පැවරී තිබෙන අයිතියක්. අපේ පක්ෂය පිළිබඳවත්, අපේ දේශපාලනය පිළිබඳවත් යම් විවේචනයක් ඉදිරිපත් වෙනවා නම් ඒ විවේචනය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න මට අයිතියක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේගේ අයිතිවාසිකම මූලාසනය විසින් ආරක්ෂා කරනු ලබයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ අයිතියත් මේ පාර්ලිමේන්තුවේ නැත්නම් එළියේ ප්‍රජාතන්ත්‍රවාදයක් කොහේද? ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන්මල්කඩ හැටියට තමුන්නාන්සේලා හඳුන්වන මේ උත්තරීතර ආයතනය ඇතුළේදීත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ලැබෙන්නේ නැත්නම්, නිදහසක් ලැබෙන්නේ නැත්නම් මේ රටේ ඈත ගම්මානයක ජීවත් වන පුරවැසියකුගේ ප්‍රජාතන්ත්‍රවාදය කවරක්ද?

මේ හදිසි නීතිය වැදගත් වන්නේ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමකාමී තත්ත්වයක් නිර්මාණය කරන්නයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමා, ඊයේ මූලාසනය කළ ඒ නියෝගය අනුව තමයි මමත් දැන් නියෝග කරන්නේ. ඒ නිසා කරුණාකර තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම නම් මං ඔබතුමාගේ අවසරය පරිදි නඩුවක් නැති කරුණක් ගැන කියන්නම්. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපට උද්ඝෝෂණය කරන්න අයිතියක් තිබෙනවා. හැබැයි, ඒ උද්ඝෝෂකයන්ට පහර එල්ල කරන්න යම් පුද්ගලයන්ට පොලු අරගෙන නිදැල්ලේ හැසිරෙන්න ඉඩකඩ හදලා දුන්නේ කවුද? මං ළඟ ඡායාරූප කිහිපයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මේකද? විජය මුද්‍රණාලය ඉදිරිපිට පොලු අරගෙන මැර කණ්ඩායම් නිදැල්ලේ හැසිරෙන හැටි මේ ඡායාරූපයෙන් දැක්වෙනවා. කවුද මේ? මේ ඡායාරූපයේ සිටිනවා, දුඹුරු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන පොල්ලක් අරගත්ත පුද්ගලයෙක්. කවුද, මේ? ඔහු තමයි කොලොන්නාවේ සමන්ත. අවුරුදු දහඅටේ දැරිවියන් දෙදෙනෙක් දූෂණය කරලා බන්ධනාගාරයට ගිහිල්ලා, අවුරුදු දෙකක් බන්ධනාගාරයේ තැපලා, දේශපාලන හේතූන් මත එළියට ආපු සමන්ත පොල්ලක් අරගෙන ඉන්නවා, උද්ඝෝෂකයන්ට පහර දෙන්න. තමුන්නාන්සේලාගේ බළකාය මේ ස්ත්‍රී දූෂකයෝද? ඊළඟට රතු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන අඩි තුනක් දිග පොල්ලක් අරගෙන, මේ ඡායාරූපයේ ඉන්නා පුද්ගලයා කවුද? ඒ ඉන්නේ කොලොන්නාවේ ඉන්දික. කොලොන්නාවේ ඉන්දික කියන්නේ කුඩු විකුණලා අහුවෙලා, රිමාන්ඩ් එකේ අවුරුදු තුනක් ඉඳලා ඇප පිට එළියට ආපු පුද්ගලයෙක්. ඔවුන් අද තමුන්නාන්සේලාගේ පෙරමුණු බළකායේ, පොලු බළකායේ ඉදිරි පෙළ නායකයන් බවට පත් වෙලා ඉන්නවා. කුඩු කාරයන්, ස්ත්‍රී දූෂකයන්, කසිප්පු වෙළෙන්දන් තමුන්නාන්සේලාගේ ආධාරකරුවන් බවට පත්වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මෙවැනි රටක ප්‍රජාතන්ත්‍රවාදය කවරක්ද? මා අවසාන වශයෙන් කියන්නේ මේකයි. කරුණාකර මේ රටේ ඇත්ත යට කරන්න දෙන්න එපා. තමුන්නාන්සේලාගේ නියෝග මත පොලීසිය වෙඩි තැබීමෙන් සහ වෙනත් හේතූන් මත විශාල හානියක් කර තිබෙනවා. මිනිසුන්ගේ අතපය කඩලා තිබෙනවා. ඒ අයට සාධාරණ වන්දියක් ගෙවන්න. ඒ අයට සාධාරණයක් ඉටු කරන්න. කාර්මික සාමය ඇති කරන්න. ඒ කර්මාන්තශාලාවලට සාධාරණ ගෙවීමක් කරන්න.

අවසාන වශයෙන්, මේ හදිසි නීතිය තවදුරටත් පවත්වාගෙන යෑමෙන් වළකින්නය කියා ඉල්ලා සිටිමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි, ඔබතුමා මේ ටිකවත් කියන්න ඉඩ ලබා දීම පිළිබඳව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

இப்பொழுது மாண்புமிகு சிவசக்தி ஆனந்தன் அவர்களை உரைநிகழ்த்த அழைக்கின்றேன். உங்களுக்கு ஆறு நிமிடங்கள் மாத்திரம்தான் உள்ளன.

[பி.ப. 6.38]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவசரகாலச் சட்ட நீடிப்பு சம்பந்தமான இந்த விவாதத்திலே ஆளும் கட்சியும் எதிர்க்கட்சியும் கட்டுநாயக்கவிலே நடைபெற்ற அசம்பாவிதங்கள் தொடர்பாகப் பல வாதப்பிரதிவாதங்களில் ஈடுபட்டுக்கொண்டிருக்கின்றன. இந்த அவசரகாலச் சட்டத்தினால் கடந்த முப்பது வருடங்களுக்கு மேலாகத் தமிழ் மக்கள் பல்வேறு வழிகளிலும் கொன்றொழிக்கப்பட்டும் பாதிக்கப் பட்டுமிருக்கின் றார்கள். இந்த நேரத்தில் தொடர்ந்தும் இந்த நாட்டிலே அவசரகாலச் சட்டம் நீடிக்கப்பட வேண்டுமா இல்லையா என்பது பற்றி முடிவெடுக்க வேண்டிய ஒரு காலகட்டத்திலே நாங்கள் இருக்கின்றோம். இங்கு நான் பல விடயங்களைக் குறிப்பிட வேண்டி இருக்கின்றபோதிலும் எனக்குரிய நேரம் போதாமல் இருப்பதால் சில முக்கியமான விடயங்களை மட்டும் இங்கே குறிப்பிட விரும்புகின்றேன்.

குறிப்பாக வன்னி மாவட்டத்திலே தமிழ் கிராமங்கள் சிங்களமயப்படுத்தப்படுகின்றன; தமிழ்க் கிராமங்களுக்குச் சிங்களப் பெயர்கள் சூட்டப்படுகின்றன. அங்குள்ள பல ஆயிரக் கணக்கான நிலங்கள் அபகரிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இந்த நிலைவரங்கள் தொடர்பாகத் தமிழ்த் தேசியக் கூட்டமைப் புக்கும் அரசாங்கத்துக்கும் இடையே நடைபெற்ற ஆறு சுற்றுப் பேச்சுவார்த்தைகளில் சுட்டிக்காட்டப்பட்டும்கூட அவை எவற்றுக்குமே தீர்வு காணப்படவில்லை. குறைந்தபட்சம் காணாமற் போனவர்களுடைய பட்டியலை வெளியிடக் கூட இந்த அரசாங்கத் தினால் முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைவரம் இருக்கின்றது. இந்த நிலையிலேதான் அரசாங்கம், "இந்தப் பிரச்சினையானது ஓர் உள்வீட்டுப் பிரச்சினை; இதை நாங்களே பேசித் தீர்க்கலாம்; இதற்கு நாங்கள் எந்த நாட்டுக்கும் போக வேண்டிய அவசியமில்லை" என்று இங்கே கூறிக்கொண்டிருக் கின்றது. அரசாங்கத்துக்கும் தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் இடையிலே நடைபெற்றுக்கொண்டிருக்கின்ற இந்தப் பேச்சு வார்த்தையானது, குறைந்தபட்சம் இந்த நாட்டிலே சமாதானம்குறித்த ஒரு நம்பிக்கையையும் மக்களின் வாழ்க்கையில் நல்ல விடிவையும் ஏற்படுத்த வேண்டும் என்பதுதான் தமிழ் மக்களுடைய விருப்பம். ஆனால், இன்றைக்கு இந்தப் பேச்சுவார்த்தை சம்பந்தமாகத் தமிழ் மக்கள் எங்களைத் தொடர்ந்தும் ஏளனமாகப் பார்க்கின்ற ஒரு நிலைவரம்தான் இருக்கின்றது. தமிழ்த் தேசியக் கூட்டமைப்பும் அரசாங்கமும் வெறும் தேநீர் விருந்துக்காகத்தான் இந்தப் பேச்சுவார்த்தையிலே ஈடுபடுகின்றார்கள் என்ற பாரிய குற்றச்சாட்டு தமிழ் மக்கள் மத்தியிலிருந்து எழுந்து கொண்டிருக்கின்றது. ஆகவே, இந்த நிலையிலே வெளிநாடுக ளினுடைய ஆதரவோ அல்லது அழுத்தங்களோ இல்லாமல் இந்தப் பிரச்சினையை தீர்க்க வேண்டுமாக இருந்தால் இந்த அரசாங்கம் உண்மையிலேயே இதய சுத்தியோடு பேச வேண்டும். ஆனால், இதுவரைக்கும் நடைபெற்ற ஆறு சுற்றுப் பேச்சுவார்த்தைகளிலே அரசாங்கம் அதனது நம்பகத் தன்மையைக் காட்டவில்லை.

அதுமட்டுமல்ல, எங்களுடைய பிரதேசங்களிலுள்ள நிலங்கள் அபகரிக்கப்பட்டு, தமிழ்க் கிராமங்கள் சிங்களமயப்படுத்தப்பட்டு அத்துமீறிய குடியேற்றங்களும் நடைபெற்றுக்கொண்டி ருக்கின்றன. குறிப்பாக வவுனியா வடக்கு நெடுங்கேணிப் பிரதேசத்திலே வெடிவைத்தகல்லு கிராம சேவையாளர் பிரிவுக்குட் பட்ட கொக்கச்சான் குளம் என்ற கிராமம் கலாபோவசேவ என்று பெயர் மாற்றப்பட்டு, அங்கு 165 சிங்களக் குடும்பங்கள் குடியேற்றப்பட்டிருக்கின்றன. இந்தப் பிரதேசத்திலே 200 ஏக்கர்களுக்கு மேற்பட்ட வயற்காணிகளும் 200 ஏக்கர்களுக்கு மேற்பட்ட குடியிருப்புக் காணிகளும் அபகரிக்கப்பட்டது மட்டுமல்லாமல், அனுராதபுரம் அரசாங்க அதிபர் ஊடாக இவர்களுக்குக் காணி அனுமதிப்பத்திரங்களும் வழங்கப் பட்டிருக்கின்றன. இந்த நிலையிலே இந்தக் காணிச் சொந்தக்காரர்கள் எங்களிடம் வந்து மிகுந்த வேதனையையும் கவலையையும் தெரிவித்திருக்கின்றார்கள். ஆகவே, இந்த மாதிரியான விடயங்கள் உடனடியாகத் தடுத்து நிறுத்தப்பட வேண்டும். அதேபோன்று செட்டிகுளம் நலன்புரி முகாம் இருந்த பிரதேசத்திலுள்ள 1500 ஏக்கர் காணியைத் தங்களுக்குத் தரும்படி இராணுவத்தினர் அந்தப் பிரதேசத்தினுடைய அதிகாரிகளை வற்புறுத்திக்கொண்டிருக்கின்றார்கள். அந்தப் பிரதேசத்தில் முகாம் அமைக்கப்பட்டபோது பல வசதிகள் செய்து கொடுக்கப்பட்டன. இன்று அந்த இடங்களும் பறிபோகின்ற நிலையில் இருக்கின்றது. அதேபோல், ஏ-9 வீதியிலுள்ள கனகராயன் குளப்பகுதியில் 04 தனிநபர்களுக்குச் சொந்தமான காணி - அரசாங்கத்தினால் வழங்கப்பட்ட உறுதிக் காணி - அபகரிக்கப்பட்டு, அதில் பௌத்த கோவில் ஒன்று நிர்மாணிப்பதற்கான வேலைகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. மேலும், வவுனியா தமிழ் மகா வித்தியாலயத்தில் ஒரு பௌத்த விகாரையைக் கட்டுவதற்குக் காணி தரும்படி கேட்டிருக்கின்றார்கள். இதே வவுனியா தமிழ் மகா வித்தியாலயத்துக்கு முன்பாக வவுனியா மாவட்டத்தினுடைய பிரதான பௌத்த கோவில் அமைந்திருக்கின்றது. இவ்வாறான தொரு நிலையில்தான் இன்று அரசாங்கத்துக்கும் தமிழ் தேசியக் கூட்டமைப்புக்கும் இடையில் பேச்சுவார்த்தை நடைபெற்றுக் கொண்டு இருக்கின்றது.

அதுமட்டுமல்லாது, ஏற்கெனவே மன்னார் மாவட்டத்திலே முள்ளிக்குளம் என்ற கிராமம் முழுவதும் கடற்படைக்கு சொந்தமாக் கப்பட்டிருக்கின்றது. மடுப் பிரதேசம் முழுவதும் அத்துமீறிய குடியேற்றங்கள் இடம்பெறுகின்றன. மேலும், பேச்சுவார்த்தை நடக்கின்ற இந்தக் காலகட்டத்தில் கூட, திருமுறிகண்டி, முள்ளிவாய்க்கால் வடக்கு, மேற்கு, அம்பலவன் பொக்கன, கேப்பாப்பிளவு உட்பட பல பிரதேசங்களில் காணிச் சுவீகரிப் புக்கள், தமிழ்க் கிராமங்களின் பெயர்கள் சிங்களத்துக்கு மாற்றப் படுதல், அத்துமீறிய குடியேற்றங்கள் போன்றன நடைபெற்றுக் கொண்டிருக்கின்றன. ஆகவே, இவ்வாறான செயற்பாடுகள் உடனடியாக நிறுத்தப்பட வேண்டும். அதேபோல், வவுனியா பம்பைமடுவில் இருக்கின்ற யாழ். பல்கலைக் கழகத்துக்குச் சொந்தமான காணியைக்கூட, ஓர் அமைச்சரின் பெயரைச் சொல்லி அபகரிப்பதற்கான முயற்சிகள் நடைபெற்றுக் கொண்டிருக் கின்றன. ஆகவே, இவ்வாறான நடவடிக்கைகள் உடனடியாக நிறுத்தப்பட்டு, அவற்றுக்குத் தீர்வு காணவேண்டும் என்று கேட்டுக்கொள்கிறேன். யுத்தம் முடிவடைந்து இரண்டு வருடங்களுக்குள் நடந்த 06 சுற்றுப் பேச்சுவார்த்தையில் எமது

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

உள்நாட்டுக்குள்ளே இருக்கின்ற இவ்வாறான சிறிய சிறிய பிரச்சினைகளைக் கூட அரசாங்கத்தினால் தீர்க்க முடியாதிருப்பது மிகவும் கவலைக்குரிய விடயமாகும்.

இன்று இந்த அரசாங்கமானது, ஐ.நா.வினுடைய அறிக்கை யினைக் கண்டு ஒவ்வொரு நாடாகச் சென்று ஆதரவைத் திரட்டுகிறது. இன்றைய தினம் தமிழக முதலமைச்சர் செல்வி ஜெயலலிதா அவர்கள் சட்ட சபையிலே இலங்கை பிரச்சினை தொடர்பாக, குறிப்பாகத் தமிழ் மக்களுடைய எதிர்காலப் பிரச்சினைகள் தொடர்பாகத் தீர்மானம் நிறைவேற்றியிருப் பதையிட்டுத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பிலே அவருக்கு நன்றியையும் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றோம். நன்றி, வணக்கம்!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 12ක් තිබෙනවා.

[අ. භා. 6.46]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ කථා රාශියක් අවසානයේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් හැම මාසයකටම සැරයක් ඒ මාසය තුළ වුණු සිදු වීම් පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණ කරනවා වාගේ වැඩක් තමයි මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය තුළින් අපි කරන්නේ. ඒකට හේතුව වෙලා තිබෙන්නේ ඒ මාසය තුළ වෙච්ච සිදු වීම් ටික අරගෙන ඒකේ වෙච්ච අසාධාරණකම් ටික කථා කරනවා මිසක මේකට නිත්‍ය විසඳුමක් ගැන අපි කිසි විටකවත් සාකච්ඡා නොකිරීමයි.

අද අපි ගොඩක් බලාපොරොත්තුවෙන් අහගෙන හිටියා, අපේ විදේශ ඇමතිතුමා ප්‍රකාශයක් කරපු වෙලාවේදී. එතුමා ඒ ප්‍රකාශයෙන් වැඩි හරියක් කළේ එතුමාගේ දින පොත කියවීමයි. එතුමාට හමු වුණු කට්ටිය, කාපු බීපු තැන්, ගිය තැන්, ගිය රටවල් ගැන එතුමා කිව්වා. නමුත් එතැන ප්‍රශ්නයක් ඇති වෙච්ච එකක් ගැන එතුමා පැහැදිලිව කථා කළේ නැහැ. මොකද අපි ගාව තිබෙනවා, මෙතුමන්ලාටම සම්බන්ධ Patriotic National Movement එකේ - මෙතුමන්ලාගේ පක්ෂයේ සාමාජිකත්වය දරන සංගමයේ- සාමාජිකයෙක් දීපු ප්‍රකාශයක්. ඒකේ පැහැදිලිව කියනවා, ජී.එල්. පීරිස් මැතිතුමාත්, ඒ වාගේම ඉන්දීය විදේශ ඇමතිතුමාත් අතර වෙච්ච සාකච්ඡාවේදී හදිසි නීතිය ලිහිල් කරන එක ගැන මෙතුමන්ලා ප්‍රකාශ කර තිබෙනවා කියලා. If you are not willing to accept it, I will read out this article on PNM, which was on the net.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම තව එක දෙයක් මතක් කරන්නට ඕනෑ. අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. මේ හදිසි නීතිය ප්‍රයෝජනයට අරගෙන තිබෙන්නේ මාධ්‍ය මර්දනය කරන්න සහ විපක්ෂය මර්දනය කරන්නයි. යුද්ධය පිළිබඳව හදිසි නීතිය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව කිසි විටක කිසිම විවාදයක් අප අතරේ නැහැ. අප එයට සියයට 500ක් ඔබ සියලු දෙනාත් එක්ක එකඟයි. නමුත් මාධ්‍ය මර්දනයටත්, විපක්ෂය මර්දනයටත්, උද්ඝෝෂණවලට පහර දීමටත් හදිසි නීතිය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව අපේ ලොකු කනස්සල්ලක්, කනගාටුවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බලන්න, සරසවියට ඉන්නවා කැලෑ හමුදාවක්. සරසවියට කැලෑ හමුදාවක් ඉන්නවා කියලා ඇමතිවරයෙක් කියනවා. කැලණියට ඉන්නවා මරාගෙන මැරෙන හමුදාවක්. එහෙම ගියාම කොළඹට ඉන්නවා, පොලු හමුදාවක්. දැන් ගාල්ලෙත් ඉන්නවා මුතු පොලීසියක්. මේ අමුතු කණ්ඩායම් රාශියක් ඇති වෙලා තිබෙනවා. දැන් ශ්‍රී ලංකා පොලීසිය වෙනුවට ගාල්ලේ ඉන්නේ මුතු පොලීසිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි කියන්නේ මේ හදිසි නීතිය පිළිබඳව තිබෙන ගැටලුව මේක තමයි කියලා. මේක තමයි අපි කියන්නේ හදිසි නීතිය පිළිබඳ-[බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කලබල වෙන්න එපා. අපි උදේ ඉඳලා ඔබතුමන්ලා වාගේ තේ බීලා, බීලා මෙතැන ඇවිල්ලා ඉඳගෙන හිටියේ නැහැ. අපි දහවල් පටන් ගත්ත වෙලාවේ සිට මෙතැන බොහොම ලස්සනට, අවංකව මේ විවාදය අහගෙන හිටියා. ඒ නිසා මේ සියලු දේ අහගෙන ඉඳලා කථා කරන්න. ඔබතුමා පොඩ්ඩක් සංවර වෙන්න. නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට පොඩ්ඩක් සංවර වෙන්න.

හැමෝම එක සිද්ධියක් ගැන මෙතැන කථා කළා. ඒ විශේෂ සිද්ධිය තමයි කටුනායක ඇති වෙච්ච සිදු වීම. මේක පිළිබඳව පුංචි ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දැන් ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කළා. මමත් රාගම රෝහලට ගියා, ප්‍රතිකාර ලබන පිරිස බලන්න. මොකද බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ කරන ජනතාව අතිවිශාල ප්‍රමාණයක් තුවාල ලබා හිටියා. ඒ ගිය වෙලාවේ ටොරොයිඩ් කියන ආයතනයේත්, ස්මාර්ට් ෂර්ට්ස් කියන ආයතනයේත් වැඩ කරපු තරුණ තරුණියෝ කිහිප දෙනෙක්ම කිව්වේ එතුමිය කියපු කථාව නොවෙයි. ඒ නිසා මට එතුමිය කියපු කථාවට එකඟ වන්නට බැහැ. මම එතුමියට ගරු කළත්, ඒකට මට එකඟ වන්නට බැහැ. මොකද පැහැදිලිව කියනවා, උද්ඝෝෂණයක් කරන කොට - ඒ උද්ඝෝෂණය කරමින් පාරට යන්න ගියාම - කාන්තාවකට ගහපු ප්‍රශ්නයක් උඩ තමයි මේ සියලු දේ උද්ගත වුණේ කියලා. ඊට පස්සේ තමයි ගල් ගහලා තියෙන්නේ කියලා කියනවා. කඳුළු ගෑස් ගැහුවාට පස්සේ නැවත වරක් මේ හිටපු සේවකයෝ පිරිස තමන්ගේ කාර්යාලවලට ගියාට පස්සේ පොලීසිය විසින් අමානුෂික ලෙස පහර දීලා තිබුණා. කඳුළු ගෑස් ගහලා ස්මාර්ට් ෂර්ට්ස් ආයතනයට, ටොරොයිඩ් ආයතනයට, සෙනඟ එළියට එන කොට දෙපැත්තෙන් ඉඳලා පොලුවලින් පහර දීලා තමයි මේ සියලු සිදුවීම් වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට වඩා බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. "www.humanrights.asia" එකේ ප්‍රශ්න කීපයක් අහලා තිබෙනවා. I quote:

"Who gave the orders to use live ammunition against the protestors?

What is the topmost authority that authorized such use?

Who was the highest ranking officer on the ground who gave the orders……?"

මේවා කිසි දෙයක් අපට ප්‍රකාශ වෙලා නැහැ. සාමාන්‍යයෙන් අපේ පුංචි මට්ටමට දන්නා තරමින් වෙඩි තියන්න ඉස්සෙල්ලා

ප්‍රකාශයක් කරනවා, "ඔන්න අපි දැන් වෙඩි තියනවෝ" කියලා. ඊට පස්සේ තමයි වෙඩි තියන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එහෙමද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එහෙම තමයි වෙඩි තියන්නේ. එහෙම තමයි උද්ඝෝෂණවලදී වෙඩි තියන්නේ. [බාධා කිරීම්] එහෙම දෙයක් දන්නේ නැති, බුද්ධියක් නැති මිනිස්සු. ඔබතුමන්ලා වාගේ බුද්ධියක් නැති මිනිස්සු. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! - [*Interruption.*] නිශ්ශබ්ද වන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා කලබල වෙනවා. භූමිතෙල් දමපු ගැරඬි වාගේ දඟලනවා. ඔහොම තමයි මෙතුමන්ලාට ඇත්ත දරා ගන්න බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let him finish his speech.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුංචි ප්‍රශ්නයක් ගැන මතක් කරන්න ඕනෑ. පොඩ්ඩක් ඒ සඳහා අවස්ථාව දෙන්න. විපක්ෂය ඔහොම මර්දනය කරන්න එපා. [බාධා කිරීම්] ඔබතුමන්ලා මේ කරුණු අහ ගන්න. [බාධා කිරීම්] එදා දවසේ අධි ආරක්ෂක කලාපයක- [බාධා කිරීම්] අධි ආරක්ෂක කලාපයක උද්ඝෝෂණයක් කරපු දේශ ප්‍රේමියා- [බාධා කිරීම්] ඒ දේශ ප්‍රේමියා උද්ඝෝෂණය කරන කොට නියෝජ්‍ය පොලිස්පතිගේ තොප්පිය ගැලෙව්වා. [බාධා කිරීම්] නියෝජ්‍ය පොලිස්පතිගේ තොප්පිය ගැලෙව්වා. [බාධා කිරීම්] අඩුම ගණනේ පහර දුන්නද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාවේ නිශ්ශබ්දතාව රකින්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
කේ.පී.පී. පතිරණ කියන DIG මහත්තයාගේ තොප්පිය ගැලෙව්වා. අඩුම ගණනේ පහර දුන්නද? [බාධා කිරීම්] අඩුම ගණනේ උද්ඝෝෂණයට පහර දුන්නද? [බාධා කිරීම්] එහෙම දෙයක් කළේ නැහැ. බොරු දොස්තර ඉඳ ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගැන තමයි අපට තිබෙන ප්‍රශ්නය. මෙතුමා කථා කරනවා මහා දේශ ප්‍රේමීත්වය ගැන. මෙතැන ප්‍රකාශයක් කළා මේ රටේ මතු වෙලා තිබෙන ප්‍රශ්න ගැන. හැබැයි, 2600 සම්බුද්ධත්ව ජයන්තියට හිටියේ ඇමෙරිකාවේ, ඩෙනිම් කලිසමක් ගහලා jacket එකක් දාලායි. වෙසක් උත්සවය වෙලාවේ විමල් වීරවංශ ඇමතිතුමා හිටියේ ඇමෙරිකාවේයි. දළදා මාළිගාවට ගියේ නැහැ, ජයසිරි මහා බෝධියට ගියේ නැහැ. දේශ ප්‍රේමියා ඇමෙරිකාවේදි ජැකට් එකක් ගහන් හිටියා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පොලීසියේ IGP-

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Neomal Perera, please go back to your seat and raise the point of Order.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா )
(The Hon. Neomal Perera )
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. Neomal Perera.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ජාල් එකටත් කියලාද ගියේ, ගහන්න? [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon. Member, you proceed with your speech

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එතුමා වයසට ගිහිල්ලා තට්ටෙත් පෑදිලා දැන් එහේ යන්න එපා. [බාධා කිරීම්] ඔබතුමාගේ කැරට්ටුව අහ ගන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාට තව එක කාරණයක් ප්‍රකාශ කරන්නට ඕනෑ. මෙතෙක් කල් සිදු වුණු සිදුවීම් පිළිබඳව සාකච්ඡා කරන්නට ඕනෑ. මගේ මිත්‍ර ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාත් දැන් මෙතැන ඉන්නවා. සමාවෙන්න. මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම මේක පසු ගිය දවසකත් ඇහුවා. ඔබතුමා 2007 ජූලි මාසේ 06 වැනි දා හදිසි නීති විවාදයකදී ප්‍රකාශයක් කළා, "මේ සුදු වැන් සංස්කෘතියට ගැලපෙන්නේ, මේ සුදු වැන් සංස්කෘතියට වගකියන්න ඕනෑ ආරක්ෂක ලේකම්තුමා" කියලා. අද ඔබතුමා ඔය පැත්තේ ඉන්නවා. ඔබතුමා ඒ කියපු වචනයට දැන් මොකක්ද කියන්නේ කියන එක පිළිබඳව දැන ගන්නට මට බොහොම ආශාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා කියනවා නම් ඒ ප්‍රකාශය අසත්‍යයක් කියලා, එහෙම නම් ඔබතුමා සරත් ෆොන්සේකාට දීපු ප්‍රකාශයත් පට්ටපල් අසත්‍යයක්ය කියන එකත් පිළිගන්න කියලා මම ඔබතුමාට කියනවා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. පොලීසියේ ලාංඡනයක් තිබෙනවා. පොලීසියේ ලාංඡනය ඔබ සියලු දෙනා කියවලා ඇති.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. Lakshman Senewiratne.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මගේ නම සඳහන් කරපු හින්දා හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට මම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේට ඉන්න පුළුවන් නම් මම හොඳ පැහැදිලි ප්‍රකාශයක් කරලා පහදලා දෙන්නම්. මෙතුමා මේ ළඟදී ටොමියා ගැනත් කියලා තිබුණා. මම ටොමියාව තියලායි මෙහාට ආවේ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon. Member, you have to wind up your speech.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඔබ සියලු දෙනාම දන්නවා පොලීසියේ ලාංඡනයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මිනිත්තුවයි තිබෙන්නේ. ඒක නිසා මූලාසනය බලා කථා කරලා අවසන් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මිනිත්තුවද තිබෙන්නේ?

ඔබ සියලු දෙනාම දන්නවා ඇති පොලීසියේ ලාංඡනයක් තිබෙන බව. ඒ ලාංඡනයේ තිබෙන්නේ "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි" කියලා. ඒ කියන්නේ, "ධර්මය රකින්නා ධර්මයෙන්ම ආරක්ෂා වෙනවා." කියලායි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධර්මය රකින්නේ බිම දා ගෙන, අනෙක් අයට පහර දීලා නොවෙයි. [බාධා කිරීම්] අහිංසක මිනිසුන්ට පහර දීලා නොවෙයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එක දෙයක් මතක තියා ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා දැන් අවසන් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
එක දෙයක් මතක තියා ගන්න. [බාධා කිරීම්] සම්බුද්ධත්ව ජයන්තියේ- [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බෝතලයකින් පහර එල්ල කළා. මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න. [බාධා කිරීම්] මට බොතලයකින් පහර එල්ල කළා. [බාධා කිරීම්] Sir, I rise to a point of order. - [*Interruption.*] Somebody attacked me with a bottle. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා අවසන් කරන්න. [බාධා කිරීම්] ඔබතුමාගේ වෙලාව අවසන්.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා එකක් මතක තියා ගන්න ඕනෑ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අවසන් කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මේ සම්බුද්ධත්ව ජයන්ති ගැන බොරුවට කථා කරන්න එපා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ වෙලාව අවසන්.

දැන් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දෙකක් තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සද්ද කරන්න එපාය කියලා කියන්නයි මම නැඟිට්ටේ. එතුමාට තව වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වෙලා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි මේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

තමුන්නාන්සේ මිනිත්තු දෙකක් කථා කරලා කථාව අවසන් කරන්න. නියෝගය පිළිපදින්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ කථා කරන්න මිනිත්තු දෙකක් ගන්න. විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා- [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Mr. Presiding Member, we were expecting the Minister of External Affairs to give a very clear-cut statement on what is going on. I have in my hand now - [*Interruption.*] Listen to me. - [*Interruption.*] This is an issue on which all of us have to work together.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Let him speak. He has got only two minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I have a document which states that the Tamil Nadu Assembly has passed a Resolution seeking imposition of economic sanctions on Sri Lanka today.- [*Interruption.*] I am asking the Minister of External Affairs - you had a joint declaration with India; you spelt it out yesterday and today the Tamil Nadu Assembly passes a resolution seeking imposition of economic sanctions on Sri Lanka. Is this the result of the joint declaration you had there? This is supported by all parties including DMK and ADMK. We all are concerned about this. We are all Sri Lankans. We can be in the Opposition but we have no thrill about this. The Minister of External Affairs has also given a very categorical statement. We are coming to the end of the Debate on the extension of the state of Emergency. This may or may not have been known by you. But, I am tabling* this document, a document by the Press Trust of India coming through the Chief Minister's office.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, do you take responsibility for that? Who has passed that Resolution?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

The Tamil Nadu Assembly.

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

But, that is not the Indian Lok Sabha?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am talking of the Tamil Nadu Assembly.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes, but that is not the Indian Parliament.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

They are basically telling the Indian Government to take action. You, as the Minister of External Affairs had a joint declaration with India. This is a politically sensitive issue. Tamil Nadu dictates Sri Lankan policy in India. So, please ensure that you make a categorical statement on this even at this moment.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, your time is up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

We must work together on issues like this. Do not tell us later on that we have gone to Western countries and told other things. This is an Indian issue. So, as the responsible Minister of External Affairs in a responsible Government that is concluding the Debate on the extension of state of Emergency, you must be able to respond spontaneously in this august Assembly to this particular issue.

What have you got to say about this? You defended matters that were taken up by my co-Opposition Colleagues and basically tried to humiliate them by saying something else. There are worse things, not only economic sanctions. But, I do not want to mention them.- [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you may conclude your speech now.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

On that particular basis, it is incumbent on the Government to respond to this matter because this is public knowledge from now onwards.

**** සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

**TN Assembly passes resolution seeking imposition of economic sanctions**

A file

PTI

Share · print · T+

PTI A file picture of Tamil Nadu Chief Minister J. Jayalalithaa. Photo: PTI

Tamil Nadu Assembly today adopted a unanimous resolution seeking imposition of economic sanctions against Sri Lanka by India on issues concerning Tamils in the island nation, including alleged human rights violations.

The resolution moved by Chief Minister Jayalalithaa also wanted India to press the United Nations to declare as "war criminals" those who committed alleged crimes during the conflict in Sri Lanka.

Ms. Jayalalithaa said only economic sanctions would "rein in" Sri Lanka, which she said, "did not heed the global opinion when it came to the Tamils issue".

"If India and other countries impose sanctions, Sri Lanka has to listen to what we say", she said replying to the debate on the resolution.

She said there were allegations about Sri Lanka committing human rights violations and preventing humanitarian aids from reaching the suffering Tamils, the issues which prompted her to move the resolution.

The Chief Minister said Tamils had been struggling against being treated as "second class citizens in their own country" even after Sri Lanka got independence from the British.

She, however, said terrorism had crept in the name of Tamil Eelam which had even resulted in fratricide.

She recalled that after the assassination of Rajiv Gandhi in 1991 on Tamil soil, the sympathy here towards LTTE had turned into an anger against them.

Ms. Jayalalithaa said it was on her insistence that the Centre had first banned LTTE in India in 1992.

She also recalled that it was her government in 2002 which passed a resolution in the assembly demanding the arrest and extradition of slain LTTE leader V Prabhakaran in connection with Rajiv Gandhi's assassination.

Taking a dig at her party's main rival the DMK, she said that it failed to do anything for the welfare of Sri Lankan Tamils and took potshots at party president M Karunanidhi for organising a fast as Chief Minister demanding ceasefire after having "breakfast and calling it off later in the day".

She alleged that he had betrayed the Tamils by announcing that a ceasefire was on which made scores of people to come out from the bunkers but they were killed in aerial bombings.

Ms. Jayalalithaa said she did not intend to level charges against DMK but insisted that it was "selfish nature and helplessness of the previous DMK regime" which resulted in the death of Tamils.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

[අ. භා. 6.59 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට සහභාගි වූ ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ මැති ඇමතිතුමන්ලා හා මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටම රජය වෙනුවෙන් අපේ ස්තුතිය පුද කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ වගකීම මෙම සභා ගර්භයට තිබෙනවා. එම නිසා අපේ මතයට විරුද්ධ වුණත් අද මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඕනෑම මතයක් ප්‍රකාශ කිරීමට අප සියලු දෙනාටම අවස්ථාව සපයා දී තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம்.அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කථාව කර ගෙන යන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ වූ විවාදයේදී මූලික වශයෙන් කටුනායක ඇති වූ සිද්ධිය සම්බන්ධයෙන්, ඊයේ පැවැති සභාව කල්තැබීමේ විවාදයට අමතරව විපක්ෂයෙනුත් ආණ්ඩු පක්ෂයෙනුත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. මේ සිද්ධිය රජය විසින් සිදු කරන ලද සිද්ධියක් හැටියට හුවා දැක්වීමට විපක්ෂය උත්සාහයක් දැරුවත් මේ රටේ ජනතාව එවැනි දේවලින් නොමඟ යන්නේ නැහැ. විශේෂයෙන් ගැටුම්කාරී තත්ත්වයන් ඇති වන විවිධ අවස්ථාවන් අප ඉතිහාසයේ දැක තිබෙනවා. සමහරවිට මේ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය කිරීමේ වගකීම සමහර දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති විසින් භාර ගත යුතුව තිබෙනවා. අද වැලේවැල් නැතිව ඉන්න සමහර දේශපාලන පක්ෂවලට මොකක් හෝ වැලක් එල්ලෙන්නට ඕනෑ වෙලා තිබෙනවා. එම නිසා ඔවුන් කල්පනා කරන්නට ඇති මේ සිද්ධියෙන් ඒ වැලේවත් එල්ලීලා දැන් අපි දේශපාලන වශයෙන් ගොඩ එන්නට ඕනෑය කියා. එවැනි කාලකණ්ණි සන්තෝෂයක් විඳිනවා නම් ඒ සන්තෝෂය විඳ ගැනීම අප ඒ අයට භාර දෙනවා. නමුත් මේ රටේ ප්‍රබුද්ධ, බුද්ධිමත් ඡන්දදායකයන් හා ජනතාව මෙවැනි දේවලින් කිසිසේත්ම පිටිපස්සට යන්නේ නැහැ. ඔවුන්ගේ ස්ථාවරයන් වෙනස් නොකර ගන්නා බව අප දන්නවා. මොකද, මීට අදාළ රූප රාමු අප දැක්කා. අපේ ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය කිව්ව ආකාරයට, අපේ අනෙකුත් මැති ඇමතිවරුන් කිව්ව ආකාරයට මේ සිද්ධිය පිළිබඳව රටේ ජනතාව ඉතා හොඳින් දන්නවා. මේක ඇවිස්සුවේ කවුද, මේක ඇති වුණේ කොහොමද කියන කාරණය පිළිබඳව දන්නවා. විශේෂයෙන් පොලීසියට සිදු වී ඇති අලාභහානි මේ සියලු දේවල් බැලුවාම හැම විටම මේ රටේ පොලීසියට හා ත්‍රිවිධ හමුදාවට මේ රටේ ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ වගකීම අප පවරා තිබෙනවා. යම් අවස්ථාවකදී පොලිස් නිලධාරියකු හෝ නිලධාරීන් අතින් තමන් විසින් නොකළ යුතු දෙයක් කර තිබෙනවා නම්, තමන්ට ලබා දී ඇති බලය අනිසි ලෙස පාවිච්චි කර තිබෙනවා නම්, එය ඉක්මවා ගිහින් තිබෙනවා නම් ඒ පිළිබඳව අප සොයා බැලිය යුතුයි. එම නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා එසේ සොයා බැලීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් තුළ රජයකට කළ හැකි දෙය තමයි අප කර තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පත පිළිබඳව ගත්තොත්, 1988 මාර්තු මාසයේදී එක්සත් ජාතික පක්ෂ රජය විසින් මේ ආකාරයටම Employees' Provident Fund එක නැති කර pension ක්‍රමයක් ඇති කිරීම පිළිබඳව පිඹුරුපත් සකස් කළ බව අප ප්‍රකාශයට පත් කරන්නට ඕනෑ.

මෙම පනත් කෙටුම්පත පිළිබඳව විරෝධතාවක් තිබෙනවා නම්, ඒ විරෝධතාවන්ට කන් දීමට තරම් අපේ රජය නිහතමානී වීම රජයේ දුර්වලතාවක් හැටියට සලකන්නට එපාය කියන එක මම ප්‍රකාශ කරන්නට කැමැතියි. අපේ රජය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස

එවැනි දේවල්වලට ඇහුම් කන් දීලා, ඇති වන තත්ත්වයන් සමනය කිරීමට කටයුතු කර තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් වඩ වඩාත්ම ගිනි අවුළුවන්නේ නැතුව අඩියක් පස්සට ගිහිල්ලා හරි රටේ එවැනි කඩාකප්පල්කාරී වාතාවරණයන් ඇති වීම නැවැත්වීමට අපි ඉතාම ප්‍රඥාගෝචර පියවර අරගෙන තිබෙන බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අපත් ද්‍රවිඩ සන්ධානයත් අතර පවත්වන සාකච්ඡා පිළිබඳව ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීතුමා කථා කළා. මේ රජය ඉතාම අවංකව ඒ සාකච්ඡා ඉදිරියට ගෙන යෑම සඳහා වැඩ කටයුතු කරනවා. ඊළඟ සාකච්ඡා වටය මේ මාසයේ 23වැනි දින පැවැත්වීමට කටයුතු යොදා තිබෙනවා. විශේෂයෙන්ම අපි එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජය කළත්, ඒ පරාජයෙන් පසු දීර්ඝ කාලීනව මේ රටේ තිරසාර සාමයක් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීමට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය සූදානම්. නමුත් අපි රට බෙදන්නට සූදානම් නැහැ. ප්‍රභාකරන් බලාපොරොත්තු වුණු දේවල් දෙන්නට සූදානම් නැහැ. විදේශිකයන් කියන ආකාරයට වැඩ කරන්න සූදානම් නැහැ. අපි අපේ රටේ මහජන නියෝජිතයන් හා ජනතාව සමඟ සාකච්ඡා කරලා සියලු ජනවාර්ගික කොටස්වලට එකඟ වන්නට පුළුවන් විසඳුමකට යන්නට ඕනෑ. ඒ විසඳුම උතුරු නැඟෙනහිර ජනතාවට පමණක් සතුටට පත් විය හැකි විසඳුමක් නොවෙයි. එය දකුණේ ජනතාවටත් සතුටට පත් වෙන්නට පුළුවන් විසඳුමක් වුණොත් විතරයි එය දිගටම පවත්වා ගෙන යන්නට අපට පුළුවන් වන්නේ. අන්න ඒ අදහස මනසේ තබා ගෙන තමයි අපේ රජය මේ සාකච්ඡා සඳහා අවතීර්ණ වෙලා තිබෙන්නේ කියන කාරණය මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අද මේ ඇති වෙලා තිබෙන සමහර දේශපාලන තත්ත්වයන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා; බොර දියේ මාළු ඇල්ලීම සඳහා නොයෙකුත් අය සූදානම් වන බව අපි දන්නවා. අද තමිල්නාඩු රජය අපට සම්බාධක පමුණුවන්නට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා කියලා රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා. ඒවා අපට අලුත් දේවල් නොවෙයි. එදා නැදුමාරන් ඇතුළු කට්ටිය දහස් ගණනක් ඉන්දියාවේ ඉඳලා ලංකාවට එන්න ඕනෑය කියලා අපට තර්ජනය කළා. නමුත් සමස්තයක් වශයෙන් ඉන්දීය රජය හා සමස්ත ඉන්දීය ජනතාව ශ්‍රී ලංකාවේ තිබෙන තත්ත්වය පිළිබඳව ගැඹුරු අවබෝධයක් හා අප පිළිබඳව ඉතා හොඳ බලාපොරොත්තුවක් තබා ගෙන ඉන්නවා. ඒ කියන ඉන්දු-ලංකා සම්බන්ධතාව අපි රැක ගෙන ඉන්නවා. ඒක කිසි ආකාරයකින් පළුදු වෙලා නැහැ. දැන් බලන්න, ශ්‍රී ලංකාවේ අපි යුද්ධය කරන අවස්ථාවේදී, ත්‍රස්තවාදය අතුගා දමන අවස්ථාවේදී අපට ප්‍රශංසා ලැබුණා වාගේම අපව අවඥාවට භාජනය කරපු අය, එය පස්සට ඇදීමට කටයුතු කරපු අය ශ්‍රී ලංකාව තුළ හිටියා. ඒ නිසා යුද්ධයෙන් පස්සේ අපි ශ්‍රී ලංකාව නැවත ගොඩ නංවලා ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමට කටයුතු කරන මේ අවස්ථාවේදී මෙවැනි අභියෝග ඇති වෙනවා. දැන් එල්ටීටීඊ සංවිධානය ඒ අයගේ වෙනමම රජයක් මානසිකව -හිතින්- හදා ගෙන, ඒකේ මැති ඇමතිවරුන් පත් කර ගෙන කටයුතු කරනවා. සමහර අය ඒ රජයට ආවඩනවා. ඒක අපට නවත්වන්න බැහැ. නමුත් අපි ඒවා පිළිගන්නේ නැහැ. අපි මේ අභියෝග තේරුම් ගන්නට ඕනෑ. සාමය ස්ථාපිත කිරීම සඳහා යුද්ධය ජය ගත්තාටත් වඩා විශාල අභියෝගයකට අපට මුහුණ දිය යුතුව තිබෙනවා. අතිවිශාල වූ වැඩ කොටසක් කළ යුතුව තිබෙනවා. ඒ වැඩ කොටස කර ගෙන යෑමේදී අපට හමු වන බාධක විශාල ප්‍රමාණයක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යුද්ධය ජයග්‍රහණය කළා වාගේම ඒ බාධක හඳුනා ගෙන මේ රටේ තිරසාර සාමයක් පැවැත්වීම සඳහා රජයක් වශයෙන් කටයුතු කළ යුතුයි. අන්තර් ජාතික වශයෙන් සහ ජාතික වශයෙන් තිබෙන බලවේග හඳුනා ගෙන ඒවා තේරුම් බේරුම් ගනිමින් නිවැරදි මාවතකට ගමන් කිරීමේ අභිප්‍රාය අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට, අපේ රජයට තිබෙනවා කියන කාරණය මම ඉතා පැහැදිලිවම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හදිසි නීතිය පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවක් නැතැයි කියලා හැම දාම විපක්ෂය තර්ක කරනවා. ඔබතුමාත් දන්නවා, අපි තවමත් හදිසි නීතිය යටතේ රඳවා ගෙන ඉන්න රැඳවියන් ප්‍රමාණයක් ඉන්නවා. මේ ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු කරන්නට ඉතා ඉක්මනින් ඔවුන් නිදහස් කිරීමේ කාර්ය භාරය අපි ඉටු කර ගෙන යනවා. මේ පිළිබඳව අපි නිරතුරුව නීතිපතිතුමා සමඟ සාකච්ඡා කරනවා. ඔවුන් නිදහස් කිරීමේ වැඩ පිළිවෙළ අපි ඉක්මන් කරනවා. නමුත් රටේ තිබෙන නීති පද්ධතිය අනුව සමහර බරපතළ අපරාධවලට හසු වුණු එල්ටීටීඊ සැකකරුවන් නිදහස් කිරීමේ ක්‍රියා පිළිවෙත ඉතා ඉක්මනින් කිරීම අමාරු වෙලා තිබෙනවා. නමුත් නීතිපතිතුමාට ඉතා පැහැදිලි උපදෙස් රජය දීලා තිබෙනවා, මේ ගැන කටයුතු කරන්නය කියා. දහස් ගණනක් අපි නිදහස් කරලා යවා තිබෙනවා. මොන රටේද මේ වාගේ දැවැන්ත ත්‍රස්තවාදී සටනකින් පසුව දහස් ගණනක් නිදහස් කරලා ඔවුන්ගේ ගම්බිම් කරා යැව්වේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මොන අභියෝග තිබුණත් ඒ වැඩ පිළිවෙළ සහ උතුරු-නැඟෙනහිර පුනරුත්ථාපන වැඩ පිළිවෙළ ඉතාම කාලානුරූපව වාගේම ඉතා ඉක්මනින් ඉටු කිරීමට හැකි වීම පිළිබඳව අපි ඉතාමත් සතුටු වනවා, අපි ආඩම්බර වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා සභාවේ ඉන්න අවස්ථාවේදී මම කියන්නට කැමැතියි, හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතාගේ නඩුව නිරීක්ෂණය කිරීම සඳහා අන්තර් ජාතික පාර්ලිමේන්තු සංගමයේ විශේෂ නියෝජිතයෙක් පැමිණියේ එතුමන්ලා කාගේවත් ඉල්ලීමක් අනුව නොවෙයි කියන එක. ඒ පිළිබඳව එතුමා මේ පාර්ලිමේන්තුව නොමඟ යැවීම ගැන මම කනගාටු වනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා කථා කරන කොට මම අහ ගෙන හිටියා නේ.

එම නියෝජිතයා අන්තර් පාර්ලිමේන්තු සංගමයේ ඉල්ලීම අනුව මෙහි පැමිණි බව අද "ලංකාදීප" පුවත් පතේ සඳහන් වනවා. එය සඳහන් වන්නේ මෙසේයි:

"මෙහි ආවේ අන්තර් පාර්ලිමේන්තු සංගමයේ ඉල්ලීම අනුව පමණයි. ෆොන්සේකාගේ නඩු නිරීක්ෂණයට පැමිණි රාජ නීතිඥ ට්‍රොවෙල් කියයි.

හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතාට එරෙහි නඩු විභාග නිරීක්ෂණය කිරීමට තමා මෙහි පැමිණියේ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයකු විසින් කරන ලද ඉල්ලීමක් අනුව නොව අන්තර් පාර්ලිමේන්තු සංගමයේ උපදෙස් අනුව යැයි රාජනීතිඥ මාර්ක් ට්‍රොවෙල් මහතා ඊයේ (07) මාධ්‍ය වෙත අදහස් දක්වමින් පැවසීය"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය කියනවා UNP එක ඉල්ලපු නිසා එව්වා කියලා. ජයලත් ජයවර්ධන මහත්මයා ඉල්ලපු නිසා එව්වා, තිස්ස අත්තනායක මහතා ඉල්ලපු නිසා ආවා කියලා. එම නිසා නොවෙයි. මමත්, මහින්ද සමරසිංහ ඇමතිතුමාත් අන්තර් ජාතික පාර්ලිමේන්තු සංගමයට ගිය වෙලාවේදී අන්තර් ජාතික පර්ලිමේන්තු සංගමය අපේ රජයෙන් ඉල්ලීමක් කළා. අපට මේ trial එක බලන්න පුළුවන්ද කියලා ඇහුවා. අපි කිව්වා, අපේ රජයට හංගන්න කිසි දෙයක් නැහැ, ඇවිල්ලා බලන්න කියලා. විත්තිකරුවන්ට තමන්ගේ විත්තිවාචකය ඉදිරිපත් කිරීමට මේ ආණ්ඩුව මොන තරම් අවස්ථාවක් දෙනවාද, මොන විධියේ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සාධාරණ නඩු විභාගයක් අපි මේ රටේ පවත්වනවාද කියලා ඇවිල්ලා බලන්න කිව්වා. ජිනීවා නුවර ශීත කාමරවලට වෙලා අපි ගැන තීන්දු ගන්න එපා කියලා අපි කිව්වා. අපි එන්න එපා කිව්වා නම් ට්‍රොවෙල් මහත්තයාට මෙහේ එන්න බැහැ. එහෙම එන්න බැහැ.

ඒ විතරක් නොවෙයි. ඒ වැඩ කටයුතු නිරීක්ෂණය කරන්න අවශ්‍ය සියලු පහසුකම් අපේ නීතිපතිතුමා එතුමාට ලබා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මානව හිමිකම් පිළිබඳව අපේ රජය දක්වන උනන්දුව හා අපේ පාරදෘශ්‍යභාවය පිළිබඳව කිසිම සැකයක් දැන් අන්තර් ජාතික ප්‍රජාවට හෝ අන්තර් පාර්ලිමේන්තු සංගමයට හෝ නැහැ කියා මෙයින්ම පෙනෙනවා. මේ ආකාරයට කටයුතු කිරීම පිළිබඳව අන්තර් පාර්ලිමේන්තු සංගමය අගය කළා. ඒ වාගේම අපි කිව්වා, මේ ගෙන යන බොරු ප්‍රචාරවලට රැවටෙන්න එපා කියා. සරත් ෆොන්සේකා මහත්මයා හිර ගෙදර ඉන්නේ කොහොමද, එයාට ලැබෙන පහසුකම් මොනවාද කියා ඕනෑ නම් මුළු කොමිටියටම අපේ හිර ගෙවල්වලට ගිහින් බලන්න කිව්වා. අනෙක් හිරකරුවන්ට වඩා සරත් ෆොන්සේකා මහත්මයාට කොතරම් විශාල ප්‍රමාණයකින් අපි පහසුකම් දීලා තිබෙනවාද කියා ගිහින් බලන්න කිව්වා. අපිට හංගන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වැරදි ප්‍රකාශයත් නිවැරදි කරමින් මේ හදිසි නීතිය පවත්වාගෙන යාම සඳහා ඔබ සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ. භා. 7.15]

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Reginold Cooray -MINISTER OF MINOR EXPORT CROP PROMOTION))

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මුහුණ දී සිටින්නේ ලංකා ඉතිහාසයේ ඉතාමත්ම වැදගත් ඓතිහාසික යුග නිර්මාණය කරන අවධියකටයි. පෙර නොවූ විරු අභියෝගයන්ට අපට අද මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. පෙර නොවූ විරු අභියෝගයන් නිසාම ඉතිහාසයෙන් අපට සකස් කර දුන්නු පිළිතුරු, ඉතිහාසයෙන් සකස් කරලා සාදා නිම කර දුන්නු ready-made උත්තර පිළිබඳව අපට කිසිදු ගැටලුවක් ඇත්තේ නැහැ. ඉතිහාසය අපට හදාරන්න පුළුවන්; ඉගෙන ගන්න පුළුවන්; සාධනීය ගුණාංග එකතු කර ගන්න පුළුවන්. ඒ වුණත් අපේ රජයට, අපේ ජනාධිපතිතුමාට සිදු වී තිබෙන්නේ ඒ සියලු දේවල් උරුම කර ගෙන පෙර නොවූ විරු අභියෝගයන්ට මුහුණ දෙමින් නිර්මාණශීලීව, අභියෝගාත්මකව, අධිෂ්ඨානශීලීව මේ ඓතිහාසික දේශය හා ජාතිය අපේ ඉලක්කය වන ආසියාවේ ආශ්චර්ය දක්වා ඉදිරියට ගෙන යෑමේ කටයුත්ත කර ගෙන යන්නයි. මේ කටයුත්ත කරද්දි සමහර අය කියනවා, අප විදේශීය බලපෑම්වලට ගොදුරු වුණාය කියා. ලංකා ඉතිහාසය ගත්තොත් විදේශීය බලපෑමෙන් තොර, ඇඹිලි ගැසීම්වලින් තොර, ඒ බලපෑම්වලට යටත් නොවූ නිදහසේ ස්වාධීනව ගත කරන්න පුළුවන් වුණු එක යුගයක් හොයා ගන්න පුළුවන්ද කියා මා අහන්න කැමැතියි. අවුරුදු 2500ක ඉතිහාසය තුළ චෝල, පාණ්ඩ්‍ය, කේරළ, දාතිය, පීතිය, උත්තිය, එළාර, මාඝ, හල්ලුක, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදීන් සමඟ වරින් වර අත් නොහැර අපේ ස්වාධීනත්වය පිළිබඳ සටනට අපිට මුහුණ දෙන්න සිදු වුණා. බෙදුම්වාදී යුද්ධයක් අවසාන කර සිටින මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට අද සිදු වී තිබෙන්නේ, ඒ නෂ්ටාවශේෂ මත නැවත වතාවක් ඒ බලවේග පන ගන්වන්නට මුළු ලෝකය පුරාම විසිරුණු ඒ ජාලය සමඟ නැවත සටන් වදින්නයි. යුද බිම දිනූ අපි සියල්ල අවසාන යැයි හකුළාගෙන නිහඬව නිදා ගත්තොත් මේ රට බෙදන, කඩන, බිඳින බලවේගයන් වෙනත් වේෂයකින් නැවත වතාවක් නැඟිටින්න පුළුවන්. ඓතිහාසික බලවේගයන්ට යටත් වී අපි පාඩම් ඉගෙන ගත්තා. මේ පුංචි ලංකාව පෘතුගීසින්ට යටත් කර ගන්න බැරි වුණා; ඉංග්‍රීසින්ට යටත් කර ගන්න බැරි වුණා; ලන්දේසීන්ට යටත් කර ගන්න බැරි වුණා.

වරින් වර මේ රට යටත් කර ගත්තත්, අපි නිදහස් කර ගත්තා. ඒ නිසා මේ රටේ ඉතිහාසය පත අට එකට සිඳලා එක කෝප්පයකට ගත්තොත්, මේ රටේ ස්වාධීනත්වය පිළිබඳ සටන තමයි එතැන තිබෙන්නේ. ස්වාධීනත්වය පිළිබඳ සටන, රට එක්සත් කිරීම පිළිබඳ සටන, රට සෞභාග්‍යවත් කිරීම පිළිබඳ සටන කියන සටන් පාඨ තුන තමයි මුළු ලංකා ඉතිහාසය තුළම තිබුණේ. රට එක්සත් කරපු රජවරු ඓතිහාසික වුණා. ගාමිණී, ගජබා, විජයබා, පැරකුම්බා, වළගම්බා රජවරු කළේ ඒකයි. අද ඒ ඓතිහාසික උරුමය, ඒ ධජය, ඒ සටන, ඔවුන් අතින් ගිලිහුණු කඩුව ඔසවා ගෙන යන්නට සිදු වෙලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට සහ අපේ පක්ෂයටයි.

මේ යුගයේදී අපි කථා කරනවා වරින් වර මේ රට එක එක්කෙනාගේ අතකොළුවක් කර ගත්තාය කියන කාරණය. ඒක මේ සභා ගැබේදීත්, පැරණි පාර්ලිමේන්තු සභා ගැබේදීත් දෝංකාර දුන්නා. වරෙක ඇමෙරිකාවේ අතකොළුව වනවා. වරෙක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අතකොළුව වනවා. වරෙක ලෝක බැංකුවේ අතකොළුව වනවා. වරෙක චීනයේ අතකොළුව වනවා. වරෙක ඉන්දියාවේ අතකොළුව වනවා. දැන් ඇමෙරිකාවේ ලොම් හැලිලා. ජර්මනියේ ලොම් හැලිලා. එංගලන්තයේත් ලොම් හැලිලා. ඒ නිසා දැන් නැඟී එන බලවතුන්ගේ හපයක් බවට මේ රට පත් වනවාය කියන චෝදනාව අපට එල්ල වෙලා තිබෙනවා. අපට තිබෙන්නේ නිර්මාණශීලීව, මේ සියලු බලවේග අතරමැද ඉඳිමින් අපේ ස්වාධීනත්වය රැක ගන්නේ කොහොමද කියන එක බලන්නයි. ඒකට තමයි බණ්ඩාරනායක මහත්මයලා මැදිහත් ප්‍රතිපත්තිය, නොබැඳි ජාතීන්ගේ සම්මේලනය, මැදිහත් ජාතීන්ගේ සම්මේලනය හැදුවේ. ඒ තුළ, බල කඳවුරු දෙකක් අතරමැද සිටිමින් තමන්ගේ ස්වාධීනත්වය රැක ගන්නයි කටයුතු කළේ. ඒ බණ්ඩාරනායක උරුමය, බැන්ඩුං සම්මේලනයේ උරුමය තුළ, මැදිහත් ජාතීන්ගේ උරුමය තුළ- අද මැදිහත් ජාතීන්ගේ සම්මේලනයක් සාර්ථකව නොතිබුණත් - බලවේග අතර මැද, ඒ බලවේග හසුරුවා ගෙන පුංචි රටකට ජාතික ස්වාධීනත්වය රැක ගන්න පුළුවන්කම තිබෙනවා. ඒක ඉදිරියට ගෙන යන්න අපේ ආණ්ඩුව හොඳට දන්නවාය කියන එක මේ අවස්ථාවේ දී පැහැදිලිව කියන්න ඕනෑ.

මුළු ලෝකයේ මහා රාජ්‍යයන් යටත් විජිත වෙද්දී අපේ රාජ්‍ය යටත් විජිත වෙලා හිටියේ නැහැ. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ අපේ ජාතීන් එක්සත් කර ගෙන, ලෝක බලවතුන් ඉදිරියේ අපේ නිදහස, ස්වාධීනත්වය රැක ගැනීමට අවශ්‍ය උපාය, උපක්‍රමය ඒ අවස්ථාවේ තිබෙන අභියෝගයට අනුව යොදා ගත යුතු බවයි. ඒ හැකියාව මේ රජයට තිබෙන බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා රටවල නොයෙකුත් කලබැගෑනි ඇති කර ගනිමින් ඔවුන් අද ලෝක මට්ටමෙන් කුමන්ත්‍රණය කරන්නේ මේ ස්වාධීන රාජ්‍යයන් බිඳ දමලා, ඒ රටවල අභිමානය බිඳ දමලා එක අධිරාජ්‍යයක් ගොඩ නඟා ගන්නටයි. ලංකාව මේ වන තෙක් ඒ සටනේ විජයග්‍රාහීව සිටින බවත්, ඉදිරියේදීත් මේ රටේ ජනතාව එක්සත් කර ගෙන ඒ කටයුතු කර ගෙන යන්නට මේ රජය සැදී පැහැදී සිටින බවත් පැහැදිලි කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*வினா விடுக்கப்பட்டது.*

*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question put.*

MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

Divide!

***පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ පක්ෂව 119; විරුද්ධව 22 යනුවෙන් බෙදුණේය.***

*பாராளுமன்றம் 43 ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 119; எதிராக 22.*

*The Parliament divided under Standing Order No. 43: Ayes 119 ; Noes 22 .*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ අනුව යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත වූ බව මම ප්‍රකාශ කරමි.

## නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත
## கடற்படை (திருத்தம்) சட்டமூலம்
## NAVY (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා ]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [ மாண்புமிகு நிமல் சிறிபால த சில்வா ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[ பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[*MR. DEPUTY SPEAKER *in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1 ஆம் வாசகத்திலிருந்து 3 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත්කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 7.30 වුයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 ජුනි මස 09 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 7.30 மணியாகிவிடவே பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2011 யூன் 09, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்தி வைக்கப்பட்டது*

*It being 7.30 p.m.,* MR. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.00 p.m. on Thursday, 09th June, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts
Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.